2015

# වාර්ෂික වාර්තාව



ලංකා ඛනිජ තෙල්
නීතිගත සංස්ථාව

# පටුන


දර්ශනය, මෙහෙවර සහ ඉලක්ක ....02

සංස්ථාපිත තොරතුරු....03

අධ්‍යක්ෂ මණ්ඩලය ....04

2015 දෙසැ. 31 දිනට පැවති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ....04

පෙර පැවති අධ්‍යක්ෂ මණ්ඩලය ....05

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ....07

මෙම වාර්තාව පිළිබඳ ....09

සංස්ථාව පිළිබඳ දළ විශ්ලේෂණය ....10

2015 වර්ෂයේ කාර්ය සාධනයේ විශේෂ අවස්ථා ....11

අපගේ අගය සාදන ලද ව්‍යාපාර ආකෘතිය ....12

සභාපතිතුමාගේ සමාලෝචනය ....13

අපගේ මෙහෙයුම් පරිසරය ....16

ලෝක ආර්ථිකය ....16

ශ්‍රී ලංකා ආර්ථිකය ....17

ඛනිජ තෙල් කර්මාන්තය ....19

අපගේ අගය එකතු කිරීම සහ බලපෑම ....21

ආයෝජකයින් වෙත අගය නිර්මාණය කිරීම ....21

සමාජයට අගය එකතු කිරීම ....33

පරිසරය වෙත අගය එකතු කිරීම ....40

අනාගත දර්ශනය ....42

අවධානම් කළමනාකරණ වාර්තාව....45

සංස්ථායික පාලනය ....50

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව ....54

විගණන කමිටු වාර්තාව....59

මූල්‍ය ප්‍රකාශන ....61

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ....62

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය....63

ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය....64

මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය ....65

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ....66

විගණකාධිපති වාර්තාව ....97

දස වසරක සාරාංශය .... 146

මූල්‍යමය ප්‍රකාශ සඳහා පාරිභාෂිතය.... 148

# දර්ශනය, මෙහෙවර සහ ඉලක්ක

## දර්ශනය

- පාරිභෝගිකයාට මුල් තැන ලැබෙන්නා වූ ද පාරිසරික හිතකාමි වූ ද කලාපයේ ඛනිජ තෙල් හා ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛ ව්‍යාපාරය බවට පත්වීම හා ඒ අතරම අපගේ ජාතියේ සෞභාග්‍ය උදෙසා දායකත්වය සැපයීම.

## මෙහෙවර

- ඛනිජ තෙල් පිරිපහදු කිරීම හා උසස්ම තත්වයේ නිෂ්පාදන අලෙවි කිරීම පිළිබඳ විශිෂ්ඨත්වය කරා ලඟාවීමේ අභිලාශය මුදුන්පත් කර ගැනීම සඳහා කැපවුන එම ක්ෂේත්‍රයේ නිපුණතා ඇති වෘත්තිකයන් කණ්ඩායමක් හා පක්ෂපාතී, කාර්යක්ෂම බෙදාහරින්නන් ජාලයක මාර්ගයෙන් පාරිභෝගික අවශ්‍යතාවයන් ඉහළින්ම ඉටුකෙරෙන පූර්ණ විසඳුම් හා සේවාවන් සැලසීම සම්බන්ධයෙන් විශිෂ්ඨත්වය සාක්ෂාත්කර ගැනීම මෙන්ම සේවක සහභාගීත්වය හා නවෝත්පාදනය මඟින් උපයෝගි කර ගනිමින් ව්‍යාපාරයේ සංවර්ධනය උදෙසා උසස්ම ආචාරධර්ම වලට අනුකූලව සෞඛ්‍යය, ප්‍රවේසම හා පාරිසරික යන අංශ කෙරෙහි ඉහළින්ම සැලකිලිමත් වෙමින් ව්‍යාපාරික හවුල් කරුවන්ගේ අභිමතාර්ථයන් මුදුන්පත් කිරීම.

## ඉලක්ක

- වෙළඳපල කොටස් ඉහළ මට්ටමක රඳවා ගැනීම.
- අධික තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා විකුණුම්, අලෙවිකරණ සහ මෙහෙයුම් යන අංශවල විශිෂ්ඨත්වයට ලඟා වීම.
- ආර්ථිකමය වශයෙන් සාර්ථක පිරිපහදු අංශයක් පවත්වාගෙන යාම.
- සෑම මට්ටමකම සේවකයින් අතර ඉහළ වෘත්තීය මට්ටමක් වර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.
- ඵලදායීතාවය සහ කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීම.
- නියම කරන ලද ප්‍රමිතීන් අභිබවා යාම සඳහා සෞඛ්‍යයය, ආරක්ෂණ සහ පරිසර හිතකාමී ක්‍රියාමාර්ග ගැනීම.
- සමාජයේ යහපත පිණිස ජාතික සහ සමාජ බැඳීම දරා ගැනීම.
- ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා වන ප්‍රධාන දායකයා වීම.
- ඛනිජ තෙල් අංශයේ ශ්‍රී ලාංකීක පාලනය පවත්වාගෙන යාම

# සංස්ථාපිත තොරතුරු

**ආයතනයේ නම:**
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**නෛතික රාමුව:**
1961 අංක. 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ නීතිගත කරන ලද රාජ්‍ය සංස්ථාවකි.

**ලියාපදිංචි කාර්යාලය:**
609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.
දු.අ. : +94 11 5455455
ටෙලිග්‍රෑම් : "LANKA OIL"
කේබල් : CEYPETCO
ටෙලෙක්ස් : 21235 CEYPETCO CE
ෆැක්ස් : +94 11 5455400
විද්‍යුත් තැපැල : cpcsec@ceypetco.gov.lk
විද්‍යුත් ලිපිනය : www.ceypetco.gov.lk

**බදු ගෙවීම් හඳුනාගැනීමේ අංකය. :** 409000053

**VAT ලියාපදිංචි අංකය :** 409000053 - 7000

**මූල්‍ය වර්ෂය:** ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

**2015 දෙසැම්බර් 31 දිනට පැවති අධ්‍යක්ෂ මණ්ඩලය:**
ටී.ජී. ජයසිංහ මහතා (සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ)
ඩී.සී.එස්. සෙනෙවිරත්න මහතා
පී. ගල්හේන මහතා
එම්.ජී. ජයසේන මහතා
අර්. හරිස්චන්ද්‍ර මහතා
කේ.ඒ. විමලේන්තිරරාජා මහතා

**ආශ්‍රිත සමාගම:**
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, නිමාව, කොලොන්නාව.

**විගණකවරු:**
විගණකාධිපති

**බැංකුකරුවෝ:**
මහජන බැංකුව, කොමර්ෂල් බැංකුව,
ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව,
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

# අධ්‍යක්ෂ මණ්ඩලය

## 2015 දෙසැම්බර් 31 දිනට පැවති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

**ටී.ජී. ජයසිංහ මහතා (සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ)**
**(2015.10.12 සිට)**

විද්‍යාපති (ප්‍රාදේශිය සංවර්ධන සැලසුම්) - ඒ.අයි.ටී. - තායිලන්තය,
සංවර්ධන ප්‍රතිපත්ති සහ සැලසුම් පිළිබඳ ඩිප්ලෝමාව - වේල්ස් විශ්ව විද්‍යාලය - එක්සත් රාජධානිය,
ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් ඩිප්ලෝමාව - යූ.එන්.සී.ආර්.ඩී. - නගෝයා,
ශාස්ත්‍රවේදී (සිලෝන්),
ශ්‍රී ලංකා සැලසුම් සේවය - I වන පංතිය,
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ
මූල්‍ය කොමිෂන් සභාවේ හිටපු ලේකම්
තෘතීක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ හිටපු සභාපති
ශ්‍රී ලංකා තාක්ෂණික අධ්‍යාපන ජාතික ආයතනයේ හිටපු උප සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ හිටපු සාමාජික
දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ හිටපු ව්‍යාපෘති අධ්‍යක්ෂ
සැලසුම් සහ උපදේශන හිටපු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්

**ඩී.සී.එස්. සෙනවිරත්න මහතා**
**(2015.10.12 සිට)**

නිෂ්පාදනය පිළිබඳව ඩිප්ලෝමාව,
ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ඩිප්ලෝමාව,
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ
එස්.එම්.එස්. හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ
ග්‍රීනරි කම්පනි පුද්ගලික සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ
බ්ලැක් ඩයමන්ඩ් ආරක්ෂක පුද්ගලික සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ
එස්.එම්.එස්. ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ
එස්.එම්.එස්. රියලිටීස් පුද්ගලික සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ

**පී. ගල්හේන මහතා**
**(2015.10.12 සිට)**

කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය හදාරමින් සිටී,
එෆ්.සී.එම්.ඒ. (එක්සත් රාජධානිය),
සී.අයි.එම්. අවසන් වසර සමත්,
ව්‍යාපාර පරිපාලනවේදී පළමු උපාධිය (ගෞරව) (දෙවන පංතිය) - කොළඹ,
ව්‍යාපාර පරිපාලනවේදී (කුසලතා) - කොළඹ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ අවසන් වසර සමත්
ඒ.ඒ.අයි.සී.ඕ. ප්‍රොපර්ටි ඩිවලප්මන්ට් ලිමිටඩ් හී සභාපති
ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජික
එච්.ඩී.එෆ්.සී. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ටයිටන් පැකේජින් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා ස්ථාවර බලශක්ති අධිකාරියේ හිටපු සභාපති
ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ හිටපු සභාපති
ලංකා නැව් සංස්ථාවේ හිටපු සභාපති
ශ්‍රී ලංකා අත්කම් මණ්ඩලයේ (ලක්සල) හිටපු සභාපති
ලංකා ගල් අඟුරු සමාගමේ හිටපු අධ්‍යක්ෂ
ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විස් පුද්ගලික සමාගමේ හිටපු අධ්‍යක්ෂ

**එම්.ජී. ජයසේන මහතා**
**(2015.10.12 සිට)**

**ආර්. හරිස්චන්ද්‍ර මහතා**
**(2015.10.12 සිට)**

**කේ.ඒ. විමලේන්තිරරාජා මහතා**
**(2015.11.11 සිට)**

## පෙර පැවති අධ්‍යක්ෂ මණ්ඩලය

**ජේ.ආර්. වික්‍රමසිංහ මහතා (හිටපු සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ)**
**(2015.01.21 සිට 2015.10.12 දක්වා)**

ඉංජිනේරු විද්‍යාවේදී (යාන්ත්‍රික ඉංජිනේරු) ගෞරව - මොරටුව,
වරලත් ඉංජිනේරු, එම්.අයි.ඊ. (ශ්‍රී ලංකා)
පොලිප්ටෝ (පුද්.) සමාගමේ අධ්‍යක්ෂ
මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ හිටපු ව්‍යාපෘති අධ්‍යක්ෂ

**ඩබ්.එස්.එම්.සී. සිරිමෙවන් මහතා**
**(2015.01.23 සිට 2015.10.12 දක්වා)**

**පී.ආර්. ගුණවර්ධන මහතා**
**(2015.01.26 සිට 2015.10.12 දක්වා)**

විද්‍යාවේදී (විද්‍යා) - කොළඹ
ශ්‍රී ලංකා ඉඩම් ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන සංස්ථාවේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ
පොලිප්ටෝ ලංකා (පුද්.) සමාගමේ ආරම්භක අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරි
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ හිටපු සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ
ලංකා විදුලිබල මණ්ඩලයේ හිටපු ක්‍රියාකාරී අධ්‍යක්ෂ

**ඒ.කේ. සෙනවිරත්න මහතා**
**(2015.01.30 සිට 2015.10.14 දක්වා)**

ව්‍යාපාර පරිපාලනවේදී (ව්‍යාපාර පරිපාලනය) - කොළඹ,
පශ්චාත් ඩිප්ලෝමා බී ඇන්ඩ් එෆ්.ඒ. - සී.ඒ.එස්.එල්,
විද්‍යාවේදී (රසායන විද්‍යා) - කැළණිය
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
ඩී ලායි රුයි ලංකා කරන්සි ඇන්ඩ් සෙක්‍යුරිටි ප්‍රින්ට් (පුද්.) සමාගමේ අධ්‍යක්ෂ
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ
ජාතික රක්ෂණ භාර අරමුදලේ හිටපු සභාපති

**ඩී.ඩී.එස්. වික්‍රමරත්න මහතා**
**(2015.02.06 සිට 2015.10.12 දක්වා)**

**එම්.කේ. සමරසිංහ මහතා**
**(2015.02.06 සිට 2015.10.12 දක්වා)**

ඔටෝ විදුලි කාර්මික ඩිප්ලෝමාව - ජී.ටී.ටී.අයි.
**ශ්‍රී කාන්ත් ප්‍රොෆෙෂනල් කිචන් (පුද්.) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ**
**රාජ්‍ය දැව සංස්ථාවේ හිටපු අධ්‍යක්ෂ**
**මූලික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ**

**ඒ.එච්.එස්. විජේසිංහ මහතා**
**(2014.01.09 සිට 2015.12.01 දක්වා)**

එම්.එච්.ආර්.ඩී.පී. - ජී.ජී.එස්.අයි.යූ. - ඉන්දියාව,
ප්‍රාදේශීය සභා පරිපාලනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
ශාස්ත්‍රවේදී - කැළණිය.
**ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන)**
**ඉඩම් හිමිකම් නිරාකරණ හිටපු කොමසාරිස් ජෙනරාල්**

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

**සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ**
ටී.ජී. ජයසිංහ මහතා
විද්‍යාපති (ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්) - ඒ.අයි.ටී. - තායිලන්තය, සංවර්ධන ප්‍රතිපත්ති සහ සැලසුම් පිළිබඳ ඩිප්ලෝමාව - වේල්ස් විශ්ව විද්‍යාලය - එක්සත් රාජධානිය, ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් ඩිප්ලෝමාව - යූ.එන්.සී.ආර්.ඩී. - නගෝයා, ශාස්ත්‍රවේදී (සිලෝන්), ශ්‍රී ලංකා සැලසුම් සේවය - 1 වන පංතිය

## පිරිපහදු කාර්යාංශය

**පිරිපහදු කළමනාකාර**
එන්.ආර්.ආර්. ජයසේකර මහතා
විද්‍යාවේදී (ඉංජිනේරු), ව්‍යාපාර පරිපාලනවේදී, වරලත් ඉංජිනේරු, එම්.අයි.ඊ. (ශ්‍රී ලංකා)

**නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර (නිෂ්පාදන සහ මෙහෙයුම්)**
ඊ.ඒ.එස්. එදිරිසිංහ මහතා
විද්‍යාවේදී (ඉංජිනේරු), වරලත් ඉංජිනේරු, එම්.අයි.ඊ. (ශ්‍රී ලංකා), එම්.එස්.එල්.ඊ.එම්.ඒ.

**වැඩබලන නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර (නඩත්තු සහ ව්‍යාපෘති)**
ඩී.එම්.පී. දිසානායක මහතා
විද්‍යාවේදී (ඉංජිනේරු) ගෞරව, එල්.එල්.බී. ගෞරව, වරලත් ඉංජිනේරු, එම්.අයි.ඊ. (ශ්‍රී ලංකා)

**නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර (විදුලි හා උපකරණ)**
එල්.ජී.එම්.ආර්. පෙරේරා මහතා
විද්‍යාවේදී ඉංජිනේරු (විදුලි සහ විදුලි සංදේශ ඉංජිනේරු) ගෞරව.

**නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර (තාක්ෂණික සේවා)**
සී. වීරසේකර මහතා
විද්‍යාවේදී (ඉංජිනේරු), වරලත් ඉංජිනේරු, එම්.අයි.ඊ. (ශ්‍රී ලංකා)

**නියෝජ්‍ය ක්‍රියාකරවුම් කළමනාකාර (සපුගස්කන්ද පර්යන්තය)**
ඩබ්.එම්.ඒ.අයි. වනසේකර මහතා
විද්‍යාවේදී (භෞතික විද්‍යාව) - කොළඹ, තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධි පූහුණු පාඨමාලාව

## තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු කාර්යාංශය

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු)**
ජී.ඒ.එස්.පී. ගුණවර්ධන මහතා
විද්‍යාවේදී ඉංජිනේරු (යාන්ත්‍රික ඉංජිනේරු)

## මුදල් කාර්යාංශය

**වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)**
ආර්.එස්. සුන්දරලිංගම් මහතා
ඒ.සී.එම්.ඒ. (එ.රා), වානිජවේදී (ගෞරව), සී.ජී.එම්.ඒ.

**මුදල් කළමනාකාර**
ආර්.ටී.ඒ. දාබරේ මිය
ඒ.සී.එම්.ඒ. (එ.රා), සී.ජී.එම්.ඒ.

## නීති කාර්යාංශය

**ප්‍රධාන නීති නිලධාරි**
ආර්.ඒ.කේ.සී. ආරියරත්න මිය
**නීතිඥ, ජාත්‍යන්තර නීතිය පිළිබඳ( ගෞරව) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.**

## ආරක්ෂක සහ විමර්ශන කාර්යාංශය

**කළමනාකාර (ආරක්ෂක සහ විමර්ශන)**
මේජර් එම්.ආර්.එස්.පී. සමරසිංහ ආර්.ඩබ්.පී ආර්.එස්.පී.
ගැටළු නිරාකරණය කිරීම සහ සාමය සඳහා සූදානම්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව

## තොරතුරු තාක්ෂණ කාර්යාංශය

**කළමනාකාර (තොරතුරු තාක්ෂණ)**
එම්.එස්.ආර්. ප්‍රනාන්දු මිය
විද්‍යාවේදී (පරිගණක විද්‍යාව) ගෞරව. - කොළඹ, තොරතුරු තාක්ෂණ විද්‍යාපති - කොළඹ,
විධායක ව්‍යාපාර පරිපාලනවේදී දෙවන උපාධිය හදාරමින් සිටී - කොළඹ, බ්‍රිතාන්‍ය පරිගණක සංවිධානයේ සාමාජික, එම්.අයි.ඊ.ඊ.ඊ.

## ප්‍රසම්පාදන හා ගබඩා කාර්යාංශය

**කළමනාකාර (ප්‍රසම්පාදන හා ගබඩා)**
එස්.ඩී.එස්. රාජපක්ෂ මහතා
විද්‍යාවේදී ඉංජිනේරු (යාන්ත්‍රික), වරලත් ඉංජිනේරු

## ගුවන්තෙල් කාර්යාංශය

**කළමනාකාර (ගුවන්තෙල් - ක්‍රියාකරවුම්)**
එම්.ඒ.ඩී. මල්ලිකාරච්චි මහතා
විද්‍යාවේදී ඉංජිනේරු (නිෂ්පාදන), එම්.පී.එම්.අයි, එම්.අයි.ඊ. (ශ්‍රී ලංකා)

## මානව සම්පත් කළමනාකරණ කාර්යාංශය

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි**
**(මානව සම්පත් හා පාලන)**
එස්.ඩබ්. ගමගේ මහතා
ව්‍යාපාර පරිපාලනවේදී - කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය - ශ්‍රී ජයවර්ධනපුර, විද්‍යාපති - ඩබ්.ඒ.යූ. - හෝලන්ඩ්, විද්‍යාවේදී - රුහුණ, බී ඇන්ඩ් එෆ්.ඒ පශ්චාත් ඩිප්ලෝමාව - සී.ඒ.එස්.එල්, සහාය සාමාජික (සී.අයි.පී.ඩී.- එ.රා.), එෆ්.සී.පී.එම්.

**කළමනාකාර (මානව සම්පත්)**
කේ.ඩබ්.එස්. පුෂ්පලාල් මහතා
ශාස්ත්‍රවේදී (දේශපාලන විද්‍යාව) විශේෂ ගෞරව - කොළඹ, ඒ.එච්.ආර්.අයි. සහතිකලත් වෘත්තීය සාමාජික - ඕස්ට්‍රේලියාව, ඒ.සී.පී.එම්.

## අලෙවි කාර්යාංශය

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි)**
ඩබ්.එම්.කේ.ආර්.බී. වික්‍රමසිංහ මහතා
ව්‍යාපාර කළමනාකරණවේදී, විද්‍යාවේදී (රසායන), එම්.අයි.කෙම්. සී, සී.එම්.එස්.එල්.අයි.එම්.

**වැඩබලන අලෙවි කළමනාකාර (සිල්ලර)**
ඩබ්.ඩී.එල්.සී. අබේගුණවර්ධන මහතා
විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලනවේදී) - ශ්‍රී ජ'පුර, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කළමනාකරණය) - වයඹ

## වානිජ කාර්යාංශය

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි**
**(වානිජ සහ සැපයුම් දාමය)**
එම්.කේ. ගරුසිංහ මහතා
විද්‍යාවේදී - කොළඹ, විද්‍යාපති (සමුද්‍ර කටයුතු) - ඩබ්.එම්.යූ. ස්වීඩනය, ව්‍යාපාර කළමනාකරණවේදී - පී.අයි.එම්. – ශ්‍රී ජයවර්ධනපුර, එම්.අයි.සී.එස්. (එ.රා.), එම්.අයි.එස්.එම්.එම්., ඊ.ඩී.බී.ඒ. - කොළඹ, වෘත්තීය නාවුක ඩිප්ලෝමාව - නෝර්වේ

**වානිජ කළමනාකාර**
ඩබ්.කේ.එස්. ගුණවර්ධන මහතා
විද්‍යාපති (සමුද්‍ර කටයුතු) - ඩබ්.එම්.යූ. - ස්වීඩනය, විද්‍යාපති (කළමනාකරණ සහ තොරතුරු තාක්‍ෂණය) - කැළණිය, විද්‍යාවේදී (ගණිතය) විශේෂ (දෙවන පංතිය - ඉහළ) - කැළණිය, එම්.එස්.එල්.අයි.එම්.

## ඉංජිනේරු සහ පාරිශ්‍ර කාර්යාංශය

කළමනාකාර (ඉංජිනේරු හා පාරිශ්‍ර)
**ජී.පී.කේ. විජේකෝන් මහතා**
විද්‍යාවේදී (ඉංජිනේරු), ඒ.එම්.අයි.ඊ. (ශ්‍රී ලංකා), ව්‍යුහාත්මක සැලසුම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

## නාවුක කාර්යාංශය

**කළමනාකාර (නාවුක)**
පී.ඒ.යූ.ආර්. කරුණාරත්න මහතා
විද්‍යාවේදී (භෞ.වි) - කොළඹ, සාමාන්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව - එන්.අයි.බී.එම්., කළමනාකරණ පුහුණුව පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍ර - පී.අයි.එම්., නාවුක සහ නිෂ්කාෂණය පිළිබඳ සහතිකපත්‍ර - අයි.එස්.එම්.එම්.

## අභ්‍යන්තර විගණන කාර්යාංශය

**නියෝජ්‍ය කළමනාකාර (අභ්‍යන්තර විගණන)**
කේ.ඩී.ජී.එන්.අයි. සපරමාදු මහතා
එෆ්.සී.ඒ., ඒ.සී.එම්.ඒ. (එ.රා), සී.ජී.එම්.ඒ., ව්‍යාපාර පරිපාලනවේදී (යූ.එස්.ක්‍යු)

## කෘෂි රසායන කාර්යාංශය

වැඩබලන නියෝජ්‍ය කළමනාකාර (කෘෂි - අලෙවි)
**එච්.එස්.කේ. අබේගුණවර්ධන මහතා**

## ලේකම් කාර්යාංශය

**වැඩබලන ලේකම් අංශ ප්‍රධානී**
**එස්. ලියනාරච්චි මහතා**
ව්‍යාපාර අධ්‍යයනවේදී - කොළඹ, සී.පී.එම්., වානිජවේදී විශේෂ - පේරාදෙණිය.

# මෙම වාර්තාව පිළිබඳව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ක්‍රමෝපාය, කාර්ය සාධනය, පාලනය, අගය ඇති කිරීම සහ පැවැත්ම පිළිබඳව වඩා පාරදෘශ්‍ය ලෙස මෙම වසරේ වාර්ෂික වාර්තාව අප විසින් ඉදිරිපත් කරනු ලබයි. ආර්ථික, සාමාජීය සහ පාරිසරික අංශ කෙරේ අවධානය යොමු කරමින් 2015 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා සංස්ථාවේ කාර්යසාධනය පිළිබඳව මෙම වාර්තාවේ සාකච්ඡා කරයි. වාර්ෂික වාර්තාකරණ චක්‍රයක් අප විසින් අනුගමනය කරන අතර මෙම වාර්තාවේ අන්තර්ගත කරුණු ක්‍රමානුකූල ක්‍රියාවලියක් මගින් තෝරා ගෙන ඇත. ගෝලීය වාර්තාකරණ ප්‍රත්‍යුත්කරණය (GRI) මඟින් නියම කර ඇති සහ අපගේ ක්ෂේත්‍රයට විශේෂිත වූ අංශයන් ද ඇතුලත් කරමින් පෙර වර්ෂයට වඩා මෙම වාර්තාවේ විෂය පථය සහ ආවරණය කිරීම වැඩිකර ඇත.

ආංශික සීමාවන් නිර්ණය කිරීමේ අරමුණ සඳහා සංස්ථාව විසින් පහත සඳහන් පරදුදරන කණ්ඩායම් හඳුනාගෙන ඇත;

➢ **අභ්‍යන්තර පරදුදරන්නෝ**

- සේවකයෝ

➢ **බාහිර පරදුදරන්නෝ**

- රජය
- ගණුදෙනුකරුවන්
- ව්‍යාපාර කොටස්කරුවන්
- අරමුදල් සපයන්නෝ
- ප්‍රජාවන්
- නියාමක අධිකාරීන්

*ආකූල ගෝලීය සහ දේශීය ආර්ථිකයක් සහ සමාජ තත්වයන් සමඟ මෙම වර්ෂය සංස්ථාවට ඉතා ශක්තිමත් වසරක් විය.*

## සංස්ථාව පිළිබඳ දළ විශ්ලේෂණය

| ප්‍රවාහනය | විදුලිබල උත්පාදනය | කර්මාන්ත | දේශීය | ගුවන්තෙල් | නැව්තෙල් | අපනයනය |
|---|---|---|---|---|---|---|
| පෙට්‍රල් 92 | ඔටෝ ඩීසල් | දැවිතෙල් | භූමිතෙල් | ගුවන් යානා ඉන්ධන | ඩීසල් | දැවිතෙල් |
| පෙට්‍රල් 95 | දැවිතෙල් | කාර්මික භූමිතෙල් | එල්.පී.ජී. | ඇව්ගෑස් | දැවිතෙල් | නැප්තා |
| ඔටෝ ඩීසල් | නැප්තා | තාර | | | | |
| 4 ස්ටාර් ඩීසල් | | එස්.බී.පී. | | | | |
| | | ලිහිසිතෙල් | | | | |
| | | කෘෂි රසායන | | | | |

*පිරවුම්හල් සංඛ්‍යාව* 1,203


*සේවකයින් සංඛ්‍යාව* 2,579

*රජය වෙත ගෙවීම්* රු.බිලියන 95


*පිරිපහදු කරන ලද බොරතෙල්* 1,692,074 මෙ.ටොන්

# 2015 වර්ෂයේ කාර්ය සාධනයේ විශේෂ අවස්ථා


ආදායම





අලෙවි ධාරිතාව





දළ ලාභය





දළ ලාභ ආන්තිකය




විනිමය අනුපාත විචල්‍යතා හේතුවෙන් සිදු වූ අලාභ




ලාභ/ (අලාභ) බදු පසු



# අපගේ අගය සාදන ලද ව්‍යාපාර ආකෘතිය

## යෙදවුම්

**මූල්‍ය ප්‍රාග්ධනය**
ස්කන්ධය : (රු. බිලියන 229)
ණය ගැනීම් : රු. බිලියන 268

**නිමැයුම් ප්‍රාග්ධනය**
පී.පී.ඊ. : රු. බිලියන 14
පිරවුම්හල් ගණන : 1,203

**බුද්ධිමය ප්‍රාග්ධනය**
- රාජ්‍ය ආයතනයක් ලෙස වන පිළිගැනීම
- දැනුම සහ පළපුරුද්ද සහිත ශ්‍රම බලකාය

**මානව ප්‍රාග්ධනය**
ස්ථිර සේවක සංඛ්‍යාව : 2,579
පාරිතෝෂික : රු.මිලි. 861

**සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**
- ජාත්‍යන්තර වෙළඳපලේ තෙල් සැපයුම්කරුවන්
- නැව් සමාගම්
- තනි පුද්ගලයන්
- සාමූහික

**ස්වාභාවික ප්‍රාග්ධනය**
- විශේෂිත බලශක්ති පරිභෝජනය (එම්.එම්.කේ/කැල් /එම්.ටී - බොරතෙල්): 0.4755
- කඩදාසි: අයි.එස්.ඕ 9001:2008, අයි.එස්.ඕ. 14001:2004 සහතිකලත් ඉහළ ප්‍රමිතියේ “ඩබල් ඒ” කඩදාසි භාවිතා කරයි.

## ක්‍රියාකාරකම්

**මූලික ක්‍රියාකාරකම්**

ආනයනය

පිරිපහදු කිරීම

ගබඩා කිරීම

බෙදාහැරීම

**සහාය ක්‍රියාකාරකම්**

ව්‍යාපාර ක්‍රමෝපාය

තාක්ෂණික සේවා

පිරිස් කළමනාකරණය

තොරතුරු තාක්ෂණ සහාය

## නිමවුම්

**ආයෝජකයන්**
ගෙවන ලද පොළිය:
රු.බිලියන 15

**රජය**
බදු ගෙවීම් :
රු. බිලියන 95

**ගණුදෙනුකරුවන්**
ආදායම :
රු. බිලියන 377

**සැපයුම්කරුවන්**
ගෙවීම් :
රු. බිලියන 292

**සේවකයන්**
වැටුප් හා ප්‍රතිලාභ :
රු. බිලියන 5

**ප්‍රජාව**
ඉහළ සහන මිල ගණන් යටතේ ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවි කිරීම

**පරිසරය**
බැහැර කරන ජලය පවිත්‍ර කිරීමේ යන්ත්‍රාගාරයක් ඉදිකිරීම.

සංස්ථායික පාලනය

අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය

# සභාපතිතුමාගේ සමාලෝචනය

2015 දෙසැම්බර් 31 දිනට අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සතුටකි. ගෝලීය සහ දේශීය දුෂ්කර ආර්ථික සහ සමාජීය තත්වයන් යටතේ වුවද සංස්ථාව ඉතාමත් ශක්තිමත්ව එයට මුහුණ දුන් වර්ෂයකි. මෙවැනි තත්වයක් යටතේ රු. බිලියන 39.62 ක දළ ලාභයක් ලැබූ අතර එය පෙර වර්ෂයට වඩා 57% ක වැඩි වීමකි. 2014 වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් ලාභය රු. බිලියන 12.3 ක් වූ අතර, මෙම වර්ෂයේ එය රු. බිලියන 27.42 කි. කෙසේ වෙතත්, මෙමෙහෙයුම් ලාභය අලාභයක් බවට පත්වීමට හේතු වූයේ, විනිමය අනුපාතයේ විචල්‍යතා, මූල්‍ය වියදම්, හෙජින් වියදම් සහ බදු වියදම්ය. බදු ගෙවීමෙන් පසු 2015 වර්ෂයේ අලාභය රු. බිලියන 21.74 ක් විය.

### මෙහෙයුම් සංධර්භය

උප අංශ තුනේම වර්ධනය සමඟ 2015 වර්ෂයේදී ශ්‍රී ලාංකීය ආර්ථිකය 4.8% න් වර්ධනය විය. කෘෂි කාර්මික ක්ෂේත්‍රය ඉහළම වර්ධනයක් වාර්තා කරන ලද අතර, ආර්ථිකයට ඉහළම දායකත්වයක් ලබා දෙන සේවා අංශය 5.3% ක වර්ධන අනුපාතයක් වාර්තා කරන ලදී. 2015 වර්ෂයේදී කාර්මික අංශයේ වර්ධනය 3% ක් විය. 2015 අගෝස්තු මාසය වනතුරු ශ්‍රී ලංකා රුපියල විශාල වශයෙන් ස්ථාවරව පැවතුන අතර, විනිමය අනුපාතය තීරණය කිරීම සඳහා වඩා නම්‍යශීලී ප්‍රවේශයක් ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ගන්නා ලද තීරණය සමඟ රුපියල සැලකිය යුතු පහළ යාමක් පෙන්නුම් කරන ලදී. මෙම වර්ෂයේදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිශතය 9.3% කි. එසේම, මෙම වර්ෂයේදී ආනයන අධෛර්යමත් කිරීම සඳහා රජය විසින් තීරු බදු වැඩි කරන ලදී. එසේම, 2015 දී ගෝලීය තෙල් මිල 47.2% න් අඩු විය. ගෝලීය තෙල් මිල සමඟ අනුගත වෙමින්, සංස්ථාව විසින් ආනයනය කරන ලද බොර තෙල් මිල 47.6% න් අඩු විය.

### අපගේ කාර්ය සාධනය

2015 වර්ෂයේ ආදායම රු. බිලියන 376.73 ක් වූ අතර, දළ ලාභය රු. බිලියන 39.62 ක් විය. ආදායම් අගයේ පහත යාමක් දක්නට ලැබුණ ද, ජාත්‍යන්තර බොරතෙල් මිල ගණන්වල පහත යාමත් සමඟ දළ ලාභයේ 57% ක ඉහළ යාමක් දක්නට ලැබුණි. පෙර වර්ෂයේ රු.බිලියන 12.3 සමඟ සැසඳීමේදී, මේ වර්ෂයේ මෙහෙයුම් ලාභය රු.බිලියන 27.42 ක් ලෙස දෙගුණයක අගයක් වාර්තා කරන ලද අතර ඒ සඳහා පරදුදරන කණ්ඩායම් සමඟ පවත්නා ඉතා ඉහළ සම්බන්ධතාව සහ ඉහළ මට්ටමේ කළමනාකරණ භාවිතයන් හේතු විය. එහෙත් ඇතැම් සමාජ ආර්ථික කරුණු හේතුවෙන් රු.බිලියන 21.9 ක සමස්ථ විස්තීරණ වියදමක් දැරීමට සංස්ථාවට සිදු විය.

2015 ජනවාරි මාසයේදී ඛනිජ තෙල් නිෂ්පාදන වල දේශීය සිල්ලර මිල ගණන් පහළ දමන ලද අතර, 2015 ජනවාරි සිට ජූනි දක්වා ජාත්‍යන්තර බොර තෙල් මිල ඉහළ යාමට සමගාමීව මිල සංශෝධනයක් සිදු නොකරන ලදී. මෙමඟින් සංස්ථාවේ දළ ලාභය ක්ෂය විය. ලීටරයට රු.15/- ක් ව පැවති පෙට්‍රල් සඳහා වන තීරු බදු ලීටරයට රු.35/- දක්වා වැඩි වීම හේතුවෙන්, පෙට්‍රල් ආනයනය කිරීමේදී ඉහළ තීරුබදු ගෙවීමක් සිදු කිරීමට සංස්ථාවට සිදුවිය. 2015 වර්ෂයේදී ගෙවන ලද තීරු බදු රු. බිලියන 32.98 ක් වූ අතර, එය 2014 වර්ෂයට වඩා වැඩි විය. ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම නිසා රු. බිලියන 32.84 ක විදේශ විනිමය අනුපාතයේ අලාභයක් සංස්ථාවට සිදු විය. මෙමඟින් සංස්ථාවේ ලාභදායීත්වය කෙරේ බලපෑමක් ඇති විය. ලබාගෙන ඇති විදේශ මුදල් සඳහා වන පොළී පිරිවැය රු. බිලියන 14.98 ක් වන අතර, ලබා ගන්නා ලද විදේශ මුදල් ණය ගෙවා දැමීම සඳහා ප්‍රායෝගික ක්‍රමවේදයක් නොමැති වීම සහ රජයෙන් ලැබිය යුතු සහන සංරචක නොලැබීම සංස්ථාව මුහුණු දෙන ලද ප්‍රධානතම බාධක වේ. එසේම, ඇමරිකානු ඩොලර් මිලදී ගැනීම සඳහා සංස්ථාවට අවසර ඇත්තේ රාජ්‍ය වානිජ බැංකු දෙකෙන් පමණක් වන අතර බලපත්‍රලාභී අනෙකුත් වානිජ බැංකු මඟින් තරඟකාරී මිල ගණන්වලට ඇමරිකානු ඩොලර්

මිලදී ගැනීම අවහිර කර ඇත. වෙළඳ ණය පියවීම කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, ඒ හේතුවෙන් වෙළඳ ණය ලැබීම් 49.21% න් අඩු විය. 2015 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණය ලැබීම් රු. බිලියන 18.73 ක් වන අතර, ඉන් රු.බිලියන 8.61 ක් ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් වන අතර ලංකා විදුලිබල මණ්ඩලය, පුද්ගලික විදුලිබලාගාර, ත්‍රිවිධ හමුදාව සහ මිහින් ලංකා (පුද්.) සමාගම යන ආයතන වලින් ලැබිය යුතු ණය, 2015 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. බිලියන 2.72 ක්, රු. බිලියන 1.78 ක් රු. බිලියන 0.65 ක් සහ රු. බිලියන 0.55 ක් වේ.

### ඉදිරි ගමන

2016 පළමු කාර්තුවට පසුව ගෝලීය තෙල් මිල පහළයාමේ ප්‍රවනතාවයක් දක්නට නොලැබුණ ලැබුණ ද එහි සියුම් ඉහළ පහළ යාමක්ද නිරීක්ෂණ විය. ඉදිරි කාර්තුවලදී ඉහළයාමේ ප්‍රවනතාවයක් අපේක්ෂා කෙරේ. එසේම, විදේශ ඉපයීම් අඩුවීමේ ප්‍රවනතාවය විදේශ විනිමය අනුපාතය කෙරේ පීඩනයක් ඇති කරන අතර ගෝලීය පොළී අනුපාතිකය ද ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමඟින් පවත්නා වෙළඳපල පොළී අනුපාතයට ලබා ගන්නා ලද විදේශ ණය සඳහා ඉහළ පොළී අනුපාතයක් ගෙවීමට ශ්‍රී ලංකාවට සිදුවේ. ප්‍රධාන වශයෙන් බදු ඉහළ දැමීම මඟින් රජය එහි ආදායම ඉහළ දැමීමට සැලසුම් කරයි. යෝග්‍ය ප්‍රතිපත්ති සමඟ ඉහළ ආර්ථික වර්ධනයක් මධ්‍ය කාලීනව ඇතිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. බාහිර විචලාත්‍ය හමුවේ ඇතිවන අභියෝග වෙත මුහුණ දීමට සංස්ථා කළමනාකාරීත්වයද සූදානම්ව සිටින අතර, ලාභ ලබන ආයතනයක් ලෙස වර්ධනය වෙමින් එම මාර්ගයට පිවිසීමට සංස්ථාව කටයුතු කරනු ලබයි.

සංස්ථාව ලාභ ලබන ආයතනයක් බවට පත් කිරීමට සහ එමඟින් ආර්ථිකයට හා මහජනතාවට ලැබෙන අගය වැඩි කිරීමට අවශ්‍ය සංස්ථාවේ මෙහෙයුම් වැඩිදියුණු කිරීමට හා ව්‍යාප්ත කිරීමට අවශ්‍ය දිගු කාලීන හා කෙටි කාලීන ව්‍යාපෘති, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සහය ඇතිව, හඳුනාගෙන ඇත. ඒ අනුව, කෙටි කාලීන ව්‍යාපෘති සඳහා 2016 සහ 2017 වර්ෂය සඳහා අවශ්‍ය අයවැය වෙන් කිරීම් සිදුකර ඇති අතර පවත්නා අරමුදල් මඟින් එම ව්‍යාපෘති කළමනාකරණය කිරීමට තීරණය කර ඇති අතර, දීර්ඝ කාලීන ව්‍යාපෘති සඳහා බාහිරින් අරමුදල් උත්පාදනය කර ගැනීමට ද තීරණය කර ඇත. ව්‍යාපාරයේ පුළුල් කිරීමක් ලෙස සම්පීඩිත දියර වායු වෙළඳපලට ඇතුල්වීමට සැලසුම් කරමින් සිටින අතර, නැව් තෙල්, තොග තාර සහ ලිහිසිතෙල් ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමට ද සැලසුම් කර ඇත. මැලේසියාවේ හයිරක්ස් ඔයිල් සමාගම සමඟ බී.ඕ.ටී. පදනම යටතේ (ඉදිකිරීම, ක්‍රියාකරවීම, පැවරීම) ලිහිසිතෙල් යන්ත්‍රාගාරයක් ඉදිකරමින් ලිහිසිතෙල් ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමට මේ වන විටත් මූලික පියවර ගෙන ඇත.

දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා පිරිවැයට අනුව මිල තීරණය කරනු ලබන පාරදෘෂ්‍ය තෙල් මිල යාන්ත්‍රණයක දැඩි අවශ්‍යතාවයක් පවතී. එසේම, සංස්ථාවට හිමි සහන සංරචකය රජය විසින් පියවනු ඇතැයි බලාපොරොත්තු වන අතර සංස්ථාව විසින් ලබා ගන්නා ලද බැංකු ණය එම සහන සංරචකය මඟින් කපා හැරිය හැකි නම් එය සංස්ථාව ඉතාමත් අගය කරනු ලබයි. ඉදිරි මූල්‍ය වර්ෂය තුළදී අප විසින් කරන ලද ඉල්ලීම් සඳහා අදාළ බලධාරීන් සතුටුදායී පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙමි. රජයේ ඛනිජ තෙල් කැනීම් ප්‍රයත්න සහ වායු වානිජකරණ ක්‍රියාවලිය සාර්ථක වේ නම්, දේශීය වායු භාවිතා කිරීමට සහ ආසූත ආනයන අඩු කිරීමට අපේක්ෂිතයි.

### ස්තූතිය

ගරු අමාත්‍යතුමාට, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමියට සහ ඛනිජ තෙල් සම්පත් අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරීන්ට ඔවුන්ගේ අඛණ්ඩ සහාය සහ අනුග්‍රහය සඳහා මාගේ කෘතඥතාවය දැක්වීමට කැමැත්තෙමි. මුදල් අමාත්‍යාංශයේ, පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා රේගුවේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහ අපගේ බැංකුකරුවන්ගේ මහඟු සහයෝගයට මාගේ විශේෂ ප්‍රශංසාව පුදකර සිටිමි. එසේම මාගේ අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකාරීත්වය සහ සංස්ථාවේ සෑම සේවකයෙකුටම, අපගේ බෙදුම්කරුවන්ට සහ ව්‍යාපාරික හවුල්කරුවන්ට ඔවුන්ගේ පක්ෂපාතීත්වය සහ දැක්වූ අනුග්‍රහයට කෘතඥ වෙමි. ඔබගේ සහයෝගය නොමැතිව සංස්ථාවේ කාර්යසාධනය මෙතරම් පහසු නොවනු ඇත.

සංස්ථාව ඉහළ තලයකට ගෙන ඒමට සහ ආර්ථිකයට අගයක් එකතු කිරීමට ඔබ සමග එක්ව කටයුතු කිරීමට අපේක්ෂා කරමි.

ස්තූතිය,




ටී.ජී. ජයසිංහ
**සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ**

# අපගේ මෙහෙයුම් පරිසරය

## ලෝක ආර්ථිකය

නැගී එන වෙළඳපල වල සහ සංවර්ධනය වන ආර්ථිකයන්ගේ වර්ධන අනුපාතයන් පහළ යාම හා දියුණු ආර්ථිකයන්ගේ මධ්‍යම වර්ධනයක් පෙන්වන බැවින් 2015 වර්ෂයේ ගෝලීය ආර්ථිකය පහළ ගොස් ඇත. 2015 වර්ෂයේදී ලෝක නිෂ්පාදනය 3.1% න් වැඩි වූ අතර එය 2014 දී 3.4% න් වැඩි විය. සංවර්ධනය වන ආසියාවේ වර්ධන අනුපාතය 6.6% සහ දියුණු ආර්ථිකයන්ගේ වර්ධන අනුපාතය 1.9% ක් සහ විය. ඉන් චීනය සහ ඉන්දියාව පිළිවෙලින් 6.9% ක සහ 7.3% ක වර්ධන වේගයක් ලඟාකර ගන්නා ලදී. තෙල් මිලෙහි අඛණ්ඩ පහළයාම හේතුවෙන් බොහොමයක් රටවල උද්ධමනය පහළ මට්ටමක පැවතිණි. කෙසේ වෙතත්, තෙල් අපනයන රටවල ආර්ථිකයන්ගේ හැකිලීමක් පෙන්නුම් කරන ලදි. 2016 වර්ෂයේදී, ගෝලීය ආර්ථිකයේ 3.2% ක වර්ධනයක් සහ 2017 දී ගෝලීය ආර්ථිකයේ 3.5% ක වර්ධනයක් අපේක්ෂා කරන ලදී.


**ලෝක නිෂ්පාදනයේ වර්ධනය**




මූලාශ්‍ර : ලෝක ආර්ථික දෘෂ්ටිය (2016 අප්‍රේල්) ජා.මූ.අ.

2015 වර්ෂයේ දී තෙල් මිල ගණන් 47.2% න් පහළ යන ලදී. (2014 දී එය 7.5% න් පහළ යන ලදී) එසේම, 2016 වර්ෂයේ පළමු කාර්තුවෙන් පසු ගෝලීය මිල ගණන් ඉහළ ගියද 2016 වර්ෂයේදී සමස්ථ මිල ගණන් පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, 2017 වර්ෂයේදී තෙල් මිල ගණන් 17.9% න් ඉහළ යනු ඇතැයි ගණන් බලා ඇත.

**තෙල් මිල ගණන වෙනස් වීම**





මූලාශ්‍ර : මධ්‍ය කාලීන භාණ්ඩ මිල ගණන් සඳහා ආධාරක රේඛාව (2016 අගෝ) IMF

ශ්‍රී ලංකාවේ ආර්ථිකය වෙත 2015 වර්ෂයේ ගෝලීය ආර්ථික පරිසරයේ විචලනයන් අභියෝගාත්මක ලෙස බලපාන ලද අතර 2016 වර්ෂයේදී ද එලෙසම අභියෝග කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අඛණ්ඩ ගෝලීය තෙල් මිල පහළ යාම මඟින් මැද පෙරදිග රටවල වර්ධනය නැවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර එමඟින් සේවකයන්ගෙන් ලැබෙන මුදල් ආදායම සහ තේ අපනයන ආදායම වක්‍ර ලෙස පහත ගොස් විදේශ විනිමය අනුපාතය වෙත පීඩනයක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කරයි. ගෝලීය පොළී අනුපාතය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර එමඟින් විචල්‍ය අනුපාතයන් යටතේ ලබා ගන්නා ලද විදේශ ණය සඳහා ඉහළ පොළී අනුපාතයන් ගෙවීමට ශ්‍රී ලංකාවට සිදු විය හැකිය.

## ශ්‍රී ලංකා ආර්ථිකය


2015 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදනය 4.8% ක වර්ධන අනුපාතයක් ළඟා කරගත් අතර (2014 - 4.9%) ඒ සඳහා කෘෂිකර්මය, සේවා සහ කර්මාන්ත යන උප අංශ තුනම දායක වූ අතර, ඒවායේ වර්ධන අනුපාතය පිළිවෙලින් 5.5%, 5.3% සහ 3% ක් වේ. දළ දේශීය නිෂ්පාදනයේ 7.9% ක් වන කෘෂි අංශය ප්‍රධාන වශයෙන් එළවළු සහ වී නිෂ්පාදනයෙන් ඉහළම වර්ධන වේගයක් ලඟා කර ගන්නා ලද නමුත් ධීවර, රබර් සහ තේ නිෂ්පාදනය අඩුවෙන ලදී. දළ දේශීය නිෂ්පාදනය සඳහා ඉහළම අනුග්‍රාහකත්වය ලබා දෙන සේවා අංශය මූල්‍ය සේවා, ඉඩකඩම්, තොරතුරු, ප්‍රවාහන ක්‍රියාකාරකම් මෙන්ම තොග සහ සිල්ලර වෙළඳ ක්‍රියාකාරකම් වලින් ශක්තිමත් විය. කර්මාන්ත අංශය ප්‍රධාන වශයෙන් අපජලය පිරිසිදු කිරීම, විදුලිබලය සහ නිෂ්පාදන උප අංශ මඟින් 3% ක වර්ධන වේගයක් ලඟා කර ගන්නා ලද අතර ඉදිකිරීම් සහ පතල් මෙන්ම කළුගල් වැනි උප අංශවල සියුම් පහළ යාමක් නිරීක්ෂණය විය.




(අ) ජන හා සංගණන දෙපාර්තමේන්තුවේ 2010 ද.දේ.නි. පදනම් වර්ෂයේ ඇස්තමේන්තු මත දත්ත සකසා ඇත.

මූලාශ්‍ර : ශ්‍රී ලංකා මහ බැංකුව

සේවක මුදල් ලැබීම් සහ ප්‍රාග්ධන ගැළීම් ඇතුළුව ශුද්ධ විදේශ විනිමය ගැළීම් අඩුවීම හේතුවෙන් ඇතිවූ ගෙවීම් හිඟය මඟින් 2015 වර්ෂයේ සමස්ථ හිඟයක් ඇතිවූ නමුත් අඩුවූ තෙල් මිල සහ සංචාරක අංශයේ ධනාත්මක ප්‍රවනතාවය හේතුවෙන් රටේ ආර්ථිකයේ පුළුල් ඉපැයීම් පෙන්නුම් කරන ලදී.




මූලාශ්‍ර : ශ්‍රී ලංකා මහ බැංකුව


ආර්ථික වර්ධනයේ ධනාත්මක සළකුණු ඇති අතර කාලෝචිත ප්‍රතිපත්ති සමඟ මධ්‍ය කාලීනව එය ඉහළ වර්ධන මාවතට ඇතුළු වනු ඇත. රජයේ ආදායම වැඩි කර රජයේ වියදම අඩු කර සහ අපනයන සහ විදේශීය සෘජු ආයෝජන දිරිමත් කරමින් ආර්ථිකය මුහුණපා ඇති ගැටළු සඳහා පිළිතුරු සෙවීමට අපේක්ෂිතය. එසේම, බලශක්ති සහ පොදු උපයෝගීතා සඳහා වෙළඳපල පදනම් කරගත් මිල යාන්ත්‍රණයක් හඳුන්වා දීමට අවශ්‍යව ඇත. 2016 සඳහා ප්‍රක්ෂිප්ත වර්ධන අනුපාතය 5.8% ක් වන අතර මධ්‍ය කාලීනව 7% දක්වා ශක්තිමත් කිරීමට අපේක්ෂිතයි. ජාත්‍යන්තර තෙල් මිල ගණන් අඩුවීම සහ මෝටර් රථ ආනයනය අඩුවීම මෙන්ම විනිමය අනුපාතය නියම කිරීම සඳහා ඉහළ නම්‍යශීලීත්වයක් පැවතීම වැනි හේතු ප්‍රකාර මඟින් 2016 වර්ෂයේ අපනයන වියදම් පහළ යාමක් අපේක්ෂා කළ හැකිය. එහෙත් ඉන්පසු ගෝලීය බොරතෙල් මිල ගණන් වල අපේක්ෂිත මිල ඉහළ යෑම හා ආයෝජන භාණ්ඩ ආනයනය වැඩිවීම සමඟ අපනයන වියදම් වැඩිවනු ඇත.

සංස්ථාවේ කාර්යසාධනය වෙත බලපෑම් කරනු ලබන ඇතැම් ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යතාවන්ගේ හැසිරීම පහත වගුවේ සාරාංශ ගත කර ඇත;

<table>
<tr><th>ආර්ථික දර්ශකය</th><th>සංස්ථාවට ඇති බලපෑම</th></tr>
<tr><td>

**විනිමය අනුපාත**

2015 අගෝස්තු මාසය වන තුරු ශ්‍රී ලංකා රුපියල පුළුල් ලෙස ස්ථාවරව පැවති අතර විනිමය අනුපාතිකය තීරණය කිරීම සඳහා වඩා නම්‍යශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව ගන්නා ලද තීරණය ප්‍රකාර වසර අවසානයේදී සැලකිය යුතු ලෙස රුපියල අවප්‍රමාණය විය. මෙම වසරේ සමස්ථයක් ලෙස රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 9.03% කින් අවප්‍රමාණය විය.





මූලාශ්‍ර : ශ්‍රී ලංකා මහ බැංකුව

</td><td>ගෝලීය බොරතෙල් වෙළඳපලේ මිල අඩුවීමේ වාසිය සංස්ථාවට සම්පූර්ණයෙන් ලබා ගත නොහැකි වූයේ රුපියල අවප්‍රමාණයවීම හේතුවෙනි. ඒ හේතුවෙන් විදේශ විනිමය අනුපාතයේ විචලතා නිසා රු.බිලියන 32.84 ක පාඩුවක් සංස්ථාවට සිදු විය.</td></tr>
<tr><td>

**පොළී අනුපාතිකය**

ලිහිල් කරන ලද මූල්‍ය කොන්දේසි සමඟ 2015 වර්ෂයේදී වෙළඳපල පොළී අනුපාත පහළ මට්ටමක පැවතුනද ඇතැම් අවස්ථාවල ඉහළ යෑම් නිරීක්ෂණය කරන ලදී. පෞද්ගලික අංශයේ ණය ගැනීම් වැඩි කිරීමට හා ආයෝජන දිරිමත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව පොළී අනුපාත අඩු මට්ටමක පවත්වාගෙන තිබුණි.

</td><td>පහළ පොළී අනුපාතය අඩු වියදම් සහිත අරමුදල් මූලාශ්‍ර සොයා යාමට පොළඹවයි. කෙසේ වෙතත්, ලබා ගන්නා ලද ඇ.ඩො. ණය පියවීම සඳහා ක්‍රමවේදයක් සංස්ථාවට නොමැති බැවින් පොළී පිරිවැය වැඩිවී ඇත.</td></tr>
</table>





මූලාශ්‍ර : ශ්‍රී ලංකා මහ බැංකුව

<table>
<tr><th>ආර්ථික දර්ශකය</th><th>සංස්ථාවට ඇති බලපෑම</th></tr>
<tr><td>

**උද්ධමනය**

2015 වර්ෂයේ ආර්ථිකයට වාසිදායී ලෙස පහළ සහ ස්ථාවර උද්ධමනයක් පැවතිණි. 2015 ජුලි සිට සැප්තැම්බර් අතර කාලපරිච්ඡේදය තුළ විවිධ භාණ්ඩවල මිල අඩුවීම හේතුවෙන් උද්ධමනය පහළ මට්ටමක පැවති අතර 2015 වර්ෂය අවසාන වන විට එය ක්‍රමයෙන් වැඩිවී 2.8% ක ශීර්ෂ උද්ධමනයක් නිරූපණය විය.




මූලාශ්‍ර - ශ්‍රී ලංකා මහ බැංකුව

</td><td>තෙල් මිල ගණන් අඩු වීම හේතුවෙන් දේශීය ඔටෝ ඉන්ධන අලෙවි ධාරිතාව වැඩි විය. කෙසේ වෙතත්, අලෙවි මිල අඩුවීම හේතුවෙන් ආදායම පහළයන ලදී.</td></tr>
</table>

## ඛනිජ තෙල් කර්මාන්තය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් ශ්‍රී ලංකාවේ ඉන්ධන සිල්ලර වෙළඳ අංශය මෙහෙයවන අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කර්මාන්තයේ කැපී පෙනෙන භූමිකාව මෙහෙයවයි. පුළුල් පරදුදරන කණ්ඩායමක් සහ අනෙකුත් කර්මාන්ත ගණනක් වෙත මෙම කර්මාන්තයේ හැසිරීම බලපෑමක් ඇති කරයි.

ජාත්‍යන්තර බොර තෙල් මිල ගණන් සමඟ අනුගත වෙමින්, සංස්ථාව විසින් ආනයනය කල සාමාන්‍ය බොරතෙල් මිල 2014 වර්ෂයේ පැවති බැරලයට ඇ.ඩො. 104.53 සිට 2015


වර්ෂයේදී බැරලයට ඇ.ඩො. 54.80 දක්වා අඩු විය. ජාත්‍යන්තර වෙළඳපලේ බොරතෙල් මිල අඩු වීමත් සමඟම එහි ප්‍රතිලාභ මහජනතාව වෙත ලබා දීමේ අරමුණින් 2015 ජනවාරි මාසයේදී ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල ගණන් ද ක්‍රමයෙන් අඩු විය. කෙසේ වෙතත්, 2015 පළමු මාස කීපය තුළ ජාත්‍යන්තර තෙල් මිල ගණන් ඉහළ ගියද දේශීය මිල ගණන් සංශෝධනය නොකරන ලදී. සිල්ලර තෙල් මිල ගණන් අඩුවීම සහ රථ වාහන සංඛ්‍යාව ඉහළ යාම ප්‍රවාහන අංශයේ තෙල් ඉල්ලුම ඉහළ යාමට බලපාන ලද අතර එමඟින් දේශීය පෙට්‍රල් වෙළඳාමේ 20.9% ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදී.

ඇතැම් ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනයන් හී මිල ගණන් සංශෝධන පහත වගුවේ දක්වා ඇත.

| නිෂ්පාදන | 01.01.2014 දිනට | 2014 සැප්තැම්බර් සංශෝධනය කළ | 2014 දෙසැම්බර් සංශෝධනය කළ | 2015 ජනවාරි සංශෝධනය කළ | 2015 ජුලි සංශෝධනය කළ | 2015 නොවැම්බර් සංශෝධනය කළ | 31.12.2015 දිනට |
|---|---|---|---|---|---|---|---|
| **පෙට්‍රල් - 90/ 92** | 162.00 | 157.00 | 150.00 | 117.00 | - | - | 117.00 |
| **පෙට්‍රල් - 95** | 170.00 | 165.00 | 158.00 | 128.00 | - | - | 128.00 |
| **ඔටෝ ඩීසල්** | 121.00 | 118.00 | 111.00 | 95.00 | - | - | 95.00 |
| **සුපර් ඩීසල්** | 145.00 | 140.00 | 133.00 | 110.00 | - | - | 110.00 |
| **භූමිතෙල් (ගෘහස්ථ)** | 106.00 | 86.00 | 81.00 | 59.00 | - | 49.00 | 49.00 |
| **දැවිතෙල් - 800** | 92.20 | - | - | 82.20 | 80.00 | - | 80.00 |
| **දැවිතෙල් - 1500** | 90.00 | - | - | 80.00 | - | - | 80.00 |
| **දැවිතෙල් - 3500** | 90.00 | - | - | 80.00 | - | - | 80.00 |

ඛනිජ තෙල් කර්මාන්තයේ කාර්ය සාධනය තීරණය කරනු ලබන ප්‍රධාන සාධකය වනුයේ තෙල් මිලයි. එබැවින්, මෙම කර්මාන්තයේ මූල්‍ය ස්ථාවරත්වය සහතික කරනු වස් පාරදෘෂ්‍ය තෙල් මිල යාන්ත්‍රණයක් පැවතීමේ හදිසි අවශ්‍යතාවය පවතී. එසේම, පිරිපහදුවේ අතුරු නිෂ්පාදන වන දැවිතෙල් සහ නැප්තා වැනි අතුරු නිෂ්පාදන භාවිතා කළ හැකි විකල්ප ක්‍රම සොයා ගත යුතුය. ස්වාභාවික වායු සංවර්ධනය කිරීම සහ නිෂ්පාදනය සැලසුම් කිරීම සඳහා රජය විසින් ඛනිජ තෙල් කැනීමේ කටයුතු නැවත ආරම්භ කරන ලදී. වායු වානිජකරණ ක්‍රියාවලිය සාර්ථක නම්, ගෘහස්ථ වායු භාවිතා කිරීම සහ ආසවන ආනයනය අඩු කිරීමට අපේක්ෂා කෙරේ.

# අපගේ අගය එකතු කිරීම සහ බලපෑම




## ආයෝජකයන් වෙත අගය නිර්මාණය කිරීම


### සංස්ථාවේ කාර්ය සාධනය

ගෝලීය සහ දේශීය උග්‍ර ආර්ථික සහ සමාජීය තත්වය හේතුවෙන් 2015 වර්ෂය සංස්ථාවට අසීරු වර්ෂයක් විය. ආදායම අතින් රජය සතු ව්‍යාපාර ආයතන වලින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පළමු තැනට පත්විය. නමුත්, 2015 වර්ෂයේ වැඩිම පාඩු ලබන රාජ්‍ය ආයතනය බවට සංස්ථාව පත්විය. සංස්ථාවේ දළ ලාභාන්තිකය ලෝක වෙළඳපලේ බොරතෙල් මිල ගණන් අඩුවීමත් සමඟ වැඩි වූ අතර, ඇ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අඛණ්ඩව අවප්‍රමාණය වීම, මූල්‍ය වියදම් වැඩිවීම සහ තීරු බදු වැඩිවීම හේතුවෙන් සංස්ථාවේ මෙහෙයුම් සහ මූල්‍ය ප්‍රතිඵල හීනවිය.


2015 වර්ෂයේදී, සංස්ථාව විසින් රු. බිලියන 376.73 ආදායමක් සහ රු. බිලියන 39.62 ක දළ ලාභයක් උපයන ලදී. ආදායම 28% න් පහළ ගියද, ලෝක වෙළඳපලේ බොරතෙල් මිල ගණන් පහතයාම පිළිබිඹු කරමින් අලෙවි පිරිවැය අඩුවීම හේතුවෙන් දළ ලාභය රු. බිලියන 39.62 ක් ලෙස 57% න් වැඩි විය. පෙර වර්ෂයේ රු. බිලියන 12.3 සමඟ සැසඳීමේදී, මෙහෙයුම් ලාභය රු. බිලියන 27.42 ක් ලෙස දෙගුණයටත් වඩා වැඩි විය. 2009 වර්ෂයෙන් පසු, රු. බිලියන 9.42 ක් වන මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ධනාත්මක මුදල් ප්‍රවාහයක් සංස්ථාව විසින් මෙම වසරේ උත්පාදනය කරන ලදී. කෙසේ වෙතත්, “ලාභදායීත්වය” යන කොටස යටතේ විස්තර කර ඇති පරිදි රු. බිලියන 21.74 ක අලාභයක් සංස්ථාව විසින් දරන ලදී.


### ආදායම

දේශීය අලෙවිය, අපනයනය සහ නැව්තෙල් ව්‍යාපාරය හරහා ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය මඟින් ආදායම් උපයන අතර දේශීය අලෙවිය ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වේ.




සිල්ලර වෙළඳ මිල ගණන් අඩුවීම හේතුවෙන් රු. බිලියන 148කින් මෙම වර්ෂය තුළදී උපයන ලද ආදායම අඩු විය. ශුද්ධ ආදායම අඩුවීමට අලෙවි බදු වැඩිවීම හා ඩීසල් සහ දැව්තෙල් සඳහා වන ප්‍රමාණාත්මක ඉල්ලුමද අඩුවීම හේතු විය. රු. බිලියන 174.98 ක් වන ඉහළම ආදායම ඔටෝ ඩීසල් මඟින් උපයා ගන්නා නමුත් එය පෙර වර්ෂයට වඩා 28.4% ක අඩු වීමකි. ඉල්ලුම් කරන ලද ප්‍රමාණය ද 10.14% කින් 2014 ට වඩා අඩු වී ඇත.








සම්පූර්ණ ආදායමේ අඩුවීමක් පෙන්නුම් කලද පෙට්‍රල් 95 ඔක්ටේන්, සුපර් ඩීසල්, දැව්තෙල් 800, නැප්තා සහ දැව්තෙල් 1500 සෘජු අපනයන්හි අලෙවි ධාරිතාවය සහ අලෙවි අගය වැඩිවිය. පෙට්‍රල් 92 ඔක්ටේන්, භූමිතෙල්, නැප්තා, කෘෂි රසායන 2015 වර්ෂයේදී අලෙවි කරන ලද ප්‍රමාණය 2014 වර්ෂයේ අලෙවි කරන ලද ප්‍රමාණයට වඩා වැඩි වුවද, ඒවායේ අලෙවි අගය පෙර වර්ෂයේ අලෙවි අගයට වඩා අඩුය. නවීන මෝටර් රථ භාවිතය වැඩිවීම හේතුවෙන් පෙට්‍රල් සහ සුපර් ඩීසල් සඳහා වන ඉල්ලුම වැඩිවිය. ඔටෝ ඩීසල් භාවිතා කළ ඇතැම් ගණුදෙනුකරුවන් සුපර් ඩීසල් භාවිතා කිරීමට පෙළඹී ඇති බවක් දක්නට ඇත්තේ එය ගෙන්දගම් අඩු, පරිසර හිතකාමී ඉන්ධනයක් වන බැවිනි. මෙම වර්ෂයේදී, ලංකා සුපර් ඩීසල් සඳහා වන ඉල්ලුම 51.35% න් වැඩි වු අතර එහි ආදායම රු. මිලියන 894.16 න් වැඩිවිය.

## වෙනත් ආදායම්

වෙනත් මෙහෙයුම් ආදායම් තුල ප්‍රධාන වශයෙන් සේවක ණය පොලිය, කුළී ආදායම, පිරවුම්හල් උපකරණ අලෙවි කිරීමෙන් ලද ලාභය සහ ලාභාංශ ආදායම ඇතුලත් වේ. මෙහෙයුම් ආදායම රු. මිලියන 414 න් අඩු වීමට ප්‍රධාන හේතුව ලාභාංශ ආදායමේ අඩු වීමයි. 2014 වර්ෂයේදී සංස්ථාව විසින් රු. මිලියන 437 ක ලාභාංශ ආදායමක් ලැබූ අතර 2015 වර්ෂයේදී ලැබූ ලාභාංශ ආදායම රු.4,000 ක් පමණි.

## විනිමය අනුපාතය උච්ඡාවචනය වීම




රු.බිලියන 32.84 ක් වූ විනිමය අනුපාතය උච්ඡාවචනය වීමේ අලාභයෙන් සංස්ථාවේ ලාභදායීත්වය ක්‍රමයෙන් අඩුවිය. මෙම පිරිවැය සඳහා දළ ලාභයෙන් 83% ක් යොදවන ලද අතර එය මෙහෙයුම් ලාභයෙන් 120% ක් විය. පෙර වර්ෂයේ, විනිමය අනුපාතය වෙනස්වීම රු. බිලියන 0.97 ක් පමණි.

## මූල්‍ය ආදායම


2015 වර්ෂයේදී මූල්‍ය ආදායම රු.මිලියන 880.29 න් ඉහළ යන ලදී. ස්ථිර තැන්පතු ඒක්ෂණ තැන්පතු සහ රජයේ සුරැකුම්පත් මඟින් ලද පොළී ආදායම වැඩි වී ඇත්තේ එම මූල්‍ය මෙවලම්හී සිදුකරන ලද ආයෝජන වැඩි වීමෙන් සහ පොළී අනුපාතයන් සියුම් වැඩිවීමෙනි. හිඟ වෙළඳ ණය මඟින් ලද පොළිය, වෙළඳ ණය ප්‍රමාණය අඩුවීමට සමගාමීව අඩුවෙන ලදී.

## මූල්‍ය වියදම්

රු. බිලියන 15.05 දක්වා මූල්‍ය පිරිවැය වැඩිවීමක් වාර්තා වූ අතර ඒ සඳහා මෙහෙයුම් ලාභයෙන් 55% ක් භාවිතා කරන ලදී. මෙම වියදම් අඩුකර ගැනීමට සංස්ථාව වෙහෙසවන අතර ඵලදායී අරමුදල් කළමනාකරණය හේතුවෙන් සංස්ථාව විසින් බැංකු අයිරා සඳහා කිසිඳු පොළියක් නොගෙවන ලදී. ණය අඩු වීමත් සමඟ දීර්ඝ කාලීන ණය සඳහා වන පොළිය සහ අනෙකුත් මූල්‍ය පිරිවැය රු. මිලියන 16.85 න් අඩු විය. ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් මෙම ජයග්‍ර හනය විදේශ මුදලින් ලබා ගත් බැංකු ණය සඳහා පොළී පිරිවැය වූ රු.මිලියන 1.818 මඟින් ක්‍ෂය විය. රජයෙන් ලැබිය යුතු සහන සංරචකය ලබා ඇමරිකානු ඩොලර් ණය ගෙවා දැමීමට ක්‍රියාකාරී යාන්ත්‍රණයක් පැවතියේ නම් සංස්ථාව ලාභදායී ආයතනයක් වනු ඇත.


## ලාභදායීත්වය


දළ ලාභාන්තිකය 5% සිට 11% දක්වා වැඩි වූ අතර මෙහෙයුම් ලාභාන්තිකය 2% සිට 7% දක්වා වැඩිවිය.





ලෝක වෙළඳපලේ බොරතෙල් මිල ගණන් පහළ යාමත් සමඟ අලෙවි පිරිවැය 32.57% න් අඩු වු අතර සංස්ථාව විසින් අලෙවි පිරිවැයේ මෙහෙයුම් අලාභය 20.13% න් අඩු කිරීමට සංස්ථාවට හැකි විය.

සමාලෝචිත වර්ෂයේදී දළ ලාභය වෙත වන ඉහළම දායකත්වය ප්‍රවාහන අංශයෙන් වු අතර එම අංශයෙන් 15.62% න් ලාභදායීත්වය ඉහළ දමන ලදී. ගුවන්තෙල් අංශයෙන් ලැබූ දළ ලාභය 150% න් වැඩි වු අතර පෙර වර්ෂය සමඟ සැසඳීමේදී විදුලිබල උත්පාදන අංශයේ දළ ලාභය දෙගුණයක් විය. රු. මිලියන 1,309.45 ක් වු පෙර වර්ෂයේ නැව් තෙල් අලාභය රු. මිලියන 515.46 දක්වා අඩු කිරිමට සංස්ථාවට හැකි විය.




සංස්ථාව විසින් රු. බිලියන 27.42 ක මෙහෙයුම් ලාභයක් ලබා ගන්නා ලද අතර, එය පෙර වර්ෂයට වඩා රු. බිලියන 15.12 ක වැඩි වීමකි. දළ ලාභයේ වැඩි වීම හැර මෙහෙයුම් ලාභය වැඩි වීමට පරිපාලන වියදම් අඩු වීම ද බලපා ඇත. එසේම, පෙර වර්ෂයේ සහන සංරචකය ලෙස ලැබූ මුදල් ප්‍රමාණයට වඩා 42% ක වැඩි වීමක් ලෙස රු. බිලියන 3.86 ක භූමිතෙල් සහන සංරචකය ලැබිණි.




2015 වර්ෂයේදී මුළු විස්තීරණ ආදායම රු. බිලියන 21.9 ක අලාභයක් සටහන් කරන ලද අතර එමගින් පෙර වර්ෂයේ උපයන ලද ආන්තික ලාභය ගෙවී යන ලදී. සංස්ථාව විසින් දරන ලද අලාභයට ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපාන ලදී.

- ජාත්‍යන්තර තෙල් මිල වෙනස්වීම සමඟ අනුගතවන පිරිවැය පරාවර්තිත මිල යාන්ත්‍රණයක් නොමැති වීම සහ රජය විසින් තීරණය කරනු ලබන ඉහළ සහන මිල ගණන් යටතේ ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවි වීම 2015 ජනවාරි මාසයේදී ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහළ දමන ලද අතර, 2015 ජනවාරි මාසයේ සිට ජුනි මාසය දක්වා ජාත්‍යන්තර බොර තෙල් මිල ගණන් ක්‍රමයෙන් ඉහළ ගියද ඊට සමගාමීව මිල සංශෝධනය නොවීම. මෙමගින් සංස්ථා දළ ලාභාන්තිකය ක්ෂය වන ලදී. 1971 අංක 38 දරන මූල්‍ය පනතේ 17 වන වගන්තිය ප්‍රකාර, රජයෙන් ලැබිය යුතු සහන රවකයට සංස්ථාව හිමිකම් ලබයි.

- ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් රු. බිලියන 32.84 ක විනිමය අනුපාතය වෙනස්වීමේ අලාභයන් සංස්ථාව දරන ලදී. මෙම වර්ෂයේදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 9.03% න් රුපියල ක්ෂය විය.

- මෙම වර්ෂය තුළදී පෙට්‍රල් ලීටරයට රු. 15 ක් ලෙස පැවති තීරුබදු, ලීටරයට රු.35 ක් ලෙස වැඩිකරන ලදී. එබැවින්, පෙට්‍රල් ආනයනය කිරීමේදී රු. බිලියන 31.21 ක අමතර මුදලක් තීරු බදු ලෙස දැරීමට සංස්ථාවට සිදුවිය.

- ලබා ගන්නා ලද විදේශ මුදල් ණය සඳහා දරන ලද පොළිය රු. බිලියන 14.98 ක් වූ අතර රජයෙන් ලැබිය යුතු සහන සංරවකය භාවිතා කර එම ණය ගෙවා දැමිය හැකි ක්‍රියාකාරී ක්‍රමෝපායක් නොමැතිවීම සංස්ථාව මුහුණපාන විශාලතම ගැටළුවයි. එසේම, ඇමරිකානු ඩොලර් මිලදී ගැනීමට සංස්ථාවට අවසර ඇත්තේ රජයේ බැංකු දෙකින් පමණක් වන අතර අනෙකුත් ලියාපදිංචි වානිජ බැංකු මඟින් තරඟකාරී මිල ගණන් අනුපාත යටතේ ඇමරිකානු ඩොලර් මිලට ගැනීම අවහිර කර ඇත.

- ප්‍රමාණවත් වැසි ලැබීම හේතුවෙන් ජලවිදුලි බලය භාවිතා කිරීම සහ ඉදිකිරීම් ක්‍රියාකාරකම් අඩු වීම හේතුවෙන් දේශීය වෙළඳපලේ දැවිතෙල් සහ නැප්තා සඳහා ඉල්ලුම අඩු විය. අතිරික්ත දැවිතෙල් හා නැප්තා නිෂ්පාදන ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් සංස්ථාව සතුව නොමැතිවීම හේතුවෙන් එම නිෂ්පාදන අඩු මිල ගණන් යටතේ අපනයනය කිරීමට සංස්ථාවට සිදුවිය.

- සංස්ථාව විසින් දරනු ලබන ප්‍රධානතම වියදම් අතරට නැව් ප්‍රමාද ගාස්තු ගෙවීම් සැලකිය හැකිය. ආනයනය කරනු ලබන තොග වරායේ සිට තොග ගබඩා පර්යන්ත වෙත බෑමේදී භාවිතා කරනු ලබන නල මාර්ගය අබලන් වීම හේතුවෙන් අඩු පීඩනයක් යටතේ ගොඩබෑම නිසා ඉන්ධන ගොඩබෑමේ තදබදයක් ඇති වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, භාණ්ඩ තොග ගොඩබෑම සඳහා වන සාමාන්‍ය ප්‍රමිතිගත කාලයට වඩා වැඩි කාලයක් ගත කිරීමෙන් විශාල ප්‍රමාණයෙන් නැව් ප්‍රමාද ගාස්තු ගෙවීමට සංස්ථාවට සිදු වේ.

- මෙහෙයින් ගනුදෙනුවේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට විරුද්ධව පැවති නීතිමය ගැටළුවේ නියෝග පරිදි රු. බිලියන 3.86 ක් ඩොයිෂ් බැංකුවට ගෙවීමට සංස්ථාවට සිදුවිය.

ඉහත කී විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් ක්‍රමෝපායන් කීපයක් භාවිතා කරමින් තම අලාභය අඩු කිරීමට සංස්ථාවට හැකි විය.

- සාකච්ඡා කීපයක් පැවැත්වීමෙන් පසුව ඇමරිකානු ඩොලර් ණය සඳහා වන පොළී අනුපාතය 5.5% සිට 5% දක්වා අඩු කරන ලදී. එමඟින් සංස්ථාවේ පොළී වියදම අඩු විය.

- ලංකා බැංකුව සමඟ සාකච්ඡා කිරීමෙන් පසු බැංකු ප්‍රතිග්‍රහන කොමිස් මුදල් අඩු කරන ලදී. එමඟින් සංස්ථාවේ මූල්‍ය පිරිවැය අඩු විය.

- මුදල් නිකරුණේ තැබීමකින් තොරව භාණ්ඩාගාර කළමනාකරණය ඵලදායී සහ කාර්යක්‍ෂම ලෙස සිදුකරන ලදී. බැංකු අයිරා ලබා නොගැනීමට වග බලා ගනිමින් අතිරේක මුදල් පොළී ලැබෙන මූලාශ්‍ර තුළ ආයෝජනය කරන ලදී. එමඟින් මෙම වර්ෂයේදී සංස්ථාව රු. බිලියන 3.76 ක් උපයා ගන්නා ලද අතර බැංකු අයිරා පොළී නොගෙවන ලදී.

- ආනයන ප්‍රසම්පාදන ක්‍රියාවලිය වඩා පාරදෘෂ්‍ය වූ අතර සැපයුම්කරුවන් බොහොමයකට ලංසු තැබීමට අවස්ථාව උදා විය. ගුණාත්මකභාවයෙන් යුත් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම සඳහා මෙය ධනාත්මක දායකත්වයක් ලබා දුන් අතර එමඟින් ආනයන මිල ගණන් අඩුවිය.

- 2015.04.01 දිනට ක්‍රියාත්මක වන පරිදි, ගුවන්තෙල් මිල ගණන් සඳහා පිරිවැය පරාවර්තිත ක්‍රමවේදයක් භාවිතා කරන ලදී. 2015 වර්ෂයේදී ගුවන්තෙල් අංශයෙන් රු. බිලියන 4.53 ක දළ ලාභයක් ලබා ගන්නා ලදී.

- විදුලිබල උත්පාදන අංශයේ ඉල්ලුම අඩුවුවද, සිල්ලර මිල ගණන් ස්ථාවරව තබා ගැනීමට සංස්ථාවට හැකි විය. මෙම පියවර මඟින්, 2015 වර්ෂය තුළදී විදුලිබල නිෂ්පාදන අංශයෙන් රු. බිලියන 12.97 ක දළ ලාභයක් ලබා ගැනීමට හැකියාව ලැබුණි.

- දැව්තෙල් සඳහා වන ඉල්ලුම අඩු වුවද දැව්තෙල් සිල්ලර මිල ගණන් ලාභ ලබන මට්ටමක පවත්වාගෙන යාමට හැකියාව ලැබිණි.

- අදාළ නාවුක ලේඛණ මුල් පිටපත් නොමැති අවස්ථා වලදී නාවුක ඇපකර/ බැංකු හා හානිරක්ෂණ භාවිතා කරමින් භාණ්ඩ තොග නිෂ්කාශනය කර ගන්නා ලදී.

- බොහොමයක් පද්ධතිමය සංවර්ධන කටයුතු සිදුකරන ලද අතර, ඒවා තවදුරටත් දියුණු කළ යුතුව ඇත. එහිදී ඉන්ධන පරිහරණය කිරීමේ සහ බෙදාහැරීමේ පද්ධතියේ බොහොමයක් අඩුලුහුඩුකම් හඳුනාගෙන නිවැරදි කරන ලදී.

- රු. බිලියන 11.74 ක් වන, ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ලැබිය යුතු වෙළඳ ණය සමඟ සංස්ථාව විසින් ගෙවිය යුතු බදු සහ තීරු බදු කපාහැර ඇත. එසේම, සංස්ථාවට ලැබිය යුතු රු. බිලියන 4.46 ක් වන සහන සංරචකය ගෙවිය යුතු බදු වෙනුවෙන් කපාහැර ඇත.

## සංස්ථාවේ මූල්‍ය තත්වය

සංස්ථාවේ වෙළඳ ණය හා තොග අඩු කරගත් සමාලෝචිත වර්ෂයේදී, ප්‍රාග්ධන නොවන අතර ආයෝජන සහ කෙටිකාලීන ආයෝජන තුළ ආයෝජනය වැඩි කර ගැනීමට හැකි විය. 2015 වර්ෂයේදී, සංස්ථාව බොල් ණය ලෙස කපා හල ණය වලින් රු.මිලියන 1.4 ක් අය කර ගන්නා ලදී. මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර තැන්පතු මඟින් සංස්ථාවේ දායක ප්‍රාග්ධනය රු. බිලියන 25 න් වැඩිවිය. මෙම වර්ෂයේදී, ණය සහ ණය ගැනීම් 47.92% න් විශාල ලෙස පහළයන ලදී.

## වෙළඳ ලැබීම්

වෙළඳ ණය අයකර ගැනීමේ කැපී පෙනෙන වර්ධනයත් සමඟ, වෙළඳ ණය ලැබීම් රු. බිලියන 18.73 ට අඩු වූ අතර, එය 2014 වර්ෂය

අවසාන වන විට පැවති ශේෂයට වඩා 49.21% ක අඩු වීමකි. සමාලෝචිත වර්ෂයේදී, සංස්ථාව වෙත ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වෙළඳ ණය වන රු. බිලියන 11.74 ක් බදු සහ තීරු බදු සමඟ හිලව් කර ගන්නා ලදී. 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකන් ගුවන් සේවයෙන් රු. බිලියන 8.61 ක හිඟ මුදල් ලැබිය යුතුව ඇත. ලංකා විදුලිබල මණ්ඩලය, පෞද්ගලික විදුලිබලාගාර, ත්‍රිවිධ හමුදාව සහ මිහින් ලංකා (පුද්.) සමාගම අනෙකුත් ප්‍රධානතම ණයකරුවන් වන අතර ඔවුන්ගේ ණය ලැබීම් පිළිවෙලින් රු. බිලියන 2.72, රු.බිලියන 1.78, රු.බිලියන 0.65 සහ රු.බිලියන 0.55 කි.

### ණය ගැනීම්

සමාලෝචිත වර්ෂයේදී, ණය ගැනීම් රු. මිලියන 647 න් අඩුවිය. කෙසේ වෙතත්, ප්‍රමාණවත් ඩොලර් නොමැතිවීම හේතුවෙන් විදේශ මුදල් ණය ගෙවීමේ අනුපාතය සතුටුදායක නොවුන අතර මෙමඟින් බිල්පත් නියමිත කාලයට නොගෙවීම හේතුවෙන් විනිමය විචලනයක් ඇති විය. සංස්ථාව පාඩු ලබන තත්වයට පත්කරන ලද එක ප්‍රධාන හේතුවක් මෙය විය.

### රඳවාගත් ඉපැයුම්

2014 වර්ෂයේ ලබන ලද ආන්තික ලාභය හැර 2008 වර්ෂයේ සිට දරන ලද අඛණ්ඩ අලාභ සමඟ රු. බිලියන 262.65 දක්වා රඳවාගත් ඉපැයුම් හිඟය වැඩිවිය. පිරිවැය පරාවර්තිත මිල ව්‍යුහයක් නොමැතිවීම මෙම පාඩු ලැබීමේ තත්වයට ප්‍රධාන හේතුව වන අතර මෙම හිඟය පියවීම සඳහා පොළිය සහිත බැංකු ණය ලබා ගැනීමෙන් සංස්ථාවේ මූල්‍ය තත්වය තවත් ගැටළුකාරී විය.


## තෙල් පිරිපහදු මෙහෙයුම්

තෙල් පිරිපහදු කිරීමේ වසර 46 ක පළපුරුද්ද සහිතව, මෙම වර්ෂයේදී බොරතෙල් මෙට්‍රික් ටොන් 1,692,074 ක් පිරිපහදු කරන ලදී. දැවිතෙල් සහ ගෑස් භාවිත පිරිවැය අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස බොරතෙල් පිරිපහදු කිරීමේ පිරිවැය 25.86% න් අඩු වූ අතර ටොන් එකක සෘජු මෙහෙයුම් පිරිවැය 29% න් අඩු වී ඇත.

ඉරානය වෙත ඇමරිකානු සම්බාධක දැමීමෙන් පසු, මර්බන් සහ ඕමාන් බොරතෙල් වර්ග දෙක මිශ්‍රකර පිරිපහදු කිරීමේ කාර්ය සිදුකරන ලදී. පිරිවිතර මට්ටමට සරිලන පරිදි නිපදවනු ලබන දැවිතෙල් ගලපා අංකය ගැළපීම සඳහා ඕමාන් බ්ලෙන්ඩ් බොරතෙල් වර්ගය භාවිතා කරන ලදී. කෙසේ වෙතත්, ඕමාන් බ්ලෙන්ඩ් බොරතෙල් වර්ගය ලාභදායී නොවූ අතර භාවිතා නොකරන ලද විස්බ්‍රේකර් ඒකකය භාවිතාකර පාලන අංක ගැටළුව මැඩපවත්වා මෙම වර්ෂයේදී මර්බර් නැමති බොරතෙල් වර්ගය භාවිතය ආරම්භ කරන ලදී.

2015 වර්ෂයේ නිෂ්පාදනයෙන්, ඩීසල් ප්‍රධානතම නිෂ්පාදනය වූ අතර දැවිතෙල් 800 සහ 1500 දෙවන හා තෙවන ප්‍රධාන නිෂ්පාදන ලෙස වාර්තා වී ඇත. රසායනික නැප්තා, මෝගැස් 92 සහ 95 ඔක්ටේන්, භූමිතෙල්, ඩීසල්, දැවිතෙල් 800 සහ පිරිපහදු ඉන්ධන නිෂ්පාදන මෙම වර්ෂයේදී පෙර වර්ෂයට වඩා ඉහළ මට්ටමක පැවතිණි.

**ඛනිජ තෙල් නිෂ්පාදන නිෂ්පාදනය - 2015**



| ප්‍රධාන ක්‍රියාවලි ඒකකයන්හි මෙහෙයුම් කාලයේ කාර්යක්ෂමතාව | |
|---|---|
| බොරතෙල් ආසවන ඒකකය | 88.80% |
| නැප්තා යුනිෆයර් ඒකකය | 83.05% |
| ප්ලැට්ෆෝමර් ඒකකය | 84.54% |
| ඩීසල් යුනිෆයර් ඒකකය | 60.64% |
| විස්බ්‍රේකර් ඒකකය | 75.47% |
| එල්.පී.ජී. මෙරොක්ස් ට්‍රීටර් ඒකකය | 83.07% |
| ඩීසල් හයිඩ්‍රොට්‍රීටර් ඒකකය 07 | 74.61% |
| එල්.පී.ජී.ඒකකය | 83.04% |
| භූමිතෙල් මෙරොක්ස් ඒකකය | 48.21% |
| ටර්බෝ ජෙනරේටර් 1 | 64.76% |
| ටර්බෝ ජෙනරේටර් 2 | 83.16% |
| ඩීසල් ජෙනරේටර් 1 | 23.6% |
| ඩීසල් ජෙනරේටර් 2 | 26.47% |
| ජලය ගැනීමේ ස්ථානය | 49.06% |

බොරතෙල් ආසවන ඒකකය කිහිප වාරයකදී හැර, වසර පුරාම ක්‍රියාකාරීව පැවතිණි. බොයිලර් V පැනලයේ ඇණහිටීමක් හේතුවෙන් මෙම වර්ෂයේදී පැය 12.35 ක් පුරා විදුලිබලය ඇණහිටීමක් පැවති අතර 01MP6B පොම්පයේ මුද්‍රාවේ කාන්දුවීමකින් බොරතෙල් පෙරණය ක්‍රියාකිරීම පැය 269.40 ක් පුරා නවතා තබන ලදී. ඉහත සඳහන් හේතුවලට අමතරව මෙම වර්ෂයේදී සිදුකරන ලද ප්ලැට්ෆෝමර් ප්‍රතිජනනය තුළදී මෙහෙයුම් කටයුතු අඩුවීම නිසා පිරිපහදු නිෂ්පාදන පෙර වර්ෂයට වඩා අඩු මට්ටමක පැවතිණි.

යන්ත්‍රාගාරයේ මෙහෙයුම් ඵලදායීතාවය වැඩි කිරීමේ අරමුණින් පිරිපහදු මෙහෙයුම් සෑම වසර තුනකට වරක්ම අළුත්වැඩියා කටයුතු සඳහා නවතා දමයි. මෙම වර්ෂය තුළ, මාර්තු 04 සිට අප්‍රේල් 10 දක්වා යන්ත්‍රාගාරය අළුත්වැඩියා කිරීමට එහි ක්‍රියාකාරිත්වය නවතා දමන ලදී. මෙමගින් පද්ධතිය ඇණහිටීම අඩුකර ඵලදායීතාවය නංවනු ලබයි.

මෙම තත්වයන් මධ්‍යයේ, පිරිපහදුව දින 324.12 ක් පුරා ක්‍රියාත්මක වූ අතර, එක් ක්‍රියාකාරී දිනකට සාමාන්‍යයෙන් ටොන් 5,221 ක ඇතුල් කර ගන්නා ලදී. පෙර වර්ෂයේ වාර්තා වූ 0.65% ක සමුද්‍ර හානිය සමඟ සැසඳීමේදී මෙම වර්ෂයේ සමුද්‍ර හානිය 0.38% ක් වූ අතර ඒ සඳහා හුවමාරු කිරීමේ හානිය අවම වීම හේතුවිය. කෙසේ වෙතත්, වෙරළාන්තික ටැංකි මඟින් ඇතිවූ අලාභය වැඩිවීමට මෙය හේතු විය.

## මෙම වර්ෂය තුළ සිදුකරන ලද ව්‍යාපෘති

අධික මූල්‍ය අලාභ සිදු විය හැකි හෝ රටේ බලශක්ති ආරක්ෂණයට තර්ජනයක් විය හැකි හෝ සංස්ථාවේ හෝ රටේ ප්‍රතිරූපයට හානි විය හැකි හෝ ඇණහිටීම් හෝ අවහිරවීම් ඇතිවීම වැලැක්වීම සඳහා කඩිනම් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර කීපයක් සංස්ථාව හඳුනාගෙන ඇත. ජාතියට වඩාත් දියුණු සේවයක් ලබා දීමේ සැලසුම සහිතව කෙරෙමින් පවතින ප්‍රාග්ධන ව්‍යාපෘති රු. මිලියන 235 න් වැඩිවිය. මෙම වර්ෂයේදී වැදගත් ව්‍යාපෘති කීපයක්ම සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදී. එසේම සුළු සහ ප්‍රාග්ධන ප්‍රසම්පාදන සම්පූර්ණ කිරීමට සංස්ථාවට හැකියාව ලැබිණි.

මෙම වර්ෂයේදී අවසන් කරන ලද ප්‍රධාන ව්‍යාපෘති පහත දක්වා ඇත;


- ස්වයංක්‍රීය බෝතල් පිරවීමේ යන්ත්‍රය, බෑග් සීල් තැබීමේ යන්ත්‍රය සහ කාණ්ඩ අංක මුද්‍රණය කිරීමේ යන්ත්‍රය ISO ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන යටතේ හඳුන්වා දෙන ලදී.
- සපුගස්කන්ද බෙදාහැරීම් පර්යන්තය වෙත පෙට්‍රල් බෙදාහැරීමේ පහසුකම එකතු කරන ලදී.
- මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ මුතුරාජවෙල ලිහිසිතෙල් ගබඩා ජාලගතකරණ ව්‍යාපෘතිය අවසන් කරන ලදී.
- පිරිපහදුව, සියළුම ප්‍රාදේශීය කාර්යාල, මුතුරාජවෙල සහ රත්මලාන ගුවන්තෙල් කාර්යාංශ සඳහා ජෛවීය මීටර් ක්‍රමය පදනම් කරගත් පැමිණීමේ පද්ධතිය සම්පූර්ණ කරන ලදී.

- මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ගුවන්තොටුපළ ඒප්‍රන ඉන්ධන ජලෝද්ගමන පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
- බොරතෙල් එස්.පී.එම්. නැවත සකස් කිරීම.
- කොළඹ වරායේ ඩොල්ෆින් ටැංකි අංගනය නඩත්තු කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ, මුතුරාජවෙල ලිහිසිතෙල් ගබඩා සංකීර්ණයේ සහ ඩුම් අංගනයේ ගබඩා ඉදිකිරීම.

| *2015 දෙසැම්බර් 31 දිනට පැවති පිරවුම්හල් සංඛ්‍යාව* | |
|---|---|
| සංස්ථාව සතු බෙදුම්කරු පාලිත | ***248*** |
| බෙදුම්කරු සතු බෙදුම්කරු පාලිත | ***911*** |
| බෙදුම්කරු පාලනය කරන | ***44*** |
| **එකතුව** | ***1,203*** |
| 2015 වර්ෂයේ ආරම්භ කරන ලද නව පිරවුම්හල් | ***35*** |

## ආංශික විශ්ලේෂණය

**2015 අලෙවි සංකලනය**





2015 වර්ෂයේදී ප්‍රවාහන, ගෘහස්ථ, කෘෂි සහ අපනයන අංශ හැර අනෙකුත් සෑම අංශයක්ම ලාභ ලබන ලදී.

### ආංශික අලාභයේ විස්තර

| *අංශය* | *2015 රු.මිලියන* |
|---|---|
| ප්‍රවාහනය - සහන මිල යටතේ පෙට්‍රල් සැපයීම | *22,935* |
| ගෘහස්ථ - සහන මිල යටතේ භූමිතෙල් සැපයීම | *3,840* |
| කෘෂි රසායන - සහන මිල ගණන් පැවතීම | *79* |
| අපනයන - නැප්තා සහ දැවිතෙල් පිරිවැයට වඩා අඩුවෙන් මිල තීරණය කරන ලදී. | *6,173* |

### ප්‍රවාහනය

**ප්‍රවාහන අංශයෙන් ලද ශුද්ධ ලාභය/ (අලාභය)**





සංස්ථාවේ විශාලතම අංශය, ප්‍රවාහන අංශය වන අතර මෙම වර්ෂයේදී එම අංශය රු.

බිලියන 263.45 ක සමස්ථ ආදායමක් සහ රු. බිලියන 24.96 ක දළ ලාභයක් උපයන ලදී. එය දළ ලාභය වෙත වන ඉහළම දායකත්වයයි. 2015 ජනවාරි මාසයේ ප්‍රවාහන අංශයේ නිවේදනය කල ගෘහස්ථ ඉන්ධන මිල අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස සමස්ථ ඉන්ධන පරිභෝජනය 9% න් ඉහළ යන ලදී. පෙර වර්ෂය සමඟ සැසඳීමේදී පෙට්‍රල් 95 ඔක්ටේන් පරිභෝජනය 50% ක වර්ධනයක් වාර්තා කරන ලදී. මෙම වෙනසට හේතු වූ ප්‍රධාන සාධකය වන්නේ සැප පහසු වාහන ආනයනය සහ විෂදුම් රහිත ඉන්ධන භාවිතයයි.


විනිමය අනුපාත විචලන අලාභය සමඟ රු. බිලියන 22.94 ක ශුද්ධ අලාභයක් ලෙස ප්‍රවාහන අංශයේ දළ ලාභය පරිවර්තනය වී ඇත. ලීටරයට රු. 20/- බැඟින් තීරු බදු වැඩි කිරීම මඟින් එම අංශයේ ලාභදායීත්වය තවත් අඩු විය.

## විදුලිබලය




ආදායමට සහ දළ ලාභයට දෙවන විශාල දායකත්ය ලබා දෙන විදුලිබල අංශය, රු. බිලියන 42.59 ක ආදායමක් සහ රු. බිලියන 12.97 ක දළ ලාභයක් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, 2014 වර්ෂයේ පරිභෝජන රටාව සමඟ සැසඳීමේදී විදුලිබලය නිෂ්පාදනය කිරීම සඳහා ජලවිදුලිය සහ ගල් අඟුරු භාවිතය හේතුවෙන් විදුලිබල නිෂ්පාදනය සඳහා භාවිතා කරන ඉන්ධන සඳහා වන ඉල්ලුම අඩු විය. විදුලිබල උත්පාදනය සඳහා භාවිතා කරන ඩීසල් සහ දැවිතෙල් පරිභෝජනය අඩුවිය. ඉල්ලුමේ අඩුවීම නොසලකා සංස්ථාව සිල්ලර මිල ගණන් නොවෙනස්ව පවත්වාගෙන යන ලදී. මෙම අංශයේ ලාභදායීත්වය ඉහළ දැමීමට එය දායක විය. එසේ වුවත් වියදම් ආවරණය කිරීම සඳහා අලෙවි මිල ගණන් ප්‍රමාණවත් නොවන බැවින් දැවිතෙල් 1500' රු. මිලියන 252 ක අලාභයක් දරන ලදී.

## ගුවන්තෙල් අංශය





ගුවන්තෙල් අංශයෙන් ලැබුණු ආදායම රු. බිලියන 34.73 ක් වන අතර රු. බිලියන 4.53 ක දළ ලාභයක් ළඟා කර ගැනීමට හැකි විය. මෙම අංශයේ ලාභ ලැබීමට හේතු වූ ප්‍රධානතම සාධකය වන්නේ 2015.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි භාවිතා කරන ලද පිරිවැය පරාවර්තිත මිල ක්‍රමයයි. මෙම වර්ෂයේදී රු. බිලියන 1.01 ක ලාභයක් ලඟාකර ගැනීමට හැකි වූ අතර එය ඉදිරි වර්ෂ වලදී වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගුවන්තෙල් ගබඩා සංකීර්ණය සමඟ ගුවන්තෙල් ජලෝද්ගමන පද්ධතිය ක්‍රියාත්මක කරන ලදී. ජෙට් ඉන්ධනවල ගුණාත්මකභාවය ගුවන් යානයේ ආරක්ෂාවට ඉතාමත් වැදගත් හෙයින් සංස්ථාව විසින් “ජොයින්ට් ඉන්ස්පෙක්ෂන් ගෲප්” මඟින් නිකුත් කර ඇති ජාත්‍යන්තර ප්‍රමිතීන් සංස්ථාව විසින් අනුගමනය කරයි. එම ආයතනය මඟින් තත්ව සහතික අවශ්‍යතා වෙත අනුගත වීම සහතික කිරීමට වාර්ෂික විගණනයන් සිදුකරනු ලබයි. වසර 27 ක ශ්‍රී ලංකා ගුවන්තෙල් ඉතිහාසයේ පළමු වරට 2014 සහ 2015 වර්ෂ වලදී කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පිහිටි ගුවන්තෙල් නැවත පිරවීම් පර්යන්තයේදී සිදුකරන ලද විගණන වලදී “හොඳයි” (සාමාන්‍ය මට්ටමට ඉහළ) තත්වය ළඟා කර ගැනීමට සංස්ථාවට හැකි විය. ජේ.අයි.ජී. විගණනයේදී මත්තල ගුවන්තෙල් ඉන්ධන නැවත පිරවීමේ පර්යන්තයේ “හොඳයි” (සාමාන්‍ය මට්ටමට ඉහළ) සහ රත්මලාන ගුවන්තොටුපලේ “සතුටුදායකයි” (සාමාන්‍ය) මට්ටමේ වර්ගීකරණය ලබා ගන්නා ලදී. කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ඉන්ධන ජලෝද්ගමන පද්ධතිය සහ පර්යන්ත අළුත්වැඩියාකොට වැඩ නිමකිරීමෙන් අනතුරුව “විශිෂ්ය” මට්ටමට ළඟා වීමට සංස්ථාව අපේක්ෂා කරයි.

## කර්මාන්ත

**කර්මාන්ත අංශයේ ශුද්ධ ලාභය**




මෙම වර්ෂයේදී කර්මාන්ත අංශය රු. මිලියන 11.76 ක ආදායමක් සහ රු. මිලියන 3.59 ක දළ ලාභයක් උපයන ලදී. දැවිතෙල් කර්මාන්ත අංශයේ ප්‍රධානතම නිෂ්පාදනයක් වූ අතර 2015 වර්ෂයේ ලීටර් මිලියන 133 ක් අලෙවි කරන ලදී. කෙසේ වෙතත්, පසුගිය වර්ෂයේදී අලෙවි කරනු ලැබූ ප්‍රමාණයෙන් 6% ක අඩු වීමක් මෙම වසරේ පෙන්නුම් කරයි. කර්මාන්ත අංශයෙන් ලබා ගන්නා ලද ශුද්ධ ලාභය රු. බිලියන 1.79 ක් වූ අතර, එය දැවිතෙල් 1500 අලෙවියෙන් ලද රු. මිලියන 262 ක අලාභයෙන් පසු ලාභයයි.

## තාර

තාර වලින් ලද අලෙවි ආදායම රු. බිලියන 1.17 ක් වන අතර 2015 වර්ෂයේදී රු. බිලියන 0.29 ක දළ අලාභයක් දරන ලදී. රටේ ඉදිකිරීම් කල්යාමත් සමඟ තාර අලෙවිය පහළ යන ලදී. තාර අලෙවිය පහත යාම හැරුණු කොට, තාර ව්‍යාපාරයේ ලාභදායීත්වය වැඩිකිරීම සඳහා ඉහළ තොග රඳවා ගැනීමේ පිරිවැය ද සැලකිල්ලට ගතයුතු කාරණයක් වී ඇත.

## ලිහිසිතෙල්


ලිහිසිතෙල් අංශයෙන් ලැබූ ආදායම රු. බිලියන 2 ක් වූ අතර රු. මිලියන 187 ක දළ ලාභයක් ලබා ගන්නා ලදී. ලිහිසිතෙල් අංශයෙන් ලබා ගන්නා ලද ලාභය පෙර වර්ෂයට වඩා අඩු වූ අතර එය සතුටුදායක නොවුණු අතර ඒ සඳහා බලපාන ලද ප්‍රධානතම හේතුවූයේ ආනයන පිරිවැය ඉතා ඉහළ අගයක් වන අතර දේශීය නිෂ්පාදකයන් බදු ප්‍රතිලාභ ලබා ඔවුන් එම ප්‍රතිලාභය දේශීය පාරිභෝගිකයාට යොමු කරයි. එමනිසා අලෙවි කරන ලද ප්‍රමාණය පෙර වර්ෂයට වඩා 6% න් අඩු වී ඇත.

## දේශීය

දේශීය මෙහෙයුම් මඟින් ලබා ගන්නා ලද ආදායම රු. බිලියන 9.7 කි. නමුත් අලෙවි පිරිවැය රු. බිලියන 11.06 ක් වූ අතර එය රු. බිලියන 1.36 ක දළ අලාභයක් ඇති කරන ලදී. එය 2015 වර්ෂයේදී දළ අලාභයක් ඇති කරන ලද තවත් අංශයකි. මෙම අලාභයට හේතුවන ප්‍රධාන සාධකය වූයේ එල්.පී.ජී. සහ භූමිතෙල් සහන මිල ගණන් යටතේ සැපයීමයි. 2014 වර්ෂයට සාපේක්ෂව අලෙවි කරන ලද දේශීය භූමිතෙල් ප්‍රමාණය 12% න් වැඩි වූවද, පවත්නා

සිල්ලර මිල ගණන් සමඟ උපයා ගන්නා ලද ආදායම 33% න් අඩු විය. එල්.පී.ජී. අලෙවි කරනු ලැබූ ප්‍රමාණය සහ උපයා ගන්නා ලද ආදායම 2014 වර්ෂයට වඩා අඩු විය.


**දේශීය අංශයෙන් ලැබූ ශුද්ධ ලාභය/ (අලාභය)**





## කෘෂි රසායන

කෘෂි රසායන අංශයේ වෙළඳපල ඉල්ලුම සැපරීම සඳහා සාධාරණ මිල ගණන් යටතේ කෘෂි රසායන සැපයීම අඛණ්ඩව සිදු කිරීමට සංස්ථාව කටයුතු කරන ලදී; එමඟින් රටේ කෘෂි නිෂ්පාදන අඩු නිෂ්පාදන පිරිවැයක් යටතේ සිදු කිරීම දිරිමත් කර ඇත. සංස්ථාව කෘෂි රසායන නිෂ්පාදන 12 ක් විකුණන ලදි. කෙසේ වෙතත්, ඉතාමත් ජනප්‍රියව පැවති ග්ලයිෆොසෙට් නිෂ්පාදනය ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීමට රජය තීරණය කරන ලද අතර, වගකිවයුතු සංස්ථායික පුරවැසියකු ලෙස සංස්ථාව ද එහි අලෙවිය නවතා දමන ලදී. සංස්ථාවේ වාර්ෂික අලෙවි ධාරිතාව සහ අගය වෙත මෙම තත්වය අධික ලෙස බලපාන ලදී. මෙම අභියෝග මධ්‍යයේ, කෘෂි රසායන අලෙවි ධාරිතාව පෙර වර්ෂයට වඩා 82% න් වැඩි විය. නමුත්, රු. මිලියන 79 ක අලාභයක් දැරීමට සංස්ථාවට සිදු විය. වඩා පරිසරහිතකාමී නව පළිබෝධනාශක හඳුන්වා දීමට සංස්ථාව බලාපොරොත්තු වෙයි.

**කෘෂි රසායන අලෙවිය (රුපියල්)**




**කෘෂි රසායන අලෙවිය (තත්වය)**




### නැව්තෙල්

නැව්තෙල් අලෙවියෙන් රු. බිලියන 1.37 ක ආදායමක් ලැබුණු අතර රු. බිලියන 0.5 ක දළ අලාභයක් දරන ලදී. එයට හේතු වූ ප්‍රධාන කරුණු වූයේ ඇව්තෙල් සහ නැප්තා ගබඩා කිරීම සඳහා ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවූයෙන් ඒවා අඩු මිල ගණන් යටතේ අලෙවි කිරීමයි. කෙසේ වෙතත්, 2014 වර්ෂය සමඟ සැසඳීමේදී දළ අලාභය 61% න් අඩු විය.

### අපනයන

මෙම වර්ෂයේදී නැප්තා සහ ඇව්තෙල් අපනයනය කිරීමෙන් සංස්ථාව රු. බිලියන 9.8 ක ආදායමක් ලබා ගන්නා ලදී. කෙසේ වෙතත්, රු. බිලියන 4.77 ක දළ අලාභයක් දරන ලද අතර, අලෙවි පිරිවැය රු. බිලියන 14.59 කි. අධික වර්ෂාපතනය සමඟ නැප්තා සහ ඇව්තෙල් සඳහා විදුලිබල නිෂ්පාදන අංශයේ දේශීය ඉල්ලුම අඩුවීම හේතුවෙන් එම නිෂ්පාදන ගබඩාකර තැබීමේදී ගැටළු මතු විය. අතිරික්ත නිෂ්පාදන ගබඩාකර තැබීම සඳහා සංස්ථාවට ප්‍රමාණවත් පහසුකම් නොමැති හෙයින් එම නිෂ්පාදන පිරිවැයටත් වඩා අඩු මිලකට අපනයනය කිරීමට සිදුවිය.

**අපනයන වලින් ලද ශුද්ධ අලාභ**




## සමාජයට අගය එකතු කිරීම

### ආර්ථිකයට අගය එකතු කිරීම

| *එකතු කරන ලද අගය* | 2015 *රු.මිලි* | 2014 *රු. මිලි* |
|---|---|---|
| ආදායම | 376,734 | 525,182 |
| මූල්‍ය ආදායම | 4,910 | 4,030 |
| භූමිතෙල් සහනය | 3,860 | 2,715 |
| වෙනත් ආදායම් | 375 | 792 |
| | **385,879** | **532,719** |
| බෙදාහරින ලද ආර්ථික අගය | | |
| සැපයුම්කරුවන්ට සහ සේවා සැපයුම්කරුවන්ට ගෙවීම් | 292,307 | 450,011 |
| සේවකයින්ට ගෙවීම් | 4,530 | 3,727 |
| ණයකරුවන්ට ගෙවීම් | 15,049 | 13,980 |
| රජයට ගෙවීම් | 94,961 | 63,349 |
| | **406,847** | **531,067** |
| ක්ෂය වීම් | 935 | 635 |
| අලෙවිය සඳහා පැවති මූල්‍ය වත්කම් වල සංචිත | 7 | - |
| රඳවාගත් ලාභය / (භාවිතා කළ) | (21,896) | 1,017 |


2015 මූල්‍ය වර්ෂයේදී සංස්ථාවේ ආර්ථික දායකත්වය රු. මිලියන 385,879 ක් වූ අතර ණයකරුවන්ට, රජය, සේවකයන් සහ සේවා සපයන්නන් අතර නැවත බෙදාහැරීම ඉහත වගුවේ පෙන්වා ඇත.

## අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ට අගය එකතු කිරීම


මහ භාණ්ඩාගාරය, මහ බැංකුව, බැංකුකරුවන්, බොරතෙල් සැපයුම්කරුවන් නාවික ආයතන, දේශීය සැපයුම්කරුවන්, බෙදුම්කරුවන් වැනි ක්‍රමෝපාය හවුල්කරුවන් සමඟ පවත්වන සම්බන්ධතා පවත්වාගෙන යාමට සහ වැඩිදියුණු කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකාව සතුව ඛනිජතෙල් සම්පත් නොමැති වීමෙන් ඒවා බාහිර මූලාශ්‍ර මඟින් ප්‍රසම්පාදනය කරගත යුතුව ඇත. තොග සමාලෝචන කමිටුවේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් හොඳින් නිර්වචනය කරන ලද ප්‍රසම්පාදන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන අතර එමඟින් කිසිඳු බාධාවකින් තොරව දේශීය වෙළඳපල වෙත ගුණාත්මකභාවයෙන් යුතු, විශ්වාසනීය සහ දැරිය හැකි ආකාරයෙන් නිෂ්පාදන සපයයි. ඉරාන සම්බාධක වලින් පසුව, සංස්ථාව පිරිපහදුව සඳහා මර්බන් බොරතෙල් වර්ගය භාවිතා කරන ලද්දේ එම වර්ගයෙන් අතුරු නිෂ්පාදන අඩුවෙන් නිෂ්පාදන වී මධ්‍යම ප්‍රමාණයේ සහ සැහැල්ලු ආශ්‍රුත ලබා දෙයි. නමුත් තවමත් අතුරු නිෂ්පාදන ලැබීම වැලැක්විය නොහැක.

**බොරතෙල් ආනයන මිශ්‍රණ**




**පිරිපහදු කරන ලද නිෂ්පාදන ආනයන මිශ්‍ර**




පිරිපහදු මෙහෙයුම් ඉතාමත් ක්‍රමවත්ව පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය වන මෙහෙයුම් සහ නඩත්තු ද්‍රව්‍ය පවතින බවට පිරිපහදු ද්‍රව්‍ය දෙපාර්තමේන්තුව සනාථ කරයි. එම වර්ෂයේදී ගුවන් ප්‍රවාහන කුලී හැර විදේශ ප්‍රසම්පාදන මුළු අගය රු.මිලියන 748.23 ක් වූ අතර, දේශීය ප්‍රසම්පාදන රු.මිලියන 259.35 ක් විය.

| *ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීම* | |
|---|---|
| **එල්.පී.ජී. සැපයුම** | |
| ලංකා ලාෆ් ගෑස් ලිමිටඩ් | *3,158 මෙ.ටොන්* |
| ලිට්‍රෝ ගෑස් | *6,498 මෙ.ටොන්* |
| **අධික දැවිතෙල්** | |
| ලං.වි.බ.ම. | *4,573 මෙ.ටොන්* |
| ආසියානු විදුලිබල | *4,036 මෙ.ටොන්* |

අවශ්‍ය වූ විට කන්සල්ටන්ට්ස් මෙසර් යූ.ඕ.පී සමාගමෙන් කාර්මික සහාය ලබා ගන්නා ලදී.

## අපගේ සේවකයන්ට අගය එකතු කිරීම


ඕනෑම ආයතනයක සාර්ථකත්වයට පක්ෂපාතී සහ කැපවුණු සේවකයන් අවශ්‍ය වේ. ජාතියට ඉන්ධන සපයන ප්‍රධානතම තෙල් බෙදාහරින්නා ලෙස සේවක සහයෝගය අත්‍යවශ්‍ය වේ. එසේ හෙයින් සංස්ථා සේවකයන් තම උපරිමයෙන් සංස්ථාවේ අභිවෘද්ධියට කැපවී සිටින අතර සංස්ථාව තම සේවකයන් හොඳින් රැකබලා ගනී.

## කණ්ඩායම් ආකෘතිය


| වයස් කාණ්ඩය | | ඒ ශ්‍රේණිය | | බී ශ්‍රේණිය | | සී ශ්‍රේණිය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ |
| අවු. | **18 – 30** | 6 | 1 | 38 | 2 | 67 | - | 111 | 3 |
| අවු. | **31 – 40** | 42 | 9 | 216 | 78 | 304 | 18 | 562 | 105 |
| අවු. | **41 – 50** | 81 | 29 | 282 | 106 | 355 | 12 | 718 | 147 |
| අවු. | **51 – 60** | 123 | 33 | 368 | 74 | 323 | 12 | 814 | 119 |
| | එකතුව | **252** | **72** | **904** | **260** | **1,049** | **42** | **2,205** | **374** |

| | |
|---|---|
| **සමස්ථ ස්ථිර සේවක මණ්ඩලය** | ***2,579*** |
| කොන්ත්‍රාත් | ***1*** |
| පුහුණු කාර්මික ශිල්පීන් | ***81*** |
| පුහුණුවන්නන් (බාහිර අධ්‍යයන ආයතන) | ***107*** |
| **කාර්ය මණ්ඩල සංඛ්‍යාව** | ***2,768*** |


### වයස අනුව සේවකයින් විශ්ලේෂණය





### ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවකයින්





### ස්ත්‍රී පුරුෂභාවය අනුව නව බඳවා ගැනීම්





### වයස අනුව නව බඳවා ගැනීම්



**ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවක පිරිවැටුම**




**වයස අනුව සේවක පිරිවැටුම**




## ත්‍යාග සහ පිළිගැනීම

මූල්‍ය සහ මූල්‍ය නොවන දිරි දීමනා සමඟ සංස්ථාවේ චේතන ඉතාමත් ආකර්ශනීය වේ. සංස්ථාව සතුව විධිමත් වැටුප් ව්‍යුහයක් පවතින අතර එය ස්ත්‍රී/පුරුෂ භාවය, වයස හෝ ජනවර්ගය අනුව වෙනස් නොවේ. පැමිණීම සමඟ ප්‍රතිලාභ බැඳී පවතින අතර සේවක පැමිණීම පදනම් කර විවිධ දිරි දීමනා ගෙවීම් සිදුකරයි.

පක්ෂපාති සේවකයින් සංස්ථාව බොහෝ සෙයින් අගය කරන අතර ඔවුන්ගේ දායකත්වය සෑම වසරක දීම අගය කරනු ලබයි. දීර්ඝ කාලීන සේවයක් සහිත සේවකයන් වෙනුවෙන් සේවා තිළිණ ලබා දෙන ලද අතර 2015 වර්ෂයේදී ලබා දෙන ලද සේවා තිළිණ පහත පරිදි වේ;

| තිළිණ ලබා දීම | |
|---|---|
| වසර 20 ක සේවා කාලය | *242* |
| වසර 30 ක සේවා කාලය | *54* |
| වසර 35 ක සේවා කාලය | *18* |
| **එකතුව** | *314* |

සංස්ථා සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට හිමිකම් ලබයි. එම අරමුදල් සඳහා පිළිවෙලින් සංස්ථාව 15% ක් සහ 3% ක දායකත්වය ලබා දෙමින් සේවකයන්ගේ විශ්‍රාම දිවිය සහතික කිරීමට පියවර ගනු ලබයි. මීට අමතරව, සේවක පාරිතෝෂිත පනත අනුව සේවය හැරයන සේවකයන් සඳහා පාරිතෝෂිත ගෙවීම ද සිදු කරයි.

## විවිධත්වය සහ සමාන අවස්ථා

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යනු භේදයකින් තොරව තම සේවකයන්ට සළකනු ලබන සේවා යෝජකයෙක් වේ. විවිධ වයස් කාණ්ඩයන්ට අයත් විවිධ ආගම් වල සහ විවිධ ජාතීන්ගෙන් යුත් ස්ත්‍රී පුරුෂ සේවකයන්ගෙන් අපගේ සේවක මණ්ඩලය සමන්විත වේ. සේවකයන් බඳවා ගනු ලබන්නේ දක්ෂතා සහ වෘත්තියට ගැළපෙන සුදුසුකම් ඇත්තේ නම් ය.

## පුහුණුව

සේවකයන් ලබන පළපුරුද්දට අමතරව විවිධ දැනුම එකතු කිරීම මගින් තම සේවක සංවර්ධනය වැඩි කිරීමට සංස්ථාව සැමවිටම ක්‍රියාකරයි. සංස්ථාව විසින් එහි සේවකයන් වෙත අභ්‍යන්තර සහ බාහිර පුහුණුවීම් ලබා දෙන අතර, දේශීයව හා විදේශීයව උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා වන මූල්‍ය අනුග්‍රහය ද ලබා දෙයි. 2015 වර්ෂයේදී ලබා දෙන ලද පුහුණු අවස්ථා පහත වගුවේ දක්වා ඇත.

| පුහුණුවීම් වර්ගය | A ශ්‍රේණිය | B ශ්‍රේණිය | C ශ්‍රේණිය | පුහුණුවන්නන් |
|---|---|---|---|---|
| **විදෙස් පුහුණුවීම්** | | | | |
| සාමාන්‍ය කළමනාකරණය | 17 | - | - | - |
| මෙහෙයුම් සම්බන්ධ පුහුණුවීම් | 34 | - | - | - |
| බලශක්ති ආරක්ෂණය | 3 | - | - | - |
| සෞඛ්‍යය සහ ආරක්ෂණය | 4 | - | - | - |
| ක්‍රීඩා | 8 | | | |
| **දේශීය පුහුණුවීම්** | | | | |
| අයි.එස්.ඕ. පුහුණුවීම් | 5 | 2 | - | - |
| වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂණය | 472 | | | |
| ප්‍රචාරණය සහ ප්‍රස්ථාර නිර්මාණය කිරීම | - | - | 1 | - |
| හැඩගැසීම සඳහා වැඩසටහන් | පුහුණුවන්නන් සහ නව බඳවා ගැනීම් | | | |
| සංස්ථා ක්‍රියාපටිපාටි, නීති සහ රෙගුලාසි | - | - | 340 | - |
| මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම | 108 | | | |
| දේශීය ආයතන | 146 | | | |
| කම්කරු නීතිය සහ කාර්මික සබඳතා | - | 4 | - | - |
| මෙහෙයුම් සම්බන්ධ පුහුණුවීම් | 33 | 25 | 1 | - |
| සන්නිවේදන සහ නිපුණතා සංවර්ධනය | 13 | 7 | - | - |
| පරිසර ආරක්ෂණ පුහුණුව | 6 | 3 | - | - |
| ගුවන්තෙල් නවමු පුහුණුව | ගුවන්තෙල් මෙහෙයුම් සේවක මණ්ඩලය | - | - | - |
| **ලබා දෙන මූල්‍ය සහාය** | | | | |
| පශ්චාත් උපාධි | 7 | | | - |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 2 | | | - |
| ඩිප්ලෝමා | 8 | | | - |
| සහතිකපත්‍ර මට්ටම | 19 | | | - |

සංස්ථා සේවකයන්ගේ දරුවන් වෙත ශිෂ්‍යත්ව ලබා දීමට සංස්ථාව කටයුතු කරන අතර මෙම වර්ෂයේදී එවැනි ශිෂ්‍යත්ව 23 ක් ලබා දෙන ලදී.

ඵලදායීතාවය සහ ගුණාත්මකභාවයෙන් යුත් සේවයක් සැපයීම සඳහා සමලෝචිත වර්ෂයේදී අයි.එස්.ඕ. ප්‍රමිති ක්‍රියාත්මක කිරීමට සංස්ථාව කටයුතු කරන අතර ඵලදායීතාවය සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම පිළිබඳව විවිධ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

**සෞඛ්‍යය සහ ආරක්ෂණය**

සංස්ථාව විසින් අලෙවි කරනු ලබන නිෂ්පාදනවල පවත්නා ගිනිගන්නා සුළු ස්වභාවය හේතුවෙන් සංස්ථාවේ මෙහෙයුම්වලට ඉහළ මට්ටමේ සෞඛ්‍යය සහ ආරක්ෂණ බලපෑමක් ඇත. එසේම, සංස්ථාව විසින් අනුගමනය කරන විධිමත් සෞඛ්‍යය සහ ආරක්ෂණ ක්‍රියාමාර්ග මඟින් සමාජය ද ආරක්ෂා කරමින් මෙහෙයුම් බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහතික කරයි. එබැවින්, සෑම ආරක්ෂණ පූර්වෝපායක්ම යථාපරිදි ක්‍රියාත්මක කෙරෙන අතර ඒවා නිරන්තරයෙන්ම නිරීක්ෂණය කරනු ලබයි. ආරම්භයේදී ආරක්ෂණ උපකරණ පරීක්ෂාවට ලක් කරන අතර උපකරණ මනා ක්‍රියාකාරීත්වයේ පවතින බව තහවුරු කිරීමට දිනපතා සහ මාසිකව පරීක්ෂා කිරීමට සහ විගණනයන් සිදු කිරීමට කටයුතු කරයි. නිරතුරුව යහපත් කාර්යාලීය පැවැත්ම පිළිබඳව සමීක්ෂණ පවත්වන අතර සෑම කාර්තුවකදීම මෙහෙයුම්, ඉංජිනේරු සහ ආරක්ෂණය

කළමනාකරණ කිරිමේ රැස්වීම් පවත්වයි. 2015 නොවැම්බර් 16 සිට 23 දක්වා "ආරක්ෂණය, සෞඛ්‍යය සහ පාරිසරික සතිය" පවත්වන ලදී. නිරන්තරයෙන් ගිනි නිවීම පිළිබඳව පංති පවත්වන අතර නිෂ්පාදන නිවැරදිව හැසිරවීම, ප්‍රවාහනය සහ ගබඩා කිරීම සහතික කිරීම සහ සමාජයට වියහැකි සෞඛ්‍යය උවදුරු වැලැක්වීම සඳහා මාසික ගිනි පුහුණු පවත්වයි. මෙම වර්ෂයේදී, දේශීය වශයෙන් පවත්වන ලද සෞඛ්‍යය සහ ආරක්ෂණ පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයන් 472 ක් සහභාගී වු අතර ඕස්ට්‍රේලියාවේ පවත්වන ලද ගිනිනිවීම පිළිබඳ පුහුණුවක් සඳහා සේවකයන් 04 ක් සහභාගී විය. ආරක්ෂණ ක්‍රියාමර්ග සඳහා සේවකයන් ඇදගැනීමේ අදහසින්, ඉලක්ක පදනම් කර ගනු ලබන ආරක්ෂණ තිළිණ ලබා දීමේ ක්‍රමයක් දියත් කරන ලද අතර "මාසයේ ශූරයා" වෙත මුදල් ත්‍යාග ලබා දීමට කටයුතු කරනු ලබයි.

| පිරිපහදුවේ සෞඛ්‍යය හා ආරක්ෂණය | 2015 | 2014 |
|---|---|---|
| හදිසි අනතුරු | 1 | *නැත* |
| ප්‍රථමාධාර අනතුරු | 10 | 5 |
| වාර්තා වු සුළු ගිනි | 08 | *නැත* |

## ශුභසාධන ක්‍රියාකාරකම්

ආගමික උත්සවයකින් අනතුරුව සංස්ථාව නව වසරේ මෙහෙයුම් ආරම්භ කරන ලදී.

බණ දේශනා ඇතුළුව විවිධ ආගමික කටයුතු බෞද්ධ සංගමය විසින් සංවිධානය කරනු ලබයි.

සේවකයන් 8 ක් විදේශීය ක්‍රීඩා තරඟ සඳහා සහභාගී වු අතර සංස්ථාව විසින් රු. 280,410 ක් දරන ලදී.

වෛද්‍යාධාර සඳහා ලිපි 478 ක් නිකුත් කරන ලදී.

## කාර්මික සම්බන්ධතා

රටේ සමස්ථ දෛනික මෙහෙයුම් සඳහා අඛණ්ඩ ඉන්ධන සැපයුමක් අවශ්‍ය වේ. එබැවින්, රටේ බලශක්ති ආරක්ෂණය සහතික කිරීම සඳහා කාර්මික සම්බන්ධතා කළමනාකරණය කිරීම සංස්ථාවට මෙන්ම රටේ ආර්ථිකයට ද වැදගත් වේ. මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට, ඵලදායීතාවයට, ව්‍යාපාරික අඛණ්ඩතාවයට සහ ලාභ වැඩි කිරීමට සේවකයන් සහ වෘත්තීය සමිති සමඟ සුහදශීලි කාර්මික සම්බන්ධතාවයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. සංස්ථාවේ වෘත්තීය සමිති 07 ක් කටයුතු කරයි. ගණුදෙනුකරුවන්, රජය, බෙදාහරින්නන් වැනි පරදු දරන කණ්ඩායම් වෙතත් කාර්මික සම්බන්ධතා ව්‍යාප්ත වී ඇති අතර, ඒ මඟින් ගුණාත්මකභාවය සහ ප්‍රමාදයකින් තොරව සේවා සැපයීම තහවුරු වේ. මේ කරුණු සම්බන්ධව මනා අවබෝධයකින් කම්කරු සම්බන්ධතා කළමනාකරණය සඳහා සංස්ථාව ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දෙයි.

## ළමා කම්කරුවන්, බලෙන් ලබා ගන්නා ලද සේවය හෝ අනිවාර්ය සේවය

සංස්ථාවේ සෑම සේවකයෙක්ම වයස අවු. 18 ට වැඩිවන අතර ඕනෑම කම්කරු අයිතීන් උල්ලංඝනය කිරීමක් වෙනුවෙන් සංස්ථා වෘත්තීය සමිති පෙනී සිටිනු ලබයි. සංස්ථාව විසින් කිසිම ආකාරයක ළමා කම්කරු සේවය, බලෙන් ලබා ගන්නා ලද සේවය හෝ අනිවාර්ය සේවය සඳහා පෙළඹවීම් නොකරයි.


## ප්‍රජාවන් වෙත අගය එකතු කිරීම

සමාජයේ ප්‍රජාව අතර විශ්වාසය ගොඩනැගීම සහ සංස්ථා කීර්තිනාමය සහතික කිරීම සඳහා නියාමනයන්ට අනුකූලව කටයුතු කිරීම මූලිකාංගයකි. එමඟින් යහපාලනය සහ දීර්ඝකාලීන පැවැත්ම පෙන්නුම් කරයි.

## රජය වෙත ගෙවීම්

සංස්ථාව රජය වෙත වැඩිම බදු මුදලක් ගෙවනු ලබන ආයතන වලින් එකකි. පසුගිය වසරේදී සංස්ථාව විසින් රු. බිලියන 94.96 ක් බදු වශයෙන් ගෙවන ලද අතර එය සංස්ථා ආදායමෙන් 25.21% කි. 2014 වර්ෂයේදී ගෙවන ලද බදු මුදල රු. බිලියන 63.35 ක් වන අතර එය ආදායමෙන් 12% ක් පමණක් විය.

## රජය වෙත ගෙවීම්




මෙම වර්ෂයේදී සංස්ථාව විසින් රේගු බදු ලෙස රු. බිලියන 44.71 ක් ගෙවන ලද අතර එය පෙර වර්ෂයට වඩා 281.18% ක වැඩි වීමකි. මෙම අධික වැඩි වීමට ප්‍රධානතම හේතු වූයේ පෙට්‍රල් ලීටර්යකට රු. 15 ක් ලෙස පැවති රේගු බදු ලීටරයට රු. 35 ක් ලෙස වැඩි වීමයි. එමඟින් සංස්ථාවේ ලාභාන්තිකය හීනවිය. එසේම, දේශීය නිෂ්පාදන බද්ද රු. බිලියන 35.69 ක් දක්වා 18.13% න් වැඩි විය. සංස්ථාව වෙත පවත්නා බදුබර වැඩි කරමින් රු. බිලියන 10 ක් ඉදිරි වසර 10 තුළ ගෙවීමට යටත්ව විශේෂ ගෙවීමක් ලෙස රජය විසින් ලබා ගන්නා ලදී. එම මුදල රේගු බදු ලෙස ගෙවා දැමීමට සංස්ථාව අදහස් කරයි.

ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමේදී පනවා ඇති වර්තමාන සෘජු බදු සමඟ අලෙවි මිල ගණන් සැසඳීමක් පහත දක්වා ඇත;

ඒ අනුව, පෙට්‍රල් 92 සහ පෙට්‍රල් 95 ආනයනය කිරීම ලාභදායි නොවනුයේ මෙහෙයුම් වියදම් ආවරණය කිරීමට ඉතිරි වනුයේ අලෙවි වටිනාකමින් 44% ක් සහ 48% ක් පමණක් පවතින බැවිනි. මහජනතාව වෙත සහ සංස්ථාවේ පැවැත්ම උදෙසා හා ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා මහජනතාවගේ අවශ්‍යතාවය සලකා බලා ඛනිජ තෙල් නිෂ්පාදන වෙත පනවා ඇති බදු අඩු කිරීමට රජයේ අවධානය යොමු කළ යුතුයි.

### නිෂ්පාදන වගකීම

විවිධ ප්‍රදේශ වලින් අහඹු ලෙස තෝරා ගන්නා ලද පිරවුම්හල් කිහිපයක ආරක්ෂණ විමර්ශනය සහ විගණන සිදුකොට කිසියම් අනතුරුදායක තත්වයන් හෝ අඩුපාඩු හඳුනා ගැනීමට කටයුතු කර ඇත. සමුපකාර පිරවුම්හල් පිළිබඳව දැඩි අවධානය යොමු කරන ලදී. එම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වූයේ ක්‍රියාපටිපාටි උල්ලංඝනය කිරීම්, අනාරක්ෂිත ක්‍රියාමාර්ග, පිරවුම්හල පවත්වාගෙන යාමේ අනතුරුදායක තත්වයන් හඳුනාගැනීමය. ප්‍රාදේශීය කළමනාකරුවන්, ක්ෂේත්‍ර කළමනාකරුවන් සහ සාමාන්‍ය සේවකයන් පුහුණු කිරීමද මෙහි අරමුණ විය. මෙම වැඩසටහන සාර්ථක වූ අතර ගැටළු බොහෝමයක් හඳුනා ගන්නා ලදී. එසේම මෙමඟින් ප්‍රාදේශීය නිලධාරීන්, පිරවුම්හල් අයිතිකරුවන් සහ එහි සේවකයින් අතර ඉහළ මට්ටමේ උද්යෝගයක් ගොඩ නැගුණි.

ලංකා රජය විසින් තහනම් කරන ලද කිසිදු නිෂ්පාදනයක් සංස්ථාව අලෙවි නොකරයි. මෙම වර්ෂයේදී ඉතාමත් ජනප්‍රිය ගල්යිෆොසෙට් නිෂ්පාදනය තහනම් කරන ලද අතර සංස්ථාවද එම නිෂ්පාදනය අලෙවි කිරීම වහාම නවතා දමන ලදී.

| | අලෙවි මිල | නිෂ්පාදන බද්ද | රේගු බද්ද | වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු | ජ.ගො.බ. | එකතුව | අලවිය % |
|---|---|---|---|---|---|---|---|
| **පෙට්‍රල් 92** | 117.00 | 27.00 | 35.00 | 2.97 | 0.87 | **65.84** | **56%** |
| **පෙට්‍රල් 95** | 128.00 | 27.00 | 35.00 | 3.16 | 0.98 | **66.14** | **52%** |
| **ඔටෝ ඩීසල්** | 95.00 | 3.00 | 9.00 | 3.11 | 0.90 | **16.01** | **17%** |
| **සුපර් ඩීසල්** | 110.00 | 3.00 | 9.00 | 3.18 | 1.04 | **16.22** | **15%** |


### නිෂ්පාදන සහ සේවා සලකුණු කිරීම

සෞඛ්‍යය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන නිවැරදි ලෙස ඇසුරුම සහ සලකුණු කිරීම ඉතා වැදගත් වේ. එබැවින්, නිෂ්පාදන සලකුණු කිරීම සමාජ වගකීමක් ලෙස සැලකිය හැකි අතර අදාළ අරමුණ සඳහා නිවැරදි නිෂ්පාදනය භාවිතා කිරීම මෙමඟින් තහවුරු වේ. එසේම, සලකුණු කිරීම සංස්ථා සන්නාමය පිළිබිඹු කරන අතර තරඟකාරී වෙළඳපලේ අලෙවි උපකරණයක් ලෙසද කටයුතු කරයි.

### අධ්‍යාපනයට සහාය දැක්වීම

වගකීම් සහගත සංස්ථායික පුරවැසියකු ලෙස සංස්ථාව සමඟ ගනුදෙනු කරනු ලබන සමාජ කණ්ඩායම්වල ජීවන තත්වයට සහාය ලබා දීමට අඛණ්ඩව කටයුතු කරයි. රටේ එකම බොරතෙල් පිරිපහදු කිරීමේ යන්ත්‍රාගාරය වන සංස්ථා පිරිපහදුවේ පුහුණු වීමට රටේ ශිෂ්‍යන් බොහොමයක් අපේක්ෂා කරන අතර රටේ අනාගත අභිවෘද්ධිය පිණිස එවැනි සිසුන් වෙත පුහුණු අවස්ථා ලබා දීමට අපගේ නිලධාරීන් තම වටිනා කාලය කැප කරයි.

**ශිෂ්‍යයන් වෙත ලබා දෙන ලද පුහුණු**




සංස්ථා මෙහෙයුම් ශ්‍රී ලංකා ආර්ථිකයට ඍජුවම සහ වක්‍රව විශාල වශයෙන් බලපෑමක් එල්ල කරයි. සමස්ථ ජාතික ආර්ථික වර්ධනය සහ ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීමට බලපෑමක් ඇති කළ හැකි අනෙකුත් කර්මාන්තවල ආර්ථික ක්‍රියාකාරකම් ධෛර්යමත් කිරීමේ ක්‍රියාවලිය හරහා වක්‍ර ආර්ථික බලපෑමක් සිදුකරයි. පහත සඳහන් කරුණු මඟින් ආර්ථිකය ධනාත්මක ලෙස වර්ධනය කිරීම සංස්ථාවේ ප්‍රතිපත්තියයි.

- මහජනතාව වෙත සහන මිල ගණන් යටතේ වෙත ඉන්ධන සැපයීම.
- වඩා කාර්යක්ෂම සහ පරිසර හිතකාමී ගුණාත්මකභාවයෙන් යුත් ඛනිජ තෙල් සැපයීම.
- ඛනිජ තෙල් නිෂ්පාදන ලබාගත හැකි ස්ථාන වැඩි කිරිම.
- වක්‍ර සේවා නියුක්තියක් ඇති කිරීම.
- සුපිරි වෙළඳසැල්, ඒ.ටී.එම්. යන්ත්‍ර, වාහන සඳහා සුළං ගැසීම් වැනි අගය එකතු කරන ලද සේවාවන් පිරවුම්හල් තුළ ලබා දීමට කටයුතු කිරීම.
- දිළිඳු ගොවි ජනතාව සුරා කෑම වැලැක්වීම සඳහා අඩු මිල ගණන් යටතේ කෘෂි රසායන ලබා දීම.

### සංවිධාන වල සාමාජිකත්වය

සංස්ථාව විසින් නියාමන ආයතන සහ ස්ථාපිත කාර්මික ආයතන සමඟ සම්බන්ධතාවය සහ සාමාජිකත්වය පවත්වාගෙන යනු ලබයි.

- ශ්‍රී ලංකා මහ බැංකුව
- මුදල් අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා වානිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා රේගුව
- ලංකා සේවා සංවිධානය
- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
- ශ්‍රී ලංකා අලෙවි ආයතනය

## පරිසරය වෙත අගය එකතු කිරීම

### පාරිසරික සම්බන්ධතාවය

සංස්ථාව විසින් පරිසරය පෝෂණය කරමින් ඒ සමඟ කටයුතු කරයි. යහපත් පාරිසරික ක්‍රමවේද භාවිතා කරමින් පරිසරය වෙත පවත්නා වගකීම සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි. පවත්නා සම්පත්

භාවිතා කරමින් පරිසර සංරක්ෂණය කිරීම අරමුණු කර ගෙන සංස්ථා සේවකයන් පුහුණු කිරීමට කැපවී සිටී. සංස්ථාවේ ක්‍රියාකාරකම් සමාජයේ බොහොමයක් ජන ජීවිත වෙත සැලකිය යුතු බලපෑමක් සිදුකරන හෙයින් සංස්ථාව නිරන්තරයෙන් මෙවැනි පියවර ගනී.

### කසළ කළමනාකරණය

කසළ කළමනාකරණය සහ වායුන් නිකුත්වීම පිළිබඳව සංස්ථාව මනා අවධානය යොමු කරයි. මෙම වර්ෂය තුළදී "කාර්මික ඝන අපද්‍රව්‍ය, අප ජලය සහ වායුන් නිකුත් වීම කළමනාකරණය" යන මැයෙන් පැවති පුහුණුවක් සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවෙකු සහභාගී වූ අතර "ජලය, කැලි කසළ සහ අප ජලය පිරිසිදු කිරීමේ යන්ත්‍රාගාරය මෙහෙයවීම සහ නඩත්තු කිරීම" පිළිබඳව විදේශ පුහුණුවක් සඳහා නිලධාරීන් දෙදෙනෙක් සහභාගී විය. එසේ ලබා ගන්නා ලද දැනුම තම සගයන් සමඟ බෙදා හැරීමට සහ සංස්ථාව තුළ එම යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. 2015 වර්ෂයේදී අප ජලය පිරිසිදු කිරීමේ යන්ත්‍රාගාරයක් ඉදිකිරීම ආරම්භ කරන ලද අතර, ජලය ගලා යෑම සඳහා ප්‍රවේශයක් ඉදිකිරීමට සැලසුම් කරයි. ISO ප්‍රමිතකරණ යටතේ, අපවිත්‍ර ජලය සහ අපවිත්‍ර නොවන ජලය වෙන් කිරීමේ අපවිත්‍ර ජල කළමනාකරණ පද්ධතියක් වැඩිදියුණු කරන ලදී.

### ජලය

මෙම වර්ෂයේදී සැලකිය යුතු ප්‍රමාණයක ජලය "ජලය ලබා ගැනීමේ" ඒකකයෙන් ලබා ගන්නා ලද අතර කුඩා ප්‍රමාණයේ ජලය ලබා ගැනීම් ජල සම්පාදන මණ්ඩලයෙන් ලබා ගන්නා ලදී.

### තෙල් අපතේයෑම්

2014 වර්ෂයේදී 0.65% ක පැවති සාගර තෙල් කාන්දුවීම් හේතුවෙන් වන අලාභය 2015 වර්ෂයේදී 0.385% දක්වා පහළ බැස ඇත්තේ හුවමාරුවේදී සිදුවූ අපතේයෑම් අවමවීම හේතුවෙනි. එහෙත් මෙමඟින් වෙරළ ටැංකිවල පවත්නා අපතේයෑම් වැඩිවිය. සංස්ථාව විසින් තෙල් අපතේයෑම් අවම කිරීම සඳහා ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුයි.

### බලශක්තිය

බලශක්තිය නොමැතිව, සංස්ථාවේ මෙහෙයුම් කටයුතු නවතිනු ඇත. සංස්ථාවේ වැඩිම බලශක්ති පරිභෝජනය සිදුවන්නේ පිරිපහදු මෙහෙයුම් සඳහාය. එබැවින්, සෑම වසරකම බලශක්ති පරිභෝජනය පාලනය කිරීම සඳහා අලාභ සහ කාර්යක්ෂමතා සමීක්ෂණයක් පවත්වනු ලබයි.

**පිරිපහදුවේ බලශක්ති පරිභෝජනය**

| | 2015 | 2014 |
|---|---|---|
| ඉන්ධන වායු පරිභෝජනය | 32,029 *මෙ.ටොන්* | 31,325 *මෙ.ටොන්* |
| දැවිතෙල් පරිභෝජනය | 43,633 *මෙ.ටොන්* | 38,904 *මෙ.ටොන්* |
| විශේෂිත බලශක්ති පරිභෝජනය (එම්.එම්.කේ. කැල්/ බොරතෙල් මෙ.ටොන්) | 0.4755 | 0.4195 |

බලශක්ති පරිභෝජනය සංස්ථාවේ පිරිවැය ව්‍යුහයට මෙන්ම පරිසරය වෙත වායුන් නිකුත් කිරීම මඟින් බලපෑමක් ඇති කරයි.

### සිදුකරන ලද පරිසර හිතකාමී ක්‍රියාකාරකම්

පරිසර හිතකාමී නිෂ්පාදන වෙළඳපලට සැපයීමට සංස්ථාව සෑම විටම උත්සහ කරනු ලබයි. එබැවින්, වඩා කාර්යක්ෂම සහ පරිසර හිතකාමී ලංකා සුපර් ඩීසල් හඳුන්වා දෙනු ලැබීය.

### ජෛව විවිධත්වය

තෙල් කාන්දුවීම්, ඉන්ධන මඟින් නිකුත්වන වායුන් හරහා ජෛවීය විවිධත්වය කෙරේ සංස්ථා මෙහෙයුම් මඟින් ඍණ බලපෑමක් ඇති කරනු ලබයි. මේ සඳහා දැඩි මෙහෙයුම් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ජෛවීය විවිධත්වය කෙරේ වන ඍණ බලපෑම් අවම කිරීමට අවශ්‍ය සෑම පූර්වෝපායන් සහ ආරක්ෂණ මිණුම් සංස්ථාව විසින් ගෙන ඇත.

| විස්තරය | ජෛව විවිධත්වයට වන බලපෑම |
|---|---|
| ආක්‍රමණික ජීවීන්, පලිබෝධ සහ රෝගකාරක බීජ හඳුන්වා දීම. | එවැනි දත්ත වාර්තා වී නොමැත. |
| ජීවීන් අඩු වීම | ,, ,, ,, |
| වාසස්ථාන අනුවර්තනය | ,, ,, ,, |
| විවිධ ජීවී විශේෂවල ස්වාභාවික පෙළගැස්මෙන් පරිබාහිර පාරිසරික ක්‍රියාවලියේ වෙනස්කම් | ,, ,, ,, |
| බලපෑම් ඇති වු ජීවී විශේෂ | බලපෑම් වාර්තා වී නොමැත. |
| බලපෑමක් ඇති වු ක්ෂේත්‍ර ප්‍රමාණය | බලපෑම් වාර්තා වී නොමැත. |
| බලපෑමක් ඇති වු කාල පරාසය | බලපෑම් වාර්තා වී නොමැත. |
| බලපෑම ප්‍රතිවර්ත්‍ය කිරීමේ හෝ නොකිරීමේ හැකියාව | බලපෑම් වාර්තා වී නොමැත. |

### අනුකූලතාවය

මෙම වර්ෂයේදී සංස්ථාව විසින් කිසිඳු සැලකිය යුතු ආකාරයේ දඩ ගෙවීමක් සිදුකර නොමැති අතර පාරිසරික නීති හෝ රෙගුලාසි සමඟ අනුගත නොවීමක් හෝ මූල්‍යමය නොවන සම්බාධකවල යටත් වීමක් වාර්තා වී නොමැත.

## අනාගත දර්ශනය

ගෝලීය තෙල් මිල ගණන් 2016 වර්ෂයේ දෙවන කාර්තුවෙන් පසුව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මැද පෙරදිග රටවල ආර්ථිකයන් වර්ධනය නවතිනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, එම රටවලින් ලැබෙන විදේශ විනිමය අඩුවීමට හැකියාව ඇත; එම නිසා විදේශ විනිමය අනුපාත මත පීඩනයක් ඇති විය හැකිය. ගෝලීය පොළී අනුපාත වැඩිවනු ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර එම හේතුවෙන් විචල්‍ය පොළී අනුපාතයන් යටතේ ලබා ගන්නා ලද විදේශ ණය සඳහා ශ්‍රී ලංකාවට ඉහළ පොළී ගෙවීම් සිදු කිරීමට වනු ඇත. රජයද තම ආදායම බදු ආදායම මඟින් වැඩි කිරීමට සැලසුම්කර ඇත.

දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා පිරිවැය පරාවර්තිත පාරදෘෂ්‍ය මිල යාන්ත්‍රණයක් නොමැති වීම තෙල් කර්මාන්තයේ දැවෙන ගැටළුවකි. ශ්‍රී ලංකා රජයෙන් ප්‍රමාදයකින් තොරව සහන සංරචකය ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන අතර එම සංරචකය මඟින් බැංකු ණය යම් ප්‍රමාණයක් ගෙවා දැමීමට රජය කටයුතු කරනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. පවත්නා තරඟකාරී අනුපාත යටතේ ඇ.ඩොලර් මිලදී ගැනීමට සංස්ථාව වෙත නිදහස ලබා දෙන්නේ නම් සංස්ථාවේ ලාභදායීත්වය වැඩි කිරීමට හැකිවනු ඇත. ඛනිජ තෙල් කැනීමේ කටයුතු සාර්ථක වු පසු සහ වායු වානිජකරණය කිරීමේ ක්‍රියාවලිය ඵලදායී වු පසු දේශීය වායු භාවිතා කිරීමට සහ ආශ්‍රැත ඉන්ධන ආනයනය සීමා කිරීමට අපේක්ෂා කෙරේ.

2014 සහ 2015 වර්ෂ සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු. මිලියන 1000 ක් විශේෂ අය කිරීමක් ලෙස ලබාගෙන ඇති අතර, සංස්ථාව විශ්වාස කරනුයේ එය සාධාරණ නොවන බවයි. එසේම සංස්ථාව විසින් ගෙවියයුතු බදු සමඟ එම මුදල් හිලව් කර ගන්නා ලෙස සංස්ථාව යෝජනා කර ඇත. පෙට්‍රල් වෙත පනවා ඇති රේගු බදු ගාස්තු සහ පිරිවැටුම මත පනවා ඊ.එස්.සී. අඩුකරන ලෙස රජයෙන් ඉල්ලා සිටීමට සංස්ථාව සැලසුම් කර ඇත. ඉහළ ගිය ඊ.එස්.සී. අනුපාතය සහ පිරිවැටුම මත බදු ගෙවීම් නිසා සංස්ථාව විසින් විශාල ප්‍රමාණයක බදු ගෙවනු ලබයි.

2015 වර්ෂයේ අයවැය මඟින් රු. බිලියන 100 ක් වෙන්කරන ලද අතර ඉන් රු. බිලියන 75 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් රජය විසින් නිකුත් කරනු ඇතැයි සංස්ථාව අපේක්ෂා කරන අතර එම අරමුදල් ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘති සහ විදේශ මුදල් ණය ගෙවීම සඳහා භාවිතා කිරීමට සැලසුම් කර ඇත. මෙය සංස්ථාවේ ලාභදායිතාවය වැඩි කිරීමට ඉවහල් වනු ඇත. පිරිපහදුව නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ නම්, ගබඩාකරණ පහසුකම් අඩු වීම හේතුවෙන් දැවිතෙල් සහ නැප්තා අපනයනයෙන් සිදුවන අලාභය අඩුකර ගත හැකිය. ඒ සඳහා රජයේ සහතික වීමක් ඇතිව බාහිර අරමුදල් සපයා ගැනීමට ප්‍රතිපත්තිමය තීරණ ගත යුතුව ඇත.

පිරිවැය අවම කරමින්, ඛනිජ තෙල් සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය දියුණු කිරීම් සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම් කෙරේ සංස්ථාව අඛණ්ඩව කටයුතු කරයි. සංස්ථාවේ වෙළඳපල තත්වය පවත්වාගෙන යාම සඳහා වන ක්‍රමෝපාය ප්‍රමුඛතා ක්‍රියාත්මක වෙමින් පවතින අතර රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස රජයේ සහයෝගය ලබා ගැනීමට සංස්ථාව අපේක්ෂා කරයි. පරිසර හිතකාමී නව පළිබෝධනාශක හඳුන්වා දෙමින් තම මෙහෙයුම් ව්‍යාප්ත කිරීමට

කෘෂි අංශය සැලසුම් කරනු ලබයි. පවත්නා තෙල් පිරිපහදු කිරීමේ ක්‍රියාවලිය තාක්‍ෂණික වශයෙන් නවීකරණය කළ පසු එමඟින් ද්‍රැව්තෙල් වැනි අතුරු නිෂ්පාදන ඉහළ වටිනාකමක් සහිත නිෂ්පාදන බවට පත් කළ හැකි වනු ඇති අතර, පාඩු ලබන තත්වයද වැලැක්විය හැකිය. අඩු ඉල්ලුමක් පවතින කාලවකවානු වලදී අතිරේක නිෂ්පාදන ගබඩා කිරීමට ගබඩා පහසුකම් වැඩි කළ යුතු වන අතර ජාත්‍යන්තර වෙළඳපලේ තෙල් මිල ගණන් අඩු වූ විට බොරතෙල් ගබඩා කිරීම සඳහා ද ගබඩා පහසුකම් වැඩි කළ යුතුය.

### දැනට කෙරෙමින් පවතින ප්‍රධාන ව්‍යාපෘතිවල තත්වය

1. තාර තොග සහ සම්පීඩිත දියරවායු පිරවීමේ අංගනය සංවර්ධනය වෙමින් පවතී.
2. සංක්ෂිප්ත වායු පද්ධතිය සඳහා ඇණවුම් කර ඇත.
3. තාක්‍ෂණික සහ වානිජ පැහැදිලි කිරීම් සම්පූර්ණ කිරීමෙන් පසුව, වාෂ්ප බොයිලේරුවක් මිලදී ගැනීමට බොයිලේරු නිෂ්පාදකයා සමඟ ගිවිසුමක් අත්සන් කරන ලදී.
4. පොම්ප ඒකකය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා විද්‍යුත් සහ උපකරණ රැහැන් සඳහා කම්බි අඟල් ඉදිකිරීම් සිදුකරමින් පවතී. රැහැන් ඇදීමෙන් අනතුරුව පොම්ප ඒකකය සවිකරනු ඇත.
5. ජෙට් ඒ 1 සඳහා අතිරේක නිෂ්පාදන ගබඩා සංකීර්ණයක් මුතුරාජවෙල ඉදිකිරීම සහ එය බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සමඟ නල පද්ධතියක් මඟින් සම්බන්ධ කිරීම.
6. බොයිලර් ෆීඩ් ජල පොම්පයක් ඇණවුම් කර ඇත.
7. තෙල් පරීක්‍ෂා කිරීමේ උපකරණ වල ප්‍රමාණවත් බව සහ පවත්නා උපකරණ වල ක්‍රියාකාරීත්වය පරීක්‍ෂා කිරීමෙන් පසු අත්‍යවශ්‍ය රසායනාගාර උපකරණ මිලදී ගැනීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.
8. පිරිපහදුවේ සිට ජලය ලබා ගැනීමේ පද්ධතිය දක්වා වන ජලනල පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා පිළියෙල කරන ලද අතර ගැබියන් බිත්තියක් සවිකිරීම මඟින් ගංඉවුර අළුත්වැඩියා කිරීම.
9. සපුගස්කන්ද බෙදාහැරීම් පර්යන්තයේදී ස්වයංක්‍රීයකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ටෙන්ඩර් කැඳවා ටෙන්ඩර් ප්‍රදානය කර ඇත.
10. අප ජලය පිරිසිදු කිරීමේ යන්ත්‍රාගාරයක් ඉදිකිරීම ආරම්භ කර ඇත.
11. බැරල් අංගනය කොන්ක්‍රීට් කිරීම සහ සේදීමේ ස්ථානය ඉදිකිරීම සඳහා මිල ගණන් කැඳවා ඇත.
12. නැප්තා ගබඩා කිරීමේ ටැංකි අංගනය ඉදිකිරීම සිදුවෙමින් පවතී.

### සැලසුම්කරණ ලද ව්‍යාපෘති

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තය අනාගතයේදී ශක්තිමත් කර්මාන්තයක් කිරීමට කෙටි කාලීන සහ දීර්ඝ කාලීන පදනම යටතේ ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන ව්‍යාපෘති කීපයක් සංස්ථා කළමනාකාරීත්වය විසින් හඳුනාගෙන ඇත.

1. සපුගස්කන්ද පිරිපහදු යන්ත්‍රාගාරය සහ රසායනාගාරය වැඩිදියුණු කිරීම සහ ව්‍යාප්ත කිරීම, විදුලිබල උත්පාදන පහසුකම් වැඩි දියුණු කිරීම සහ මාබිම පාර වෙනත් පාරකින් යැවීම.
2. හම්බන්තොට ටැංකි සංකීර්ණය සහ තෙල් ජැටිය අත්පත්කර ගැනීම.
3. තෙල්බෑමේ ස්ථානවලට, ගබඩා කිරීමේ පර්යන්තයට සහ පිරිපහදු බැටරි සීමාවලට මාස් ෆ්ලෝ මීටර් හඳුන්වා දීම.
4. එස්.ටී.ඒ.ඩී.අයි.එස්. නික්ෂේපණය කිරීමේ ඒකකයක් පිහිටුවීම සහ කොලොන්නාව ගුවන්තෙල් ගබඩාකරණ අංගනයේ පෙරණයක් සවි කිරීම.
5. පිරිපහදුවෙන් සහ වරායෙන් එකවර ඉන්ධන ලබා ගැනීම ක්‍රියාත්මක කිරීම

සඳහා කොලොන්නාව නල මාර්ගය/ කපාටය නවීකරණය කිරීම.

6. ජෙට් ඒ 1 හුවමාරු කිරීම සඳහා වන නල මාර්ගය, පිරිපහදුව සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සහ පිරිපහදුව සහ මුතුරාජවෙල සම්බන්ධ කිරීම.

7. සපුගස්කන්ද පොහොර යන්ත්‍රාගාරය සඳහා දුම්රිය මාර්ග පුනරුත්ථාපනය කිරීම සහ දුම්රිය ටැංකි වාහන හඳුන්වා දීම.

8. මුතුරාජවෙල පර්යන්තය සහ කොලොන්නාව පර්යන්තය සම්බන්ධ කිරීම.

9. ගාල්ල වරායේ තොග තාර ආනයනය කිරීම්, ගොඩබෑම, ගබඩා කිරීම සහ බෙදාහැරීම් සංකීර්ණය ස්ථාපිත කිරීම.

10. සපුගස්කන්ද පර්යන්තයේ ගබඩාකරණ පහසුකම් වැඩිදියුණු කිරීම.

11. මෙට්‍රික් ටොන් 60,000 ක ප්‍රමාණයේ නැව් ආනයනය සඳහා අවසර ලබා දෙමින්, යාත්‍රා මත පනවා තිබූ මුතුරාජවෙල එස්.පී.බී.එම්. කාර්මික සීමාවන් ලිහිල් කිරීම සහ ඩී.ඩබ්.ටී. පුළුල් පෙළ බොහොමයක් යාත්‍රා සඳහා වන බොරතෙල් එස්.පී.බී.එම්. තාක්ෂණික සීමාවන් ලිහිල් කිරීම.

12. එස්.පී.බී.එම්. මඟින් බොරතෙල් ගොඩබෑමේදී බාධා පැමිණෙන නම් බොරතෙල් ගොඩබෑමේ විකල්ප පවත්වා ගැනීම සඳහා ඩී.ටී.බී. හී බොරතෙල් පැටවීමේ/ ගොඩබෑමේ අංශය පුනරුත්ථාපනය කිරීම.

13. ස්වයං සේවා පොම්ප ස්වයංක්‍රීය කිරීම සහ ලංකා පිරවුම්හල් සමඟ සම්බන්ධ කිරීම.

කෙටිකාලීන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර වශයෙන් උපදවා ගන්නා අරමුදල් භාවිතා කිරීමටත් දීර්ඝ කාලීන ව්‍යාපෘති සඳහා බාහිර අරමුදල් භාවිතා කිරීමටත් අපේක්ෂිතය.


# අවදානම් කළමනාකරණ වාර්තාව

වර්ධනය සහ අවදානම සමබර කිරීම තුලින් සංස්ථාවේ තිරසාර සංවර්ධනය ඵලදායී අවදානම් කළමනාකරණ පද්ධතියක් මඟින් සහතික කරයි. එම කරුණු ගැන අවදානය යොමු කරමින්, ක්‍රමෝපාය සූත්‍රණය කිරීමේදී සහ දෛනික මෙහෙයුම් සිදුකිරීමේදී ඒ හා සම්බන්ධ අවදානම් කෙරෙහි සංස්ථාව ඉහළ අවධානයක් යොමු කරයි. ඵලදායි අවදානම් කළමනාකරණ රාමුව, ඵලදායී සහ විස්තීරණ අභ්‍යන්තර පාලන ක්‍රමයක් සහ හොඳින් නිර්වචනය කරන ලද පාලන ව්‍යුහයක් මඟින් සකසනු ලබයි.

## අවදානම් පාලනය

සංස්ථාවේ අවධානම් කළමනාකරණය සඳහා වන ඉහළ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන අතර විධායක මට්ටමේ සහ අධ්‍යක්ෂ මණ්ඩලය මට්ටමෙන් පවත්වනු ලබන අනෙකුත් පාලන කමිටු මඟින් මේ සඳහා අවශ්‍ය සහාය ලබා දේ. මෙම කමිටුව මෙහෙයවනු ලබන්නේ පැහැදිලි ලෙස නිර්වචනය කරන ලද වගකීම් හා භූමිකාවලට අනුවය.

## සංස්ථා පාලන ව්‍යුහය



## අවදානම් කළමනාකරණය වෙත සංස්ථාවේ ප්‍රවේශය

ශක්තිමත් ආරක්ෂණ පියවර දෙකක් මත සංස්ථාවේ අවදානම් කළමනාකරණ ප්‍රවේශය පදනම් වී ඇත. එය අවධානම හඳුනා ගෙන කළමණාකරණය කර එය හොඳින් වලක්වා ගනියි.




## අභ්‍යන්තර පාලන පද්ධතිය

ඇතිවිය හැකි අවදානම් සොයා ගැනීම, කළමනාකරණය කිරීම සහ වැලැක්වීම සඳහා අවස්ථාව උදාකරමින් සෑම ප්‍රතිපත්තියක්ම සහ ක්‍රියාපටිපාටියක්ම ආවරණය කරනු ලබන විස්තීරණ අභ්‍යන්තර පාලන පද්ධතියක් සංස්ථාව විසින් නිර්මාණය කර ඇත. අභ්‍යන්තර පාලන පද්ධතිය නිර්මාණය කිරීමේදී 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත, 1971 අංක 38 දරණ මූල්‍ය පනත සහ අනෙකුත් නියාමන පද්ධතීන් සලකාබලා ඇත. ව්‍යාපාරයේ අඛණ්ඩතාවය සහතික කරමින් සංස්ථාවේ අවදානම කළමනාකරණය කිරීම සඳහා ඉහත කී පනත් ශක්තිමත් අත්තිවාරමක් සපයා ඇත. එසේම, එමගින් අක්‍රමිකතා සහ වංචාවන් වලක්වනු ඇත.

## අභ්‍යන්තර සහ බාහිර විගණන

අවදානම් කළමනාකරණ පද්ධතියේ අත්‍යවශ්‍ය භූමිකාවක් අභ්‍යන්තර සහ බාහිර විගණනය මඟින් සිදු කරයි. මූල්‍ය පද්ධතියේ සහ අනෙකුත් මෙහෙයුම් පද්ධතිවල සැකැස්ම සහ කාර්යසාධනය අභ්‍යන්තර සහ බාහිර විගණකවරුන් විසින් අධ්‍යයනය කරනු ලබන අතර ඔවුන් විසින් හඳුනාගනු ලබන ඕනෑම අවදානමක් කළමනාකරණය කිරීමට ඔවුන් විසින් අවශ්‍ය නිර්දේශ ද ඉදිරිපත් කරයි. සැලකිය යුතු මට්ටමේ විගණන සොයා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවන ලද විගණන කමිටුව විසින් සමාලෝචනය කරයි.

## සංස්ථාව විසින් මුහුණ දෙනු ලබන අවදානම්

සංස්ථාව නිරාවරණය වනු ලබන අවදානම් පිළිබඳව කෙටි විස්තරයක් සහ ඒ සඳහා ගෙන ඇති අවදානම් කළමනාකරණ මිණුම් පහත දක්වා ඇත.

## ආර්ථික අවදානම

ගෝලීය සහ ශ්‍රී ලාංකීය ආර්ථික තත්වයන් සංස්ථාව වෙත දැඩි ලෙස බලපෑමක් ඇති කරයි. සංස්ථාව වෙත වඩාත්ම පීඩනයක් ඇති කරන ලද සාධක අතරින් කැපී පෙනෙන සාධක ලෙස ගෝලීය වෙළඳපලේ බොරතෙල් මිල ගණන් වෙනස්වීම, විනිමය අනුපාතය සහ රටේ උද්ධමන අනුපාතය සැලකිය හැක. ඛනිජ තෙල් නිෂ්පාදන සපයන ප්‍රධානතම සැපයුම්කරු සහ රජය සතු ආයතනයක් ලෙස ලාභ ලැබීමට වඩා සමාජීය සහ ආර්ථික තත්වයන් සපුරාලීම සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන ඉහළ සහන මිල ගණන් යටතේ සපයනු ලබයි. ඛනිජ තෙල් නිෂ්පාදන වල මිල ගණන්හි ඉතා සුළු වෙනසක් වුවද සමස්ථ ආර්ථිකය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරයි.

සංස්ථාවේ ලාභදායීත්වය හා රටේ සමාජ ආර්ථික තත්වය සමබර කිරීම අරමුණු කර ඛනිජ තෙල් නිෂ්පාදන තරඟකාරී මිල ගණන් යටතේ අලෙවි කිරීමට හැකියාවක් ඇති කරමින්, ආක්‍රමණශීලි පිරිවැය කළමනාකරණ ප්‍රත්‍යුත්ක්‍රම සංස්ථාව නිරන්තරයෙන් යොදවමින් ආර්ථික අවධානම් තුළින් ඇතිවන හානිකර තත්වයන් අවම කරනු ලබයි. ඛනිජ

තෙල් නිෂ්පාදනවල දේශීය පිරිවැය පිළිබිඹුවන ආකාරයේ මිල යාන්ත්‍රණයක් හඳුන්වා නොදීම සංස්ථාව ලාභදායී ව්‍යාපාරයක් කිරීම සඳහා වන ප්‍රධානතම බාධකයයි.

## මූල්‍ය අවදානම

සංස්ථාවේ යහපැවැත්ම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් පැවතීම මූල්‍ය අවදානම යටතට ගැනේ. ලාභදායීත්වය මත වන වෙළඳපල තත්වය මඟින් පැන නැඟිය හැකි සෘණ බලපෑම අඩු කරමින් ඕනෑම අවස්ථාවක පිරිවැය එළදායී අරමුදල් පවත්නා බව සංස්ථාව තහවුරු කරයි. සංස්ථාව නිරාවරණය වනු ලබන ප්‍රධානතම අවදානම් නම්, විදේශ විනිමය අනුපාතක සහ පොළී අනුපාතය. කෙසේ වෙතත්, සංස්ථාව මුහුණදෙනු ලබන විශාලතම බාධකය ලෙස ඇ. ඩොලර් ණය පියවීම සඳහා ක්‍රියාකාරී යාන්ත්‍රණයක් නොමැති වීම හැඳින්විය හැක. සංස්ථාවට ලැබිය යුතු සහන සංරචකය මඟින් බැංකු ණයක් ලබා ගන්නේ නම් පවත්නා මූල්‍ය අවදානම තවදුරටත් අවම කර ගත හැක.

## විදේශ විනිමය අවදානම

බොරතෙල් සහ පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා සැපයුම්කරුවන්ගේ මුදල් ගෙවීම් පියවීම් සඳහා සංස්ථාව විසින් ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකෙන් ඇමරිකානු ඩොලර් මිලදී ගැනීමට පුරුදුව ඇත. නමුත් ආදායම ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකා රුපියල් වලින් උත්පාදනය කරයි. එබැවින්, සංස්ථාව විදේශ මුදල් අවදානම වෙත නිරාවරණය වේ. මෙම අවදානම අවම කිරීම සඳහා සෑම බැංකුවකින්ම ඉදිරිපත් කරන මිල ගණන් දෛනිකව අධීක්ෂණය කරන අතර වෙළඳපල මිල ගණන් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බැංකු විසින් ඉදිරිපත් කරන මිල ගණන් වලට නොව වෙළඳපල මිල ගණන් වලට ඩොලර් මිලදී ගනී. මෙමඟින් සංස්ථාව සැලකිය යුතු ලාභයක් ලබා ගන්නා ලදී. රජය සතු වානිජ බැංකු දෙකට සීමා නොවී වෙනත් ලියාපදිංචි වානිජ බැංකු මඟින් තරඟකාරී අනුපාත යටතේ ඩොලර් ලබා ගැනීමට අධිකාරිය ලබා දෙන්නේ නම් සංස්ථාවේ අලාභය අවම කරගත හැකිය.

## ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු සංස්ථාවේ බැඳීම් අවශ්‍ය විට සපුරාලීම නොහැකි වීම තුළින් ඇතිවිය හැකි අලාභයයි. සංස්ථාවේ ගිවිසුම්ගත බැඳීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටමක් සංස්ථාව විසින් පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. සංස්ථාවේ ද්‍රවශීලතා කළමනාකරණ රාමුවේ ප්‍රධාන අංශ පහත පරිදි වේ;

- සංස්ථාවේ ද්‍රවශීලතා තත්වය නිරන්තරයෙන් අධීක්ෂණය කෙරමින් පවතින අතර අනාගත ද්‍රවශීලතා අවශ්‍යතාවය නිර්ණය කරයි.
- බැංකු සහ මහා භාණ්ඩාගාරය සමඟ පවත්වාගෙන යන මිත්‍රශීලී සම්බන්ධතාවය මඟින් විවිධ අරමුදල් ක්‍රමෝපායන් සංස්ථාව විසින් පිළියෙල කර ඇත.
- සංස්ථාවේ ලාභදායීත්වය සහ ද්‍රවශීලතා තත්වය සමබර කරමින් අමතර මුදල් යථා පරිදි ආයෝජනය කර ඇත.

## පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු පොළී අනුපාත වෙනස්වීම් සමඟ අනුගත වන පරිදි අගය විචලනය වන වත්කම් සහ බැරකම් වෙත සංස්ථාව නිරාවරණය වීමෙන් ඇතිවිය හැකි අලාභයයි. ප්‍රධාන වශයෙන් ණය ගැනීම් මඟින් පොළී අනුපාත අවදානම වෙත සංස්ථාව නිරාවරණය වන අතර පොළී වියදම් සහ අනෙකුත් මූල්‍ය අයකිරීම් සංස්ථාවේ ලාභදායීත්වයට විශාල බලපෑමක් එල්ල කරයි. සාකච්ඡා වාර කීපයක් පැවැත්වීමෙන් පසුව, මෙම වර්ෂය තුළදී, 5.5% පැවති ඇමරිකානු ඩොලර් ණය ගැනීම් පොළී අනුපාතය 5% දක්වා අඩු කිරීමට සංස්ථාවට හැකියාව ලැබිණි. ප්‍රමාදයකින් තොරව සහන සංරචක ලබා දෙනු ඇතැයි සංස්ථාව අපේක්ෂා කරන අතර එමඟින් සංස්ථාව ලබා ගන්නා ලද බැංකු ණය යම් ප්‍රමාණයකින් අඩුකර ගනිමින් සංස්ථාව නිරාවරණය විය හැකි පොළී අනුපාත අවදානම අඩුකර ගත හැකි වේ.

### මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවන හෝ අසමත් අභ්‍යන්තර ක්‍රියාවලීන්ගෙන් පුද්ගලයන් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් මඟින් ඇතිවිය හැකි අවදානමය. තීරණාත්මක ක්‍රියාකාරකම් හෝ සංස්ථාවේ පද්ධති සහ ක්‍රියාපටිපාටීන් අසමත්වීම මත වන ප්‍රමාණවත් නොවන හෝ ඵලදායී නොවන පාලනයක් මඟින් මෙහෙයුම් අවදානම ඇතිවිය හැක. ඛනිජ තෙල් නිෂ්පාදන මේ වන විට සමාජයට අත්‍යවශ්‍ය භාණ්ඩයක් වී ඇති අතර කුඩා මෙහෙයුම් දෝෂයක් මඟින් උවදුරක් ඇතිවිය හැක. මෙම අවදානම් කළමනාකරණය කිරීමට සංස්ථාව දැඩි අවදානමක් යොමු කරයි. මෙහෙයුම් අවදානම පහත පරිදි කළමනාකරණය කර ඇත;

- මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ඇතුළුව පැහැදිලි ලෙස නිර්වචනය කරන ලද ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සුදුසු ලෙස ක්‍රියාවට නංවා ඇත.
- අභ්‍යන්තර පාලන පද්ධති බිඳවැටීම හඳුනා ගැනීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් ඉදිරියට යන ඇගයීම් පවත්වනු ලබයි.
- සංස්ථාව සමඟ බැඳී ඇති මෙහෙයුම් අවදානම අවම කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව සහ ටෙන්ඩර් ඇගයීම් කමිටුව වැනි විවිධ කමිටු ක්‍රියාත්මක වෙමින් පවතී.

### සැපයුම්කරුගේ අවදානම

සංස්ථාවේ ඛනිජ තෙල් නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපලෙන් ආනයනය කරන අතර සැපයුම්කරුගේ බිඳවැටීම්, නිෂ්පාදනයේ දෝෂයන් සහ අවශ්‍ය තාක්ෂණික ප්‍රමිතීන් නොමැති නිෂ්පාදන සංස්ථාව වෙත සැපයුම්කරුගේ අවදානම ඇති කරයි. ඛනිජ තෙල් නිෂ්පාදන ඇතුළුව ගුණාත්මකභාවයෙන් යුත් භාණ්ඩ හා සේවා සැපයීම සහතික කරනු වස් සංස්ථාව විසින් තොග සමාලෝචන කමිටු, ප්‍රසම්පාදන කමිටු සහ ටෙන්ඩර් ඇගයීම් කමිටු වැනි උපකමිටු ස්ථාපනය කර ඇත.


### ණය අවදානම

ණය අවදානම යනු සංස්ථාව වෙත වන ගිවිසුම්ගත බැඳීම් සපුරාලීම සඳහා සංස්ථාවේ යම් සේවාදායකයෙක් අසමත් වේ නම් ඉන් ඇතිවිය හැකි මූල්‍ය අලාභයි. පැහැරහරින ලද ණය අවදානම සහ සංකේන්ද්‍රණ අවදානම ලෙස ණය අවදානම පුළුල් ලෙස ප්‍රභේද දෙකකට වෙන් කළ හැකිය.

පැහැර හරින ලද ණය අවදානම ඇතිවනුයේ සේවාදායකයකු විසින් ණය ගෙවීමක් පැහැර හරින ලද අවස්ථාවකය. මෙම වර්ෂය තුළදී, සංස්ථාව විසින් ලැබිය යුතු වෙළඳ ණය 49.21% දක්වා අඩු කිරීමට හැකියාව ලැබිණි.

සංකේන්ද්‍රණ අවදානම ඇති විය හැක්කේ යම් සේවාදායකයකු, අංශයක් හෝ නිෂ්පාදනයක් වෙත ඉහළ ණය දීම් මඟිනි. විවිධ අංශයන් වෙත පිරිනමන ලද නිෂ්පාදන ගණනක් සමඟ සංස්ථාවේ ලැබිය යුතු ණය හොඳින් වර්ගීකරණය කර ඇත. කෙසේ වෙතත්, 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වෙළඳ ණය 50% ට වඩා රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු අතර ඒවා පියවා ගැනීම සඳහා පසු විපරම් කළ යුතු වේ.

**2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වෙළඳ ණය**



## කම්කරු අවදානම

කම්කරු ගැටළු ඛනිජ තෙල් නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහ සංස්ථාවේ කීර්තිනාමය වෙත බලපෑමක් ඇති කරයි. කම්කරුවන් සම්බන්ධ නඩු සහ තරඟකාරී ශ්‍රමබලකායක් ගොඩනැගීම සඳහා බඳවා ගැනීම් සහ පුහුණුවීම් සඳහා කාලය හා සම්පත් ආයෝජනය කිරීම වැනි ගැටළු ඇති වේ. සැමවිටම දිරිමත් ශ්‍රමබලකායක් පවත්වාගෙන යාම සඳහා සංස්ථාව සැම උත්සහයක්ම දරන ලද අතර සංස්ථාව නියෝජනය කරනු ලබන වෘත්තීය සමිති සමඟ පවත්නා සාමූහික ගිවිසුම මඟින් එය සනාථ කරයි. මෙම ගිවිසුම් මඟින් සේවකයන්ගේ සහ සේව්‍යාගේ රුචිකත්වයන් අතර සාධාරණ සමබරතාවයක් පවත්වයි. උද්යෝගීමත් සහ කාර්යක්‍ෂම ශ්‍රමබලකායක් ගොඩනැගීම සඳහා අපගේ සේවකයන් වෙත ලබාදී ඇති කාර්යමණ්ඩල ශුභසාධනය සහ වෙනත් ප්‍රතිලාභ යෝජනාක්‍රම ප්‍රධාන කාර්යක් ඉටුකරයි.එසේම, කාර්යසාධනය පදනම්කර ගත් ප්‍රතිලාභ පද්ධතියක් සහ උසස්වීම් ක්‍රමය මඟින් ද වඩා අපේක්‍ෂා සහගත ශ්‍රමබලකායක් බිහි කරයි.

## සංස්ථායික පාලනය

ශක්තිමත් සංස්ථායික පාලන ප්‍රතිපත්ති යනු දීර්ඝ කාලීන සංවර්ධනය පවත්වාගෙන යාම සඳහා පරදුදරන කණ්ඩායම් වෙත අගය එකතු කිරීම් තහවුරු කරනු ලබන සංස්ථාවේ ජීවනාලියයි. එසේම, එය සමස්ථයක් ලෙස සමාජයට ඉතා වැදගත් වන අතර එය ජාතික ආර්ථිකයේ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරයි. අවංකත්වය, වාස්තවිකතාවය, ඒකාබද්දතාවය සහ පාරදෘෂ්‍යතාවය මඟින් සංස්ථායික පාලනයේ ඉහළම ප්‍රමිතීන් පුහුණුවීම සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සිදුකිරීමට සංස්ථාව බැඳී සිටී. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද සංස්ථායික පාලනය මත වන විශිෂ්ඨ භාවිත සංග්‍රහය සහ 2003 වර්ෂයේ මුදල් අමාත්‍යාංශයේ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහපාලනය සඳහා වන පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ මඟින් ඉදිරිපත් කර ඇති අවශ්‍යතා මඟින් සංස්ථාවේ සංස්ථායික යහපාලනය ශක්තිමත් කරනු ලබයි. වගවීම, පාරදෘෂ්‍යභාවය සහ ඒකාබද්දවීම ළඟා කර ගැනීම පිණිස පහත සඳහන් ශක්තිමත් සංස්ථායික පාලන භාවිතයන් අනුගමනය කරමින් ඉහත කී අවශ්‍යතාවයන් පිළිපැදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී.

### අධ්‍යක්ෂ මණ්ඩලය

ක්‍රමෝපාය, මූල්‍ය සහ කීර්තිනාමය වැනි විශේෂ කරුණු සඳහා සංස්ථාවේ ප්‍රධානතම තීරක ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරයි. වසර අවසානයේදී 1961 අංක.28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පනත සහ එහි සංශෝධන ප්‍රකාර ගරු ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ඇමතිතුමා විසින් සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හත්දෙනෙක්ගෙන් සමන්විත වේ. ඉන් එක් අධ්‍යක්ෂවරයෙක් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි මහාභාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන සාමාජිකයෙක් පත් කරයි. සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ හැර සෑම අධ්‍යක්ෂවරයෙක්ම විධායක නොවන අධ්‍යක්ෂවරු වේ.

නැවත පත්වීමට යටත්ව, වසර තුනකට නොවැඩි කාලපරිච්ඡේදයක් සඳහා අධ්‍යක්ෂවරු පත්කරනු ලබයි. තීරණ ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථායික කළමනාකාරීත්වයේ සහ අවශ්‍ය වූ විට බාහිර වෘත්තිකයන්ගේ තොරතුරු ලබා ගනී. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය වූ විට අදාළ තොරතුරු ලබා දෙමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට සහාය ලබා දීම සංස්ථායික කළමනාකාරීත්වයේ වගකීමකි.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

ව්‍යවස්ථානුකූල අවශ්‍යතා වෙත අනුගත වෙමින් ව්‍යාපාරික ඒකාබද්දතාවය පරදුදරන කණ්ඩායම්වල විශ්වාසය පවත්වාගෙන යමින් ශක්තිමත් සංස්ථායික ව්‍යුහයක් තුළ පවත්නා වටිනාකමක් පරදුදරන කණ්ඩායම් වෙත නිර්මාණය කර ලබාදීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම වේ. ප්‍රතිපත්ති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම මෙන්ම ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම මඟින් සංස්ථාවේ ඵලදායි පාලනය තහවුරු කිරීම සඳහා සංස්ථාව කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වීම මඟින් සංස්ථාවේ කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී කටයුතු කරයි. යහපාලන භාවිතයන් වෙත අවශ්‍ය පරිදි අනුගතවීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම ප්‍රයත්නයක්ම දරන අතර සංස්ථාවේ කාර්ය සාධනය සහ අපේක්ෂාවන් පිළිබඳව වාස්තවික ඇගයීමක් සිදු කරයි.

### අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්

ව්‍යවස්ථානුකූල අවශ්‍යතා වෙත අනුගත වෙමින් ව්‍යාපාරික ඒකාබද්දතාවය පරදුදරන කණ්ඩායම්වල විශ්වාසය පවත්වාගෙනයමින් ශක්තිමත් සංස්ථායික ව්‍යුහයක් තුළ පවත්නා වටිනාකමක් පරදුදරන කණ්ඩායම් වෙත නිර්මාණය කර ලබාදීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම වේ. ප්‍රතිපත්ති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම මෙන්ම ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම මඟින් සංස්ථාවේ ඵලදායී පාලනය තහවුරු කිරීම සඳහා සංස්ථාව කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී විම මඟින් සංස්ථාවේ කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී කටයුතු කරයි. යහපාලන භාවිතයන් වෙත

අවශ්‍ය පරිදි අනුගත වීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම ප්‍රයත්නයක්ම දරන අතර සංස්ථාවේ කාර්යසාධනය සහ අපේක්ෂාවන් පිළිබඳව වාස්තවික ඇගයීමක් සිදු කරයි.

ඉහත කරුණු හැර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික අයවැය, සංස්ථායික සැලසුම, ක්‍රියාකාරී සැලැස්ම සහ දෛනික පදනම යටතේ මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය කිරීම සඳහා අනුමැතිය ලබා දීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරනු ලබයි. ප්‍රධාන පත්වීම්, කාර්ය මණ්ඩල උසස්වීම්, ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ආයෝජන සහ සංස්ථා සේවාදායකයන් වෙත වන ණය පහසුකම් සඳහා වන අනුමත කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පාලනය කරනු ලබයි.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන අතර අවශ්‍ය වූ විට විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වයි. ඇතැම් අවස්ථාවන්හිදී ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා කැඳවයි. මෙම රැස්වීම් විධිමත් න්‍යාය පත්‍රයකට පවත්වනු ලබන අතර රැස්වීමට පෙර සංස්ථායික කළමනාකාරීත්වය විසින් අවශ්‍ය පසුබිම් විස්තර සපයනු ලබයි.

තම වගකීම් ඉටුකිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගණන කමිටුව විසින් අවශ්‍ය සහාය ලබා දෙයි. අභ්‍යන්තර විශේෂිත ක්ෂේත්‍ර පිළිබඳව විගණන කමිටුව වගකීම දරන අතර විධායක මට්ටමේ උපකමිටු කීපයක්ද පවතී.

## විගණන කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වගකියනු ලැබේ. පොදු ව්‍යාපාරයන්හී විගණන කමිටු පැවැත්වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වා ඇති වගකීම් ක්ෂේත්‍රය, අධිකාරීත්වය සහ විශේෂිත රාජකාරි ආවරණය වන පරිදි විගණන කමිටුව න්‍යාය පත්‍රය සකස් කර ඇත. විගණන කමිටුවේ වගකීම්, සංයුතිය පවත්වන ලද රැස්වීම් සහ සිදුකරන ලද ක්‍රියාකාරකම් වාර්ෂික වාර්තාවේ 59 සහ 60 පිටුවල දක්වා ඇත.

## අභ්‍යන්තර පාලනයන්

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෘත්තීය සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරීවරයෙකු විසින් පාලනය කරයි. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම මෙම පද්ධතිය මඟින් අපේක්ෂා කරන අතර විධිමත් වාර්තා පවත්වාගෙන යන අතර විශ්වාසනීය තොරතුරු ඉදිරිපත් කරනු ලබයි. මෙම වගකීම මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලනය කිරීම මෙන්ම අවදානම් කළමනාකරණය ඇතුළුව සෑම ආකාරයකම පාලනය කිරීම් ආවරණය කරනු ලබයි. කෙසේ වෙතත්, ප්‍රතිපත්ති සහ ව්‍යාපාර අරමුණු ලඟා කර ගැනීම සඳහා වන අවදානම ඉවත් කිරීමට වඩා පිළිගත අවදානම්වල ප්‍රධාන ක්ෂේත්‍ර කළමනාකරණය කිරීම සඳහා මෙම පද්ධතිය නිර්මාණය කර ඇත. ඒ අනුව, අභ්‍යන්තර පාලන පද්ධතිය කළමනාකරණය පිළිබඳ ද්‍රව්‍යමය අවප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනය සහ වාර්තා හෝ මූල්‍ය හානි හෝ වංචා මත සාධාරණ නමුත් ස්ථිර ආරක්ෂණයක් පමණක් අභ්‍යන්තර පාලන පද්ධතිය මඟින් ලබා දෙයි.

සෑම අභ්‍යන්තර පාලන ක්‍රියාමාර්ගයක්ම සමාලෝචනය කිරීම සඳහා සහ ඒවායේ ප්‍රමාණවත්භාවය සහ ඵලදායිත්වය සමාලෝචනය කිරීම මෙන්ම අභ්‍යන්තර පාලන දියුණු කිරීම සංස්ථාවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති වගකීමකි.

## අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය මෙහෙයවනු ලබන්නේ වෘත්තීයමය වශයෙන් සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරිවරයෙකු විසිනි. අභ්‍යන්තර පාලන ඇගයීම, අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ගනුදෙනුවල සම්පූර්ණභාවය සහතික කිරීම සඳහා විගණන කමිටුව විසින් අනුමත කරන ලද විගණන සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී. නිරීක්ෂණ සහ නිර්දේශ කළමනාකාරීත්වය වෙත සැපයීමේ අරමුණු සහිතව විශේෂ විමර්ශන පැවැත්වීම සඳහා එම කණ්ඩායම් යොදවා ඇත. අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු ලබන අනෙකුත් කටයුතු ලෙස නිෂ්පාදන අහිමිවීම් සහ ආදායම් අහිමිවීම් සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම, විගණන ගැටළු සඳහා පිළිතුරු සමඟ විගණකාධිපති වාර්තාව සාකච්ඡා කිරීම සහ සිදුකරන ලද සැබෑ කාර්යන් විගනන සැලැස්ම සමඟ සමාලෝචනය කිරීම හැඳින්විය හැකිය.

## කළමනාකරණ කමිටුව

කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්‍ෂවරු දෙදෙනකුගෙන් සමන්විත වන අතර ඉන් අයෙක් කළමනාකරණ කමිටුවේ සභාපති වේ. අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමට පෙර මසක වරක් කළමනාකරන කමිටුව මුණගැසී අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සාකච්ඡා කර වාර්තා කරයි. අවසන් අනුමැතිය සඳහා එම වාර්තා කළමනාකරණ කමිටුව විසින් අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි. සියළුම ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරු සහ කාර්යාංශ ප්‍රධානීන් මෙම කමිටුවේ සාමාජිකත්වය ලබා ගනී.

## සංස්ථායික කළමනාකාරීත්වය

අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වරින්වර අනුමත කරන ලද ක්‍රමෝපාය නිර්දේශ, සකස් කරන ලද ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග පදනම්ව සභාපති සහ කළමනාකාර අධ්‍යක්‍ෂ විසින් කළමනාකරණය කරයි. ප්‍රාදේශිය කාර්යාල ඇතුළුව පිරිපහදු මෙහෙයුම් සහ ප්‍රධාන කාර්යාලය ඇතුළු පුළුල් ප්‍රධාන කොටස් දෙකකට සංස්ථාවේ මෙහෙයුම් සහ ප්‍රධාන පාලනය බෙදා වෙන්කර ඇත.

විද්‍යුත් සහ උපකරණ, නිෂ්පාදන සහ මෙහෙයුම්, නඩත්තු සහ ව්‍යාපෘති සහ තාක්‍ෂණික සේවා වැනි විවිධ තාක්‍ෂණික ක්ෂේත්‍රයන්ට අයත් නියෝජ්‍ය පිරිපහදු කළමනාකාරවරු විසින් සහාය ලබා ගනිමින් පිරිපහදු කළමනාකාරු විසින් පිරිපහදු මෙහෙයුම් පාලනය කරයි.

වඩා යහපත් කළමනාකරණයක් සඳහා ප්‍රධාන කාර්යාලය විවිධ කාර්යාංශ කීපයක බෙදා ඇති අතර ඉන් සෑම කාර්යාංශයක්ම විවිධ කාර්යාංශ වලට බෙදා ඇති අතර සෑම කාර්යාංශයක්ම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වරයෙකු හෝ කළමනාකාරවරයෙකු විසින් පාලනය කරන අතර සංස්ථාවේ දෛනික කටයුතු සඳහා ඔවුන් විසින් සභාපති/ කළමනාකාර අධ්‍යක්‍ෂ වෙත අවශ්‍ය සහාය ලබා දෙනු ලබයි. සංස්ථා කළමනාකාරවරු නිපුණත්වයෙන්, අත්දැකීමෙන් මනා සමබර කණ්ඩායමක් වන අතර අවශ්‍ය අධ්‍යයන උපාධි සුදුසුකම් ද ලබා ඇති අය වෙති.

## තොග සමාලෝචන කමිටු

තොග ගබඩා පර්යන්ත සමාගමේ කාර්ය මණ්ඩලය සහ ලංකා විදුලිබල මණ්ඩලය සහ ඉන්දියානු තෙල් සමාගම යන ආයතනවල නියෝජිතයන් සමඟ තොග සමාලෝචන කමිටුව සතිපතා පවත්වයි. තොග තත්වය සමාලෝචනය කරනු ලබන අතර කමිටුව හරහා ඉදිරි මාස තුන සඳහා වන අවශ්‍යතාවය සමාලෝචනය කරනු ලබයි.

රටේ ඛනිජ තෙල් සඳහා වන ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන හැකියාව සහ ටැංකි ගබඩා කිරීමේ ධාරිතාව සලකා බලා ආනයනය කළ යුතු ප්‍රමාණයන් සහ නැව්තෙල් තොග සැලසුම් කරනු ලබයි. මෙම ක්‍රමානුකූල සමීප සුපරීක්‍ෂණ ක්‍රියාවලික හේතුවෙන් රටේ ඉන්ධන සැපයීම බාධාවකින් තොරව සිදු කිරීමට ආනයන පිරිවැය, නිෂ්පාදන සහ රඳවා ගැනීමේ පිරිවැය අවම කිරීමට හැකියාව ලැබී ඇත.

## ප්‍රසම්පාදන කමිටු සහ තාක්‍ෂණික ඇගයීම් කමිටු

නිෂ්පාදන, භාණ්ඩ සේවා සහ කාර්යයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය විසින් නිකුත්කර ඇත. ප්‍රසම්පාදනයේ පාරදෘෂ්‍යතාවය සහතික කිරීම, ප්‍රමාදයන් අවම කිරීම සහ මූල්‍යමය වශයෙන් වඩාත් වාසි සහගත සහ ගුණාත්මකභාවයෙන් යුතු සේවාවක් සංස්ථාවට ලබා ගැනීම සඳහා තාක්‍ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව කටයුතු කරයි.

## මහා භාණ්ඩාගාරය සහ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ වන සම්බන්ධතාවය

සංස්ථාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ මහා භාණ්ඩාගාරය සමඟ සමීපව සම්බන්ධ වෙමින් සංස්ථාවේ මහා භාණ්ඩාගාරය හා සම්බන්ධ මෙහෙයුම් කළමනාකරණය කිරීමට අවශ්‍ය සේවය ලබා ගනී. ප්‍රධාන ව්‍යාපෘති වැඩසටහන් සහ අරමුදල් ලබා ගැනීම් සඳහා අවශ්‍ය උපදෙස් සහ මඟපෙන්වීම ද සංස්ථාව විසින් ලබා ගනී.

## අනුගතවීම් සහ පාරදෘශ්‍යතාවය

සංස්ථාව එහි සෑම ක්‍රියාකාරකමක්ම පාරදෘශ්‍යභාවයෙන් සිදු කිරීමට කැපවී සිටී. වගවීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් සහ අදාළ රෙගුලාසි වෙත අනුගත වෙනු ඇත. 1971 අංක 38 දරණ මූල්‍ය පනත ප්‍රකාර අභ්‍යන්තර පාලන පද්ධතිය සංස්ථාවේ දෛනික මෙහෙයුම් සමඟ අනුගත වී ඇත. මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව ප්‍රකාශයට පත්කරනු ලබන අතර පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබයි. මූල්‍ය පනත සමඟ අනුගත වෙමින් සංස්ථාවේ බාහිර විගණනය විගණකාධිපති වරයා විසින් සිදුකරයි.

## 2015 මූල්‍ය වර්ෂයේදී පැවති අධ්‍යක්ෂ මණ්ඩල සහ උප කමිටු රැස්වීම් සඳහා සහභාගීවීම්

| අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ තනතුරේ ස්වාභාවය | අධ්‍යක්ෂ මණ්ඩලය | විගණන කමිටුව | සටහන |
|---|---|---|---|---|
| | | පවත්වන ලද රැස්වීම් ගණන | | |
| | | 25 | 4 | |
| ජේ.ආර්. වික්‍රමසිංහ (හිටපු සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ) | විධායක අධ්‍යක්ෂ | 19 | අ/නොවේ | 2015.10.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වී ඇත. |
| ඩබ්.එස්.එම්.සී. සිරිමෙවන් | විධායක නොවන අධ්‍යක්ෂ | 18 | 2 | 2015.10.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වී ඇත |
| පී.ආර්. ගුණවර්ධන | විධායක නොවන අධ්‍යක්ෂ | 19 | අ/නොවේ | 2015.10.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වී ඇත |
| ඒ.කේ. සෙනවිරත්න | විධායක නොවන අධ්‍යක්ෂ | 20 | 3 | 2015.10.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වී ඇත |
| ඩී.ඩී.එස්. වික්‍රමරත්න | විධායක නොවන අධ්‍යක්ෂ | 16 | අ/නොවේ | 2015.10.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වී ඇත |
| එම්.කේ. සමරසිංහ | විධායක නොවන අධ්‍යක්ෂ | 15 | අ/නොවේ | 2015.10.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වී ඇත |
| ඒ.එච්.එස්. විජේසිංහ | විධායක නොවන අධ්‍යක්ෂ | 21 | 3 | 2015.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වී ඇත |
| ටී.ජී. ජයසිංහ (සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ) | විධායක අධ්‍යක්ෂ | 6 | අ/නොවේ | 2015.10.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කර ඇත. |
| ඩී.සී.එස්. සෙනවිරත්න | විධායක නොවන අධ්‍යක්ෂ | 6 | අ/නොවේ | 2015.10.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කර ඇත. |
| එම්.ජී. ජයසේන | විධායක නොවන අධ්‍යක්ෂ | 6 | අ/නොවේ | 2015.10.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කර ඇත. |
| ජී. ගල්හේන | විධායක නොවන අධ්‍යක්ෂ | 5 | 2 | 2015.10.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කර ඇත. |
| ආර්. හරිස්චන්ද්‍ර | විධායක නොවන අධ්‍යක්ෂ | 6 | 1 | 2015.10.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කර ඇත. |
| කේ.ඒ. විමලේන්තිරරාජා | විධායක නොවන අධ්‍යක්ෂ | 4 | 1 | 2015.11.11 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කර ඇත. |

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

1961 අංක.28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ අංක. 32(3) ප්‍රකාර, 2015 දෙසැ. 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සතුටින් ඉදිරිපත් කරමි. මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

1961 අංක. 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපිත කරන ලද රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නීතිගත කර ඇත. මෙය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබයි.

ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මඟින් සහ 1971 අංක. 38 දරණ මූල්‍ය පනතේ විධිවිධාන සහ එහි සංශෝධන ප්‍රකාර ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අනුව අදාළ අනාවරණයන් සහිතව වාර්ෂික වාර්තාවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අන්තර්ගතව පළියෙල කර ඇත.

අංක. 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 ලිපිනයේ ලියාපදිංචි කාර්යාලය පවත්වා ඇත.

#### දැක්ම, මෙහෙය සහ සංස්ථා ඉලක්ක

මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක. 02 හී සංස්ථාවේ දැක්ම, මෙහෙය සහ සංස්ථා ඉලක්ක පෙන්වා ඇත. මෙම ඉලක්ක සපුරාලීමේදී සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙක්ම සහ සේවකයෙක්ම සහයෝගයෙන් සහ අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරයි.

#### මූලික ක්‍රියාකාරකම්

සංස්ථාවේ මූලික ක්‍රියාකාරකම් අතර ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, පිරිපහදු කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම ප්‍රධාන වේ. සංස්ථාවේ ඛනිජ තෙල් නිෂ්පාදන අපනයනය ද සිදු කරයි.

#### ආශ්‍රිත සමාගම්

සංස්ථාව සතුව කොටස් 2/3 පවතින ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සංස්ථාවේ එකම ආශ්‍රිත සමාගම වේ. පර්යන්ත සමාගමේ මූලික ක්‍රියාකාරකම් වනුයේ ඉන්ධන ගබඩා කිරීම සහ බෙදා හැරීමේ සංකීර්ණය සහ තොරතුරු තාක්ෂණ සේවා සැපයීම හඳුන්වා දිය හැක.

#### වර්ෂයේ කාර්ය සාධන සමාලෝචනය

2015 මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් සමාලෝචනය සහ එම මෙහෙයුම්වල ප්‍රතිඵල සභාපතිතුමාගේ සමාලෝචනයේ පිටු අංක. 13 සිට 15 දක්වා වන සංස්ථාවේ කාර්ය සාධන වාර්තාවේ පිටු අංක. 21 සිට 44 දක්වා පෙන්වා ඇත. මෙම වාර්තා වාර්ෂික වාර්තාවේ ඒකාබද්ද කොටසකි.

#### සංස්ථාවේ සහ එහි සමාගම්වල මූල්‍ය ප්‍රකාශන

2015 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂයේ, සංස්ථාවේ සහ එහි සමාගම් වල විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) සහ මූල්‍ය කළමනාකාර විසින් අත්සන් තබා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව පිටු අංක. 62 සිට 96 දක්වා ඇති අතර, එය වාර්ෂික වාර්තාවේ ඒකාබද්ද කොටස් වේ.

#### මූල්‍ය වාර්තාකරණය සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

සංස්ථාවේ සහ එහි ආශ්‍රිත සමාගම් වල මූල්‍ය තත්වය යථා පරිදි ප්‍රතිරූපණය වන ලෙස මූල්‍ය

ප්‍රකාශන පිළියෙල කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. 1995 අංක. 15 දරන ශ්‍රී ලංකා ගණකාධිකරණ සහ විගණන ප්‍රමිතීන් මඟින් නියෝග කර ඇති පරිදි මෙම වාර්තාවේ පිටු අංක. 62 සිට 96 දක්වා වන විස්තීරණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, කැපීපෙනෙන ගණකාධිකාරී ප්‍රතිපත්ති සහ සටහන් පිළියෙල කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි.

**විගණන වාර්තාව**

2015 දෙසැම්බර් 31 දිනට අවසන්වන වර්ෂය සඳහා ඒකාබද්ද මූල්‍ය ප්‍රකාශන සහ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සංස්ථාවේ විගණකාධිපති විසින් විගණනය කරනු ලබයි. 1961 අංක. 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 13 වන වගන්තිය ප්‍රකාර, විගණකාධිපති වාර්තාව පිටු අංක. 97 සිට 145 දක්වා පෙන්වා ඇත.

**කැපී පෙනෙන ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ මෙම වර්ෂයේ සිදුකරන ලද වෙනස්කම්**

සමාලෝචිත වර්ෂයේදී, සකසා ගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්තිවල වෙනසක් සිදු නොවුණු අතර, "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" මත වන ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අංක. 01 මඟින් අපේක්ෂිත පෙර මූල්‍ය වර්ෂ වලදී ගලපාගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති සමඟ අනුගත වේ. සංස්ථාවේ සහ එහි සමාගම් වල මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ගලපාගන්නා ලද සටහන් සමඟ කැපීපෙනෙන ගණකාධිකරණ ප්‍රතිපත්ති පිටු අංක.66 සිට 96 දක්වා ඇත.

## මූල්‍ය ප්‍රතිඵල

**ආදායම සහ ප්‍රතිලාභ**

2015 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා වන සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල සාරාංශයක් සංසන්දනාත්මක දත්ත සමඟ පහත දක්වා ඇත.

| | **2015**<br>රු. බිලියන | **2014**<br>රු. බිලියන |
|---|---|---|
| ආදායම | **414.50** | **558.32** |
| **අඩුකළා : අලෙවි බදු (සුරා බදු සහ ජා. ගො.බ)** | (37.76) | (33.14) |
| ශුද්ධ අලෙවි ආදායම | **376.74** | **525.18** |
| **රේගු බදු සහ වරාය හා ගුවන්සේවා සංවර්ධන බදු හැර අලෙවි පිරිවැය** | (283.48) | (472.75) |
| **අඩුකළා : ආනයන බදු (රේගු බදු සහ වරාය හා ගුවන්සේවා සංවර්ධන බදු)** | (53.64) | (27.20) |
| දළ ලාභය | **39.62** | **25.23** |
| **වෙනත් මෙහෙයුම් ආදායම්** | 0.37 | 0.79 |
| **භූමිතෙල් සහනාධාර** | 3.86 | 2.71 |
| **අලෙවි සහ බෙදාහැරීම් වියදම්** | (13.62) | (11.53) |
| **පරිපාලන වියදම්** | (7.43) | (5.15) |
| මූල්‍ය අයකිරීම් | (15.05) | (13.98) |
| මූල්‍ය ආදායම් | 4.91 | 4.03 |
| **පිරිවැය අනුපාත විචලනය** | (32.84) | (0.97) |
| ලාභය/ (අලාභය) බදු පෙර | **(20.18)** | **1.13** |

**2015 වර්ෂයේ ආංශික අලාභය පහත දක්වා ඇත;**

| අංශය | 2015 රු. බිලි | අලාභය සඳහා හේතු |
|---|---|---|
| **ප්‍රවාහනය**<br>පෙට්‍රල් 92 ඔක්ටේන් | 26.53 | • රේගු බදු වැඩි කිරීම.<br>• ඇ.ඩො. සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම.<br>• සිල්ලර මිල ගණන් සහන මිල ගණන් යටතේ පැවතීම. |
| පෙට්‍රල් 95 ඔක්ටේන් | 2.79 | |
| **විදුලිබල උත්පාදනය**<br>දැවිතෙල් 1500 | 0.25 | • ඉල්ලුම වැඩිවීම.<br>• ජනවාරි මාසයේ රු.10 න් සහන මිල ගණන් තවදුරටත් අඩුවූ අතර ඉන්පසුව කිසිදු මිල සංශෝධනයක් සිදු නොවීය. |
| **කර්මාන්ත**<br>දැවිතෙල් 1500 | 0.26 | |
| **තාර** | 0.34 | • ඉල්ලුම අඩු වීම.<br>• ඉහළ තොග තබා ගැනීමේ පිරිවැය |
| **දේශීය**<br>භූමිතෙල් | 3.86 | • 2015 ජනවාරි සහ නොවැම්බර් මාසවලදී සහන මිල ගණන් තවදුරටත් අඩු කරන ලදී. |
| **කෘෂි**<br>කෘෂි රසායන | 0.08 | • 2015 නොවැම්බර් මාසයේදී ග්ලයිෆොසෙට් සම්පූර්ණයෙන් තහනම් කරන ලදී.<br>• රටේ කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදන පිරිවැය අඩු මට්ටමක පවත්වාගෙන යාම සඳහා සිල්ලර මිල ගණන් සාධාරණ මිල මට්ටමක පවතී. |
| **අපනයන**<br>දැවතෙල් 1500<br>දැවිතෙල් 800<br>නැප්තා | <br>3.57<br>1.78<br>0.83 | • ගබඩාකරණ පහසුකම් අඩු බැවින් හා දේශීය ඉල්ලුම අඩු බැවින් අඩු මිල ගණන් යටතේ අපනයනය කිරීමට සිදුවී ඇත. |

**බදුකරණය**

බදු වර්ෂ 2011/12 සිට වසර 05 ක කාලපරිච්ඡේදයක් සඳහා ව්‍යාපාර ප්‍රතිලාභ මත සංස්ථාව විසින් ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කර ඇත. සංස්ථාවේ අනෙකුත් ආදායම් මූලාශ්‍ර 28% ක ආදායම් බදු ගෙවීමට යටත්ව වේ.

2014 වර්ෂය තුළදී විශේෂ ගෙවීමක් ලෙස රු. බිලියන 10 ක් ගෙවීමට මහා භාණ්ඩාගාරය උපදෙස් ලබා දී ඇති අතර, 2014 වර්ෂය සඳහා රු.මිලියන 250 ක්, 2015 වර්ෂය සඳහා රු.මිලියන 750 ක් 2016 සිට 2024 දක්වා කාලපරිච්ඡේදය සඳහා වාර්ෂිකව රු. මිලියන 1,000 ක් ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස අයකිරීමට ඉල්ලා ඇත.

**දේපළ, පිරියත සහ උපකරණ**

සංස්ථාවේ දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර සහ ඒවායේ විචලනයන් මූල්‍ය ප්‍රකාශයේ සටහන 12 ලෙස පිටු අංක.78 දක්වා ඇත.

**දායක ප්‍රාග්ධනය**

2015 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ දායක ප්‍රාග්ධනය රු. මිලියන 28,500 ක් විය. එම වර්ෂයේදී, ප්‍රාග්ධන වැඩිදියුණු කිරීම් සඳහා රු. මිලියන 25,000 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලදී. මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක. 83 සටහන 19 දායක ප්‍රාග්ධනය පිළිබඳ විස්තර දක්වා ඇත.

**සංචිත**

සංස්ථාවේ සංචිතවල සාරාංශයක් පහත දක්වා ඇත;

| | **2015**<br>රු.බිලි | **2014**<br>රු.බිලි |
|---|---|---|
| ප්‍රාග්ධන සංචිත | 4.99 | 4.99 |
| රඳවාගත් ඉපැයුම් | (262.65) | (240.75) |

පිටු අංක.64 ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශයේ ස්කන්ධ විචලනයන් දක්වා ඇත.

**අධ්‍යක්ෂවරුන්**

2015 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් පහත දක්වා ඇත.

| **අධ්‍යක්ෂවරුන්ගේ නම්** | **විධායක/ විධායක නොවන තත්වය** |
|---|---|
| ටී.ජී. ජයසිංහ (සභාපති සහ ක.අ) | විධායක අධ්‍යක්ෂ |
| ඩී.සී.එස්. සෙනෙවිරත්න | විධායක නොවන අධ්‍යක්ෂ |
| එම්.ජී. ජයසේන | විධායක නොවන අධ්‍යක්ෂ |
| පී. ගලහේන | විධායක නොවන අධ්‍යක්ෂ |
| ආර්. හරිස්චන්ද්‍ර | විධායක නොවන අධ්‍යක්ෂ |
| කේ.ඒ. විමලේන්තිරරාජා | විධායක නොවන අධ්‍යක්ෂ |

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ විස්තර විගණන කමිටු රැස්වීම් පිළිබඳ පිටු අංක. 50 සහ 53 දක්වා ඇත.

වාර්ෂික වාර්තාවේ පිටු අංක. 53 අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පිළිබඳ විස්තර දක්වා ඇත.

### අධ්‍යක්ෂවරුන් වෙත ගෙවීම්

වර්ෂය තුළදී අධ්‍යක්ෂවරුන් වෙත සිදුකරන ලද ගෙවීම් පහත දක්වා ඇත.

| | 2015<br>රු. මිලි | 2014<br>රු. මිලි |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ වේතන | 2.49 | 0.83 |

### කොන්ත්‍රාත් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ රුචිකත්වය

මූල්‍ය ප්‍රකාශනවල සටහන් 31 මඟින් අධ්‍යක්ෂවරුන්ගේ කොන්ත්‍රාත් පිළිබඳ ඍජු සහ වක්‍ර රුචිකත්වය දක්වා ඇත.

### අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

අවදානම් කළමනාකරණය කිරීම සඳහා සමස්ථ වගකීම අධ්‍යක්ෂ මණ්ලය දරයි. මේ සඳහා සංස්ථාවේ ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාපිත කර ඇත. පිටු අංක. 45 සිට 49 දක්වා ඇති අවදානම් කළමනාකරණය පිළිබඳ වාර්තාවේ අවදානම් කළමනාකරණය කිරීම සඳහා සංස්ථාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග දක්වා ඇත.

## සංස්ථායික යහපාලනය

### අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් දෑ ප්‍රකාශයට පත්කරයි.

(අ) තම ව්‍යාපාරයට අදාළ නීති සහ රෙගුලාසි වෙත අනුගත වෙමින් අදාළ නීති රෙගුලාසි උල්ලංඝනය නොවන ආකාරයට සංස්ථාව පවත්වාගෙන යාම.

(ආ) සංස්ථාව සම්බන්ධවන කොන්ත්‍රාත්වල සෑම ද්‍රව්‍යමය රුචිකත්වයන්ම අධ්‍යක්ෂවරුන් විසින් ප්‍රකාශයට පත් කර ඇත.

(ඇ) උපකාරි උපකල්පන සමඟ ව්‍යාපාරයේ යහපැවැත්ම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාවේ සංස්ථායික ව්‍යාපාර සැලැස්ම විශ්ලේෂණය කරනු ලබන අතර ස්ථාවර අනාගතයක් සඳහා ප්‍රමාණවත් සම්පත් සංස්ථාව සතු බවද අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත් තත්වයක පවතී. ඒ අනුව, සංස්ථාවේ යහපැවැත්ම පදනම් කර සංස්ථාවේ සහ ආශ්‍රිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

(ඉ) මූල්‍ය, මෙහෙයුම් සහ අනුගත වීම පාලනය කිරීම් සහ අවදානම් කළමනාකරණය ආවරණය වන පරිදි අභ්‍යන්තර පාලනය පිළිබඳව සමාලෝචනයක් අධ්‍යක්ෂවරුන් විසින් සිදුකරන ලද අතර ඵලදායිතාවය සහ ඒවා වෙත සාර්ථකව අනුගත වීම සම්බන්ධව සැලකිය යුතු මට්ටමේ සහතිකයක් ලබා ගෙන ඇත.

මෙම වාර්තාවේ පිටු අංක 50 සිට 53 දක්වා සංස්ථායික පාලන වාර්තාවේ පැහැදිලිකර ඇති සංස්ථායික පාලනයේ නීති සහ රෙගුලාසි සමඟ ක්‍රියාපටිපාටිය සහ භාවිතය අනුගත වී ඇත.

### මානව සම්පත්

ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම් සහ දැක්ම යථාර්ථයක් බවට පත් කිරීමේ දී මානව සම්පත් වටිනාකම සංස්ථාව විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව, සංස්ථායික ඉලක්ක සහ අරමුණු ලඟාකර ගැනීම වෙනුවෙන් මානව සම්පත් ප්‍රාග්ධනය වැඩකිරීම සහ ඔවුන්ගේ දායකත්වය ප්‍රශස්ථ මට්ටමකට රැගෙන ඒමට විවිධ මිණුම් ලබා ගෙන ඇත. දේශීය සහ විදේශීය පුහුණු අවස්ථා ලබා දෙමින් ඔවුන්ගේ දැනුම සහ නිපුණතා අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා සෑම කණ්ඩායමකම සේවකයන් වෙත ප්‍රමාණවත් අවස්ථාවන් සලසා දීම අපගේ මානව සම්පත් ප්‍රතිපත්තිය මඟින් අවධාරණය කරයි. මානව සම්පත තුළ ඉහළ මට්ටමේ තාක්ෂණික සහ කළමනාකාරීත්ව හැකියාවන් පැවතීම සහතික කිරීම පිණිස මානව ප්‍රාග්ධනය

සංවර්ධනය කිරීම සංස්ථාවේ ප්‍රධාන අරමුණක් බවට පත්වී ඇත.

**අවසන් නොවූ නඩු**

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සංස්ථා නීතිඥවරුන්ගේ මත අනුව මූල්‍ය ප්‍රකාශයේ සටහන 30 යටතේ පෙන්වා ඇති පරිදි සංස්ථාවට එරෙහිව පවත්නා තවමත් විභාග වෙමින් පවතින නඩු, සංස්ථාවේ අනාගත මෙහෙයුම් කටයුතු හෝ සංස්ථා මූලය තත්වය කෙරේ සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි.

**නීති රෙගුලාසි වෙත අනුගත වීම**

කිසිදු නීතියක් උල්ලංඝණය වන ආකාරයේ කටයුත්තක සංස්ථාව නිරත වී නොමැත.

**පාරිසරික ආරක්‍ෂණය**

අදාළ පාරිසරික නීති රෙගුලාසි සමඟ අනුගත වීම සඳහා සංස්ථාව සම්පූර්ණ උත්සහය දරනු ලබයි.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

අධ්‍යක්ෂවරු විසින් තම දැනීමේ හා විශ්වාසය අනුව, අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත අධිකාරීන් කාලීනව සිදුකර ඇත.

**මූල්‍ය ප්‍රකාශන තත්වය දක්වන දිනයට පසුව වන සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනයට ගැලපීම් සිදු කළ යුතු භෞතික වටිනාකමක් සහිත සිදුවීම් නොමැති අතර, මූල්‍ය ප්‍රකාශනයේ දිනට පසුව ඇතිවූ ගැලපීම් පිටු අංක. 93 මූල්‍ය ප්‍රකාශයේ සටහන 32 හි දක්වා ඇත.

**යහපැවැත්ම**

අනාගතය සඳහා වන වානිජ ශක්‍යතාවය ශක්තිමත් කිරීම සහතික කිරීම සඳහා සංස්ථාවේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීමේ අරමුණ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාවේ ව්‍යාපාරික සැලැස්ම පිළියෙල කර ඇත. ඒ අනුව, යහපැවැත්ම පදනම් කොට ගෙන මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කර ඇත.

**විගණකවරු පත් කිරීම**

සංස්ථාවේ විගණකවරයා ලෙස විගණකාධිපතිවරයා කටයුතු කරයි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ඔහු එම තනතුරට පත් කර ඇත. 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 31 වන වගන්තිය ප්‍රකාරව විගණකවරුන්ගේ වැටුප් හා ප්‍රතිලාභ තීරණය කරයි.

**විගණකවරුන්ගේ වැටුප් හා ප්‍රතිලාභ සහ සංස්ථාවේ කොන්ත්‍රාත් පිළිබඳ රුචිකත්වය**

විගණක ගෙවීම් ලෙස සංස්ථාව විසින් 2015 දෙසැම්බර් 31 දිනට අවසන්වූ වර්ෂය සඳහා රු.මිලියන 1 ක් විගණකවරුන් වෙත ගෙවන ලදී.

සංස්ථාවේ හෝ එහි ආශ්‍රිත සමාගමේ කොන්ත්‍රාත් සම්බන්ධව සම්බන්ධතාවයක් හෝ රුචිකත්වයක් විගණකවරුන් වෙත නොමැති බැව් අධ්‍යක්ෂ මණ්ඩලය අවබෝධයෙන් සිටී.


**වාර්තාවේ අන්තර්ගතය පිළිබඳව පිළිගැනීම**

1961 අංක. 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වගන්තිය ප්‍රකාර, මෙම වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය අධ්‍යක්ෂ මණඩලය විසින් මෙසේ පිළිගනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් වාර්ෂික වාර්තාව අත්සන් කරනු ලැබුයේ,



ටී.ජී. ජයසිංහ
**සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ**



ඩී.සී.එස්. සෙනවිරත්න
**අධ්‍යක්ෂ**
**කොළඹ**

# විගණන කමිටු වාර්තාව

සංස්ථාවේ විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වගකියනු ලබයි. රාජ්‍ය වානිජ ව්‍යාපාර වල විගණන කමිටු පැවැත්වීම සම්බන්ධව නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛයේ සඳහන් වගකීම්, අධිකාරය සහ විශේෂිත කාර්යයන් ආවරණය කරමින් විගණන කමිටු ප්‍රඥප්තිය පිළියෙල කර ඇත.

### විගණන කමිටුවේ ප්‍රධාන වගකීම්

සංස්ථාවේ විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ උපකමිටුවක් ලෙස ක්‍රියා කරනු ලබන අතර, එහි වගකීම් සුපරීක්ෂාවට ලක් කරමින්, මූල්‍ය වාර්තා කරණය සහ අවධානම් කළමනාකරණ ක්‍රියාවලිය ස්වාධීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සහාය ලබා දෙයි. විගණන කමිටුවේ ප්‍රධාන වගකීම් පහත පරිදි වේ;

- අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණත්වය, කාල නියම කිරීම සහ පැවැත්ව සමාලෝචනය කරයි.
- ව්‍යාපාර මෙහෙයුම්වල අනුකූලතාවය අධීක්ෂණය කිරීම.
- මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ අනාවරණය කිරීමේ ප්‍රමාණවත්භාවය සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් ඇතුළුව මූල්‍ය වාර්තාකරණ රෙගුලාසි සඳහා ගැලපීම් කර ඒවාට අනුගත වෙමින් ගණකාධිකරණ ප්‍රතිපත්ති පිළිබඳව සංගතතාවය සහතික කිරීම.
- අවදානම සහ ඒවායේ බලපෑම අවම කිරීම සඳහා පියවර ගෙන ඇති අතර සංස්ථාව නිරාවරණය වනු ලබන අවදානම් සමාලෝචනය කිරීම.
- මූල්‍ය සහ මෙහෙයුම් ක්‍රියාවලීන් සහ පාලනයන්ගේ ඵලදායීත්වය ස්ථාපිත කරනු ලබන අභ්‍යන්තර විගණන පද්ධතියේ ක්ෂේත්‍රය තීරණය කිරීම.
- අභ්‍යන්තර විගණනයේ සොයා ගැනීම් සමාලෝචනය .

### විගණන කමිටු රැස්වීම සහ සංයුතිය

විගණන කමිටුව විධිමත් න්‍යාය පත්‍රයකට අනුව පවත්වන ලද අතර රැස්වීමට පෙර සංස්ථායික කළමනාකාරීත්වය මඟින් අදාළ විස්තීර්ණ පසුබිම් තොරතුරු සාමාජිකයන් වෙත ලබා දෙනු ඇත. පැහැදිලි කිරීම් සඳහා විවිධ අවස්ථාවල විගණන කමිටු රැස්වීම් සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරු සහ කළමනාකාරවරු සහභාගී වෙයි.

විගණන කමිටුව වෙත පවරන ලද රාජකාරීන් සාකච්ඡා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වන ලද අතර, ඒ සඳහා සහභාගී වන ලද කමිටු සාමාජිකයන් පහත දක්වා ඇත.

| දිනය | සහභාගී වූ ගණන | සාමාජිකයන්ගේ නම් |
|---|---|---|
| 02/03/2015 | 3 | • ඒ.කේ. සෙනෙවිරත්න මහතා (සභාපති)<br>• ඒ.එච්.එස්. විජේසිංහ මහතා<br>• ඩබ්.එස්.එම්.සී. සිරිමෙවන් මහතා |
| 06/08/2015 | 3 | • ඒ.කේ. සෙනවිරත්න මහතා (සභාපති)<br>• ඒ.එච්.එස්. විජේසිංහ මහතා<br>• ඩබ්.එස්.එම්.සී. සිරිමෙවන් මහතා |
| 28/10/2015 | 4 | • ඒ.කේ. සෙනෙවිරත්න මහතා (සභාපති)<br>• ඒ.එච්.එස්. විජේසිංහ මහතා<br>• පී. ගල්හේන මහතා<br>• ආර්. හරිස්චන්ද්‍ර මහතා |
| 04/12/2015 | 3 | • කේ.ඒ. විමලෙන්තිරරාජා මහතා (සභාපති)<br>• පී. ගල්හේන මහතා<br>• ආර්. හරිස්චන්ද්‍ර මහතා - නොපැමිණ ඇත. |

පිටු අංක. 04 සිට 06 දක්වා විගණන කමිටු සාමාජිකයන් පිළිබඳව කෙටි විස්තරයක් සපයා ඇත. ඔවුන්ගේ සාමූහික දැනුම සහ ව්‍යාපාරික, මූල්‍යමය, නීතිමය සහ අවදානම් කළමනාකරණය පිළිබඳ නිපුණතාවය සහ

පළපුරුද්ද එකට කැටිකොට තම රාජකාරීන් ඉටුකරන ලදී.

**මෙම වර්ෂයේදී කමිටුව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් සාරාංශය**

සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් පරිදි කමිටුව කටයුතු සිදුකරන ලදී;

- 2014 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශය සඳහා වන විගණකාධිපති වාර්තාව පිළිබඳව සාකච්ජා කරන ලදී.
- අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමානවත්බව කළමනාකාරීත්වය, විගණකාධිපතිවරයා සහ අභ්‍යන්තර විගණකවරු සමඟ සමාලෝචනය කරන ලදී.
- 2015 වර්ෂයේ පළමු භාගය සඳහා නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සාකච්ජා කර අවශ්‍ය නිරීක්ෂණ සිදු කිරිම.
- සංස්ථාව විසින් මුහුණ දෙනු ලබන ප්‍රධාන ක්‍රමෝපාය ගැටළු සාකච්ජා කරන ලදී.
- සංස්ථාවේ පවත්නා මූල්‍ය පැවරීම් යාන්ත්‍රණය සම්බන්ධ ගැටළු සාකච්ජා කරන ලද අතර යහපාලන මූලධර්ම අනුව එම යාන්ත්‍රණය පුනරීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමු කිරීම.
- 2016 වර්ෂය සඳහා වන වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කිරීම.

**නිගමනය**

සංස්ථාවේ අනුමත ප්‍රතිපත්ති ප්‍රකාර සංස්ථාව විසින් කළමනාකරණය කරනු ලබන කටයුතු සාධාරණ සහතික වීමක් පිළිබඳව සහ සංස්ථාවේ වත්කම් විධිමත් ලෙස ගණනය කර, ඒවා ප්‍රමාණවත් පරිදි ආරක්‍ෂා කර ඇති බවට ද විගණන කමිටුව සැහීමකට පත් වේ.



කේ.ජ්. විමලේන්තිරරාජා
**සභාපති - විගණන කමිටුව**

කොළඹ
2016 නොවැම්බර් 15.

# මූල්‍ය ප්‍රකාශන

විස්තීරණ ආදායම් ප්‍රකාශනය ........ 62
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය ........ 63
ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය ........ 64
මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශනය ........ 65
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ........ 66

# විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| දෙසැ.31 දිනට අවසන් වූ වර්ෂය සඳහා | සටහන | සංස්ථාව 2015 රු. මිලියන | සංස්ථාව 2014 (නැවත ප්‍රකාශිත) රු. මිලියන | සමූහය 2015 රු. මිලියන | සමූහය 2014 (නැවත ප්‍රකාශිත) රු. මිලියන |
|---|---|---|---|---|---|
| ආදායම | *2* | 376,734.487 | *525,182.094* | 377,261.652 | *527,168.712* |
| විකුණුම් පිරිවැය | *3* | (337,118.644) | *(499,955.539)* | (343,301.815) | *(506,834.181)* |
| **දළ ලාභය** | | **39,615.843** | ***25,226.555*** | **33,959.837** | ***20,334.531*** |
| වෙනත් මෙහෙයුම් ආදායම | *4* | 326.391 | *739.652* | 836.644 | *1,197.116* |
| භූමිතෙල් සහනාධාරය | | 3,860.000 | *2,715.000* | 3,860.000 | *2,715.000* |
| ආයෝජන දේපළ මත ආදායම | *5* | 47.590 | *51.823* | 47.590 | *51.823* |
| විකුණුම් සහ බෙදාහැරීම් වියදම් | | (13,617.902) | *(11,532.812)* | (2,957.522) | *(1,760.156)* |
| පරිපාලන වියදම් | | (2,813.565) | *(4,904.127)* | (6,391.546) | *(8,082.450)* |
| **මෙහෙයුම් ලාභය** | *6* | **27,418.357** | **12,296.090** | **29,355.002** | **14,455.864** |
| විනිමය අනුපාත විචලනය | | (32,841.590) | (967.489) | (32,841.590) | (967.489) |
| මූල්‍ය ආදායම | *7* | 4,910.347 | *4,030.057* | 4,936.157 | *4,058.754* |
| හෙජින් වියදම් | *8* | (3,864.375) | - | (3,864.375) | |
| විශේෂ ගෙවීම් | *9* | (750.000) | *(250.000)* | (750.000) | *(250.000)* |
| මූල්‍ය වියදම් | *10* | (15,048.660) | *(13,979.634)* | (15,048.660) | *(13,979.634)* |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | | **(20,175.920)** | ***1,129.025*** | **(18,213.465)** | ***3,317.495*** |
| ආදායම් බදු | *11* | (1,559.263) | - | (1,846.248) | *(275.168)* |
| **වර්ෂය සඳහා ලාභය/ (අලාභය)** | | **(21,735.183)** | ***1,129.025*** | **(20,059.713)** | ***3,042.327*** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| **ලාභය හෝ අලාභය වෙත වර්ගීකරණය නොකරන අයිතම** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම මත වන නැවතඇගයීම් ලාභ/ (අලාභය) | *21* | (167.186) | *(112.498)* | (299.648) | *(152.495)* |
| **ලාභය හෝ අලාභය වෙත නැවත වර්ගීකරණය කරනු ලබන හෝ නොලබන අයිතම** | | | | - | |
| අලෙවිය සඳහා පවත්නා මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය/ (අලාභය) | | 6.500 | - | 6.500 | - |
| **වර්ෂය සඳහා වන අනෙකුත් විස්තීර්ණ අලාභ** | | (160.686) | *(112.498)* | (293.148) | *(152.495)* |
| **පාලනය කල නොහැකි අයිතිය** | | - | - | (514.336) | *(624.435)* |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ලාභය/ (අලාභය)** | | **(21,895.869)** | **1,016.527** | **(20,867.197)** | **2,265.397** |

පිටු අංක 66 සිට 96 දක්වා සඳහන් සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත කොටසකි.

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| | | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|---|
| 2015.12.31 දිනට | සටහන | 2015<br>රු. මිලියන | 2014<br>(නැවත ප්‍රකාශිත)<br>රු. මිලියන | 2015<br>රු. මිලියන | 2014<br>(නැවත ප්‍රකාශිත)<br>රු. මිලියන |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 12 | 13,613.866 | 13,591.470 | 30,267.359 | 30,879.895 |
| ආයෝජන වත්කම් | 12.5 | 24.558 | 25.362 | 24.558 | 25.362 |
| අස්පෘශ්‍ය වත්කම් | 12.6 | - | - | 17.350 | 47.358 |
| පරිපාලිත සමාගමේ ආයෝජන | 13 | 5,000.000 | 5,000.000 | - | - |
| ජංගම නොවන මූල්‍ය වත්කම් | 14 | 36,849.405 | 10,027.557 | 36,849.405 | 10,027.557 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 15 | 11,675.654 | 12,047.778 | 11,389.949 | 11,190.663 |
| | | 67,163.483 | 40,692.167 | 78,548.621 | 52,170.835 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 16 | 41,035.111 | 63,581.753 | 41,363.947 | 63,949.846 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 15 | 27,128.594 | 43,120.185 | 30,833.435 | 44,457.037 |
| ලැබිය යුතු ආදායම් බදු | | - | 962.151 | - | 962.151 |
| කෙටිකාලීන ආයෝජන | 17 | 12,721.916 | 11,994.697 | 12,721.916 | 11,994.697 |
| මුදල් හා මුදල් සමාන දෑ | 18 | 51,058.261 | 21,474.788 | 51,806.227 | 23,384.985 |
| | | 131,943.882 | 141,133.573 | 136,725.525 | 144,748.716 |
| **මුළු වත්කම්** | | **199,107.365** | **181,825.740** | **215,274.145** | **196,919.551** |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | | | |
| දායක ප්‍රාග්ධනය | 19 | 28,500.000 | 3,500.000 | 28,500.000 | 3,500.000 |
| ප්‍රාග්ධන සංචිත | 20 | 4,992.686 | 4,992.686 | 4,992.686 | 4,992.686 |
| රඳවාගත් ඉපැයීම් | | (262,645.305) | (240,749.436) | (253,451.479) | (232,584.282) |
| පාලනය කල නොහැකි අයිතිය | | - | - | 7,096.913 | 6,582.577 |
| **මුළු ස්කන්ධය** | | (229,152.619) | (232,256.750) | (212,861.880) | (217,509.019) |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව | 21 | 861.114 | 663.950 | 2,414.251 | 2,006.254 |
| විලම්බිත බදු | 22 | - | - | 544.864 | 492.982 |
| ණය සහ ණය ගැනීම් | 23 | 341.817 | 703.481 | 1,740.668 | 2,590.131 |
| | | 1,202.931 | 1,367.431 | 4,699.783 | 5,089.368 |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළඳ ණය සහ වෙනත් ගෙවිය යුතු දෑ | 24 | 159,473.117 | 164,280.022 | 155,356.351 | 160,416.366 |
| ණය සහ ණය ගැනීම් ජංගම කොටස | 23.1 | 361.664 | 647.369 | 857.619 | 1,135.168 |
| කෙටි කාලීන ණය ගැනීම | 25 | 267,222.272 | 247,787.669 | 267,222.272 | 247,787.669 |
| | | 427,057.053 | 412,715.059 | 423,436.242 | 409,339.202 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **199,107.365** | **181,825.740** | **215,274.145** | **196,919.551** |

පිටු අංක 66 සිට 96 දක්වා සඳහන් සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත කොටසකි.

2015.12.31 දිනට අවසන්වූ වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි ආශ්‍රිත සමාගම් වල කටයුතු පිළිබඳව සත්‍ය සහ සාධාරණ සමාලෝචනයක් මෙම මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් වන අතර, මෙම වර්ෂය අලාභයකින් අවසන් වේ.

ආර්.එස්. සුන්දරලිංගම්
**වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)**

ආර්.ටී.ජී. දාබරේ
**මුදල් කළමනාකාර**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලද්දේ,

ටී.ජී. ජයසිංහ
**සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ**

M.S.S.S.Fernando
DIRECTOR
එම්.එස්.එස්.එස්.ප්‍රනාන්දු
**අධ්‍යක්ෂ**

# ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනය

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

| | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ආදායම් සංචිත | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **2014 ජන. 01 දිනට** | **3,500.000** | **4,992.686** | **(244,959.429)** | **(236,466.743)** |
| වර්ෂය සඳහා නැවත ප්‍රකාශිත ලාභය | | | 1,129.025 | 1,129.025 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | (112.498) | (112.498) |
| ලාභාංශ බදු ප්‍රතිපාදන හැරවීම | | | 170.691 | 170.691 |
| පෙර වර්ෂය සඳහා ලැබුණු සහනාධාර | | | 3,022.775 | 3,022.775 |
| **2014 දෙසැ. 31 දිනට** | **3,500.000** | **4,992.686** | **(240,749.436)** | **(232,256.750)** |
| වර්ෂය සඳහා ලාභය | | | (21,735.183) | (21,735.183) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | (160.686) | (160.686) |
| ප්‍රාග්ධන වැඩි දියුණු කිරීම් සඳහා නිකුත් කර ඇති භාණ්ඩාගාර බැදුම්කර | 25,000.000 | | - | 25,000.000 |
| **2015 දෙසැ. 31 දිනට** | **28,500.000** | **4,992.686** | **(262,645.305)** | **(229,152.619)** |

**සමූහය**

| | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ආදායම් සංචිත | කොටස්කරුවන්ගේ අරමුදල් | පාලනය කළ නොහැකි අයිතිය | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **2014 ජන. 01 දිනට** | **3,500.000** | **4,992.686** | **(238,043.145)** | **(229,550.459)** | **5,958.142** | **(223,592.317)** |
| වර්ෂය සඳහා නැවත ප්‍රකාශිත ලාභය | | | 2,417.892 | 2,417.892 | 624.435 | 3,042.327 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | (152.495) | (152.495) | | (152.495) |
| ලාභාංශ බදු ප්‍රතිපාදන හැරවීම් | | | 170.691 | 170.691 | | 170.691 |
| පෙර වර්ෂය සඳහා ලැබුණු සහනාධාර | | | 3,022.775 | 3,022.775 | | 3,022.775 |
| **2014 දෙසැ. 31 දිනට** | **3,500.000** | **4,992.686** | **(232,584.282)** | **(224,091.596)** | **6,582.577** | **(217,509.019)** |
| වර්ෂය සඳහා ලාභය | | | (20,574.049) | (20,574.049) | 514.336 | (20,059.713) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | (293.148) | (293.148) | | (293.148) |
| ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම සඳහා නිකුත් කරන ලද භාණ්ඩාගාර බැදුම්කර | 25,000.000 | | - | 25,000.000 | | 25,000.000 |
| **2015 දෙසැ.31 දිනට** | **28,500.000** | **4,992.686** | **(253,451.479)** | **(219,958.793)** | **7,096.913** | **(212,861.880)** |

පිටු අංක. 66 සිට 96 දක්වා වන සටහන මෙම මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත කොටසකි.

# මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශනය

| | | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| අවසාන වූ කාල පරිච්ඡේදය සඳහා | සටහන | 31.12.2015 | 31.12.2014 | 31.12.2015 | 31.12.2014 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවහ** | **27** | 24,947.455 | 12,467.371 | 25,324.955 | 10,880.117 |
| | | | | - | |
| පොළී ගෙවීම් | **10** | (15,048.660) | (13,979.634) | (15,282.220) | (14,384.351) |
| විශ්‍රාම පාරිතෝෂිත ගෙවීම් | **21** | (68.623) | (64.187) | (167.892) | (143.028) |
| ආදායම් බදු/ ඩබ්.එච්.ටී. ගෙවීම් | | (413.710) | (240.607) | (413.710) | (240.607) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ ශුද්ධ මුදල්** | | 9,416.462 | (1,817.057) | 9,461.133 | (3,887.869) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් වන ලැබීම් | | 36.151 | 16.216 | 36.151 | 21.006 |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම් | **12** | (972.115) | (1,116.716) | (1,162.087) | (1,325.867) |
| ආයෝජන වලින් ලද ආදායම | | 0.004 | 437.501 | 8.316 | - |
| ලැබුනු පොළී | **7** | 4,910.347 | 4,030.057 | 4,936.157 | 4,058.754 |
| භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන | | (27,817.081) | - | (27,817.081) | - |
| ස්ථිර තැන්පත් වල ආයෝජන | | 274.514 | (5,193.046) | 274.514 | (5,193.046) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්** | | (23,568.180) | (1,825.988) | (23,724.030) | (2,439.153) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ප්‍රාග්ධන ආයෝජන | | 25,000.000 | - | 25,000.000 | - |
| ලබා ගන්නා ලද අළුත් ණය/ ණය ගෙවීම් | | 16,048.986 | 28,745.610 | 14,997.932 | 28,257.810 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් (භාවිතා කළ) වලින් ශුද්ධ මුදල්** | | 41,048.986 | 28,745.610 | 39,997.932 | 28,257.810 |
| **මුදල් සහ සමාන දේ මඟින් ලද ශුද්ධ වැඩිවීම/ අඩු වීම** | | 26,897.268 | 25,102.563 | 25,735.035 | 21,930.788 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | 17,803.174 | (7,299.390) | 19,713.372 | (2,217.415) |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | **18** | **44,700.441** | **17,803.174** | **45,448.407** | **19,713.372** |

පිටු අංක. 66 සිට 96 දක්වා ඇති සටහන මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1.1 සංස්ථායික තොරතුරු

### පොදු විස්තර

1961 අංක. 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ පිහිටා ඇති රාජ්‍ය සංස්ථාවකි. අංක. 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 ලිපිනයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

මෙම ආයතනයේ ප්‍රධානතම ක්‍රියාකාරකම් නම් ඛනිජ තෙල් නිෂ්පාදන පිරිපහදු කිරීම්, අලෙවි කිරීම් සහ බෙදාහැරීම්, ආනයනය කිරීම් හා අපනයනය කිරීම් වේ.

### මව් සමාගම සහ පර්යන්ත මව් සමාගම සහ පරිපාලිත සමාගම

සංස්ථාව ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පාලනය වෙයි. අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, සංස්ථාව පාලනය කරනු ලබන ඒකකය වනුයේ ශ්‍රී ලංකා රජයයි. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොටස් 2/3 ක් සංස්ථාව සතුව පවතී.

### නිකුත් කිරීම සඳහා අධිකාරීත්වය ලබා ගන්නා දිනය

2016 සැප්තැම්බර් 07 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව 2015 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ සහ එම සමූහයේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා බලය ලබා දී ඇත.

### අනුගතවීමේ ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය සහ 1971 අංක. 38 දරණ මූල්‍ය පනතේ විධිවිධාන විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත.

## 1.2. පිළියෙල කිරීමේ පදනම

සාධාරණ වටිනාකම මත මනිනලද මූල්‍ය උපකරණ (ලැයිස්තුගත කොටස් ආයෝජන සහ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන) හැර අන් තොරතුරු උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම යටතේ පිළියෙල කර ඇත. සාධාරණ වටිනාකම මත මනින ලද මූල්‍ය උපකරණ සාධාරණ අගයට පිළියෙල කර ඇත.

### ඉදිරිපත් කිරීම සහ ශ්‍රිතිය මුදල්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් මඟින් ඉදිරිපත් කර ඇති අතර සියලුම අගයන්, විශේෂයෙන් දක්වා නොමැති අවස්ථාවල හැර, ආසන්න රුපියල් මිලියනයට වටයා ඇත.

### ඒකාබද්ද කිරීමේ පදනම

සංස්ථාවේ ආශ්‍රිත සමාගමක් වන තොග ගබඩා පර්යන්ත සමාගමේ කොටස් 2/3 ක් සංස්ථාව සතුවන බැවින් එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ද කර සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. සාමූහික මූල්‍ය ප්‍රකාශනයන් හී සංස්ථාවේ සහ තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ද කර ඇත.

### නිකුත් කරන ලද නමුත් මෙතෙක් බලාත්මක නොකරන ගණකාධිකරණ ප්‍රමිතීන්

අනාගතයේ දී ක්‍රියාත්මක විය යුතු දිනයක් සහිතව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි වරුන්ගේ ආයතනය මඟින් පහත සඳහන් එස්.එල්.එෆ්.ආර්.එස්. නිකුත් කරන ලද ප්‍රමිතීන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගෙන නැත. එම ප්‍රමිතීන් සංස්ථාව විසින් දැනට ගලපාගෙන ඇති ගණකාධිකරණ ප්‍රතිපත්ති වෙත බලපෑමක් ඇති කරනු ඇති අතර අනාගත මූල්‍ය ප්‍රකාශන වෙත බලපෑමක් ඇති කරනු ඇත.

#### අ) එස්.එල්.එෆ්.ආර්.එස්. 9 - මූල්‍ය උපකරණ : වර්ගීකරණය සහ මැණීම.

එල්.කේ.ඒ.එස්. 39 ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පළමු අදියර ලෙස නිකුත් කරන ලද SLFRS 9 මූල්‍ය

වත්කම් සහ වගකීම් වර්ගීකරණය සහ මැන බැලීම සිදු කරයි. එහි බලපෑම සංස්ථාව විසින් යථා කාලයේදී ප්‍රමාණකරණය කරනු ලබයි. 2018 ජනවාරි 01 දිනට හෝ ඉන්පසුව ආරම්භ කරනු ලබන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා මෙම ප්‍රමිතීන් මූලික වශයෙන් බලපාන ලදී. කෙසේ වෙතත්, ක්‍රියාත්මක වන දිනය පසුවට කල්තබන ලදී.

එම ප්‍රමිතින් බලාත්මක වූ විට සංස්ථාව විසින් ඒවා ගලපාගනු ලබයි. විස්තරාත්මක සමාලෝචනය අවසන්වනතුරු මෙම මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනට මූල්‍ය බලපෑම සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ නොහැක.

**ආ) එස්.එල්.එෆ්.ආර්.එස්. 15 - සේවාදායකයන් සමඟ වන කොන්ත්‍රාත් වල ආදායම**

ආදායම කොපමණද යන්න හඳුනා ගැනීම සඳහා විස්තීරණ රාමුවක් එස්.එල්.එෆ්.ආර්.එස්. 15 මඟින් ස්ථාපිත කර ඇත. එල්.කේ.ඒ.එස්. 18 ආදායම, එල්.කේ.ඒ.එස්. 11 ඉදිකිරීම් කොන්ත්‍රාත් සහ අයි.එෆ්.ආර්.අයි.සී. 13 සේවාදායක පාක්ෂිකත්ව වැඩසටහන ඇතුලත්ව පවත්නා ආදායම් හඳුනාගැනීමේ ක්‍රමවේදය මඟින් ප්‍රතිස්ථාපනය කරනු ලබයි. මෙම ප්‍රමිතීන් 2018 ජනවාරි 01 හෝ ඊට පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා බලපානු ලබයි.

සංස්ථාව මෙම ප්‍රමිතීන් ක්‍රියාත්මක වූ විට අනුගත වේ. සවිස්තරාත්මක සමාලෝචනය අවසන්වනතුරු මෙම මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත්කරනු ලබන දිනට මූල්‍ය බලපෑම සාධාරණ ලෙස ඇස්තමේන්තුගත කළ නොහැක.

## 1.3 ගණකාධිකරණ ප්‍රතිපත්ති

**ගණකාධිකරණ ප්‍රතිපත්තිවල වෙනස් වීම්**

සංස්ථාව විසින් ගලපා ගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති පෙර වර්ෂවල භාවිතා කරන ලද ප්‍රතිපත්ති සමඟ අනුගත වී ඇත.

**අඛණ්ඩ පැවැත්ම**

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය මතය. 2015 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාර රු. මිලියන 229,153 ක සෘණ ස්කන්ධ තත්වයක් සහ රු. මිලියන 21,896 ක අලාභයක් ලැබුවද සංසථාවේ මෙහෙයුම් කිසිදු ආකාරයකින් අඩපණ කිරීමේ අදහසක් සංස්ථාව සතුව නැත.

**සංසන්දනාත්මක තොරතුරු**

වඩාත් පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීම සහ පවත්නා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳිය හැකිවන පරිදි අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

**කැපීපෙනෙන ගණකාධිකරණ තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් සමඟ අනුගතවන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඇතැම් තීරණාත්මක ගණකාධිකරණ ඇස්තමේන්තු භාවිතය අවශ්‍ය වේ. සංස්ථාවේ ගණකාධිකරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේදී තම තීන්දු භාවිතා කිරීම කළමනාකාරීත්වයට අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශනවල ඉහළ මට්ටමේ තීරණ හෝ සංකූලතා අවශ්‍ය ක්ෂේත්‍ර හෝ කැපීපෙනෙන උපකල්පන සහ ඇස්තමේන්තු අවශ්‍ය ක්ෂේත්‍ර පහත දක්වා ඇත.

**විශ්‍රාම බැඳීමේ (පාරිතෝෂිත)**

විශ්‍රාම බැඳීම් වල වර්තමාන අගය උපකල්පන කීපයක් භාවිතා කරමින් ආයුගණක පදනම මත නිර්ණය කරනු ලබන කරුණු කීපයක්මත තීරණය වේ. විශ්‍රාම පිරිවැය නිර්ණය කිරීමේදී වට්ටම් අනුපාතය ඇතුළුව විවිධ උපකල්පන භාවිතා කර ඇත. විශ්‍රාම බැඳියාවේ ප්‍රමාණය සඳහා උපකල්පනයන්හි ඕනෑම වෙනසක් බලපානු ඇත.

සෑම වසරකම අවසානයේම අදාළ වැටුප් අනුපාතය කළමනාකාරීත්වය විසින් නිර්ණය කරනු ලබයි. විශ්‍රාම බැඳීම් පියවීම සඳහා අවශ්‍ය වන ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන අගය තීරණය කිරීම සඳහා මෙම

පොළී අනුපාතය භාවිතා කරනු ලබයි. වට්ටම් අනුපාතය නිර්ණය කිරීමේදී, ශ්‍රී ලංකාවේ සංස්ථායික බැඳුම්කර සඳහා ප්‍රබල වෙළඳපල ඉල්ලුමක් නොමැතිවිට රාජ්‍ය බැඳුම්කරවල පොළී අනුපාතය කළමනාකාරීත්වය විසින් සලකා බලනු ලබයි. විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා වන වෙනත් ප්‍රධාන උපකල්පන වර්තමාන වෙළඳපල තත්වයන් මත පදනම් වේ.

**අලෙවිය සඳහා පවත්නා ස්කන්ධ උපකරණ හානිකරණය**

අලෙවිය සඳහා පවත්නා ස්කන්ධ උපකරණ අඩු කිරීමේදී සංස්ථාව විසින් එල්.කේ.ඒ.එස්. 39 මාර්ගෝපදේශ අනුගමනය කරයි. මෙම නිර්ණය කිරීම සඳහා කැපී පෙනෙන තීන්දු අවශ්‍ය වේ. මෙම තීන්දු ගැනීමේදී සලකා බලනු ලබන අනෙකුත් කරුණු වලට අමතරව ආයෝජනයක සාධාරණ අගය එහි පිරිවැයට වඩා අඩුවී යම් කාලපරාසයක් පැවතීම, ආයෝජකයාගේ කෙටිකාලීන ව්‍යාපාර දර්ශනය සහ මූල්‍යමය ශක්තිමත්භාවය කාර්මික සහ ආශ්‍රික කාර්යසාධනය ඇතුළුව තාක්‍ෂණික සහ මෙහෙයුම් වෙනස්වීම් මෙන්ම මුදල් ප්‍රවාහය මූල්‍යකරණය කිරීම වැනි කරුණු කළමනාකාරිත්වය විසින් ඇගයීමට ලක් කරයි.

## 1.4 කැපී පෙනෙන ගණකාධිකරණ ප්‍රතිපත්ති සාරාංශය

### 1.4.1 ආදායම හඳුනා ගැනීම

ආයතනයක සාමාන්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීමේදී යම් කාලපරිච්ඡේදයක් තුළ ආර්ථික ප්‍රතිලාභ වල දළ ගලා ඒම සහ ස්කන්ධ හවුල්කාරීත්වයෙන් ලැබෙන දායකත්වයට අදාළ ඉහළ යාම හැර වෙනත් ස්කන්ධයන් ගලා ඒම ආදායම වේ.

වෙළඳ වට්ටම් සහ අලෙවි බදු අඩු කිරිමෙන් පසු ලැබෙන සාධාරණ අගය මඟින් ආදායම ගණනය කරයි. ආදායම හඳුනා ගැනීමේ අරමුණ සඳහා භාවිතා කිරීමට පහත සඳහන් විශේෂිත මිණුම් භාවිතා කර ඇත.

**භාණ්ඩ අලෙවිය**

භාණ්ඩ වලට අදාළ ප්‍රමාණවත් අවදානම් හා ප්‍රතිලාභ වල හිමිකම ගැණුම්කරු අතට පත්වන විට භාණ්ඩ විකිණීමේ ආදායම හඳුනාගනු ලබයි.

**පොළී ආදායම් සහ වියදම්**

පොළී වියදම් සහ ආදායම උපචිත පදනම මත හඳුනාගනු ලබයි.

**ලාභාංශ**

ගෙවීම් ලැබීමට කොටස්කරුවන්ගේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලබයි.

**කුලී ආදායම**

බදු කොන්දේසි මත රේඛිය පදනමින් කුලී ආදායම ගණනය කරනු ලබයි.

**දේපළ, පිරියත සහ උපකරණ අලෙවියෙන් ලද ලාභය/ (අලාභය)**

දේපළ, පිරියත සහ උපකරණ අලෙවියෙන් ලැබූ ලාභය/ (අලාභය), අලෙවිය සිදු කරනු ලැබූ කාලපරිච්ඡේදය තුළ හඳුනාගනු ලබන අතර, වෙනත් ආදායම් ලෙස වර්ගීකරණය කරනු ලබයි.

**ආයෝජන සුරකුම් මඟින් ලබා ගන්නා ලද ඉපැයීම් හෝ අලාභ**

ස්කන්ධ කොටස් අලෙවිය සහ මූල්‍ය උපකරණ අලෙවිය මඟින් ලබාගන්නා ලද ඉපැයීම් හෝ අලාභ එම ගනුදෙනු සිදුවන දිනයට ගණනය කර ඇත.

**භූමිතෙල් සහනාධාරය**

මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද අංක. 77IP/1/83/(1)T යන ලිපිය සහ 1971 අංක. 38 දරණ මූල්‍ය පනතේ 17 වන වගන්තිය ප්‍රකාර, පිරිවැයට වඩා අඩු මිලකට භූමිතෙල් අලෙවි කල විට සහනාධාර ලැබීමට සංස්ථාව හිමිකම් කියයි.

**වෙනත් ආදායම්**

උපචිත පදනම මත වෙනත් ආදායම් හඳුනාගෙන ඇත.

## 1.4.2 වියදම් හඳුනාගැනීම

දරන ලද පිරිවැය සහ ආදායමේ විශේෂිත ඉපැයීම් අතර වන ඍජු සම්බන්ධතාවය පදනම් කොටගෙන ආදායම් ප්‍රකාශයේ පිරිවැය හඳුනාගෙන ඇත.

**මෙහෙයුම් වියදම්**

ගෙවිය යුතු සෑම වියදමක්ම උපචිත පදනම මත අදාළ කාලපරිච්ඡේදයට ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

**බදුකරණය**

**වර්තමාන බදු**

අදාළ කාලපරිච්ඡේදය සඳහා වන බදු වියදම් තුළ වර්තමාන සහ විලම්භිත බදු අන්තර්ගත වේ. ප්‍රවර්තන පූර්ව කාලසීමාවක් සඳහා වූ ප්‍රවර්තන බදු වත්කම් හා වගකීම් ගණනය කරනුයේ බදු බලධාරින් වෙතින් ලැබිය යුතු හෝ ඔවුන් වෙත ගෙවිය යුතු යැයි අපේක්ෂිත මුදල පදනම් කරගෙනය. බදු ගණනය කිරිමට උපයෝගි කරගත් බදු අනුපාතිකය හා බදු නීති වනුයේ ශේෂ පත්‍ර දිනට බල පවත්වන හෝ ප්‍රමාණාත්මකව බලපවත්වන අනුපාතික හා නිතීන්ය.

මූල්‍ය ප්‍රකාශනයේ වාර්තා කරන ලද ආදායම් සහ වියදම් ආදායම් බදු ප්‍රතිපාදනය ගණනය කිරීම සඳහා පදනම් කර ගන්නා අතර 2006 අංක. 06 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාර ගණනය කර ඇත.

**විලම්භිත බදු**

ශේෂ පත්‍ර දිනය වන විට වත්කම් හා වගකීම් වල බදු පදනම හා මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරනීය අගය අතර වූ තාවකාලික විචලන මත වගකීම් ක්‍රමය උපයෝගී කර ගනිමින් විලම්භිත ආදායම් බදු සඳහා ප්‍රතිපාදන වෙන් කෙරෙයි.

ව්‍යාපාර සංකලනයක් නොවන ගනුදෙනුවක වත්කම් හෝ බැරකම් පිළිබඳව මූලික හඳුනාගැනීම මඟින් විලම්භිත කරන ලද ආදායම් බදු ගෙවීම හැර බදු ගෙවීම්වල සෑම තාවකාලික වෙනසක්ම විලම්භිත බදු මඟින් හඳුනාගෙන ඇති අතර, එය ගණකාධිකරණ ලාභ හෝ බදු ලාභ හෝ අලාභ වෙත බලපෑමක් නොකරයි.

අඩු කළ හැකි තාවකාලික විචනන, උපයෝගි නොකල බදු වත්කම් හා බදු අලාභ වල ඉදිරියට ගෙන ගිය අගය සඳහා වූ බදු පැනවිය හැකි ලාභයක් තිබීමේ සම්භාවිතාවක් තිබෙනතාක් හා අඩු කළ හැකි තාවකාලික විචලන උපයෝගි නොකළ බදු වත්කම් හා අලාභ වල ඉදිරියට ගෙන ගිය අගය ඒ සඳහා උපයෝගි කළ හැකි නම් අඩු කළ හැකි තාවකාලික විචලන වලට අදාළ විලම්භිත ආදායම් බදු වත්කම් හැර ව්‍යාපාරික සංකල්පයක් නොවන ගනුදෙනුවක් නොවන්නා වූද එම ගනුදෙනු අවස්ථාවේදී ගණනය කළ ලාභය හෝ බදු පැනවිය හැකි ලාභය හෝ පාඩුවට බලපෑමක් නොවන්නා වූද වත්කම් හෝ වගකීමක් මූලවරට හඳුනාගැනීමේදී පැනනගින විලම්භිත ආදායම් බදු වත්කම් පිළිගැනේ.

සෑම ශේෂ පත්‍ර දිනකම විලම්බිත ආදායම් බදු වත්කම් අගය සමාලෝචනයට පාත්‍රවි සමස්ථයක් වශයෙන් උපයෝගි කරගෙන ප්‍රමාණවත් බදු පැනවිය හැකි ලාභයක් තිබිමේ සම්භාවිතාව තවදුරටත් වෙළඳ නොවන තරමට එම විලම්භිත ආදායම් බදු වත්කමින් අඩුකෙරේ.

විලම්භිත ආදායම් බදු වත්කම් හා වගකීම් ගණනය කරනුයේ වත්කම අලෙවිකරණ හෝ වගකීම් පියවන වසරට අදාළ අපේක්ෂිත බදු අනුපාතය අනුව වන අතර, එය පදනම්ව ඇත්තේ ශේෂපත්‍ර දිනයට බලපවත්වන හෝ ප්‍රමාණාත්මකව බලපවත්වන බදු අනුපාත හා බදු නීතින්ය. ස්කන්ධයේදී සජුවම හඳුනාගෙන තිබෙන අයිතම වලට අදාළ විලම්භිත ආදායම් බදු හඳුනාගෙන තිබෙනුයේ ආදායම් ප්‍රකාශයේ නොව ස්කන්ධයේය.

**විකුණුම් බදු**

වත්කම් මිලදී ගැනීමේදී හා සේවාවන් ලබාගැනීමේදී දරන ලද විකුණුම් බදු, බදු අධිකාරින්ගෙන් අයකරගත නොහැකි අවස්ථාවන්හිදී වත්කම් හා වියදම්හි කොටසක් ලෙස හඳුනාගන්නා අවස්ථාවන්හිදී හැර ආදායම්, වියදම් හා වත්කම් විකුණුම් බදු වටිනාකම හැර හඳුනාගෙන ඇත. බදු බලධාරින්ට අදාළව ලැබිය යුතු හා ගෙවිය යුතු අලෙවි බදු මුදල ශේෂ පත්‍රයේ ලැබිය යුතු මුදල් හා ගෙවිය යුතු මුදල් යටතේ ඇතුලත්ය.

**ණය ගැනීම් සඳහා වූ පිරිවැය**

වත්කම් වල අපේක්ෂිත භාවිතය හෝ අලෙවිය සඳහා සූදානම් වීම පිණිස ප්‍රමාණවත් කාලපරිච්ඡේදයක් අවශ්‍යයෙන්ම ලබා ගන්නා වත්කම් පවරා ගැනීම්, ඉදිකිරීම් හෝ නිෂ්පාදනය කිරීම් සඳහා ඍජුවම බලපානු ලබන සාමාන්‍ය සහ විශේෂිත ණය ගැනීම් පිරිවැය, එවැනි වත්කම් අපේක්ෂිත භාවිතයට ලක්කිරීම හෝ අලෙවි කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි සූදානම් වන තුරු පිරිවැයට එකතු කර ඇත.

## 1.4.3. විදේශ විනිමය ගනුදෙනු

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරී සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ලෙස ශ්‍රී ලංකාවේ නිල මුදල් ඒකකය වන රුපියල යොදාගෙන තිබේ.

විදේශ විනිමය පදනම් කරගෙන සිදුවන ගණුදෙනු ඒ ඒ විදේශ මුදල් ඒකකයන්ට අදාළව ගණුදෙනුව සිදුව පැවති දිනයට අදාළවන විදේශ විනිමය අනුපාතිකය යොදාගෙන දේශීය ව්‍යවහාර මුදල් පදනම යොදගෙන මූලික වශයෙන් ගිණුම් වල වාර්තා කිරීම සිදුකරයි. එහිදී ඇතිවන විදේශ විනිමය වාසි හා පාඩු ආදායම් ගිණුමට ගලපනු ලබයි. විදේශ මුදල් ඒකකයන්ගේ ස්වරූපයෙන් දක්වා ඇති මූල්‍ය වත්කම් හා වගකීම් දේශීය ව්‍යවහාර මුදල් ඒකකයට අදාළව ශේෂපත්‍ර දිනයට පැවති විනිමය අනුපාත යොදාගෙන පරිවර්තනය සිදුකරනු ලබයි. මූල්‍යමය නොවන ස්වරූපයේ පවතින සියළු දෑ ඓතිහාසික පිරිවැය පදනමට අනුව එම ගනුදෙනුව සිදුවන මුල් දිනට පැවතුනු විදේශ විනිමය අනුපාතයට පරිවර්තනයකර වාර්තා කරයි.

## 1.4.4. දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත හා උපකරණ වලට අදාල එදිනෙදා සේවා වියදම් හැර සමුච්චිත ක්ෂය වීම සහ සමුච්චිත හානි කරන වටිනාකම අඩු කළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත හා උපකරණ වල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදි හඳුනා ගැනීම සඳහා වූ නිර්ණායකයන් සපුරන ලද්දේ නම් එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත. ගොඩනැගිලි සඳහා වූ සමුච්චිත ක්ෂය පිරිවැයෙන් අඩුකර ඉඩම් ගොඩනැගිලිවල අගය ගණනය කර ඇත.

වත්කමේ ශේෂ අගය, උපයෝගී කරගත හැකි ආයු කාලය හා ක්ෂය කිරීමේ ක්‍රම සෑම මුදල් වර්ෂයක අවසානයේදීම සමාලෝචනයට භාජනය වන අතර උචිත පරිදි වෙනස් කෙරේ.

**මිණුම්**

වත්කම් ලෙස සැලකෙන දේපළ පිරියත හා උපකරණ එකී වත්කම් අත්පත් කර ගැනීම හෝ ඉදිකිරීම හෝ අහඹු වියදම් සමඟ වන තක්සේරු කිරීම සඳහා ඍජුවම අදාල වන මිලට මූලික වශයෙන් මැනීම සිදු කරයි .

ස්වයං නිර්මිත වත්කම් පිරිවැය තුළ ද්‍රව්‍යමය පිරිවැය සහ ඍජු ශ්‍රමය, වත්කම් ක්‍රියාකාරි තත්වයට ගෙන ඒම සඳහා ඍජුවම අදාළ වන ඕනෑම පිරිවැයක් සහ අයිතමයන් බිඳ දැමීම සහ ඉවත් කිරීම සඳහා වන පිරිවැය සහ ඒවා පිහිටා ඇති භූමිය නැවත සකස් කිරීම සඳහා වන පිරිවැය අන්තර්ගත වේ.

**පිරිවැය ආකෘතිය**

පිරියත සහ උපකරණ සඳහා සංස්ථාව විසින් පිරිවැය ආකෘතියක් අදාල කර ගන්නා අතර, මිලදී ගන්නා හෝ ඉදිකිරීමේදී වන පිරිවැය ඒ සමඟ ඇතිවිය හැකි අනුෂාංගික වියදම්ද අඩුවෙන් ඒකරාශී කරන ලද ක්ෂය වීම සහ ඕනෑම ඒකරාශි කරන ලද හානිකරන අලාභයන්ද සමඟ වාර්තා කරනු ලබයි.

**පසු පිරිවැය**

දේපළ, පිරියත සහ උපකරණ ප්‍රතිශ්ඨාපනය කිරීමේ පිරිවැය, අයිතමන්ගේ අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ලැබේ නම් සහ එම පිරිවැය නියත වශයෙන්ම මැනිය හැකි නම් එම කොටසේ පවත්නා මිලට හඳුනාගෙන ඇත.

**ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය**

දේපළ, පිරියත හා උපකරණ අළුත්වැඩියා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා දරන ලද පිරිවැය, ඒවා දරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

**ඉවත් කිරීම**

දේපළ, පිරියත හා උපකරණවල පවත්නා වටිනාකම, ඒවා විකිණීමේදී හෝ එමගින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නොලැබෙන අවස්ථා වලදී, ඉවත් කර ඇත. දේපළ, පිරියත සහ උපකරණ ඉවත් කිරීම මගින් වන ලාභය හෝ අලාභය එම අයිතමය ඉවත් කරනු ලබන අවස්ථාවේදී අදායම් ප්‍රකාශයේ අන්තර්ගත කර ඇත.

**ක්ෂය වීම්**

වත්කම් වල විවිධ වර්ගයන්ගේ ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ආයුකාලයට අදාළ කාලපරිච්ඡේදය තුල සෘජු පදනම මත සංස්ථාව ක්‍ෂයවීම් ඉදිරිපත් කර ඇත.

දේපළ, පිරියත සහ උපකරණ ක්‍ෂවීම සඳහා වන ප්‍රතිපාදන අනුපාතික පදනම යටතේ සිදුකර ඇත. වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය පදනම්කර ගෙන සෘජු පදනමක් යටතේ ක්‍ෂයවීම් ගණනය කර ඇත.

වත්කම් වල අඩුවීමේ අගයන්, ප්‍රයෝජනවත් ආයුකාලය සහ ක්‍ෂවීමේ ක්‍රමය විශ්ලේෂණය සෑම මූල්‍ය වර්ෂයකම සිදුකර ඇති අතර අදාළ නම් ගලපා ඇත.

**කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්**

කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් පිරිවැයට දක්වා ඇත. ගොඩනැගිලි ඉදිකිරීම්, ප්‍රධාන යන්ත්‍රාගාරය සහ යන්ත්‍රසූත්‍ර සහ පද්ධති සංවර්ධනය, වැනි සෘජුවම දරන ලද ප්‍රාග්ධන මට්ටමේ වියදම් ප්‍රාග්ධනීකරණය වීමට නියමිතය.

**මූල්‍ය නොවන වත්කම් හානිකරණය කිරීම**

දේපළ පිරියත සහ උපකරණ වල ධාරණ ප්‍රමාණය නැවත අයකර ගැනිමට නොහැකි ලෙස ඇතැම් අවස්ථා වෙනස්වීම් වලදි පෙන්නුම් කරන විට ඒවා හානිකරණය කිරිම සඳහා සමාලෝචනය කරනු ලබයි. වත්කම් ධාරණ ස්වභාවය ඒවායේ නැවත අයකර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන ප්‍රමාණය සඳහා හානිකරණය වන අලාභ හඳුනාගෙන ඇත. නැවත අයකර ගත හැකි ප්‍රමාණය වනුයේ වත්කම් වල සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය සහ භාවිත අගය අඩුකිරිමේදී වන ඉහළ ප්‍රමාණයයි. හානිකරණය කිරිම ඇගයීම සඳහා වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි මුදල් ප්‍රවාහ (මුදල් උත්පාදන ඒකක) සඳහා අඩුම මට්ටමින් වත්කම් කාණ්ඩ කර ඇත. අඩු වූ මූල්‍ය නොවන වත්කම් සෑම වාර්තාකරන දිනයකදීම අඩුකිරිම ආපසු හැරවිය හැකි වන පරිදි සමාලෝචනය කර ඇත.

## 1.4.5. ආයෝජන

**පරිපාලිත සමාගම්වල ආයෝජන**

ඒකාබද්ද සහ වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වන අංක 26 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් අනුව පරිපාලිත සමාගම්හි ආයෝජන පිරිවැය ක්‍රමය යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම්ගත කොට ඇත.

ඒ අනුව, සංස්ථා ශේෂ පත්‍රයේ පරිපාලිත සමාගම් වල ආයෝජන හානිකරණය කරන ලද අලාභ අඩුකල පසු පිරිවැයට දක්වා ඇත.

**ආයෝජන වත්කම්**

**හඳුනා ගැනීමේ පදනම**

ආයෝජන දේපළ යනු කුලී ඉපැයීම සඳහා පවත්වාගෙනයන දේපළ හෝ ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා හෝ එම අවස්ථා දෙකම සඳහා රඳවා ගත් එහෙත් ව්‍යාපාරයේ සාමාන්‍ය ක්‍රියාවලියේදී අලෙවි කිරිමක් සිදුනොවන දේපළ වේ.

**මැණීම**

මූල්‍ය ප්‍රකාශනවල පිරිවැය ක්‍රමය යටතේ ආයෝජන වත්කම් ගණනය කර ඇත. ඒ අනුව, වත්කමක් ලෙස හඳුනා ගැනීමෙන් අනතුරුව, දේපළ එහි පිරිවැයෙන් සමුච්චිත ක්‍ෂයවීම් සහ හානිකරණය කරන ලද අලාභයන් අඩුකර දක්වා ඇත.

**ක්‍ෂයවීම්**

මිලදිගත් දින සිට ඉවත් කරන ලද දිනය දක්වා වත්කම්වල වර්ගයේ ඇස්තමේන්තුගත ආයුකාලය පදනම් කරගෙන සරල රේඛීයව ක්‍ෂයවීම් දක්වා ඇත.

**ඉවත්කිරීම**

ඉවතලන අවස්ථාවලදී හෝ අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති නිසා වත්කම් සම්පූර්ණයෙන්ම ඉවත් කළ විට ආයෝජන ඉවත් කරනු ලබයි.
භාවිතයේ වෙනසක් ඇති අවස්ථාවලදී පමණක් ආයෝජන දේපළ මාරු කිරීම් සිදු කරනු ලබයි.

## 1.4.6.තොග

තොග තක්සේරු කරනු ලබනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන්ම වඩාත් අඩු අගයටය. ශුද්ධ උපලබ්ධිත අගය යනු සම්පූර්ණ කිරිමට ඇස්තමේන්තුගත පිරිවැය හා අලෙවිය ක්‍රියාත්මක කිරිම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය අඩුකිරිමෙන් පසු සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක් වශයෙන් අදාළ අගයට විකිණිය හැකි මිලයි.

භාණ්ඩ තොග වර්තමාන තත්වයට ගෙන ඒමට අදාල වු පිරිවැය පහත දැක්වෙන පිරිවැය සුත්‍රයන් උපයෝගි කරගෙන ගණනය කරනු ලබයි.

| අමු ද්‍රව්‍ය | පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිල |
|---|---|
| **නිමි භාණ්ඩ**<br>අ) පිරිපහදු කරන ලද නිෂ්පාදන | සෘජු ද්‍රව්‍ය, සෘජු කුලී හා ණය ගැනීමේ පිරිවැය හැර සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවය පදනම් වු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයේ උචිත අනුපාත අගය. |
| ආ)ආනයනය | පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිල |
| **නොනිමි වැඩ,**<br>(අ)පිරිපහදු කල නිෂ්පාදන | සෘජු ද්‍රව්‍ය, සෘජු කුලී හා ණය ගැනීමේ පිරිවැය හැර සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවය පදනම් වු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයේ උචිත අනුපාත අගය |
| (ආ) ආනයන | පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිල |
| **වෙනත් නිමි භාණ්ඩ** | හරිත සාමාන්‍ය පදනම මත ගැණුම් මිල |
| **පාරිභෝජක සහ අමතර කොටස්** | හරිත සාමාන්‍ය පදනම මත ගැණුම් මිල |

## 1.4.7. වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

ඉන්ධන අලෙවිය වෙනුවෙන් සේවාදායකයන් ගෙන් ලැබිය යුතු මුදල් වෙළඳ ලැබීම් වේ. වෙළඳ ලැබීම් මූලික වශයෙන් සාධාරණ අගයට හඳුනා ගන්නා අතර ඉන්පසුව ඵලදායී පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්‍ෂය කරන ලද පිරිවැයට ගණනය කරනු ලබයි. අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දෑ හානිකරණය සඳහා වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු හඳුනා ගෙන ඇත.

## 1.4.8. මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ යනු අත ඉතිරි මුදල්, ඉල්ලුම් තැන්පතු හා වටිනාකම වෙනස්වීමේ සුලු අවධානමකට පමණක් භාජනය විය හැකි හා මුදල් වලට ක්ෂණිකව පරිවර්තනය කල හැකි කෙටි කාලීන අධිද්‍රවශීලි ආයෝජනයක් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා වන මුදල් හා මුදල් සමාන දෑ වෙත ඇතුළත් වනුයේ අත ඉතිරි මුදල් බැංකු තැන්පතු හා බැංකු අයිරා වල ශුද්ධ හිඟ අගයන්ය. කෙටි කල් පිරිමේ ආයෝජනයන්ද (එනම් ලබාගත් දිනයේ සිට තුන්මසක් හෝ ඊට අඩු) මුදල් සමාන දෑ ලෙස සැලකේ.

## 1.4.9. ප්‍රතිපාදන සහ වගකීම්

**ප්‍රතිපාදන**

ආර්ථික ප්‍රතිලාභයන් පිළිඹිබු කරන සම්පත් ගලායාමේ සම්භාවිතාවයන්ට අදාළ බැදියාව පියවීම සඳහා අවශ්‍ය වු විට බැදියාවේ අගය සම්බන්ධයෙන් විශ්වාසනීය ඇස්තමේන්තුවක් සකස් කළ හැකි වීම හා අතීත සිද්ධීන් හේතුකොටගෙන සංස්ථාවට වත්මන් (නීතිමය

හෝ සම්මුතියකින්) බැඳියාවක් තිබෙන විට ප්‍රතිපාදන හඳුනා ගැනේ. ප්‍රතිපාදන සියල්ලම හෝ ඒවායින් කොටසක් ප්‍රතිපූර්ණය කිරීම සමාගමක් අපේක්ෂා කරන විට එවැනි ප්‍රතිපූර්ණයන් හඳුනාගන්නේ වෙනම වත්කමක් වශයෙනි. නමුත් මෙය බලපෑනුයේ ප්‍රතිපූර්ණය නියත වශයෙන් සහතික නම් පමණි .කිසියම් ප්‍රතිපාදනයන් වෙනුවෙන් වූ වියදම් ඕනෑම ප්‍රතිපූර්ණයක ආදායම් ප්‍රකාශනයක ඇතුළත් කෙරේ .මුදලේ වර්තමාන කාල අගයේ බලපෑම වැදගත් නම් මුදලේ කාල අගයේ ප්‍රවර්තන වෙළඳ අගය පිළිඹිබු වන බදු අය කිරීමට පෙර අනුපාතිකයන් මත අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් හා අදාල පරිදි වගකීමට ආවේනික වූ අවදානම මත ප්‍රතිපාදන තීරණය වේ .වට්ටම් යොදා ගන්නා විට කාලයාගේ ඇවෑම නිසා ප්‍රතිපාදනයේ වැඩි වීම පොළී වියදමක් ලෙස සලකනු ලැබේ .

**පාරිතෝෂිත ප්‍රතිපාදන**

සෑම සේවකයෙක් සඳහාම සේවයේ පළමු වසර සිටම විශ්‍රාම පාරිතෝෂිත ගෙවීම සඳහා විධිවිධාන මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇත . පාරිතෝෂිත සම්බන්ධව ශේෂපත්‍රයේ එන හඳුනාගෙන ඇති වගකීම් නම් වාර්තාකරන කාල පරිච්ඡේදය අවසානයේ දී වන වගකීම් හි වර්තමාන අගයයි .LKAS - 19 මඟින් නිර්දේශ කර ඇති පරිදි ,ගණනය කරන ලද ඒකක බැරක්‍රමය භාවිතා කරමින් සංස්ථාව විසින් විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය ගණනය කරනු ලබයි. ශ්‍රී ලංකාවේ සංස්ථාපිත බැඳුම්කර සඳහා විශාල වෙළඳපලක් නොමැති අවස්ථා වලදී රජයේ බැඳුම්කර පොලී අනුපාත භාවිතයෙන් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයක් සඳහා වට්ටම් ලබා දෙමින් නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීම් වර්තමාන අගය නිර්ණය කරනු ලබයි .

අනුභූතික ගැලපීම් සහ ආයු ගණන උපකල්පන වෙනස්වීම් වලින් ඇති විය හැකි ආයු ගණන ඉපැයුම් /අලාභ ඒවා ඇති වන කාලපරිච්ඡේදයේ අනෙකුත් විස්තීරණ ආදායම් වල ස්කන්ධයට බැර කර හෝ අය කර ඇති අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයට වහාම පැරණි සේවා පිරිවැය එකතු කර ඇත .

**නිශ්චිත දායක සැලැස්ම - සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල**

අදාළ විධිවිධාන ප්‍රකාර සෑම සේවකයෙක්ම සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල වෙත හිමිකම් ලබයි. සංස්ථාව දළ වේතන වලින් 15% සහ 3% ක් ලෙස පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල වෙත දායකත්වය ලබා දෙයි.

### 1.4.10. ප්‍රාග්ධන සංචිත

රජයේ ඒකාබද්ද අරමුදලින් ලැබූ නිශ්චිත මුදල් හා ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු අලෙවියෙන් ලැබුණු සමාකාලයේ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අනුප්‍රාප්තික සමාගමේ නිකුත් කළ ප්‍රාග්ධනය ලෙස පිහිටන ශුද්ධ අගය ප්‍රාග්ධන සංචිතයට බැර කොට ඇත.

### 1.4.11. වෙළඳ ගෙවීම්

වෙළඳ ගෙවීම් යනු සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලියේදී සංස්ථාවේ සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන්ය. මෙම ගෙවීම් සාධාරණ අගය යටතේ මූලික වශයෙන් හඳුනාගනු ලබන අතර පසුව ක්‍රමක්ෂය කරනු ලබන පිරිවැයට ගණනය කරනු ලබයි.

### 1.4.12. මූල්‍ය උපකරණ

මෙම උපකරණවල ගිවිසුම්ගත විධිවිධාන සඳහා සංස්ථාව පාර්ශවයක් වන අවස්ථා වලදී මූල්‍ය වත්කම් සහ බැරකම් හඳුනාගනු ලබයි. වත්කම් තුළින් මූල්‍ය ප්‍රවාහ ලැබීම කල් ඉකුත්වන අවස්ථාවේදී හෝ එම ලැබීම් හුවමාරු කරන ලද අවස්ථාවේදී සහ අයිතිය සම්බන්ධ සෑම අවදානමක් සහ ප්‍රතිලාභයක්ම සංස්ථාව විසින් මාරුකරන ලද අවස්ථාවකදී මූල්‍ය වත්කම් ඉවත් කිරීම සිදුකරයි. කොන්ත්‍රාත්තුවේ සඳහන් ගෙවීම් ගෙවා අවසන් වූ විට, අවලංගු කරන ලද විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය බැරකම් ඉවත්කරනු ලබයි.

මූලික හඳුනා ගැනීමේදී, පහත කාණ්ඩ යටතේ සංස්ථාව විසින් මූල්‍ය උපකරණ වර්ගීකරණය කරනු ලබයි.

**(i) අලෙවිය සඳහා පවත්නා ආයෝජන**

මෙම කාණ්ඩය යටතේ නම් නොකරන ලද හෝ වෙනත් කාණ්ඩයක් යටතේ වර්ගීකරණය නොවූ හෝ ව්‍යුත්පන්න නොවන ආයෝජන අලෙවි ආයෝජන ලෙස සැලකේ. මුදල් සමාන දෑ නොවන හිමිකම් සුරැකුම්පත් වල සිදුකරනු ලබන ආයෝජන සංස්ථාවේ අලෙවිය සඳහා පවත්නා ආයෝජන තුළ අන්තර්ගත වේ. (ලැයිස්තුගත කර ඇති සහ නොමැති) මිල ගණන් දක්වන ලද හිමිකම් සුරැකුම්පත් සඳහා වන සාධාරණ අගය ක්‍රියාකාරී වෙළඳපලේ දක්වන ලද පොදු මිලට අනුකූලව ඍජුවම නිර්ණය කරනු ලබයි.

**(ii) ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ ක්‍රියාකාරි වෙළඳපලේ මිල ගණන් ඉදිරිපත් නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය ගෙවීම් සමග එන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ .

සංස්ථාවේ ණය සහ ලැබිය යුතු දෑ අතරට වෙළඳ ලැබීම් ,කාර්ය මණ්ඩලය සඳහා දෙනු ලබන ණය සහ මුදල් සමාන දෑ සහ ජංගම සහ ජංගම නොවන වත්කම් අන්තර්ගත වේ .ණය සහ ලැබීම් මූලික වශයෙන් හඳුනාගනු ලබන්නේ ලැබිය යුතු ප්‍රමාණයන්ගෙන් ණය සහ ලැබීම් වට්ටම් සහිතව සාධාරණ අගයක් දක්වා අඩු කිරීමෙන් ලැබෙන අගය වේ .ඒ අනුව ,ණය සහ ලැබීම් මනිනු ලබන්නේ , ඵලදායි පොළී ක්‍රමයෙන් අඩු කිරීම් සඳහා වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් එන ක්‍රමක්ෂිත පිරිවැය මඟිනි .

**(iii) කල්පිරෙන තෙක් දරා සිටින ආයෝජන**

කල්පිරෙන තුරු රඳවා ගැනීමට සංස්ථාවේ අභිමතය සහ හැකියාව ඇති විට නිර්ණය කරන ලද හෝ ස්ථිර ගෙවීම් සහිත මූල්‍ය වත්කම්, කල් පිරෙන තුරු රඳවා ගන්නා ආයෝජන ලෙස හැඳින්වේ.

ඵලදායී පොළී ක්‍රමය භාවිතා කර අපවය කිරීම් වෙතොත් ඒවා අඩුකර ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ආයෝජන කල්පිරෙන තුරු රඳවා ගැනීම් මූලික වශයෙන් ගණනය කිරීමෙන් පසුව ගණනය කරනු ලබයි.

සංස්ථාවේ මෙවැනි ආයෝජන කල්පිරෙන කාලය දක්වා රඳවා ගැනීමට අපේක්ෂිත භාණ්ඩාගාර බැඳුම්කර වලින් සමන්විත වේ.

**(iv) ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ වන මූල්‍ය බැරකම්**

ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේවන මූල්‍ය බැරකම් යටතට වෙළඳ ගෙවීම්, බැංකු ණය සහ දීර්ඝ කාලීන ණය ගැනේ. වෙළඳ ගෙවීම් මූලික වශයෙන් හඳුනා ගනු ලබන්නේ, ගෙවිය යුතු මුදලින් සාධාරණ අගය දක්වා ගෙවීම් අඩු කිරීම සඳහා වන වට්ටම් ලබා දුන් විට ඒවා අඩු කිරීමෙනි.

**මූල්‍ය වත්කම් හානිකරණය**

සෑම වාර්තාකරණ දිනකම, මූල්‍ය වත්කම් අපවය කිරීම පිළිබඳව සාක්ෂි තිබේදැයි සංස්ථාව විසින් ඇගයීම කරනු ලබයි. අපවය කරන ලද අලාභයේ වාස්තවික සාක්ෂි තිබේදැයි නිර්ණය කිරීමට භාවිතා කරනු ලබන නිර්ණායක පහත දක්වා ඇත.

(i) බන්ධන්දායියා ගේ කැපී පෙනෙන මූල්‍ය දුෂ්කරතා;

(ii) මූලික ගෙවීම්වල පොළී පැහැර හැරීම; සහ,

(iii) ණය ලබා ගන්නා මූල්‍යමය වශයෙන් භංගත්වයට පත් වීම හෝ වෙනත් එවැනි මූල්‍යමය දුෂ්කරතා සඳහා මුහුණ දෙනු ඇතැයි සැලකීම.

හිමිකම් සුරැකුම්පත් සඳහා, ඒවායේ පිරිවැයට අඩුවන සාධාරණ අගයේ කැපී පෙනෙන හෝ දීර්ඝ කාලීන පසුබෑමක් පැවතීම වත්කම් අපවය වන බවට සාධක ලෙස ගැනෙනු ඇත. එවැනි සාක්ෂි ඇත්නම්, පහත සඳහන් පරිදි සංස්ථාව විසින් අපවය වන අලාභ හඳුනා ගනු ඇත.

**(i) ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ වන මූල්‍ය වත්කම් :**

ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ එන මූල්‍ය වත්කම් අලාභය යනු ණය මුදලේ ක්‍රමක්ෂය කරන ලද පිරිවැය හෝ ලැබිය යුතු ණය සහ උපකරණයේ මුල්ම ඵලදායී පොළී අනුපාතය භාවිතා කරමින් වට්ටම් ලබා දීම මඟින් ඇස්තමේන්තුගත කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහයේ වර්තමාන අගය දීමනා ගිණුමක් භාවිතා කිරීම මඟින් ඍජුවම හෝ වක්‍රව මෙම ප්‍රමාණය වත්කම් වල පවත්නා අගයෙන් අඩු කරනු ලබයි.

**(ii) විකුණුම් සඳහා පවතින මූල්‍ය වත්කම් :**

අඩු කරන ලද අලාභය යනු වත්කම් වල මූලික පිරිවැය ගණනය කරන දිනයට ඒවායේ සාධාරණ අගය අතර වෙනසින්, ව්‍යුහාත්මක ආදායම් ප්‍රකාශයේ කලින් හඳුනාගෙන ඇති අඩු කරන ලද අලාභයක් වෙතොත් එය අඩු කිරීමෙන් ලැබෙන අගය වේ. මෙම ප්‍රමාණය, ශුද්ධ ආදායමට නැවත වර්ගීකරණය කරන ලද සමුච්චිත අනෙකුත් ආදායමේ අලාභය නියෝජනය කරයි.

අලාභයේ ප්‍රමාණය අඩුවේ නම් සහ එලෙස අඩුවීම් හඳුනා ගැනීමෙන් පසුව ඇතිවිය හැකි සිදුවීමක් විෂයානුබද්ධ ලෙස සම්බන්ධ කළ හැකි නම්, ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ ගණනය කරන ලද මූල්‍ය වත්කම් මත වන අඩු කරන ලද අලාභය පසු කාලපරිච්ඡේදය තුළදී ප්‍රතිවර්තනය කරනු ඇත.

විකුණුම් සඳහා වන කොටස් මත වන අලාභ අඩුවීම් ප්‍රතිවර්තනය නොවේ.

## 1.5 අවිනිශ්චිත වගකීම්, නඩු සහ ගෙවීම් සඳහා බැඳීම්

ආර්ථික ප්‍රතිලාභ හුවමාරු කිරීම නිශ්චිත නොවන අවස්ථා වලදී හෝ ස්ථිර ගණනය කළ නොහැකි විට, වර්තමාන ගෙවීම් හෝ නිශ්චිත නොවන අනාගත සිදුවීම් මගින් පමණක් පැවැත්ම තහවුරු වන ගෙවීම් අවිනිශ්චිත වගකීම් ලෙස හැඳින්වේ. ශේෂ පත්‍රයේ මෙම ගෙවීම් හඳුනාගෙන නොමැති නමුත් අසම්භාව්‍ය වගකීම් දුරස්ථ ඒවා නොවේ නම් , ඒවා අනාකරණය කර ඇත.

**2. ආදායම**

| | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | **2015** | **2014** | **2015** | **2014** |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ඛනිජ තෙල් නිෂ්පාදන වලින් ලද ශුද්ධ අලෙවි ආදායම | 376,734.487 | 525,182.094 | 376,281.320 | 525,182.094 |
| පර්යන්ත ගාස්තු සහ වෙනත් අලෙවි අදායම් | - | - | 980.332 | 1,986.618 |
| | **376,734.487** | **525,182.094** | **377,261.652** | **527,168.712** |

| **3. විකුණුම් පිරිවැය** | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | **2015** | **2014** | **2015** | **2014** |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| විකුණුම් පිරිවැය | 336,479.470 | 499,155.298 | 336,479.470 | 499,155.311 |
| මෙහෙයුම් අලාභය/ (ලාභය) | 639.174 | 800.241 | 639.174 | 800.228 |
| සෘජු වියදම් සහ වෙනත් | - | - | 6,183.171 | 6,878.642 |
| මුළු විකුණුම් පිරිවැය | **337,118.644** | **499,955.539** | **343,301.815** | **506,834.181** |

විකුණුම් පිරිවැය යටතට නිෂ්පාදන පිරිවැය සහ ආනයනික ඩී.ඊ.එස්. පිරිවැය , රේගු බදු, පී.ඒ.එල්, ණයවර ලිපි විවෘත කිරීම සහ පිළිගැනීමේ ගාස්තු, සැපයුම්කරුවන්ගේ පොළිය, වරාය ගාස්තු, අධීක්ෂණ ගාස්තු, ප්‍රවාහනය ආදී බොරතෙල් සහ ඛනිජ තෙල් ආනයනයේදී දරණ ලද පිරිවැය අන්තර්ගත වේ.

| **4. වෙනත් මෙහෙයුම් ආදායම්** | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | **2015** | **2014** | **2015** | **2014** |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| සේවක ණය පොළී | 173.181 | 145.061 | 530.950 | 379.285 |
| කුලී ආදායම | 53.938 | 50.009 | 56.030 | 45.636 |
| පිරවුම්හල් උපකරණ | 16.642 | 25.940 | 16.642 | 30.730 |
| ලාභාංශ ආදායම | 0.004 | 437.501 | 0.004 | 437.500 |
| විවිධ ආදායම් | 82.626 | 81.141 | 233.018 | 303.965 |
| | **326.391** | **739.652** | **836.644** | **1,197.116** |

විවිධ ආදායම් යටතට ස්ථිර වත්කම් මත වන ලාභ, අලෙවි අබිලි, උපකරණ කුලී ආදායම, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු , බැඳුම්කර මුදල් කිරීම, දඩ ආදිය ඇතුලත් වේ.

| | | | | |
|---|---|---|---|---|
| **5. ආයෝජන දේපල මත ආදායම** | **47.590** | **51.823** | **47.590** | **51.823** |

ආයෝජන දේපල මත වන ආදායම මල්පාර ගොඩනැගිල්ල සහ පිරවුම්හල් කුලිය අන්තර්ගත වේ.

**6.මෙහෙයුම් ලාභය**

පහත වියදම් ගෙවීමෙන් පසු මෙහෙයුම් ලාභ දක්වා ඇත.

| | සංස්ථාව | |
|---|---|---|
| **වියදම් ස්වාභාවය** | **2015** | **2014** |
| | රු. මිලියන | රු. මිලියන |
| අධ්‍යක්ෂවරුන්ගේ වේතන | 2.487 | 0.832 |
| විගණකවරුන්ගේ වේතන | 1.000 | 1.000 |
| ක්ෂය වීම් (සටහන 12) | 758.605 | 494.584 |
| කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | 2,239.969 | 1,909.652 |
| කුලී සහ අනුපාත | 52.558 | 81.019 |
| අලෙවි පිරිවැය | 336,479.470 | 499,155.298 |
| නිෂ්පාදන විචලනයන් | 639.174 | 800.241 |
| අළුත්වැඩියා සහ නඩත්තු | 177.247 | 377.378 |
| ප්‍රවාහනය | 2,623.193 | 1,993.624 |
| පර්යන්ත ගාස්තු | 8,865.130 | 7,699.539 |
| ප්‍රචාරණ වියදම් | 30.057 | 233.823 |
| නීතිමය ගාස්තු සහ වෙනත් වෘත්තීයමය ගාස්තු | 67.119 | 70.168 |
| අවසර නොදුන් වැටි | 1,280.392 | 2,741.436 |
| බොල්ණය/ කපාහරින ලද ණය | 8.405 | 3.855 |
| වෙනත් | 325.305 | 829.989 |
| **අලෙවි, විකුණුම් සහ බෙදාහැරීම් සහ පරිපාලන වියදම් එකතුව** | **353,550.111** | **516,392.438** |

| 7. මූල්‍ය ආදායම | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2015 | 2014 | 2015 | 2014 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| භාණ්ඩාගාර බිල්පත්, ස්ථිර තැන්පතු සහ ඉල්ලුම් තැන්පතු වලින් ලද පොළි ආදායම | 2,782.123 | 1,222.395 | 2,807.933 | 1,251.092 |
| නේවාසික විදේශ මුදල් ගිණුම් මත වන පොළී ආදායම | 1.045 | 1.801 | 1.045 | 1.801 |
| ණය ඉන්වොයිස් සහ කල් ඉකුත්වූ වෙළඳ ණය මත පොළී ආදායම | 42.664 | 115.698 | 42.664 | 115.698 |
| ලං.වි.ම/ පෞ.විදුලිබලාගාර/ ගුවන්තෙල් ණයකරුවන්ගෙන් ලැබූ පොළි ආදායම | 1,105.732 | 1,961.930 | 1,105.732 | 1,961.930 |
| භාණ්ඩාගාර බිල්පත් මත වන පොළී ආදායම | 978.783 | 728.233 | 978.783 | 728.233 |
| | **4,910.347** | **4,030.057** | **4,936.157** | **4,058.754** |

**8. හෙජින් වියදම**

ජාත්‍යන්තර ආරවුල් විසදීම සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථනයේදී ඩොයිෂ් බැංකුව විසින් ශ්‍රී ලංකාවට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ලබා ගන්නා ලදී. මේ සම්බන්ධව 2015 නොවැම්බර් 18 දිනැති කැබිනට් තීරණය අනුව, එකී සමතයට පැමිණීම සඳහා එමගින් සංස්ථාවට අනුමැතිය ලැබුණු අතර 2016 වර්ෂයේදී ඩොයිෂ් බැංකුව වෙත රුපි. මිලියන 3,864.375 ක් වන ඇ.ඩො. 26,562,927 ක ගෙවීමක් සිදුකරන ලදී.

| 9. මහා භාණ්ඩාගාරය සඳහා විශේෂ ගෙවීම් | | | | |
|---|---|---|---|---|
| 2014 සිට 2024 දක්වා ක්‍රියාත්මක වන පරිදි මහා භාණ්ඩාගාරය වෙත විශේෂ ගෙවීම් සිදුකර ඇත. | **750.000** | **250.000** | **750.000** | **250.000** |

| 10. මූල්‍ය වියදම් | 2015 | 2014 | 2015 | 2014 |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| දීර්ඝකාලීන ණය පොළී | 61.147 | 71.782 | 61.147 | 71.782 |
| බැංකු අයිරා පොළී | - | 30.346 | - | 30.346 |
| විදේශ විනිමය බැංකු ණය මත පොළිය | 14,975.672 | 13,156.730 | 14,975.672 | 13,156.730 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත අලාභය | - | 702.717 | - | 702.717 |
| වෙනත් මූල්‍ය පිරිවැය | 11.841 | 18.059 | 11.841 | 18.059 |
| | **15,048.660** | **13,979.634** | **15,048.660** | **13,979.634** |

**11. ආදායම් බදු**

බදු වර්ෂ 2011/2012 සිට ක්‍රියාත්මක වන පරිදි, වසර 05 ක කාල පරිච්ඡේදයක් සඳහා ව්‍යාපාරික ප්‍රතිලාභ මත ආදායම් බදු ගෙවීමෙන් සංස්ථාව ඉවත්කර ඇත. සංස්ථාව ව්‍යාපාර ප්‍රතිලාභ වලින් ඉවත්කර තිබුණද, වෙනත් ආදායම් මුලාශ්‍ර මත 28% ක ප්‍රතිශතයක ආදායම් බදු ගෙවිය යුතු වේ.

ඒ අනුව, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් 2011/2012 සිට 2012/2013 දක්වා වන බදු වර්ෂයට බදු ගෙවීම් පිළිබඳ අවසන් තීරණය ගන්නා ලද අතර 2013/2014 සිට 2015/2016 දක්වා වසර සඳහා එම පදනම අදාළ කර ගන්නා ලදි.

| | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 | 2014 | 2015 | 2014 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| වර්ෂය සඳහා ගාස්තුව | 634.384 | | 921.369 | 275.168 |
| පෙර වර්ෂය සඳහා ප්‍රතිපාදන | 924.879 | | 924.879 | - |
| එකතුව | **1,559.263** | **-** | **1,846.248** | 275.168 |

## 12 දේපළ පිරියත සහ උපකරණ

### 12.1 දළ ධාරණ පිරිවැය

| පිරිවැය | ඉඩම් හා ගොඩනැගිලි රු. මිලියන | අයිතිය ලබාගත් දේපළ රු. මිලියන | යන්ත්‍රසූත්‍ර සහ උපකරණ රු. මිලියන | SPM සංකීර්ණය රු. මිලියන | මෝටර් වාහන රු. මිලියන | ගෘහභාණ්ඩ/උප. කාර්යාලීය උප. වෙනත් වත්කම් රු. මිලියන | සංස්ථාව එකතුව රු. මිලියන | සමූහය එකතුව රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|---|
| 2015.01.01 දිනට ශේෂය | 4,318.419 | 1.016 | 8,548.810 | 2,142.422 | 514.651 | 2,151.987 | 17,677.305 | 45,015.329 |
| එකතු කිරීම් | 142.258 | | 213.668 | | 355.998 | 25.247 | 737.171 | 853.153 |
| ඉවත් කිරීම් | (0.005) | | (15.134) | | (18.859) | (13.344) | (47.342) | (59.926) |
| **2015.12.31 දිනට ශේෂය** | **4,460.672** | **1.016** | **8,747.344** | **2,142.422** | **851.790** | **2,163.890** | **18,367.134** | **45,808.556** |

### 12.2 ක්‍ෂය වීම්

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2015.01.01 දිනට ශේෂය | 472.499 | 0.397 | 3,798.963 | 1,290.634 | 281.260 | 1,501.459 | 7,345.212 | 17,452.179 |
| වර්ෂය සඳහා ගාස්තු | 138.976 | | 626.620 | | 76.393 | 91.790 | 933.779 | 1,758.683 |
| ඉවත් කිරීම් | | | (12.449) | | (18.859) | (0.095) | (31.403) | (43.987) |
| 2015.12.31 දිනට හේෂය | 611.475 | 0.397 | 4,413.134 | 1,290.634 | 338.794 | 1,593.154 | 8,247.588 | 19,166.875 |
| **2015.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම** | **3,849.197** | **0.619** | **4,334.210** | **851.788** | **512.996** | **570.736** | **10,119.546** | **26,641.681** |
| 2014.12.31 දිනට ගාස්තුව | 4,318.419 | 1.016 | 8,548.810 | 2,142.422 | 514.651 | 2,151.987 | 17,677.305 | 45,015.329 |
| 2014.12.31 දිනට ගිණුම්ගත ක්‍ෂය වීම් | 472.499 | 0.397 | 3,798.963 | 1,290.634 | 281.260 | 1,501.459 | 7,345.212 | 17,452.179 |
| **2014.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම** | **3,845.920** | **0.619** | **4,749.847** | **851.788** | **233.391** | **650.528** | **10,332.093** | **27,563.150** |

### 12.3 කරමින් පවතින ව්‍යාපෘති සහ ස්ථාවර වත්කම්

| | සංස්ථාව 31.12.2015 රු.මිලියන | සංස්ථාව 31.12.2014 රු.මිලියන | සමූහය 31.12.2015 රු.මිලියන | සමූහය 31.12.2014 රු.මිලියන |
|---|---|---|---|---|
| පිරිපහදු නවීකරණ ව්‍යාපෘතිය | 837.034 | 837.628 | 837.034 | 837.628 |
| ගොඩනැගිලි | 84.870 | 126.275 | 84.870 | 126.275 |
| පිරියත හා යන්ත්‍ර | 2,255.266 | 2,119.661 | 2,255.266 | 2,119.661 |
| ගබඩා කිරිමේ පහසුකම් | 128.188 | 70.024 | 128.188 | 70.024 |
| පිරවුම්හල් නවීකරණය කිරීම | 4.042 | 3.736 | 4.042 | 3.736 |
| වෙනත් | 184.920 | 102.053 | 316.277 | 159.421 |
| | **3,494.320** | **3,259.377** | **3,625.678** | **3,316.745** |

### 12.4 ශුද්ධ පොත් අගය

| | | | | |
|---|---|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | 10,119.546 | 10,332.093 | 26,641.681 | 27,563.150 |
| වත්කම් හා කරගෙන යන ප්‍රග්ධන ව්‍යාපෘතිය | 3,494.320 | 3,259.377 | 3,625.678 | 3,316.745 |
| **දේපළ, පිරියත හා උපකරණ වල මුළු ධාරණ අගය** | **13,613.866** | **13,591.470** | **30,267.359** | **30,879.895** |

### 12.5 ආයෝජන වත්කම්

| | 31.12.2015 රු.මිලියන | 31.12.2014 රු.මිලියන | 31.12.2015 රු.මිලියන | 31.12.2014 රු.මිලියන |
|---|---|---|---|---|
| **පිරිවැය** | | | | |
| 01.01 දිනට ශේෂය | 33.570 | 33.570 | 33.570 | 33.570 |
| එකතු කිරීම් | | | - | |
| 31.12. දිනට ශේෂය | 33.570 | 33.570 | 33.570 | 33.570 |
| **ක්ෂය වීම්** | | | | |
| 01.01 දිනට ශේෂය | 8.208 | 7.404 | 8.208 | 7.404 |
| එකතු කිරීම් වර්ෂය සඳහා | 0.804 | 0.804 | 0.804 | 0.804 |
| 31.12. දිනට ශේෂය | 9.012 | 8.208 | 9.012 | 8.208 |
| **ශුද්ධ පොත් අගය** | **24.558** | **25.362** | **24.558** | **25.362** |

ශේෂපත්‍ර දිනට සාධාරණ අගය ගණනය කිරීමක් සිදු වී නොමැති අතර, වර්ෂ 2016 දී වෘත්තීමය තක්සේරුවක් ලබා ගැනීමට පියවර ගනු ලැබේ.

**12.6** අස්පෘෂ්‍ය වත්කම්

| | සැප් පද්ධතිය | සැප් ඊ.ආර්.පී. භාවිතය ස්වයංක්‍රීය කරණය බලපත්‍ර | පද්ධතිය | එකතුව |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **පිරිවැය** | | | | |
| 2015.01.01 දිනට ශේෂය | 412.496 | 9.380 | 37.793 | 459.669 |
| එකතු කිරීම් | - | - | - | - |
| ඉවත් කිරීම් | - | - | - | - |
| **2015.12.31 දිනට ශේෂය** | 412.496 | 9.380 | 37.793 | 459.669 |
| **සමුච්චිත ක්‍රමක්ෂය කිරීම** | | | | |
| 2015.01.01 දිනට ශේෂය | 391.037 | 4.234 | 17.040 | 412.311 |
| වර්ෂය සඳහා ගාස්තුව | **20.419** | **0.930** | 8.659 | 30.008 |
| ඉවත් කිරීම් | - | - | - | - |
| **2015.12.31 දිනට ශේෂය** | 411.456 | 5.164 | 25.699 | 442.319 |
| **2015.12.31 දිනට ශේෂය** | **1.040** | **4.216** | **12.094** | **17.350** |
| **2014.12.31 දිනට ශේෂය** | 21.459 | 5.146 | 20.753 | 47.358 |

**12.7** වත්කම් ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි ඇස්තමේන්තුගත කර ඇ

| | **2015 දෙසැ.31** | **2014 දෙසැ.31** |
|---|---|---|
| ගොඩනැගිලි | වසර 40 | වසර 40 |
| නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල | වසර 50 | වසර 50 |
| පිරිපහදු නල පද්ධතිය සහ ටැංකි | වසර 40 | වසර 40 |
| පිරිපහදු යන්ත්‍රාගාරය සහ යන්ත්‍ර සූත්‍ර | වසර 10 | වසර 10 |
| වෙනත් ස්ථානවල පවත්නා ටැංකි | වසර 40 හෝ වසර 20 | 40 හෝ වසර 20 |
| වෙනත් ස්ථානවල පවත්නා නල පද්ධතිය | වසර 10 හෝ වසර 5 | 10 හෝ වසර 5 |
| යන්ත්‍රාගාරය සහ යන්ත්‍ර සූත්‍ර | වසර 10 හෝ වසර 5 | 10 හෝ වසර 5 |
| බවුසර් සහ ටැංකි ලොරි | වසර 5 | වසර 5 |
| වෑන් සහ බස් | වසර 4 | වසර 4 |
| 1999.12.31 දිනට ගෘහ භාණ්ඩ/ කට්ටල සහ කාර්යාලීය උපකරණ | වසර 3 | වසර 3 |
| එස්.පී.එම්. පරිශ ටැංකි සංකීර්ණය | වසර 40 | වසර 40 |
| නල පද්ධතිය | වසර 20 | වසර 20 |
| බෝයාව | වසර 10 | වසර 10 |
| මත්තල ගුවන්තෙල් සංකීර්ණය - ඉන්ධන ජලෝද්ගමනය | වසර 40 | වසර 40 |
| ඉන්ධන ජලෝද්ගමන පද්ධතිය | වසර 40 | වසර 40 |
| ටැංකි | වසර 40 | වසර 40 |
| ඉදිරිකිරීම් සහ ගොඩනැගිලි | වසර 40 | වසර 40 |
| නල මාර්ග | වසර 40 | වසර 40 |
| අභ්‍යන්තර මාර්ග පද්ධතිය සහ වැට් | වසර 20 | වසර 20 |
| ගැන්ට්‍රි සහ පොම්ප | වසර 10 | වසර 10 |
| මීටර් සවිකිරීම් සහ විද්‍යුත් පද්ධතිය | වසර 10 | වසර 10 |
| ගිනි නිවීමේ පද්ධතිය | වසර 10 | වසර 10 |
| වෙනත් වත්කම් | වසර 08 | වසර 08 |

| 13 පරිපාලිත සමාගම් වල ආයෝජන | සංස්ථා | | සමූහය | |
|---|---|---|---|---|
| | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **පරිපාලිත සමාගම්වල ආයෝජන (ලයිස්තුගත නොවූ)** | | | | |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 5,000.000 | 5,000.000 | - | - |
| | **5,000.000** | **5,000.000** | **-** | **-** |

| 14 ජංගම නොවන මූල්‍ය වත්කම් | | සංස්ථා | | සමූහය | |
|---|---|---|---|---|---|
| | | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
| | සටහන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ලයිස්තුගත ස්කන්ධ ආයෝජන | 14.1 | 39.500 | 33.000 | 39.500 | 33.000 |
| ලයිස්තුගත නොවූ ස්කන්ධ ආයෝජන | 14.2 | 5.626 | 5.626 | 5.626 | 5.626 |
| ස්කන්ධ නොවන ආයෝජන | 14.3 | 36,804.279 | 9,988.931 | 36,804.279 | 9,988.931 |
| | | **36,849.405** | **10,027.557** | **36,849.405** | **10,027.557** |

| **14.1.ලයිස්තුගත ස්කන්ධ ආයෝජන** | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ලංකා සිමෙන්ති සමාගම | | | | |
| 5,000,000 සාමාන්‍ය කොටස් සඳහා එකකට රු. 10/- බැගින් ගෙවන ලද | 33.000 | 33.000 | 33.000 | 33.000 |
| සාධාරණ අගය ස්කන්ධය වෙත මාරු කිරීම | 6.500 | - | 6.500 | - |
| | **39.500** | **33.000** | **39.500** | **33.000** |

| **14.2. ලයිස්තුගත නොවූ ස්කන්ධ ආයෝජන** | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම** | | | | |
| එකකට රු. 10/- බැගින් සාමාන්‍ය කොටස් 61,206 | | | | |
| සම්පූර්ණයෙන් ගෙවන ලද | 0.539 | 0.539 | 0.539 | 0.539 |
| **ලංකා ලේලන්ඩ් සමාගම** | | | - | |
| එකකට රු. 10/- බැගින් සාමාන්‍ය කොටස් 100 | | | - | |
| සම්පූර්ණයෙන් ගෙවන ලද | 0.001 | 0.001 | 0.001 | 0.001 |
| **ඉන්ටර්නැෂනල් කෝපරේටිව් පෙට්‍රෝලියම් ඇසෝසියේෂන්** | | | - | |
| එකකට ඇ.ඩො.100/- බැගින් සම්පූර්ණයෙන් ගෙවන ලද කොටස් 5,499 | | | - | |
| ඇ.එ. ජනපදයේ දී නීතිගත කරනලද | 5.086 | 5.086 | 5.086 | 5.086 |
| | **5.626** | **5.626** | **5.626** | **5.626** |

අලෙවි සඳහා වන ආයෝජන ලෙස වර්ගීකරණය කරන ලද ලයිස්තුගත නොවූ ආයෝජන පිරිවැයට දක්වා ඇත.
වර්තාකරණ දිනටම ණය අවදානම සඳහා උපරිම නිරාවරණය වීම අලෙවිය සඳහා වර්ගීකරණය කරන ලද ස්කන්ධ ආරක්ෂණවල ධාරක වටිනාකමින් දැ
අලෙවිය සඳහා වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් කිසිවක් හිඟ හෝ ක්‍රමක්ෂය කර නැත.

| **14.3.ස්කන්ධ නොවන ආයෝජන** | | | | |
|---|---|---|---|---|
| ස්ථිර තැන්පතුවල ආයෝජන | 5.000 | 5.000 | 5.000 | 5.000 |
| භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන | 36,799.279 | 9,983.931 | 36,799.279 | 9,983.931 |
| | **36,804.279** | **9,988.931** | **36,804.279** | **9,988.931** |

**15 .** වෙළඳ හා වෙනත් ලැබීම්

සංස්ථාව

| | 2015 දෙසැ. 31 දිනට | | 2014 දෙසැ. 31 දිනට | |
|---|---|---|---|---|
| | පුනරාවර්තන රු. මිලියන | පුනරාවර්තන නොවන රු. මිලියන | පුනරාවර්තන රු. මිලියන | පුනරාවර්තන නොවන රු. මිලියන |
| වෙළඳ ලැබීම් | 18,734.681 | | 36,879.360 | |
| වෙනත් ලැබීම් | 5,128.789 | 8,254.993 | 2,795.620 | 9,827.130 |
| තැන්පතු | 21.700 | 719.374 | 24.818 | 82.448 |
| අත්තිකාරම් | 2,924.956 | | 3,091.563 | |
| පෙර ගෙවීම් | 269.424 | | 278.562 | |
| සේවකයින් වෙත ණය සහ අත්තිකාරම් ගෙවීම් | 49.044 | 2,701.287 | 50.262 | 2,138.200 |
| | **27,128.594** | **11,675.654** | **43,120.185** | **12,047.778** |

සමාගම

| | 2015 දෙසැ. 31 දිනට | | 2014 දෙසැ. 31 දිනට | |
|---|---|---|---|---|
| | පුනරාවර්තන රු. මිලියන | පුනරාවර්තන නොවන රු. මිලියන | පුනරාවර්තන රු. මිලියන | පුනරාවර්තන නොවන රු. මිලියන |
| වෙළඳ ලැබීම් | 18,539.258 | - | 34,443.092 | - |
| වෙනත් ලැබීම් | 5,542.795 | 7,969.288 | 4,241.119 | 9,000.520 |
| තැන්පතු | 229.147 | 719.374 | 223.750 | 51.940 |
| අත්තිකාරම් | 2,924.956 | - | 3,091.563 | |
| පෙර ගෙවීම් | 1,063.985 | - | 278.562 | |
| සේවකයින් වෙත ණය සහ අත්තිකාරම් ගෙවීම් | 2,533.294 | 2,701.287 | 2,178.951 | 2,138.203 |
| | **30,833.435** | **11,389.949** | **44,457.037** | **11,190.663** |

වාර්ෂිකව 10% ක් වන වෙළඳපල පදනම් කරගත් පොළී අනුපාතය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමෙන් කාර්ය මණ්ඩල ණය වල සාධාරණ අගය (ආපදා ණය හැර) යටතේ මූලිකව හඳුනාගෙන ඇත.
2015 දෙසැ. 31 දිනට, රු. මිලියන 52.099 ක් වන වෙළඳ ලැබීම් ක්‍රමක්ෂය කරන ලදී. 2015 දෙසැ.31 දිනට ක්‍රමක්ෂය කරන ලද ප්‍රමාණය රු. මිලියන 8.219 කි.
මෙම වෙළඳ ලැබීම්වල කාලය පහත දක්වා ඇත.

| | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
|---|---|---|
| වසර 2- 3 දක්වා | 8.654 | 4.635 |
| වසර 4 - 5 දක්වා | 4.837 | 2.118 |
| වසර 5 ට වැඩි | 38.608 | 38.519 |
| | **52.099** | **45.272** |

වෙළඳ ලැබීම් හානිකරණය කිරීම සඳහා වන ප්‍රතිපාදනහි හැසිරීම පහත දක්වා ඇත.

| | 2015 දෙසැ. 31 දිනට රු. මිලියන | 2015 දෙසැ. 31 දිනට රු. මිලියන |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | 45.272 | 42.491 |
| අඩුකළා : පියවා ගන්නා ලද ප්‍රමාණය | (1.391) | (0.426) |
| අඩුකළා : බොල් ණය | (0.001) | (0.027) |
| එකතු කළා : වර්ෂය සඳහා වන ප්‍රතිපාදන | 8.219 | 3.234 |
| දෙසැ. 31 දිනට ශේෂය | **52.099** | **45.272** |

| 15 (අ) කාණ්ඩ වශයෙන් වන මූල්‍ය උපකරණ | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| මූල්‍ය තත්වය අනුව වන වත්කම් | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 38,804.249 | 55,167.964 | 40,964.724 | 55,647.700 |
| අලෙවිය සඳහා වන ආයෝජන (ලයිස්තු ගත හා ලයිස්තු ගත නොවූ) | 45.126 | 38.626 | 45.126 | 38.626 |
| ස්ථිර තැන්පතු මත ආයෝජන | 7,720.073 | 11,321.688 | 7,720.073 | 11,321.688 |
| ඉතිරි කිරීම් මත වන ආයෝජන | 4,000.109 | 678.009 | 4,000.109 | 678.009 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත වන ආයෝජන | 37,806.012 | 9,983.931 | 37,806.012 | 9,983.931 |
| අතැති මුදල් සහ බැංකුවේ අතැති මුදල් | 51,058.261 | 21,474.788 | 51,778.060 | 21,474.788 |
| **එකතුව** | **139,433.830** | **98,665.006** | **142,314.104** | **99,144.742** |

| මූල්‍ය තත්වය අනුව වන වගකීම් | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ණය ගැනීම් | 267,583.936 | 248,435.037 | 269,759.291 | 248,435.037 |
| මූල්‍ය නොවන වගකීම් හැර වෙළඳ සහ වෙනත් ගෙවීම් එකතුව | 159,473.117 | 164,280.022 | 161,064.507 | 164,280.022 |
| **එකතුව** | **427,057.053** | **412,715.059** | **430,823.798** | **412,715.059** |

| **16.** තොග | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| බොරතෙල් | 12,336.721 | 16,731.368 | 12,336.721 | 16,731.368 |
| වෙනත් අමුද්‍රව්‍ය | 870.473 | 934.465 | 870.473 | 934.465 |
| නිමි නිෂ්පාදන | 25,493.467 | 43,527.759 | 25,493.466 | 43,527.759 |
| වෙනත් ද්‍රව්‍ය සහ සැපයුම් | 2,732.211 | 2,768.295 | 3,061.048 | 3,334.592 |
| අඩුකළා - මන්දගාමී ලෙස විචලනය වන අයිතම සඳහා වන ප්‍රතිපාදන | (397.761) | (380.134) | (397.761) | (578.338) |
| | **41,035.111** | **63,581.753** | **41,363.947** | **63,949.846** |

| **17** කෙටි කාලීන ආයෝජන | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| | | | - | |
| බැංකු තැන්පතු | 11,720.182 | 11,994.697 | 11,720.182 | 11,994.697 |
| රජයේ බැඳුම්කර | 1,001.734 | - | 1,001.734 | - |
| | **12,721.916** | **11,994.697** | **12,721.916** | **11,994.697** |

| **18.** මුදල් සහ මුදල් සමාන දෑ | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **මුදල් සහ මුදල් සමාන දේ සඳහා අදාළ උපාංග** | | | | |
| බැංකුවේ සහ අතැති මුදල් | 51,058.261 | 21,474.788 | 51,806.227 | 23,384.985 |

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා පහත සඳහන් මුදල් හා මුදල් සමාන දෑ අන්තර්ගත වේ.

| | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| මුදල් හා මුදල් සමාන දෑ | 51,058.261 | 21,474.788 | 51,806.227 | 23,384.985 |
| බැංකු අයිරා (සටහන 25) | (2,738.249) | - | (2,738.249) | - |
| | **48,320.012** | **21,474.788** | **49,067.978** | **23,384.985** |
| එකතු කළා/ අඩු කළා - විදේශ මුදල් පරිවර්තන සඳහා ගැලපීම් | (3,619.571) | (3,671.614) | (3,619.571) | (3,671.613) |
| | 44,700.441 | 17,803.174 | 45,448.407 | 19,713.372 |

**19.** දායක ප්‍රාග්ධනය

| | 2015 දෙසැ. 31 දිනට<br>රු. මිලියන | 2015 දෙසැ. 31 දිනට<br>රු. මිලියන |
|---|---|---|
| 1961 අංක. 28 දරණ පනතේ 23 වන වගන්තිය ප්‍රකාර මූලික දායකත්වය | 10.000 | 10.000 |
| 1964 අංක. 23 දරණ අදාළ කර ගැනීමේ පනත මඟින් ප්‍රකාශිත | 4.000 | 4.000 |
| 1967 අංක. 15 දරණ අදාළ කර ගැනීමේ පනත මඟින් ප්‍රකාශිත | 20.000 | 20.000 |
| 1976 ප්‍රාග්ධන මත කළ දායකත්වය | 60.000 | 60.000 |
| 1979 ප්‍රාග්ධනය මත කළ දායකත්වය | 13.110 | 13.110 |
| 1980 ප්‍රාග්ධනය මත කළ දායකත්වය | 10.710 | 10.710 |
| **ශ්‍රී ලංකා රජය මඟින් සිදුකළ මුළු දායකත්වය** | **117.820** | **117.820** |
| 1987 රාජ්‍ය සංචිත මඟින් කළ මාරු කිරීම් | 750.000 | 750.000 |
| 1987 රඳවාගත් ලාභ මඟින් කළ මරු කිරීම් | 132.180 | 132.180 |
| මහා භාණ්ඩාගාරය විසින් රඳවාගත් තොග ගබඩා පර්යන්ත සමාගමේ 1/3 ක කොටස් මාරු කිරීම් | 2,500.00 | 2,500.00 |
| 2015 මහා භාණ්ඩාගාරය විසින් කළ ප්‍රාග්ධන වැඩි දියුණු කිරීම් සඳහා නිකුත් කළ භාණ්ඩාගාර ඇපකර | 25,000.00 | - |
| | **28,500.00** | **3,500.00** |

බලයලත් ප්‍රාග්ධන ප්‍රමාණයක් පාර්ලිමේන්තුව විසින් නියමකර නොමැත.

| **20.** ප්‍රාග්ධන සංචිත | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| දෙසැ. 31 දිනට ශේෂය | 4,992.686 | 4,992.686 | 4,992.686 | 4,992.686 |

2003 වර්ෂයේදී, තොග ගබඩා පර්යන්ත සමාගම වෙත වත්කම් හුවමාරු කිරීමේදී පොත් වටිනාකමට සිදු කරන ලදී. ඉන්පසුව පුද්ගලීකරණය ක්‍රියාවලියේදී එකඟ වූ ආකාරයට වටිනාකම පදනම් කර ඉහත ගනුදෙනු වාර්තා කිරීමට තීරණය විය. මෙහි බලපෑම ප්‍රාග්ධන සංචිත යටතේ ගලපන ලදී.

| **21.** විශ්‍රාම ප්‍රතිලාභ බැදීයාව | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ජනවාරි 01 දිනට ශේෂය | 648.362 | 522.521 | 1,990.666 | 1,739.542 |
| අඩුකළා - වර්ෂය තුළදී සිදුකළ ගෙවීම් | (68.623) | (64.187) | (167.891) | (143.028) |
| | 579.739 | 458.334 | 1,822.775 | 1,596.514 |
| එකතු කළා - වර්තමාන සේවා පිරිවැය | 40.628 | 31.697 | 129.441 | 110.633 |
| පොළී පිරිවැය | 57.973 | 45.833 | 146.798 | 131.024 |
| ආයු ගණන (ඉපැයුම්)/ අලාභ | 167.186 | 112.498 | 299.648 | 152.495 |
| | 845.526 | 648.362 | 2,398.663 | 1,990.666 |
| එකතු කළා -චීන වරාය/එල් එල් එල්/නයිලෝන්/සී.පී.එස්.ටී.එල් සේවකයින්ගේ ප්‍රතිල | 15.588 | 15.588 | 15.588 | 15.588 |
| | **861.114** | **663.950** | **2,414.251** | **2,006.254** |
| | | | | |
| **විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගන්නා ලද ප්‍රමාණයන් පහත දක්වා ඇත.** | | | | |
| වර්තමාන සේවා පිරිවැය | 40.628 | 31.697 | 129.441 | 110.633 |
| පොළී පිරිවැය | 57.973 | 45.833 | 146.799 | 131.024 |
| **එකතුව, සේවක මණ්ඩල පිරිවැය ඇතුල් කර ඇත.** | **98.601** | **77.530** | **276.240** | **241.657** |

| **මූලික ආයු ගණන උපකල්පන පහත පරිදි වේ.** | | |
|---|---|---|
| අපේක්ෂිත වැටුප් වර්ධක | 1% | 1% |
| අපේක්ෂිත සේවක මණ්ඩල පිරිවැටුම | 3.8% | 4% |
| පොළිය/ වට්ටම් අනුපාත | 10% | 10.0% |
| සේවක සංඛ්‍යාව | 2,579 | 2,662 |

| **22. විලම්භිත බදු** | **සමාගම** | |
|---|---|---|
| | **2015 දෙසැ. 31 දිනට** | **2014 දෙසැ. 31 දිනට** |
| | **රු. මිලියන** | **රු. මිලියන** |
| කාල පරිච්ඡේදය ආරම්භයේදී ශේෂය | 492.982 | 394.660 |
| ඌන/ (අතිරික්ත) ප්‍රතිපාදන | - | 5.566 |
| තාවකාලික වෙනස්කම් උත්පාදනය සහ පුනරීක්ෂණය | 51.882 | 92.756 |
| **කාල පරිච්ඡේදය අවසානයේදී ශේෂය** | **544.864** | **492.982** |
| | | |
| විලම්භිත බදු වත්කම් | (315.773) | (348.276) |
| විලම්භිත බදු | 860.637 | 841.258 |
| **ශුද්ධ විලම්භිත බදු** | **544.864** | **492.982** |

| **22.1 විලම්භිත බදු වත්කම් සහ වගකීම් හඳුනා ගැනීම්** | **2015 දෙසැ. 31 දිනට රු. මිලියන** | | **2014 දෙසැ. 31 දිනට රු. මිලියන** | |
|---|---|---|---|---|
| | තාවකාලික වෙනස්කම් | විලම්භනය කරන ලද බදු ගෙවීම්/ වත්කම් | තාවකාලික වෙනස්කම් | විලම්භනය කරන ලද බදු ගෙවීම්/ වත්කම් |
| **විලම්භිත බදු වගකීම්** | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 8,606.367 | 860.637 | 8,412.583 | 841.258 |
| | | | | |
| **විලම්භිත බදු වත්කම්** | | | | |
| තොග | (195.546) | (19.554) | (198.204) | (19.820) |
| ප්‍රතිපාදන | (172.058) | (17.206) | (141.941) | (14.194) |
| සේවක ප්‍රතිලාභ සැලැස්ම | (1,553.136) | (155.314) | (1,342.304) | (134.231) |
| බදු අලාභ | (1,236.988) | (123.699) | (1,800.311) | (180.031) |
| | 5,448.639 | 544.864 | 4,929.823 | 492.982 |

**23** ණය සහ ණය ගැනීම්

| | සංස්ථාව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2015 දෙසැ. 31 දිනට<br>රු. මිලියන | 2014 දෙසැ. 31 දිනට<br>රු. මිලියන | 2015 දෙසැ.31 දිනට<br>රු. මිලියන | 2014 දෙසැ. 31 දිනට<br>රු. මිලියන |
| **පර්යන්ත සමාගම වෙත අනුයුක්ත නොකරන ලද දීර්ඝ කාලීන ණය** | | | | |
| මහා භාණ්ඩාගාර ණය (ආ.සං.බැ.) | 341.817 | 417.776 | 341.817 | 417.776 |
| **පර්යන්ත සමාගම වෙත අනුයුක්ත කළ ණය** | | | - | |
| භාණ්ඩාගාර (එක්සිම් බැංකුව) ණය | - | 285.705 | - | 285.705 |
| **මහජන බැංකුව** | | | 1,398.851 | 1,886.650 |
| | **341.817** | **703.481** | **1,740.668** | **2,590.131** |

**23.1** ණය සහ ණය ගැනීම් වල ජංගම කොටස

| | | | | |
|---|---|---|---|---|
| **පර්යන්ත සමාගම වෙත අනුයුක්ත නොකරන ලද දීර්ඝ කාලීන ණය** | | | | |
| මහා භාණ්ඩාගාර ණය (ආ.සං.වැ.) | 75.959 | 75.959 | 75.959 | 75.959 |
| **පර්යන්ත සමාගම වෙත අනුයුක්ත කළ ණය** | | | | |
| භාණ්ඩාගාර (එක්සිම් බැංකුව) ණය | 285.705 | 571.410 | 285.705 | 571.410 |
| **වෙනත්** | - | - | 495.955 | 487.799 |
| | **361.664** | **647.369** | **857.619** | **1,135.168** |

**දෙසැ. 31 දින සිට වසර 05 ක් තුළ නැවත ගෙවිය යුතු ණය පහත දක්වා ඇත.**

| | 2015 දෙසැ. 31 දිනට<br>රු. මිලියන | 2014 දෙසැ. 31 දිනට<br>රු. මිලියන |
|---|---|---|
| | | |
| වසර 1 - 2 අතර ගෙවිය යුතු ප්‍රමාණය | 151.916 | 437.621 |
| වසර 3 - 5 අතර ගෙවිය යුතු ප්‍රමාණය | 189.901 | 227.880 |
| වසර 5 න් පසු ගෙවිය යුතු ප්‍රමාණය | - | 37.980 |
| | **341.817** | **703.481** |

**ණය ගැනීම් වල ධාරක අගය සාධාරණ වටිනාකම සලකා බලා ඇත.**

(අ) ජුලි 01 දිනට ආරම්භ වන සෑම වසරකම රු. මිලියන 37.977 ක වාරික මගින් අර්ධ වාර්ෂිකව නැවත ගෙවිය යුතු භාණ්ඩාගාර ණය (ආ.සං.බැ.) - (වාර්ෂික පොළිය 14.0%)

(ආ) අවසාන ණය අගයෙන් අර්ධ වාර්ෂික වාරික ලෙස සමාන වාරික 24 න් 2004 ඔක්. 24 සිට ආරම්භ කරමින් භාණ්ඩාගාර ණය (එක්සිට් බැංකුව) නැවත ගෙවීම - (වාර්ෂික පොළිය 12%)

**24.** වෙළඳ සහ වෙනත් ගෙවීම්

| | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 දෙසැ. 31 | 2014 දෙසැ. 31 | 2015 දෙසැ. 31 | 2014දෙසැ. 31 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ගෙවිය යුතු විදේශ බිල්පත් | 121,662.975 | 143,445.126 | 122,751.071 | 143,445.126 |
| වෙනත් ණයකරුවන් | | | - | |
| - දේශිය ආදායම් සහ බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් | 3,401.847 | 824.289 | 3,697.670 | 1,031.396 |
| - උපචිත වියදම් | 4,627.177 | 1,019.542 | 4,986.039 | 1,799.208 |
| - නැවත ගෙවිය යුතු අත්තිකාරම් හා වෙනත් | 23,952.442 | 13,385.316 | 23,921.571 | 13,673.507 |
| - අදාළ පාර්ශවයන් වෙත ගෙවිය යුතු ප්‍රමාණය | 5,828.676 | 5,605.749 | - | 467.129 |
| | **159,473.117** | **164,280.022** | **155,356.351** | **160,416.366** |

**25.** කෙටි කාලීන ණය ගැනීම්

| | 2015 දෙසැ. 31 | 2014 දෙසැ. 31 | 2015 දෙසැ. 31 | 2014දෙසැ. 31 |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| බැංකු සහ වෙනත් ණය | | | | |
| - වර්ෂයකදී සම්පූර්ණයෙන්ම ගෙවිය යුතු | 264,484.023 | 247,787.669 | 264,484.023 | 247,787.669 |
| - බැංකු අයිරා | 2,738.249 | - | 2,738.249 | - |
| | **267,222.272** | **247,787.669** | **267,222.272** | **247,787.669** |

සංස්ථාව වෙනුවෙන් ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත ඇ.ඩො.මිලියන 1,550 ක් සඳහා භාණ්ඩාගාර ඇපකර මඟින් ණය සහතික කර ඇත.
සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු මූල්‍ය ආනයන බිල්පත් සඳහා කෙටිකාලීන ණය ලබාගෙන ඇත.
අදාළ වාර්ෂික පොළී අනුපාතය 5.5% කි.

**26.** සේවකයන්

**26.1.** කාර්ය මණ්ඩල පිරිවැය

| | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| වැටුප් සහ වේතන | 3,905.211 | 3,230.897 | 8,557.779 | 6,967.350 |
| නිර්වචනය කරන ලද දායක සැලැස්ම | 358.952 | 299.893 | 772.247 | 636.716 |
| නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම (සටහන 21) | 265.787 | 196.440 | 443.425 | 360.566 |
| | **4,529.950** | **3,727.230** | **9,773.451** | **7,964.632** |

**26.2** සේවක සංඛ්‍යාව

| | | |
|---|---|---|
| පරිපාලනය සහ අලෙවිය | 1,140 | 1,254 |
| නිෂ්පාදනය | 1,020 | 976 |
| ආරක්ෂණය | 419 | 432 |
| | **2,579** | **2,662** |
| **26.3** කොන්ත්‍රාත් සහ තාවකාලික සේවකයින් | 2 | 6 |

**27.** මෙහෙයුම් මගින් උපදවන ලද මුදල්

| | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට | 2015 දෙසැ. 31 දිනට | 2014 දෙසැ. 31 දිනට |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| අඛණ්ඩ මෙහෙයුම් මගින් බදු පෙර ලාභය/ (අලාභය) | **(20,336.606)** | **1,016.527** | **(18,506.614)** | **3,451.322** |
| **ගැලපීම් -** | | | - | |
| ක්ෂය වීම් | 934.582 | 635.058 | 1,759.486 | 1,528.837 |
| ක්‍රමක්ෂය කිරීම | - | - | 30.008 | 91.935 |
| විදේශ මුදල් පරිවර්තනය | 52.04 | 1,396.794 | 52.042 | 1,396.794 |
| ආයෝජන ආදායම | (0.004) | (437.501) | (0.004) | |
| පොළී ලැබීම් | (4,910.347) | (4,030.057) | (4,936.157) | (3,985.931) |
| වෙළඳපල අගය වෙත ගැලපීම් (උපචිත ගන්නා ලද කොටස්) | (6.500) | - | (6.500) | - |
| පොළී පිරිවැය | 15,048.660 | 13,979.634 | 15,282.220 | 14,384.351 |
| පාරිතෝෂිත මත පොළිය | - | - | 88.825 | 85.191 |
| විශ්‍රාම ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 265.787 | 190.028 | 487.063 | 268.963 |
| හානිකරණය සඳහා ප්‍රතිපාදන | | | 36.045 | 3.436 |
| දේපළ, පිරියත සහ උපකරණ අලෙවිය මගින් ලාභය/ අලාභය | (20.212) | (14.580) | (28.524) | (19.370) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ප්‍රතිලාභ/(අලාභය)** | **(8,972.596)** | **12,735.903** | **(5,742.109)** | **17,409.136** |
| | | | | |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්** | | | | |
| තොග (ඉහළ යාම)/ පහළයාම | 22,546.642 | 1,454.541 | 22,585.899 | 1,482.688 |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් (ඉහළ යාම)/ පහළ යාම | 16,363.714 | 28,266.383 | 13,428.784 | 29,178.363 |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් ඉහළ යාම/( පහළ යාම) | (4,990.306) | (29,989.456) | (4,947.618) | (37,190.070) |
| (භාවිත කළ) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපදවන ලද මුදල් | **24,947.455** | **12,467.371** | **25,324.955** | **10,880.117** |

**28. මූල්‍ය ප්‍රකාශනය නැවත ප්‍රකාශ කිරීම සඳහා වන පැහැදිලි කිරීම්**

1. භාණ්ඩාගාර බැඳුම්කර පොළී ආදායම මත ජාතික බදු සඳහා රු.මිලියන 72.823 ක් ගණනය නොකිරීම.
2. 2014 වර්ෂයේදී රු. මිලියන 359.146 ක් වන කාර්ය මණ්ඩල ණය පොළිය ලෙස වාර්තා වූ කාර්ය මණ්ඩල ණය නැවත ගණනය කිරීම.
3. 2014 දෙසැ. 31 දිනට රු. මිලියන 188,313 ක් මඟින් දැව්තෙල් තොග අවසන් කිරීමේ අධි ප්‍රකාශය නිවැරදි කිරීම.
4. රු. මිලියන 0.002 ක් වන අධි ක්‍ෂයවීම් පුනරීක්‍ෂණය කිරීම.
5. 2014 වර්ෂයේ මහා භාණ්ඩාගාරය වෙත ගෙවන ලද විශේෂ ගෙවීම් සඳහා වන වර්ගීකරණය නිවැරදි කිරීම.

මෙම වැරදි ගණකාධිකරණ ප්‍රතිපත්ති, ගණකාධිකරණ ඇස්තමේන්තු වෙනස්කම් සහ ගැටළු එල්.කේ.ඒ.එස්. 8 ප්‍රකාර ප්‍රත්‍යාවර්තිතව නිවැරදි කර ඇත.

**28.1 .** කොටස්කරුවන්ගේ ස්කන්ධය සැසඳීම

| | **31.12.2014** |
|---|---|
| | **රු. මිලියන** |
| පෙර මූල්‍ය ප්‍රකාශන පරිදි වාර්තා වූ ශේෂය | (231,532.116) |
| කල්පිත බදු සඳහා ගැලපීම් | 72.823 |
| කාර්ය මණ්ඩල ණය පොළී ආදායම ගැලපීම් | (359.146) |
| අලෙවි පිරිවැය සඳහා ගැලපීම් | (188.313) |
| විශේෂ ගෙවීම් සඳහා ගැලපීම් | (250.000) |
| ක්‍ෂය වීම් සඳහා ගැලපීම් | 0.002 |
| | **(232,256.750)** |
| | |
| **දේපළ පිරියත සහ උපකරණ** | |
| පෙර මූල්‍ය ප්‍රකාශන පරිදි වාර්තා වූ ශේෂය | 13,591.468 |
| ක්ෂය වීම් ගැලපීම | 0.002 |
| | **13,591.470** |
| | |
| **පුනරාවර්තන නොවන වෙළඳ සහ වෙනත් ලැබීම්** | |
| පෙර මූල්‍ය ප්‍රකාශන පරිදි වාර්තා වූ ශේෂය | 3,406.924 |
| කාර්ය මණ්ඩල ණය පොළී ආදායම ගැලපීම | (359.146) |
| පුනරාවර්තන නොවන ලැබීම් යටතේ විශේෂ ගෙවීම් වර්ගීකරණය | 9,000.000 |
| | **12,047.778** |
| | |
| **භාණ්ඩ තොග** | |
| පෙර මූල්‍ය ප්‍රකාශන පරිදි වාර්තා වූ ශේෂය | 63,770.066 |
| දැව්තෙල් 3500 තොගය සඳහා ගැලපීම් | (188.313) |
| | **63,581.753** |
| | |
| **පවත්නා වෙළඳ සහ වෙනත් ලැබීම්** | |
| පෙර මූල්‍ය ප්‍රකාශන පරිදි වාර්තා වූ ශේෂය | 52,370.185 |
| පුනරාවර්තන නොවන ලැබීම් යටතේ විශේෂ ගෙවීම් වර්ගීකරණය | (9,000.000) |
| විශේෂ මිල සඳහා ගැලපීම් | (250.000) |
| | **43,120.185** |
| | |
| **ආදායම් බදු ලැබීම්** | |
| පෙර මූල්‍ය ප්‍රකාශන පරිදි වාර්තා වූ ශේෂය | 889.328 |
| 2014 වර්ෂයේදී භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම මත වන ආංශික ණය ගැලපීම් | 72.823 |
| | **962.151** |

**28.2 .** විස්තිරණ ආදායම සැසඳීම

| | පෙර වාර්තා කරන ලද ශේෂය | ගැලපීම් | නැවත දක්වන ලද ශේෂය |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන |
| ආදායම | 525,182.094 | - | 525,182.094 |
| අලෙවි පිරිවැය | (499,767.226) | (188.313) | (499,955.539) |
| **දළ ලාභය** | 25,414.868 | | **25,226.555** |
| වෙනත් මෙහෙයුම් ආදායම | 1,098.798 | (359.146) | 739.652 |
| භූමිතෙල් සහනාධාරය | 2,715.000 | - | 2,715.000 |
| ආයෝජන දේපළ මත ආදායම | 51.823 | | 51.823 |
| අලෙවි සහ බෙදාහැරීමේ පිරිවැය | (11,532.812) | | (11,532.812) |
| පරිපාලන පිරිවැය | (4,922.189) | 18.062 | (4,904.127) |
| **මෙහෙයුම් ලාභය** | 12,825.488 | (529.397) | **12,296.091** |
| මූල්‍ය ආදායම | 3,957.234 | 72.823 | 4,030.057 |
| විනිමය අනුපාත වෙනස්කම් | (967.489) | | (967.489) |
| මූල්‍ය පිරිවැය | (13,961.574) | (18.060) | (13,979.634) |
| විශේෂ ගාස්තු (රජයට) | - | (250.000) | (250.000) |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | **1,853.659** | **(724.634)** | **1,129.025** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම නැවත ගණනය කිරීම මගින් ලාභය/ (අලාභය) | (112.498) | | (112.498) |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීරණ අලාභය** | (112.498) | - | (112.498) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ලාභය/ (අලාභය)** | **1,741.161** | **(724.634)** | **1,016.528** |

**28.3 .** **මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සැසඳීම**

පහත දක්වා ඇති දත්ත හැර, සංස්ථාවේ පෙර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ වැරදි නිවැරදි කිරීමෙන් පසු ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය අතර සැලකිය යුතු ද්‍රව්‍යමය වෙනසක් දක්නට නොමැත. වෙනස්කම් හේතුවෙන් මූල්‍ය ප්‍රවාහයට කිසිදු බලපෑමක් නොමැත.

| | පෙර දක්වන ලද ශේෂය | ගැලපීම් | නැවත දක්වන ලද ශේෂය |
|---|---|---|---|
| මුළු විස්තීරණ ආදායම | 1,741.161 | (724.634) | 1,016.527 |
| අය කරන ලද ක්‍ෂය වීම් | 635.060 | (0.002) | 635.058 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 27,657.237 | 609.146 | 28,266.383 |
| තොග වෙනස්වීම් | 1,266.228 | 188.313 | 1,454.541 |
| ගෙවන ලද ආදායම් බදු | (167.784) | (72.823) | (240.607) |
| | **31,131.902** | **(0.000)** | **31,131.902** |

## 29. සංසන්දනාත්මක තොරතුරුවල වෙනස්කම්

වර්තමාන වර්ෂය සමඟ සැසඳීම සහ වඩා හොඳින් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය අවස්ථා වලදී, පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ පහත දැක්වෙන වර්ගීකරණයන් සංශෝධන කර ඇත.

| අයිතම | රු. මිලියන | නැවත වර්ගීකරණය | පෙර වර්ගීකරණය කරන ලද්දේ |
|---|---|---|---|
| විනිමය අනුපාත විචලනය | 967.489 | විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මුහුණත | අලෙවි පිරිවැය |
| බැංකු කොමිස් | 18.060 | මූල්‍ය පිරිවැය | පරිපාලන වියදම් |
| භාණ්ඩාගාර බැඳුම්කර මත ආයෝජන | 9,983.931 | ජංගම මූල්‍ය වත්කම් | වෙළඳ සහ වෙනත් ලැබීම් |

## 30. අවිනිශ්චිත ණය, ගෙවීම් සහ නඩු

### අවිනිශ්චිත ණය

2015 දෙසැ. 31 දිනට වන අවිනිශ්චිත ණය පහත සඳහන් කරුණු සමඟ සම්බන්ධ වේ.

නැව්ගත භාණ්ඩ තොග සඳහා 2015 දෙසැ.31 දිනට පවතින ප්‍රමාද ගාස්තු ගෙවීම සඳහා වන ඉල්ලීම් පහත දක්වා ඇත.

| වර්ෂය | ඇ.ඩො. |
|---|---:|
| 2011 | 700,739.30 |
| 2012 | 1,015,752.40 |
| 2013 | 805,362.80 |
| 2014 | 3,633,146.64 |
| 2015 | 996,604.41 |

කෙසේ වෙතත්, ශේෂ පත්‍ර දිනට පසුව සිදු වූ සාකච්ඡා/ බේරුම්කරණ ආදිය මඟින් මූල්‍ය වගකීම් නිර්ණය වේ.

මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට, ඉහත සඳහන් ගෙවීම් හැර වෙනත් වැදගත් අවිනිශ්චිත ගෙවීම් වාර්තා වී නොමැත.

### බැඳීම්

2015 දෙසැ. 31 දිනට වන බැඳීම් පහත සඳහන් කරුණු වෙත සම්බන්ධ වේ.

### බැංකු වෙත වන බැඳීම්

සංස්ථාව විසින් රු. මිලියන 2,509 ක් සහ රු.මිලියන 2,126 ක් වටිනා (ඇ.ඩො. 17.139 සහ ඇ.ඩො.14.520) ණයවර ලිපි ලංකා බැංකුව සහ මහජන බැංකුව සමඟ විවෘත කරන ලදී. එසේ සිදුකරන ලද්දේ බොරතෙල් සහ පිරිපහදු කරන ලද නිෂ්පාදන ආනයනය කිරීම වෙනුවෙනි.

### වාර්තාකරණ දිනට පැවති නඩු

2015 දෙසැම්බර් 31 දිනට සමථයට පත් නොවූ නඩු 244 ක් පැවතිණි. එය පහත දක්වා ඇත.

| නඩුවේ ස්වාභවය | නඩු ගණන | |
|---|---|---|
| | සංස්ථාව | සමූහය |
| කම්කරු විනිශ්චය සභාවේ නඩු | 01 | 02 |
| මහේස්ත්‍රාත් උසාවි නඩු | 02 | 05 |
| දිස්ත්‍රික් උසාවි නඩු | 110 | 121 |
| ඉහළ උසාවි නඩු | 16 | 21 |
| අභියාචනාධිකරණ නඩු | 10 | 14 |
| ශ්‍රේෂ්ඨාධිකරණ නඩු | 13 | 13 |
| මානව හිමිකම් කොමිෂන් සභාව | 28 | 28 |
| කම්කරු දෙපාර්තමේන්තුව | 29 | 40 |

මෙම නඩු මඟින් සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වයට සැලකිය යුතු බලපෑමක් සිදු නොවනු ඇති බව සංස්ථාව විශ්වාස කරන බැවින් මේ සඳහා ප්‍රතිපාදන සිදුකර නැත.

## 31. ශිවිසුම් වෙත අධ්‍යක්‍ෂවරුන්ගේ සම්බන්ධය සහ සංස්ථාව සමඟ වන ආශ්‍රිත පාර්ශවීය ගනුදෙනු

අධ්‍යක්‍ෂවරුන්ගේ ගෙවීම් සිදුකරනු ලබන්නේ 2015.06.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.03/2015 අනුවය.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ශ්‍රී ලංකාව තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීම සිදු කරනු ලබයි. සංස්ථාව සතුව 2/3 ක කොටස් පවතින තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලයට සංස්ථාවේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්‍ෂ, ටී.ජී. ජයසිංහ මහතා පත්කළ අතර පර්යන්ත සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්‍ෂ, ඩී.සී.එස්. සෙනෙවිරත්න මහතා සංස්ථා අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත්කරන ලදී. ඒ හැර සංස්ථාවෙහි හා පර්යන්ත සමාගමෙහි ශිවිසුම් වෙත කිසිදු අධ්‍යක්‍ෂවරයකු සම්බන්ධ නොවේ.

තොග ගබඩා පර්යන්ත සමාගම සමඟ පහත සඳහන් ගනුදෙනු සිදුකරන ලදී.

| **ගනුදෙනු** | **2015**<br>**රු. මිලියන** | **2014**<br>**රු. මිලියන** |
|---|---|---|
| **සේවා** | | |
| පර්යන්ත ගාස්තු | 8,865.130 | 7,688.365 |
| ප්‍රවාහන ගාස්තු | 1,795.249 | 2,084.291 |
| කුලී | 6.980 | 20.937 |
| | **10,667.359** | **9,793.593** |
| **අලෙවිය** | | |
| ඉන්ධන | 448.212 | 602.427 |
| වෙනත් සේවා | 0.052 | 0.157 |
| නැව් තෙල් අලෙවිය | 51.507 | 3,239.410 |
| | **499.771** | **3,841.994** |
| **පර්යන්ත සමාගම වෙත වන ණය පියවීම්** | | |
| **ණය වාරික** | 571.409 | 571.409 |

| **හිඟ ශේෂය** | **2015**<br>**රු. මිලියන** | **2014**<br>**රු. මිලියන** |
|---|---|---|
| **ලැබිය යුතු** | | |
| ණය | 285.705 | 857.114 |
| නැව් තෙල් අලෙවිය සහ වෙනත් ලැබීම් | 209.898 | 1,307.307 |
| | **495.603** | **2,164.421** |
| **ගෙවීම්** | **5,828.676** | **4,102.852** |

## 32. වාර්තාකරණ දිනට පසු සිදුවීම්

වාර්තාකරණ දිනට පසුව වූ සෑම මූල්‍යමය වටිනාකමක් සහිත සිදුවීමක්ම, අවශ්‍ය අවස්ථාවලදී සලකා බලා අදාළ ගැලපීම්/ ආවරණය කිරීම සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

## 33. මූල්‍ය අවදානම සම්බන්ධ කරුණු

වෙළඳපල අවදානම (මුදල් අවදානම, පොළී අනුපාත අවදානම ඇතුළුව), ණය අවදානම සහ ද්‍රවශීල අවදානම මෙන්ම මිල අවදානම වැනි විවිධ අවදානම් අවස්ථා සඳහා සංස්ථාවේ කටයුතු නිරාවරණය වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති යටතේ කළමනාකාරීත්වය විසින් අවදානම් කළමනාකරණය සිදු කරනු ලබයි. සංස්ථාවේ මෙහෙයුම් හා සම්බන්ධ මූල්‍ය අවදානම් කළමනාකාරීත්වය විසින් හඳුනාගෙන විශ්ලේෂණය කරනු ලබයි. සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය මත ඇතිවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීම සංස්ථාවේ සමස්ථ අවදානම් කළමනාකරණ වැඩසටහන් මඟින් සිදු කරයි.

සංස්ථාවේ මූලික මූල්‍ය උපකරණ කෙටි කාලීන ස්ථිර තැන්පතු, මූල්‍ය වෙළඳපල ආයෝජන, ඇ.ඩො. තැන්පතු සහ මුදල් වලින් සමන්විත වේ. සංස්ථාවේ ද්‍රවශීලිතාව පවත්වාගෙන යාම සහ ඒවා වැඩි දියුණු කිරීම මෙන්ම ආයෝජන අරමුදල් මත වන මූල්‍ය ලැබීම් වැඩි කිරීම මෙම මූල්‍ය උපකරණ වල මූලික අරමුණ වේ. වෙළඳ ලැබීම් සහ වෙළඳ ගෙවීම් වැනි ව්‍යාපාරය තුලින් සෘජුවම මතුවන ගෙවීම් සංස්ථාවේ විවිධ වෙනත් මූල්‍ය උපකරණ යටතට ගැනෙනු ඇත.

### (අ) වෙළඳපල අවදානම

#### (i) විදේශ මුදල් හුවමාරු අවදානම

විදේශ මුදල් හුවමාරු කිරීමේදී ඇතිවන අවදානම සංස්ථාවේ ආනයන, අපනයන ක්‍රියාවලියේදී මූලික වශයෙන් ඇ.ඩො. සම්බන්ධව මුහුණපානු ලබයි. දේශීය ගනුදෙනු සිදු කරනු ලබන ශ්‍රී ලංකා රුපියල සංස්ථාවේ ක්‍රියාකාරී මුදල් වර්ගය වන අතර වාර්තාකරණය සඳහා ශ්‍රී ලංකා රුපියල හැර අනෙකුත් සෑම මුදල් වර්ගයක්ම විදේශ මුදල් ලෙස සැලකේ. ඇතැම් බැංකු ශේෂ, වෙළඳ ලැබීම් සහ වෙළඳ ගෙවීම් විදේශ මුදල් වලින් පවතියි.

රුපියල් මඟින් ඉදිරිපත් කරනු ලබන සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන හුවමාරු කිරීමේ සහ ගනුදෙනු කිරීමේ අවදානමට නිරාවරණය වේ. විදේශ මුදල් හුවමාරු අනුපාතය මූල ද්‍රව්‍ය පිරිවැය, විදේශ මුදල් මඟින් ලබා ගන්නා ප්‍රසම්පාදන සහ සේවා වෙත බලපෑමක් ඇති කරයි. ආනයනය කරනු ලබන ඛනිජ තෙල් නිෂ්පාදන සහ වෙනත් ප්‍රසම්පාදන පිරිවැය කෙරේ වන බලපෑම තුලින් ඇ.ඩොලරයට සහ වෙනත් විදේශ මුදල් වලට සාපේක්ෂව රුපියල අඛණ්ඩව අවප්‍රමාණය වීම සෘජුවම අහිතකර ලෙස මූල්‍ය ප්‍රතිඵල වලට බලපා ඇත.

#### (ii) පොළී අනුපාත අවදානම

රෙපෝ සහ කාලීන තැන්පතු ලෙස සිදුකර ඇති ණය ගැනීම් සහ ආයෝජන මඟින් ප්‍රධාන වශයෙන්ම සංස්ථාවේ පොළී අනුපාත අවදානම ඇති වේ. සැපයුම්කරුවනගේ පොළී අනුපාත ප්‍රධාන වශයෙන්ම පවත්නා වෙළඳපල අනුපාතයට අනුව විචලනය වේ. සංස්ථාව විසින් අඛණ්ඩව පොළිය වෙත නිරාවරණය විශ්ලේෂණය කරනු ලබන අතර ලන්ඩන් ඉන්ටර් බැන්කින් ඔෆර් අනුපාතය සහ මූල්‍ය වෙළඳපල අනුපාත අධීක්ෂණය කරනු ලබයි.

### (ආ) ණය අවදානම

සේවාදායකයින් තම ගිවිසුම්ගත ගෙවීම් සිදු කිරීමට අපොහොසත් වේ නම්, සංස්ථාවට දැරීමට සිදුවන මූල්‍ය අලාභය ණය අවදානම ලෙස හැඳින්වේ. සංස්ථාවේ සේවාදායකයන් බොහොමයක් තනි පුද්ගලයන් ලෙස ශ්‍රේණිගත කර නොමැති අතර, ඔවුන්ගේ ගුණාත්මකභාවය ඔවුන්ගේ මූල්‍ය තත්වය, පළපුරුද්ද සහ වෙනත් ප්‍රමාණාත්මක කරුණු මඟින් ගණනය කරනු ලබයි. ණය සීමාවන් පැනවීමට පෙර එසේ ණය ලබා දීමට සුදුසුකම් සලකා බැලීම සඳහා තනි තනිව සේවාදායකයන් විශ්ලේෂණය කළ හැකි ණය ප්‍රතිපත්තියක් සංස්ථාව විසින් මේ වන විට ස්ථාපිත කර ඇත. එම ණය ප්‍රතිපත්ති සමඟ අනුගත නොවිය හැකි සේවාදායකයන් සංස්ථාව සමඟ මුදල් වලින් පමණක් ගනුදෙනු සිදුකරයි.

මුදල් සහ මුදල් සමාන දෑ සහ බැංකුවල සහ මූල්‍ය ආයතනවල සිදුකර ඇති තැන්පතු සහ සේවාදායකයන් වෙත ණය දීම්, හිඟ ලැබීම් සහ ගෙවීමට බැඳී ඇති ගනුදෙනු මඟින්ද ණය අවදානම ඇති විය හැකිය.

**(ඇ) ද්‍රවශීලී අවදානම**

මුදල් ප්‍රවාහ සැලසුම් කිරීම සහ පුරෝකථනය කිරීම සංස්ථාවේ මුදල් අංශය විසින් සිදුකරනු ලබයි. විවිධ මූල්‍ය ගෙවීම් සිදු කිරීම සඳහා අරමුදල් පවතින බව මූල්‍ය අංශය විසින් අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබන අතර, අතිරේක කෙටිකාලීන මූල්‍ය සම්පත් උපරිම අයුරින් ආදායම් ලැබෙන ලෙස භාවිතය ද තහවුරු කරනු ලබයි.

කාරක ප්‍රාග්ධනය, කළමනාකරණය සඳහා අවශ්‍ය වන ශේෂයට වඩා පවතින අතිරික්ත මුදල්, ඉතිරිකිරීමේ ගිණුම් සහ කෙටි කාලීන මුල්‍යමය ආයෝජන / කාල තැන්පතු වැනි පොළී ලබා දෙන මුල්‍යමය අංග තුළ ආයෝජනය කර ඇත. ද්‍රවශීල අවදානම් කළමනාකරණය කිරීම සඳහා වහාම මුදල් ප්‍රවාහ ජනනය කිරීමේ අපේක්ෂාවෙන් රු. මිලියන 35.932 ක ආයෝජන සහ රු. මිලියන 13.717 ක ද්‍රවශීල වත්කම් (කාලීන තැන්පතු) වාර්තා කරන දිනට සංස්ථාව පවත්වා ගන්නා ලදි.

ශේෂපත්‍ර දිනයට සංස්ථාවේ ව්‍යුත්පන්න නොවන වගකීම් ගිවිසුම්ගත කල්පිරෙන දිනට ඉතිරි කාලපරිච්ඡේදය පදනම් කරගෙන අදාළ කල්පිරීමේ කාණ්ඩයට පහත වගුවේ දක්වා ඇත.

| 2015 දෙසැම්බර් (රු. මිලියන) | | | | | |
|---|---|---|---|---|---|
| | මාස 3 ට අඩු | මාස 3 -12 දක්වා | වසර 1 - 2 දක්වා | වසර 3 - 5 දක්වා | වසර 5 ට වැඩි |
| බැංකු ණය | 116,299 | 151,285 | - | - | - |
| දීර්ඝ කාලීන ණය | - | - | 152 | 190 | - |
| | 116,299 | 151,285 | 152 | 190 | - |

**(ඇ) මිල අවදානම**

ඩොලර් සහ වෙනත් විදේශ මුදල් භාවිතා කර, විදේශීය රටවලින් ඛනිජ තෙල් නිෂ්පාදන (බොරතෙල් සහ නිමි නිෂ්පාදන) සහ වෙනත් අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී සංස්ථාව මිල අවදානමට මුහුණ දෙනු ඇත. ජාත්‍යන්තර තෙල් මිල ගණන්වලට සාපේක්ෂව ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර දේශීය මිල ගණන් තීරණය කිරීමේ පිරිවැය පරාවර්තිත මිල යාන්ත්‍රණයක් නොමැත. අනාගත මෙහෙයුම් සඳහා අවශ්‍ය, නිෂ්පාදන අවශ්‍යතා සාකච්ඡා කර සැලසුම් කිරීම සඳහා සංස්ථාව සතිපතා තොග සමාලෝචන රැස්වීම් පවත්වනු ලබයි. එසේම, සුදුසු කාලීන කළමනාකරණ තීරණ ලබා ගැනීම සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන පිළිබඳ මූල්‍යමය තොරතුරු සපයමින් සංස්ථාව මහා භාණ්ඩාගාරය සමඟ අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වයි.

## 34. ප්‍රාග්ධන කළමනාකරණය

කොටස්කරුවන් වෙත ලාභාංශ ලබා දීම සහ වෙනත් පරදුදරන කණ්ඩායම් වෙත ප්‍රතිලාභ ලබා දීම පිණිස සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීම ප්‍රාග්ධන කළමනාකරණයේ මූලික අරමුණයි. 2015 වර්ෂයට අවසන් වු වර්ෂයේදී සංස්ථාව සහ එහි සමාගම් විසින් රු. මිලියන 20,867 ක අලාභයක් (බදු ගැලපීමෙන් තොරව) සහ පසුගිය වසර 5 තුල සමුච්චිත අලාභ හේතුවෙන් රු. මිලියන 212,862 ක ඍණ ශුද්ධ වත්කම් තත්වයක් පැවතිණි. බාහිර විගණකවරුන්ගේ මතය අනුව ශ්‍රී ලංකා රජයේ සහ වෙනත් මූල්‍ය ආයතනවල මූල්‍ය සහාය නොමැතිව සංස්ථාවේ පැවැත්ම අඛණ්ඩව පවත්වාගෙන යාම සැක සහිතය.

සංස්ථාව විසින් දරනු ලබන අධික පාඩු සඳහා වන ප්‍රධානතම හේතුව වන්නේ පෙට්‍රල් ඉහළ සහන මිල ගණන් යටතේ අලෙවි කිරීම සහ සිල්ලර මිල ගණන් රජය විසින් තීරණය කිරීමයි. 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 17 වන වගන්තිය ප්‍රකාර මෙවැනි අලාභයක් ආවරණය කිරීම සඳහා රජය විසින් සහනාධාර ලබා ගැනීමට සංස්ථාව හිමිකම් ලබයි. මෙම සහන සංරචකය ලැබුණේ නම් සංස්ථාවේ ඍණ වත්කම් තත්වය මග හරවා ගත හැකිය.

# විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | පීඊආර්/ඒ/සීපීසී/1/15/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2016 දෙසැම්බර් 09 දින |

සභාපති

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි පරිපාලිතයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනතේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

2

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ විගණන මතය

(අ) තත්ත්වාගණනය කළ විගණන මතය

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

(ආ) තත්ත්වාගණනය කළ විගණන මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට 2/3 කොටස් අයත් පරිපාලිතයක් වන ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කිරීම සඳහා අනුමත නොකරන ලද කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන සංස්ථාව විසින් 2015 වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි. ඒ අනුව එය මූල්‍ය තොරතුරුවල විශ්වාසනීයභාවය පිළිබඳ සැක උපදවන්නක් විය.

(ආ) ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ විගණකවරුන් පහත දැක්වෙන කරුණු පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි.

(i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සකසුරුවම් සමිතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන ලැබී නොතිබුණි. කෙසේ වෙතත් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව මුළු වත්කම් හා මුළු වගකීම් පිළිවෙලින් රු.1,390,983,174 ක් සහ රු.2,126,559,556 ක් වශයෙන් වාර්තා වී තිබුණි. තවද සමාගම විසින් රු.735,576,382 ක සමුච්චිත ඍණ සංචිතයට දායක වන රු.1,410,978,763ක නොබෙදුණු ඍණ සංචිත ශේෂයක් වාර්තා කර තිබුණි. කෙසේ නමුත් ඉහත ඍණ සංචිත තත්ත්වය සමාගමේ කටයුතු කෙරෙහි බලපෑමක් ඇති නොවන බවත් එහි කටයුතු අඛණ්ඩව ඉදිරි කාලයක් සඳහා සිදු කළ හැකි බවත් දක්වා තිබුණි.

(ii) තවද සකසුරුවම් සමිතියේ ඉහත සඳහන් කළ මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු නොතිබීම හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමට අදාල අරමුදල්වල හිඟය තීරණය කිරීමට නොහැකි විය. එසේම සකසුරුවම් සමිතියේ වගකීම ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා ගැනීමට තීරණය කර ඇති බැවින් වගකීම ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ සාමාජිකයින්ට අදාල හිඟ අරමුදල් සඳහා වෙන් කිරීම් එහි මූල්‍ය ප්‍රකාශන තුල පෙන්නුම් කර නොතිබුණි.

(iii) ලැබුණු තහවුරු කිරීම් මත සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු වටිනාකම, මූල්‍ය ප්‍රකාශනවල අපහායනය සඳහා කරන ලද ඉඩ හැරීම රු.මිලියන 164 හා සැලකීමේදී රු. මිලියන 336 කින් වෙනස් වී තිබුණි.

**2.2.2 සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන**

**2.2.2.1 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම**

2015 වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වලින් රු. මිලියන 20,176 ක බදු පෙර ශුද්ධ අලාභයක් සහ රු. මිලියන 21,896ක මුළු විස්තිරණ ශුද්ධ අලාභයක් ලැබීම සහ සමාලොචිත වර්ෂයේ අවසාන දිනට රු. මිලියන 229,153 ක ඍණ ශුද්ධ වත්කම් තත්ත්වයක් පැවතීම කෙරෙහි අවධානය යොමු වේ. තවද සමාලෝචිත වර්ෂයේදී ඇති වූ විනිමය අනුපාත වෙනස්වීම්වල ඍණාත්මක බලපෑම සහ 2012 වර්ෂයේ හෙජින් ගනුදෙනුව හේතුවෙන් ඇතිව තිබූ ඍණාත්මක බලපෑම පසුගිය වර්ෂවල ශුද්ධ පාඩුව වැඩි වීමට හේතු විය. පසුගිය වර්ෂයේදී මූල්‍ය කාර්යසාධනය වර්ධනය වී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී අධික අලාභ ලැබීම හේතුවෙන් තව දුරටත් සංස්ථාවේ ශුද්ධ වත්කම් තත්ත්වය බාදනය වී තිබුණි. එබැවින් රජයේ මූල්‍ය සහාය නොමැතිව සංස්ථාව ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙසට අඛණ්ඩව පවත්වා ගැනීමට ඇති හැකියාව සැක සහිතය.

**2.2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) එල්.කේ.ඒ.එස් 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි**

(i) තක්සේරු වර්ෂ 2011/2012 සිට 2014/2015 දක්වා සංස්ථාවේ අනෙකුත් ආදායම් සඳහා ගෙවිය යුතු රු.මිලියන 925 ක ආදායම් බදු අතීතයට බලපාන පරිදි ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ බදු වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් ගිණුම්වල 2010 වර්ෂයේදී සිදු වූ සහ 2015 වර්ෂය දක්වා පැවති පිළිවෙලින් රු.26,026,697 සහ රු.2,943,012 ක වැරදි ප්‍රමිතියේ ප්‍රතිපාදනවලට එරෙහිව සමාලෝචිත වර්ෂය තුළදී ගැලපීම් කර තිබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් වියදම් එම වටිනාකම්වලින් අඩුවෙන්

දක්වා තිබුණි. තවද එම ගැළපීම්වලට අදාල ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිණි.

**(ආ) එල්.කේ.ඒ.එස් 12 - ආදායම් බදු**

(i) ප්‍රමිතියෙන් දක්වා ඇති අවස්ථාවන් හැර අනෙකුත් සියළුම තාවකාලික වෙනස්කම් සඳහා සංස්ථාව විසින් කල්පිත බදු වත්කම්/වගකීම් හඳුනා ගත යුතුය. කෙසේ වෙතත් සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශනවල කල්පිත බදු වත්කම්/වගකීම් හඳුනාගෙන නොතිබුණි.

(ii) ප්‍රමිතියේ අවශ්‍යතාවය පරිදි බදු වියදම් හා ගිණුම්කරණ ලාභ අතර සම්බන්ධතාවය පැහැදිලි නොකර සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 1,559 ක් බදු වියදම් ලෙස හඳුනාගෙන තිබුණි.

**(ඇ) එල්.කේ.ඒ.එස් 19 - සේවක වරප්‍රසාද**

මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 1.3 අනුව, සංස්ථාව විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය, **ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය** යොදා ගෙන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) සඳහා පමණක් අවසර දෙනු ලැබූ මෘදුකාංගය භාවිතයෙන් ගණනය කර තිබුණි. ඒ අනුව, ප්‍රමිතිය පරිදි පාරිතෝෂික වෙන් කිරීමේ අවශ්‍යතාවය අනුගමනය කර නොතිබුණි.

**(ඈ) එල්.කේ.ඒ.එස් 24 - සම්බන්ධිත පාර්ශව පිළිබඳ හෙළිදරව් කිරීම**

(i) ප්‍රධාන කළමනාකරණ මණ්ඩලයට ගෙවන දීමනා සම්බන්ධයෙන් විධිමත් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශන තුල සිදු කර නොතිබුණි.

(ii) සම්බන්ධිත පාර්ශවයන්ගේ ස්වභාවය හා රේඛීය අමාත්‍යාංශයට කුලී පදනම මත ලබා දී ඇති ආයෝජන වත්කම්වලට අදාල ගනුදෙනු පිළිබඳ විධිමත් හෙළිදරවු කිරීමක් මූල්‍ය ප්‍රකාශන තුල සිදු කර නොතිබුණි.

**(ඉ) එල්.කේ.ඒ.එස් 32 - මූල්‍ය උපකරණ - ඉදිරිපත් කිරීම**

(i) මුදල් අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි විශේෂ ගෙවීමක් වශයෙන් රු. මිලියන 10,000ක් 2014 දෙසැම්බර් 31 දින මහා භාණ්ඩාගාරයට ගෙවා තිබූ අතර ඉන් රු.මිලියන 250 ක් සහ රු.මිලියන 750 ක් පිළිවෙලින් 2014 හා 2015 වර්ෂ තුලදී වියදම් වශයෙන් කපා හැර ඇති අතර හිඟ හිටි රු. මිලියන 9,000ක වටිනාකම 2016 සිට 2024 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල සමානුපාතිකව කපා හැරීමට තීරණය කර තිබුණි.කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශන අනුව එම මුදල වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වල ඇතුලත් කර තිබූ අතර ප්‍රමිතියට එරෙහිව මූල්‍ය උපකරණ ලෙස 2015 දෙසැම්බර් 31 දිනට වර්ගීකරණය කර තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ රු. මිලියන 9,000කින් වැඩියෙන් පෙන්වා දී තිබූ අතර ජංගම නොවන වත්කම් සහ ජංගම වත්කම් තුල ඇති කලින් ගෙවීම් පිළිවෙලින් රු.මිලියන 8,000 කින් හා රු. මිලියන 1,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) තවද ප්‍රමිතියට එරෙහිව 2015 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වල දක්වා ඇති වටිනාකම රු. මිලියන 269.4 ක් වූ කලින් ගෙවීම් මූල්‍ය උපකරණ ලෙස වර්ගීකරණය කර තිබුණි.

**(ඊ) එල්.කේ.ඒ.එස් 37 - වෙන් කිරීම්, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්**

ඉදිරි සුරකුම් ගනුදෙනුවලට අදාලව එ.ජ.ඩො 8,648,300 කට හිමිකම් කියමින් කොමර්ෂල් බැංකුව විසින් කොළඹ පිහිටි වාණිජ ඉහළ අධිකරණයේ නඩුවක් පවරා තිබුණි. කෙසේ වෙතත් ඉදිරි සුරකුම් ගනුදෙනුවලට අදාලව ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශන තුල සිදු කර නොතිබුණි.

**(එ) එල්.කේ.ඒ.එස් 40 - ආයෝජන වත්කම්**

සංස්ථාව ආයෝජන වත්කම් පිරිවැයට හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත් ප්‍රමිතියේ පරිදි ආයෝජන වත්කම්වල සාධාරණ අගය තීරණය කළ නොහැකි අවස්ථාවල සංස්ථාව විසින් පහත දැක්වෙන තොරතුරු හෙළිදරවු කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන තුල ඒවා හෙළිදරව් කර නොතිබුණි.

- ආයෝජන වත්කම පිළිබඳ විස්තරයක්
- විශ්වාස කළ හැකි ලෙස සාධාරණ අගය තීරණය කිරීමට නොහැකි වීමට හේතු, සහ
- තීරණය කළ හැකි නම් සාධාරණ අගය කුමන ඇස්තමේන්තුගත පරාසයක් තුල පවතීද යන්න.

**2.2.2.3 ගිණුම්කරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂය සඳහා ලැබිය යුතු බිල්පත් අනුපාතය මත ගණනය කළ වටිනාකම රු. මිලියන 264.3 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර මත පොළී ආදායම ජංගම නොවන වත්කම් යටතේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන ගිණුමට බැර නොකර වෙනත් ලැබිය යුතු දෑ ගිණුමට හර කර පොළී ආදායම් ගිණුම බැර කර තිබුණි. තවද භාණ්ඩාගාර බැඳුම්කර මත ගණනය කළ සඵල පොළී අනුපාත ප්‍රතිලාභය (EIRR) වූ රු. මිලියන 214.4 ක පොළී ආදායම් ගිණුම බැර කර භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන ගිණුමට හර කර තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන ගිණුම රු.මිලියන 264.3 කින් අධි ගණනය වී තිබුණි. තවද සංස්ථාව මතිමාත්‍ර බදු ප්‍රතිලාභය වූ රු. මිලියන 29.4 ක වටිනාකමක් එකතු කිරීමෙන් ලද දළ පොළී ආදායම 2014 වර්ෂය සඳහා ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පොළී ආදායම රු.මිලියන 293.7කින් අධිගණනය වී තිබුණු අතර ආදායම් බදු වෙන්කිරීමේ ගිණුම රු.මිලියන 29.4කින් අඩුවෙන් ගණනය වී තිබුණි. තවද මෙම වැරදි 2015 වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේදී ආදායම් සංචිත රු. මිලියන 293.7කින් අධි ගණනය වූ අතර ලැබිය යුතු ආයෝජන ගිණුමද රු.මිලියන 264.3කින් අධි ගණනය වී තිබූ අතර ආදායම් බදු වෙන් කිරීමේ ගිණුමද රු.මිලියන 29.4කින් ඌණ ගණනය වී තිබුණි.

(ආ) සංස්ථාවට අයත් බෙදුම්කරු මෙහෙයුම් මධ්‍යස්ථාන (CODO) වල පිහිටුවා ඇති විකුණුම් මධ්‍යස්ථානවල කුලී ආදායම මුදල් පදනම මත හඳුනාගෙන තිබුණු අතර ඒ අනුව 2014 වර්ෂයට අදාලව 2015 වර්ෂය තුලදී ලද රු.මිලියන 6.1ක කුලී ආදායම් 2015 වර්ෂයේදී ආදායම් වශයෙන් හඳුනාගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2015 වර්ෂයේදී ලැබිය යුතු වටිනාකම සලකා බලන වර්ෂය සඳහා ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඇ) ලැබී ඇති තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයට හා පෙර වර්ෂවලට අදාල ස්ථාවර තැන්පතු මත රු.මිලියන 622ක පොළී ආදායම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල පොළී ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලෙජර් ගිණුම් අනුව 2013 අගෝස්තු 22 දින සිට ලංකා බැංකුවේ ඇමරිකානු ඩොලර් මිලියන 7.5ක වටිනාකමින් යුතු ස්ථාවර තැන්පතු පවත්වාගෙන ගොස් තිබුණි.කෙසේ වුවද 2015 වර්ෂය තුල දින 70ක් සඳහා පොළී ආදායම ගණනය කර තිබුණු අතර ලැබිය යුතු පොළී ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. පෙර කාලපරිච්ඡේදයන්හි පොළී ආදායමට අදාල තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව පොළී ආදායමෙහි සම්පූර්ණත්වය හා නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සහතික විය නොහැක.

(ii) සංස්ථාව විසින් යම් කාලයකින් ආපසු ලබා ගැනීමේ අදහසින් පොළිය අදාල ස්ථාවර තැන්පතු ගිණුමේ නැවත ආයෝජනය කිරීමේ අනුමැතිය ඇතිව 2013 සැප්තැම්බර් මස 24 වන දින රු. 1,102,676,727 ක් ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. ඒ අනුව 2014 දෙසැම්බර් 24 දින දක්වා එකතුව රු.98,241,638 ක් නැවත ආයෝජනය කර තිබූ අතර එය ස්ථාවර තැන්පතු ලෙස ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත් ආපසු ගන්නා කාලය තෙක් නැවත ආයෝජනය නොකළ පොළිය නොසලකා රු.1,245,202,499 ක් 2015 සැප්තැම්බර් මස 25 වන දින ස්ථාවර තැන්පතු ගිණුමෙන් ආපසු ලබා ගෙන තිබූ අතර ඒ අනුව රු.44,284,133 ක් ස්ථාවර තැන්පතු ගිණුමෙන් වැඩියෙන් ආපසු ලබා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතු ගිණුම සහ පොළී ආදායම් ගිණුම රු.44,284,133 කින් අඩුවෙන් ගණනය වී තිබුණි.

(iii)2014 වර්ෂය සඳහා ලැබිය යුතු රු.174,557,534 ක පොළී ආදායමක් වැරදි ලෙස සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම් ගිණුමට හර හා වෙනත් ලැබිය යුතු දෑ ගිණුමට බැර කර තිබුණි. ඒ අනුව පොළී ආදායම් හා වෙනත් ලැබිය යුතු දෑ එම වටිනාකමින් ඌන ගණනය වී තිබුණි.

(ඇ) සංස්ථාව රු.5,000,000 ක ශේෂයක් සහිත ස්ථාවර තැන්පතුවක් දිගුකාලීනව රඳවාගෙන තිබූ අතර එහි පොළී ආදායම සංස්ථාවේ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. කෙසේ වෙතත් එම ආදායමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. එම නිසා පොළී ආදායමේ නිරවද්‍යතාවය සහ සම්පූර්ණ බව පිළිබඳව විගණනයේදී සහතික විය නොහැක.

(ඉ) සංස්ථාව කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ බොර තෙල් නල මාර්ගය වෙනත් තැනකට ගෙන යාම සඳහා රු. මිලියන 2,116.18 ක් 2011 වර්ෂයේදී වැය කර තිබූ අතර පිරියත හා යන්ත්‍ර සූත්‍ර ලෙස වත්කම් වශයෙන් ඇතුලත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල දේපළ පිරියත හා උපකරණ යටතේ කෙරී ගෙන යන ප්‍රාග්ධන ව්‍යාපෘති තුල ඇතුලත් කර තිබුණි. කෙසේ වෙතත් එම ව්‍යාපෘතියේ ප්‍රගතිය සහ එම වටිනාකම ප්‍රාග්ධනිත නොකිරීමට අදාල හේතු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඊ) ලැබී ඇති තොරතුරු අනුව සංස්ථාව මත්තල පිහිටි හම්බන්තොට ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ගුවන් යානා ඉන්ධන ගබඩා කිරීමේ පහසුකම හා ඉන්ධන ගලා යන නල පද්ධතිය (Outside the apron area) ඉදි කිරීම සඳහා එකතුව රු. මිලියන 5,071.7 ක් දරා තිබූ අතර එම ව්‍යාපෘතිය සැලකිය යුතු මට්ටමකින් අවසන් කර 2014 ජුනි 22 දින සංස්ථාවට පවරා දී ඇති අතර 2014 ජුලි 16 දින පවරා දීමේ සහතිකය නිකුත් කර තිබුණි. ඒ අනුව ඉන්ධන ගලා යන පද්ධතියේ මෙහෙයුම් කටයුතු 2014 ජුනි 22 දින සිට බලපැවැත්වෙන පරිදි ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

i. දේපළ පිරියත හා උපකරණවල ඇතුලත් සමහර කොටස් සඳහා වෙන වෙනම විවිධ දිනයන්හිදී ක්ෂය ගණනය කර තිබුණි.

ii. ක්ෂය ගණනය කිරීම සඳහා සංස්ථාව විසින් යොදා ගත් ක්ෂය අනුපාත, දිනයන් සහ දේපළ පිරියත හා උපකරණ තුල ඇතුලත් අදාල අයිතමවල ඵලදායී ජීවිත කාලය සැසඳිය නොහැක. එහි ප්‍රතිඵලයක් ලෙස ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය මත පදනම්ව ගණනය කළ ක්ෂය වටිනාකම සහ සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති (SAP පද්ධතිය අනුව) ක්ෂය වටිනාකම අතර පිළිවෙලින් රු.128,576,712 ක සහ රු.36,487,486ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.2.4 නොසැසඳුනු වෙනස්කම්

2015 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ හා එහි පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම් අතර පහත සඳහන් නොසැසඳුනු වෙනස්කම් නිරීක්ෂණය විය.

| අයිතමය | වර්ෂය | වටිනාකම තනි තනි මූල්‍ය ප්‍රකාශන අනුව | | වෙනස |
|---|---|---|---|---|
| | | සංස්ථාව | සීපීඑස්ටීඑල් | |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| **සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු:** | | | | |
| පර්යන්ත (throughput) හා ප්‍රවාහන ගාස්තු/තෙල් ගබඩා කිරීමේ හා බෙදා හැරීමේ ගාස්තු | 2015 | 10,660.4 | 10,234.4 | 426.0 |
| | 2014 | 9,772.7 | 10,185.5 | 412.8 |
| **හිඟ ශේෂය:** | | | | |
| ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ(සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු) | 2015 | 5,828.7 | 6,164.2 | 335.5 |
| | 2014 | 5,605.7 | 7,237.6 | 1,631.9 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු යටතේ ඇතුලත් කර ඇති පර්යන්ත ගාස්තු හා ප්‍රවාහන ගාස්තුවලට අදාල රු. මිලියන 10,660.4ක් හා රු.මිලියන 9,772.6ක් පමණක් පිළිවෙලින් 2015 හා 2014 වර්ෂවලදී ඒකාබද්ධකරන ක්‍රියාවලියේදී ඉවත් කර තිබුණි. සංස්ථාව විසින් පිළියෙල කරන ලද සැසඳුම් ප්‍රකාශය අනුව වටිනාකම රු. මිලියන 338ක් වූ අයිතම පහතින් යුතු ගනුදෙනු මත භේදයට තුඩු දී තිබුණි.

(ආ) තවද සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන සම්බන්ධිත පාර්ශව ශේෂයන් හා ඊට අනුරූපීව පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ශේෂයන් මත සංස්ථාව විසින් පිළියෙල කරන ලද සැසඳුම් ප්‍රකාශය අනුව වටිනාකම රු.මිලියන 172කින් යුතු ශේෂ සම්බන්ධයෙන් මතභේදයට තුඩු දී තිබුණි.

**2.2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු වෙළඳ ණය ප්‍රමාණය වූ රු.මිලියන 18,786.8 න් පිළිවෙලින් රු.මිලියන 4,313.5ක් සහ රු.මිලියන14,473.2 ක් රාජ්‍ය ආයතන වලින් හා පුද්ගලික ආයතන වලින් සමන්විත වේ. කෙසේ වෙතත් පෙර වර්ෂයේ හිඟ හිටි ශේෂය වන රු. මිලියන 37,060 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය අවසානයේදී මුළු ලැබිය යුතු දෑ සියයට 49කින් අඩු වී ඇත.

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දෑවල කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| ගනුදෙනුකරු වර්ගය | 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය | 2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම්වල කාලවිශ්ලේෂණය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂයකට අඩු | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 3දක්වා | වර්ෂ 3 සිට 4දක්වා | වර්ෂ 4 සිට 5දක්වා | වර්ෂ 5ට වැඩි |
| | රු | රු. | රු. | රු. | රු | රු | රු. |
| බෙදුම්කරුවන් | 814,620,088 | 783,717,567 | 10,981,377 | 3,267,723 | 1,379,217 | 252,922 | 15,021,283 |
| ගුවන් සේවා | 9,477,595,864 | 7,335,533,925 | 5,173,970 | 23,376,709 | 2,111,097,630 | 2,326,616 | 87,015 |
| විදුලිජනක පිරියත | 4,497,947,417 | 3,500,944,742 | 243,391,845 | 753,610,830 | | | - |
| රජයේ පාරිභෝගිකයින් | 1,593,523,430 | 928,829,094 | 480,740,633 | 61,544,346 | 51,100,014 | 46,952,425 | 24,356,918 |
| පුද්ගලික පාරිභෝගිකයින් | 494,299,036 | 206,643,766 | 21,662,297 | 22,568,177 | 25,412,079 | 24,665,945 | 193,346,772 |
| කෘෂි රසායනික | 23,048,258 | 16,350,064 | (421,790) | 28,210 | (30,360) | 81,988 | 7,040,145 |
| අනෙකුත් | 1,885,747,417 | 1,884,321,245 | (4,081,296) | 1,362,001 | 65,474 | 201 | 4,079,793 |
| එකතුව | 18,786,781,510 | 14,656,340,403 | 757,447,036 | 865,757,996 | 2,189,024,054 | 74,280,097 | 243,931,926 |

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) 2006 අගෝස්තු 08 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සියයට 24 ක වාර්ෂික පොළී අනුපාතයක් ගනුදෙනුකරුවන්ගේ හිඟ හිටි ශේෂය මත අය කර ගත යුතුවේ. කෙසේ වුවද, දත්ත සැකසීම සහ තොග මට්ටම් සුපරීක්ෂණය වෙනුවෙන් සංස්ථාව විසින් භාවිතා කර තිබූ ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම මගින් හඳුන්වා දුන් හා ක්‍රියාත්මක කරන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීම (ERP) සඳහා වන පද්ධති යොදා ගැනීම සහ දත්ත ක්‍රියාවලි පද්ධතිය (SAP) මගින් ණය කාලය ඉක්මවූ නොපියවූ ඉන්වොයිස් මත පොළී ගණනය කිරීමේ පහසුකම සපයා නොතිබුණි. එම නිසා සංස්ථාව නොපියවූ ඉන්වොයිස් මත පොළිය අතින් ගණනය කර SAP පද්ධතිය යාවත්කාලීන කර තිබුණි. ඒ අනුව, හිඟ හිටි ශේෂ මත අය කරනු ලබන පොළියෙහි නිවැරදිභාවය හා සම්පූර්ණභාවය පිළිබඳ සහතික වීමට හැකි වන පරිදි විධිමත් පද්ධතියක් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සී/ස ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම සහ සී/ස මිහින් ලංකා පුද්ගලික සමාගම සංස්ථාවේ කොන්ත්‍රාත් ගනුදෙනුකරුවන් වුවත් 2014 වර්ෂය දක්වා එම සමාගම් සඳහා ගුවන් යානා ඉන්ධන අලෙවි කිරීම තුලින් සංස්ථාව පාඩු ලබා තිබූ අතර ඔවුන්ගේ දුර්වල මූල්‍ය කාර්යසාධනය නිසා හිඟ හිටි ඉන්ධන බිල් පත් පියවීම ඉතා දුර්වල තත්ත්වයක පැවතිණි. කෙසේ වෙතත් සංස්ථාව විසින් 2015 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ශේෂය, 2014 හිඟහිටි ශේෂය වන රු. මිලියන 22,239.1 සිට රු. මිලියන 9,156.7 දක්වා අඩුකර ගැනීමට හැකි වී තිබුණි. 2010 වර්ෂයේ සිට හිඟ හිටි ශේෂයන්ගේ උපනතිය පහත පරිදි වේ.

| සමාගමේ නම | දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ශේෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2016 ජූලි 31 | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| සී/ස ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම | 10,709.30 | 8,607.36 | 20,900.35 | 29,519.68 | 25,890.12 | 12,351.43 | 541.54 |
| මිහින් ලංකා පුද්. සමාගම | 247.50 | 549.37 | 1,338.73 | 4,313.68 | 3,416.10 | 1,227.02 | 361.24 |
| **එකතුව** | **10,956.80** | **9,156.73** | **22,239.08** | **33,833.36** | **29,306.22** | **13,578.45** | **902.78** |

(ඈ) සංස්ථාව සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම සමඟ ගුවන් තෙල් සැපයීම සම්බන්ධ ගිවිසුමක් අත්සන් කර නොතිබූ අතර ඒ අනුව සංස්ථාවට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව අවම වීම නිසා ණය නොගෙවීමේ අවදානමක් පැවතුණි. තවද 2015 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 8,607.4 ක් වූ හිඟ හිටි ශේෂය 2016 ජූලි 31 දින වන විට රු. මිලියන 10,709.3 දක්වා වැඩි වී තිබුණි.

(ඇ) සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ බොල් ණය සඳහා වෙන් කිරීම්වලට අදාලව සිදුකළ විගණන පරීක්ෂාවට අනුව පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(i) 2015 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් සිදු කළ නිශ්චිත අඩමාන ණය වෙන් කිරීම රු. 52,099,042ක් වූ අතර එය එක් වර්ෂයක සිට වර්ෂ 29 ක කාල පරිච්ඡේදයක් පුරා පැවති හිඟ හිටි ශේෂයන්ගෙන් සමන්විත වේ. ඉන් රු. 8,219,208 ක් 2015 වර්ෂය තුලදී වෙන් කර තිබුණි. විස්තර පහත පරිදි වේ.

| ගනුදෙනුකරුගේ නම | අඩමාන ණය වෙන් කිරීම | |
|---|---|---|
| | 2015 දෙසැම්බර් 31 දිනට | සංඛ්‍යාව වෙන් කිරීමේ ප්‍රතිශතයක් ලෙස |
| | රු. | |
| ගනුදෙනුකරුවන් හා භූමිතෙල් නියෝජිතයන් | 26,900,233 | 52 |
| වතු හා පුද්ගලික ගනුදෙනුකරුවන් | 9,264,132 | 17 |
| රාජ්‍ය දෙපාර්තමේන්තු හා සංස්ථා | 4,625,679 | 09 |
| ගුවන් | 4,032,957 | 08 |
| කෘෂි රසායනික හා වෙළෙන්දන් | 7,276,041 | 14 |
| **එකතුව** | **52,099,042** | **100** |

(ii) බෙදුම්කරුවන් සහ භූමි තෙල් නියෝජිතයන් සඳහා 2015 දෙසැම්බර් 31 දිනට බොල් හා අඩමාන ණය වශයෙන් රු. මිලියන 26.9 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර එම වටිනාකමෙන් රු. මිලියන 8.1 හෝ සියයට 30 ක ප්‍රතිශතයක් එක් බෙදුම්කරුවකුගෙන් නිරූපණය විය. එම බෙදුම්කරු 2014 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ශේෂය වූ රු. 7,817,395 පියවීමට අපොහොසත් වූ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට මුළු හිඟ හිටි ශේෂය රු. 8,102,409ක් (පොළී සමඟ) විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

- සංස්ථාව විසින් 2015 ට පෙර අනුගමනය කළ භාර දීම මත චෙක්පත් පදනම අනුව චෙක්පතක් අගරු වූ විට හා එම ගනුදෙනුකරුට හිඟ මුදල් පියවීමට අපොහොසත් වූ විට එම ගනුදෙනුකරු මුදල් පදනම මත ගනුදෙනුකරුයකු ලෙස වර්ගීකරණය කරන අතර අගරු වන එකිනෙක චෙක් පත මත රු. 1,000 ක දඩ මුදලක් ලෙස අයකරනු ලැබීය. තවද හිඟ මුදල් පියවූ පසු එම ගනුදෙනුකරු නැවත භාර දීම මත චෙක්පත් පදනම මත වර්ගීකරණය කරනු ලබයි. මෙම දුර්වල ණය පාලනය අනුව සමහර ගනුදෙනුකරුවන් එම අවස්ථාවලින් අයුතු ප්‍රයෝජන ලබා ගෙන තිබූ අතර ඔවුන්ගේ වාසිය සඳහා යොදාගෙන තිබුණි.
- මේ සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂාවට අනුව ලබා දී තිබූ ණය කාල සීමාව තුල අඛණ්ඩව හිඟ මුදල් නොගෙවූ ඉහත සඳහන් ගනුදෙනුකරුට එය නොසලකා අඛණ්ඩව විශේෂ ණය පහසුකම් ලබා දී තිබුණි. තවද ලැබී තිබූ තොරතුරු අනුව සංස්ථාවේ අලෙවි කළමණාකරු විසින් එම ගනුදෙනුකරු වෙත අනුචිත ණය පහසුකම් සලසා දී තිබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් එම ගනුදෙනුකරු එම අවස්ථාවලින් අයුතු ප්‍රයෝජන ලබා ගෙන තිබූ අතර වර්ෂ කිහිපයක් පුරා උපරිම වාසි ලබා ගෙන තිබුණි.
- පවතින භාර දීම මත චෙක්පත් පදනම සමඟ වර්ෂ කිහිපයක සිට අඛණ්ඩව හිඟ ශේෂ පියවීමට අපොහොසත් වීම හේතුවෙන් ණය මුදල් ගෙවීම පැහැර හැරීමේ අවධානමක් ඇති බව අතිරේක මූල්‍ය කළමණාකරු විසින් අවධාරනය කළ නමුත් සංස්ථාව විසින් එම අවධානම අඩු කිරීමට පියවර ගෙන නොතිබූ අතර ඒ වෙනුවට බෙදුම්කරුගේ මූල්‍ය හැකියාව සහ පෙර කරන ලද ගෙවීම් පිළිබඳ වාර්තා ඇගයීමක් සිදු නොකොට අලෙවි කළමණාකරු විසින් ණය පහසුකම් විශාල ප්‍රමාණයක් ලබා දී තිබුණි.
- අගරු චෙක්පත් සහ බිල්පත් සඳහා ගෙවීම් කිරීමෙන් වැළකී සිටීම පිළිබඳ නොසලකා අලෙවි කළමණාකරු විසින් තොගය ලැබුණු පසු ගෙවීම් කිරීමේ පහසුකම එම

ගනුදෙනුකරු සඳහා මාස දෙකක කාලයක් සඳහා කිසිදු ඇප සහතිකයකින් තොරව ලබා දී තිබුණි.

- 2013 මාර්තු 06 වන දින බෙදූම්කරුවකු විසින් කළ ඉල්ලීමකට අනුව කළමනාකාර අධ්‍යක්ෂ විසින් ණය සීමාව රු. 3,641,008 දක්වා සහ දින 45 ක කාලයක් තුල බැංකු ඇපකරයක් සැපයීමේ කොන්දේසිය මත දින 45 ක කාලයක් සඳහා දින තුනක ණය කාල සීමාවක් සඳහා වැඩි කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. තවද නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් 2013 අප්‍රේල් 22 වන දින නැවතත් ණය කාල සීමාව මාස දෙක දක්වා අනුමත කර තිබූ අතර එය 2013 ජූනි 20 දින බැංකු ඇපකරයක් ලබා නොගෙන මාස තුනකින් තව දුරටත් වැඩි කර තිබුණි.

- ව්‍යාපාර කටයුතු නැවැත්වූ 2014 ජනවාරි 21 වන දිනට හිඟ හිටි ශේෂය රු. 7,224,416 ක් විය. කෙසේ වෙතත් ඔහු විසින් කළ ඉල්ලීම මත සංස්ථාව විසින් බැංකු ඇපකරයක් නොමැතිව සහ හිඟ ශේෂයන් පියවීමේ එකඟතාවය මත අඛණ්ඩව සේවා සපයා දී තිබුණි. කෙසේ වෙතත් 2014 ඔක්තෝබර් 21 වන දින ඔහු විසින් නිකුත් කළ තවත් චෙක් පත් දෙකක් ආපසු එවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2015 දෙසැම්බර් 31 දිනට පොළියත් සමඟ හිඟ හිටි ශේෂය රු. 8,102,409ක් විය.

### 2.2.2.6 ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්)

සංස්ථාවේ ඉදිරි සුරැකුම් ගනුදෙනුවලට අදාලව කරනු ලබූ විගණන පරීක්ෂාවට අනුව 2015 දෙසැම්බර් 31 දිනට රටට සිදු වූ පාඩුව රු.මිලියන14,062ක් බව නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකරන ලදී.

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉදිරි සුරැකුම් ගනුදෙනුවලට අනුව වාණිජ බැංකු කීපයක් සමඟ එළඹ තිබුණු ඉදිරි සුරැකුම් ගිවිසුම් සම්බන්ධයෙන් බේරුම් කිරීමේ ක්‍රියාවලියේ පාර්ශවයක් වශයෙන් සංස්ථාව කැඳවා තිබුණි. පාර්ශව අතර එළඹ තිබූ බේරුම් කිරීමේ ඔප්පුව යටතේ එ.ජ.ඩො. මිලියන 60ක් (රු. මිලියන 7,612ක්) ස්ටෑන්ඩඩ් චාටර්ඩ් බැංකුවට (SCB) 2013 ජූනි 03 දින ගෙවා තිබූ අතර එ.ජ.ඩො මිලියන 27 ක් (රු. මිලියන 3,864.37) ක් 2016 අගෝස්තු 04 දින (2015 දෙසැම්බර් 31 දිනට වෙන් කිරීම් සිදු

කර තිබිණි) ඩොයිෂ් බැංකුවට ගෙවා තිබුණි. ලැබී ඇති තොරතුරුවලට අනුව 2015 දෙසැම්බර් 31 දිනට සංස්ථාව දරා ඇති පාඩුව රු. මිලියන 13,641.12 ක් විය.

(ආ) සංස්ථාවේ ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නීති වියදම් වශයෙන් රු. මිලියන 570.6 ක් දරා ඇති අතර එයින් රු. මිලියන 567.5 ක් ශ්‍රී ලංකා මහ බැංකුවට 2011 සිට 2014 කාලය තුල සංස්ථාව විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ඇ) මීට අමතරව ශ්‍රී ලංකා රජයට එරෙහිව ඩොයිෂ් බැංකුව ඒජී ආරම්භ කර ඇති බේරුම් කිරීමේ ක්‍රියාවලිය සඳහා පෙනී සිටි විදේශ නීතිඥයින්ගෙන් ලබාගත් සේවා සඳහා 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව රු. මිලියන 404.3 ක් ගෙවා තිබුණි. තවදුරටත් ශ්‍රී ලංකා මහ බැංකුව මේ සම්බන්ධයෙන් 2015 වර්ෂය තුල රු. මිලියන 13.1 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

(ඉ) තවද සංස්ථාවට එරෙහිව එ.ජ.ඩො 8,648,300 ක අයිතියක් සඳහා කොමර්ෂල් බැංකුව විසින් කොළඹ වාණිජ ඉහළ අධිකරණයේ නඩුවක් පවරා ඇත.

(ඊ)මේ සම්බන්ධයෙන් 2008 වර්ෂයේ සිට අනිවාර්ය නිවාඩු ලබා සිටින හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුල්‍ය) 2016 අගෝස්තු 04 දින සිට සේවයෙන් ඉවත් කර තිබුණි. කෙසේ වෙතත් සංස්ථාවේ මෙම ගනුදෙනු සම්බන්ධයෙන් වගකිව යුතු වෙනත් පුද්ගලයින්ට එරෙහිව කිසිදු පරීක්ෂණයක් ආරම්භ කර නොතිබුණි.

### 2.2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 වගන්තිය. | සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අවම වශයෙන් ඛනිජ තෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ සිටින එක් සාමාජිකයෙකු හෝ ඇතුලත්ව නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය. | පුරප්පාඩු තනතුරක රාජකාරි ආවරණය කිරීමේ කාලය මාස තුනක කාලයකට සීමා විය යුතු වුවත් සේවකයන් 04 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මාස 8 සිට වසර 4 ක කාලයක් පුරප්පාඩු තනතුරුවල රාජකාරී ආවරණය කර තිබුණි. |
| (ඇ) 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 සහ 2013 නොවැම්බර් 04 දිනැති අංක එෆ්පී/06/35/02/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | සමාලෝචිත වර්ෂය සඳහා සේවකයින් විසින් ගෙවිය යුතු රු.213,986,411ක උපයන විට ගෙවීම් බදු ඔවුන්ගේ වැටුපෙන් අඩු නොකර සංස්ථාව විසින් එහි වියදමක් වශයෙන් දරා තිබුණි. |
| (ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 5.4.12 | එකතු කළ අගය මත බදු වගකීම පියවීම සඳහා ගෙවීම් කළ පසු එම ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපති වෙත පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත පසුව එළඹෙන මාසයේ 15 වන දිනට පෙර දැනුම් දිය යුතුය. කෙසේ වෙතත් එම තොරතුරු 2016 ජූලි 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 135 | 2007 වර්ෂයේ සිට මූල්‍ය බලතල බෙදා දී නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පසුගිය වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය වූ රු.මිලියන 1,129ට එරෙහිව සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 20,176 ක බදු පෙර ශුද්ධ අලාභයක් ලබා තිබූ අතර ඒ අනුව රු.මිලියන 21,305ක මූල්‍ය ප්‍රතිඵලයේ බාදනයක් සිදු වී තිබුණි. විනිමය අනුපාත වෙනස්වීම්වල සෘණාත්මක බලපෑම, විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්වල සහ මූල්‍ය වියදම්වල වැඩි වීම සහ බදු වැඩි වීම මෙම බාදනය සඳහා ප්‍රධාන හේතු විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

19

සමාලෝචිත වර්ෂය සඳහා බදු පෙර ශුද්ධ අලාභය රු.මිලියන 20,176 ක් වුවද රට වෙනුවෙන් සංස්ථාවේ දායකත්වය රු.මිලියන 78,440 ක් විය. සමාලෝචිත වර්ෂයේ හා පසු ගිය වර්ෂ හතරක් තුල සංස්ථාව විසින් රටට කළ දායකත්වය පහත පරිදි වේ.

| | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| | ---------- | ---------- | ---------- | ---------- | ---------- |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| *බදු පසු ශුද්ධ ලාභය/පාඩුව | (21,735) | 1,129 | (7,889) | (97,181) | (94,357) |
| එකතු කළා: | | | | | |
| සේවක මණ්ඩල පාරිශ්‍රමික | 4,530 | 3,727 | 3,572 | 2,658 | 2,610 |
| ▪ රජයට කළ බදු ගෙවීම් | | | | | |
| · ආදායම් බදු | 1,559 | - | - | - | - |
| · ජාතිය ගොඩනැගීමේ බදු (NBT) | 2,074 | 2,936 | 2,652 | 3,147 | 1,897 |
| · රේගු බදු | 44,713 | 11,730 | 10,187 | 9,735 | 440 |
| · එකතු කළ අගය මත බදු (VAT) | 1,280 | 2,741 | 1,685 | 1,538 | 1,337 |
| · සුරා බදු | 35,687 | 30,205 | 25,148 | 26,089 | 23,935 |
| · වරාය ගාස්තු (PAL) | 8,648 | 15,289 | 15,823 | 20,810 | 14,537 |
| · අනෙකුත් බදු | - | 447 | - | - | - |
| ▪ විශේෂ ගෙවීම්* | 750 | 250 | - | - | - |
| ▪ ක්ෂය | 934 | 634 | 485 | 516 | 417 |
| **මුළු දායකත්වය** | **100,175** | **67,959** | **59,552** | **64,493** | **45,173** |
| **එකතු අගය** | **78,440** | **69,088** | **51,663** | **(32,688)** | **(49,184)** |

**විශේෂ ගෙවීම**

2014 දෙසැම්බර් 31 දින රු.මිලියන 10,000ක් විශේෂ ගෙවීමක් වශයෙන් සංස්ථාව විසින් මහා භාණ්ඩාගාරයට ගෙවා තිබූ අතර ඉන් රු. මිලියන 250 ක් හා රු.මිලියන 750 ක් පිළිවෙලින් 2014 හා 2015 වර්ෂ තුලදී වියදම් වශයෙන් කපා හැර තිබූ අතර ඉතිරි හිඟ ශේෂය වූ රු. මිලියන 9,000 වර්ෂ 2016 සිට 2024 දක්වා කාලය තුල කපා හැරීමට තීරණය කර තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ලාභදායීත්වය**

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම්වලින් සියයට 11.75ක ආන්තිකයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේදී සියයට 5.05ක් වූ ආන්තිකය සමඟ සැසඳීමේදී සියයට 6.70 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. එසේම, සමාලෝචිත වර්ෂයේදී දළ ලාභය ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ දළ ලාභය වූ රු. මිලියන 25,227 හා සැසඳීමේදී රු. මිලියන 14,389කින් හෙවත් සියයට 57කින් වැඩි වී තිබුණි. මෙම වර්ධනයන් සාරාංශගත කර පහත පරිදි දක්වා ඇත.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | වෙනස වාසිදායක/ (අවාසිදායක) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | 2015 | 2014 Restated | | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| ආදායම | 376,734 | 525,182 | (148,448) | 28.3 |
| විකුණුම් පිරිවැය | (337,118) | (499,955) | 162,837 | 32.6 |
| **දළ ලාභය** | **39,616** | **25,227** | **14,389** | **57.0** |
| අනෙකුත් ආදායම් | 4,234 | 3,506 | 728 | 20.8 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | (13,618) | (11,533) | (2,085) | 18.1 |
| පරිපාලන වියදම් | (2,814) | (4,904) | 2,090 | 42.6 |
| **මෙහෙයුම් ලාභය** | **27,418** | **12,296** | **15,122** | **123.0** |
| විනිමය අනුපාත වෙනස්වීම් | (32,841) | (967) | (31,874) | 3,296.2 |
| මූල්‍ය වියදම් | (15,049) | (13,980) | (1,069) | 7.6 |
| මූල්‍ය ආදායම් | 4,910 | 4,030 | 880 | 21.8 |
| ඉදිරි සුරැකුම් ගනුදෙනු | (3,864) | - | (3,864) | ∝ |
| විශේෂ ගෙවීම් | (750) | (250) | (500) | 200 |
| **ආදායම් බදු පෙර ලාභය/පාඩුව** | **(20,176)** | **1,129** | **(21,305)** | **1,887.1** |


Auditor General's Department

21

(ආ) ශුද්ධ ලාභය/අලාභයට එරෙහිව ශුද්ධ වත්කම්

2015 වර්ෂය සහ ඉකුත් වර්ෂ 7 සඳහා සංස්ථාවේ ශුද්ධ ලාභය/(පාඩුව) හා ශුද්ධ වත්කම් තත්ත්වය පහත සඳහන් වගුවෙහි හා රූප සටහනෙහි දැක්වේ.

| වර්ෂය | ශුද්ධ ලාභය/(අලාභය) | වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් තත්ත්වය |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| 2008 | (14,952) | (1,416) |
| 2009 | (11,353) | (13,038) |
| 2010 | (26,923) | (39,952) |
| 2011 | (94,357) | (131,236) |
| 2012 | (97,181) | (228,545) |
| 2013 | (7,947) | (236,529) |
| 2014* | 1,129 | (232,257) |
| 2015 | (21,735) | (229,153) |



ඉහත දැක්වූ අඛණ්ඩ මූල්‍ය පාඩු හා ප්‍රාග්ධන බාදනය සඳහා හේතු වූ ප්‍රධාන කරුණු ලෙස පෙට්‍රල් හා සුපිරි ඩීසල් හැර අනෙකුත් ඛණිජ තෙල් නිෂ්පාදන ආනයන පිරිවැයට හා දේශීය පිරිපහදු පිරිවැයට වඩා අඩු මිලකට දේශීය සිල්ලර වෙළඳ පොලේ විකිණීම, නියමිත වේලාවට බිල් පත් නොපියවීම සහ ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ක්ෂය වීම හේතුවෙන් සිදු වන විනිමය අනුපාතවල වෙනස් වීම්, බැංකු වලින් ලබා ගන්නා ණය වැඩි වීම නිසා මූල්‍ය වියදම් වැඩි වීම, රේගු බදු වැඩි වීම, අඩු ආන්තිකයක් සහිත වූ අකාර්යක්ෂම පිරිපහදු ක්‍රියාවලිය සමඟ අඩු ඵලදාව හා පිරිපහදුවේ නිතර සිදුවන වැඩ නැවැත්වීම් හේතුවෙන් නැප්තා හා දැවි තෙල් (පිරිපහදුවේ පහළ නිෂ්පාදන) අපනයනයෙන් වූ පාඩුව සහ හා එහි ප්‍රතිඵලයක් ලෙස රටේ ඉල්ලුම සපුරාලීම සඳහා පිරිපහදු කරන ලද ඛණිජතෙල් නිෂ්පාදිත ආනයනය, ඉදිරි සුරැකුම් ගනුදෙනු මත දැරූ අධික පාඩු, ලංකා විදුලිබල මණ්ඩලයට සහනදායී රේටයකට ඉන්ධන(දැවිතෙල් සහ නැප්තා) සැපයීම ආදිය වේ.

සංස්ථාව විසින් මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දීම සඳහා 2014 සැප්තැම්බර් දක්වා ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල ගණන් අඛණ්ඩව ඉහළට සංශෝධනය කර තිබූ නමුත් ජාත්‍යන්තර ඉන්ධන මිල අඩු වීමට සාපේක්ෂව 2014 වර්ෂය තුලදී දෙවරක් ද 2015 වර්ෂය තුලදී එක් වරක්ද මිල ගණන් අඩු කර තිබුණි. කෙසේ වෙතත් සංස්ථාව විසින් ජාත්‍යන්තර මිල වෙනස් වීම් හා රජයේ අරමුණුවලට සමගාමීවූ ඵලදායී මිල කරන උපාය මාර්ගයක් සැළසුම්කර ස්ථාපනය කර නොතිබුණි. 2014 හා 2015 වර්ෂවලදී සංස්ථාව විසින් ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිලෙහි සිදු කළ ප්‍රධාන වෙනස්කම් පහත පරිදි වේ.

| ඛනිජ තෙල් නිෂ්පාදන | ලීටරයක සංශෝධිත මිල (බලපැවැත්වෙන දිනය) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 නොවැ. 28 | 2015 ජන. 22 | 2014 දෙසැ.06 | 2014 සැප්. 17 | 2013 පෙබ. 23 |
| | රු. | රු. | රු. | රු. | රු. |
| පෙට්‍රල් ඔක්ටේන් 95 | 128.00 | 128.00 | 158.00 | 165.00 | 170.00 |
| පෙට්‍රල් ඔක්ටේන්92 | 117.00 | 117.00 | 150.00 | 157.00 | 162.00 |
| ලංකා ඔටෝ ඩීසල් | 95.00 | 95.00 | 111.00 | 118.00 | 121.00 |
| ලංකා සුපර් ඩීසල් | 110.00 | 110.00 | 133.00 | 140.00 | 145.00 |
| ලංකා භූමිතෙල් | 49.00 | 65.00 | 81.00 | 86.00 | 106.00 |
| ලංකා කාර්මික භූමිතෙල් | 88.00 | 94.00 | 110.00 | 115.00 | 115.00 |

**(ඇ) වැදගත් ගිණුම්කරණ අනුපාත**

ලැබී ඇති තොරතුරු අනුව සංස්ථාවේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| අනුපාත | 2015 | 2014 නැවත ප්‍රකාශිත |
|---|---|---|
| **ලාභදායිත්ව අනුපාත** | | |
| දළ ලාභ අනුපාතය (සියයට) | 10.52 | 4.80 |
| මෙහෙයුම් ලාභ අනුපාතය (සියයට) | 7.28 | 2.34 |
| ශුද්ධ ලාභ/(අලාභ) අනුපාතය (සියයට) | (5.77) | 0.21 |
| **ද්‍රවශීලතා අනුපාත** | | |
| ජංගම වත්කම් අනුපාතය (වාර ගණන) | 0.31:1 | 0.34:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන) | 0.21:1 | 0.19:1 |
| කාරක ප්‍රාග්ධනය (රු. මිලියන) | (295,113) | (271,581) |
| **ආයෝජන අනුපාත** | | |
| වත්කම් මත ප්‍රතිලාභය (සියයට) | (10.9) | 0.62 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී දළ ලාභ අනුපාතය සියයට 5.71 කින් වර්ධනය වී තිබූ අතර ශුද්ධ ලාභ අනුපාතය සියයට 5.57කින් බාදනය වී තිබුණි.

(ii) 2015 වර්ෂයේ සංස්ථාවේ කාරක ප්‍රාග්ධන තත්ත්වය පසුගිය වර්ෂය සමග සලකා බැලීමේදී සුළු වශයෙන් අඩු වී තිබුණි. කෙටි කාලීන ණය ගැනීම්වල වැඩි වීම සහ තොග හා වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දැවල අඩු වීම මෙම දුර්වල තත්ත්වය සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත.

4 **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

(අ) සංස්ථාවේ ඇතිවී තිබුණු මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දීම සඳහා 2014 සැප්තැම්බර් දක්වා ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල ගණන් අඛණ්ඩව ඉහළට සංශෝධනය කර තිබුණි. එසේම ජාත්‍යන්තර ඉන්ධන මිල අඩු වීමට සාපේක්ෂව 2014 වර්ෂය තුලදී දෙවරක් හා 2015 වර්ෂය තුලදී එක් වරක් මිල ගණන් අඩු කර තිබුණි. එසේ වුවද, ජාත්‍යන්තර වෙළඳ පොලේ සත්‍ය මිල අඩු වීම ඉහත මිල වෙනස් වීම් තුලින් සම්පූර්ණයෙන් පෙන්නුම් නොකෙරුණි. තවද පහත දැක්වෙන ඛණිජ තෙල් නිෂ්පාදනයන්ගෙන් සංස්ථාව අඛණ්ඩව පාඩු ලබා තිබුණි.

| අංශය | වර්ෂය සඳහා ශුද්ධ අලාභය | | | |
|---|---|---|---|---|
| | 2015 | 2014 | 2013 | 2012 |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| **විදුලිබල උත්පාදන** | | | | |
| දැවි තෙල් 1500 | 252 | 299 | 1,240 | 34,959 |
| **කර්මාන්ත හා දේශීය** | | | | |
| දැවි තෙල් 1500 | 262 | 69 | 350 | 2,003 |
| දේශීය භූමිතෙල් | 3,860 | 2,715 | 2,449 | 3,525 |
| **අපනයන** | | | | |
| නැප්තා | 827 | 1,799 | - | - |
| දැවි තෙල් | 5,346 | 1,627 | - | - |

තවද 2014 දෙසැම්බර් මාසයේදී පෙට්‍රල් ලීටරයක් මත අය කළ රේගු බදු රු.20 කින් (රු.15 සිට රු.35 දක්වා) වැඩි වීම හේතුවෙන් සහ 2015 ජනවාරි මාසය තුලදී දේශීය විකුණුම් මිල පහළට සංශෝධනය කිරීම හේතුවෙන් පිළිවෙලින් පෙට්‍රල් ඔක්ටේන් 92 සහ ඔක්ටේන් 95 තුලින් රු. මිලියන 26,530 ක සහ රු. මිලියන 2,787 ක අලාභයක් සංස්ථාව විසින් දරා තිබුණි.

2015 වසර සඳහා ඛනිජතෙල් නිෂ්පාදන මත ලාභදායිත්වය (ලීටරයකට)

| නිෂ්පාදනය | විකුණුම් මිල ලීටරයකට | ගනුදෙනුකරුගේ කොමිස් මුදල හැර විකුණුම් ආදායම ලීටරයකට | විකුණුම් පිරිවැය ලීටරයකට | දල ලාභය ලීටරයකට | මුළු පිරිවැය ලීටරයකට | ශුද්ධ ලාභය/ (අලාභය) ලීටරයකට | පිරිවැයෙහි අන්තර්ගත සම්පූර්ණ බදු වටිනාකම ලීටරයකට ** | සමස්ථ ශුද්ධ ලාභය/ (අලාභය) වසරට |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. මිලියන |
| පෙට්‍රල් 95 | 128.00 | 125.51 | 103.73 | 21.78 | 151.48 | 66.83 | (25.97) | (2,787) |
| පෙට්‍රල් 92 | 117.00 | 115.13 | 96.56 | 18.57 | 141.83 | 66.56 | (26.70) | (26,530) |
| ඔටෝ ඩීසල් | 95.00 | 93.68 | 71.37 | 22.31 | 90.52 | 16.35 | 3.17 | 5,647 |
| සුපර් ඩීසල් | 110.00 | 108.23 | 75.75 | 32.48 | 94.98 | 16.28 | 13.24 | 734 |
| භූමිතෙල් | 59.00 | 57.80 | 66.84 | (9.04) | 82.60 | 0.04 | (24.80) | (3,860)* |

* භූමිතෙල් සහනාධාරය වශයෙන් රු. මිලියන 3,860ක් භාණ්ඩාගාරයෙන් 2015 වර්ෂය තුලදී ලැබී ඇත.

සංස්ථාවේ සභාපති මේ සම්බන්ධයෙන් පහත පරිදි කරුණු දක්වා ඇත.

*පිරිවැය ප්‍රතිරූපණය වන මිල ක්‍රමයක් හඳුන්වා දුන් පසු මෙම නිෂ්පාදනවලින් වන අලාභය ඉවත් කළ හැක.*

(ආ)ද්‍රව ගෑස් විකිණීම සම්බන්ධව පුද්ගලික ගෑස් සමාගමක් හා ලංකා ඛනිජ තෙල් සංස්ථාව අතර එළඹ තිබූ ගිවිසුම 2006 ඔක්තෝබර් 20 දින අවසන් වී තිබුණි. කෙසේ වුවද, සංස්ථාව එම ගිවිසුම අළුත් කිරීමකින් හෝ නව ගිවිසුමකට එළඹීමකින් තොරව අඛණ්ඩව අදාල සමාගම වෙත ද්‍රව ගෑස් සපයා තිබුණි. මීට අමතරව සංස්ථාව විසින් ගිවිසුමකට එළඹීමකින් තොරව වෙනත් පුද්ගලික සමාගමකටද ද්‍රව ගෑස් සපයා තිබුණි. කෙසේ වෙතත් එල්පී ගෑස් සඳහා සිල්ලර ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අරමුණින් ගෑස් ටොන් 60ක් පැය දහයක් තුල, කිලෝ ග්‍රෑම් 13.5ක සිලින්ඩර්වලට පිරවිය හැකි එල්පී ගෑස් පිරවුම් උපකරණයක් (Mobile LPG Filling Plant)2009 වර්ෂයේදී සංස්ථාව විසින් රු. මිලියන 24කට මිලදී ගෙන තිබුණි. එසේ වුවත්,මෙතෙක් සංස්ථාව විසින්

වාණිජ කටයුතු ආරම්භ කර නොතිබුණු අතර එම වත්කම් අත්කරගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි.

සංස්ථාවේ සභාපති මේ සම්බන්ධයෙන් පහත පරිදි කරුණු දක්වා ඇත.

*සියළුම උපායයන් ව්‍යාර්ත වීමෙන් පසු සංස්ථාව අවසානයේදී එල්පී ගෑස් සිල්ලර අලෙවි ව්‍යාපාරයට යොමු වීමට තීරණය කළ අතර ඒ අනුව මළකඩ කෑම නිසා සුළු අළුත්වැඩියා කිරීමට අවශ්‍ය බව හඳුනා ගත් මුල් සැපයුම්කරුට ලබා දීමට උත්සාහ කළේය. මෙම පියවර සංස්ථාව විසින් තදින් සැලකිල්ලට යොමු කර තිබේ. සංස්ථාව විසින් දැනටමත් මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන්ගෙන් කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපි ලබා ගෙන ඇත.*

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

#### (අ) ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය(ERP)

(i) ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) විසින් හඳුන්වා දෙන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) පිළිබඳව අදාළ පාර්ශවයන්ගේ වගකීම් සම්බන්ධයෙන් සංස්ථාව, ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් නොතිබූ බව නිරීක්ෂණය විය. එසේම, මෙම පද්ධතිය විශේෂයෙන් ඉන්ධන තොග සමාලෝචනය කිරීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් ලෙස උපයෝජනය කර නොතිබුණි.

(ii) ලෙජර් ගිණුම් සඳහා කළ ගැළපීම්වල විස්තර පැහැදිළිව දක්වා නොතිබූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය තුලදී ලෙජර් ගිණුම් සඳහා කළ ගැළපීම් හඳුනා ගැනීම අපහසු විය.

#### (ආ) මාසික උපයෝගීතා ගාස්තු එකතු කිරීම

2013 ඔක්තෝබර් 29 දිනැති අංක 38/1140 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි, 2014 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි මාසික කුලිය (මාසික උපයෝගීතා ගාස්තු) සංස්ථාවට අයත් බෙදුම්කරුවන් මෙහෙයවන නියෝජිතයන් (CODO) සහ භාණ්ඩාගාරයට අයත් බෙදුම්කරුවන් මෙහෙයවන නියෝජිතයන්ගෙන් අය කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. කෙසේ වෙතත් 2016 ජූනි 30 දින වන විටත් විශේෂ බෙදුම්කරු ගිවිසුම් පිළියෙල කර ගැනීම ප්‍රමාද වීම නිසා මෙම පරිපාටිය ආරම්භ කිරීමට සංස්ථාවට නොහැකි වී තිබුණි. තවද CODO

බෙදුම්කරුවන් 248 දෙනෙකුගෙන් මාසික උපයෝගීතා කුලී ලෙස බෙදුම්කරුවන් 12 දෙනෙකුගෙන් පමණක් රු.මිලියන 23 ක් සමාලෝචිත වර්ෂය තුලදී අය කර ගෙන තිබුණි

(ඇ) බැංකු අංශයෙන් ණය ලබා ගැනීම් ඉහළ දැමීම

සංස්ථාව විසින් ඛණිජ තෙල් බිල්පත් පියවීම සඳහා බැංකු වලින් ලබා ගෙන තිබූ ණය ප්‍රමාණය වැඩි වී තිබූ අතර එය සංස්ථාවේ අලාභය වැඩි වීමට හා සෘණ ශුද්ධ වත්කම් තත්ත්වය තව දුරටත් බාදනය වීමටද හේතු වී තිබුණි. ඒ අනුව සංස්ථාව අඛණ්ඩව පසුගිය අනුයාත වර්ෂ කිහිපයක් තුල සැලකිය යුතු වටිනාකමකින් ණය ගැනීම නිසා පහත දැක්වෙන පරිදි අධික මූල්‍ය පිරිවැයක් සංස්ථාවට දැරීමට සිදු වී තිබුණි.

| වර්ෂය | දෙසැම්බර් 31 දිනට ණය සහ ණය ගැනීම්වල ශේෂය | වර්ෂය තුල කරන ලද ණය ගැනීම් | මූල්‍ය පිරිවැය | මෙහෙයුම් කටයුතු වලින් ලද ලාභය /(අලාභය) |
|---|---|---|---|---|
| | රු. බිලියන | - රු. බිලියන | රු. බිලියන | රු. බිලියන |
| 2015 | 267.926 | 356.57 | 15.05 | (21.74) |
| 2014 | 249.139 | 376.61 | 13.98 | 1.13 |
| 2013 | 228.758 | 406.85 | 18.54 | (7.89) |
| 2012 | 213.161 | 399.52 | 18.36 | (97.18) |
| 2011 | 150.622 | 310.06 | 9.00 | (94.36) |
| 2010 | 46.626 | 168.02 | 6.86 | (26.92) |

(ඉ) තෙල් ප්‍රවාහන නල මාර්ග ජාලය

කොළඹ වරාය සිට කොළොන්නාව ඛණිජතෙල් ගබඩා පර්යන්තය දක්වා පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ දැවිතෙල් වැනි ඛණිජ තෙල් නිමි නිෂ්පාදිත ප්‍රවාහනය කිරීමට දශක කිහිපයකට පෙර ස්ථාපනය කරන ලද නල මාර්ග අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින අතර ඉන් නල මාර්ග කිහිපයක් අළුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයට දිරාපත්වීම හේතුවෙන් දැනටමත් අත්හැර දමා තිබුණි. ඛනිජ තෙල් නිෂ්පාදනවල ජාතික අවශ්‍යතාවයෙන් විශාල ප්‍රමාණයක් මෙම දිරාපත් වූ නල මාර්ග තුලින් කොලොන්නාව ඉන්ධන ගබඩා පර්යන්තයට ගෙන යන බැවින් මෙම නල මාර්ග

අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම වහා කළ යුතු අවශ්‍යතාවයක් වී ඇත. එම අබලන් වූ නල මාර්ග තුලින් ආනයනික පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය කිරීම නිසා උග්‍ර ඉන්ධන අර්බුදයක් සමඟ මුළු රටම අකර්මන්‍ය වීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැක.

මේ සම්බන්ධව සංස්ථාවේ සභාපතිවරයා පහත පරිදි අදහස් දක්වා ඇත.

*"පිළිවෙලින් විෂ්කම්භය අඟල් 18 හා අඟල් 14 සහිත මාරුකිරීමේ නල 02 ක් ඉදිකිරීමට ටෙන්ඩර් කැඳවීමට පියවර ගෙන ඇත.මෙම නල ඩොල්පින් ටැංකර් බර්ත්(DTB) සිට ආරම්භ කර (නව ලෝඩින් ආර්ම් දෙකක් සහිත ) ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) කොලොන්නාව තෙල් ස්ථාපිතයෙන් අවසන් වේ. මීට අමතරව, මේ වන විට අලුත්වැඩියා කරමින් පවතින අඟල් 12 නලයද, Horizontal Drillings අවශ්‍යකරන කොටස් සිදුකර සම්පූර්ණ කරයි."*

මුතුරාජවෙල පර්යන්තයේ සිට කි.මී. 7.2ක් හා මුහුදු වෙරළේ සිට කි.මී. 6ක් පමණ දුරින් මුහුද මැද පිහිටුවා ඇති සිංගල් පොයින්ට් බෝයි මූරින් පහසුකම මාර්ගයෙන් මුතුරාජවෙල ස්ථාපිතයට සැපයීම් සිදු කෙරෙන අතර, මුහුදු රළ තත්ත්වය ඉතා දැඩිවන අවස්ථාවලදී හෝ අදාල පහසුකම පිළිබඳ නඩත්තු කටයුතු සිදුවන අවස්ථාවලදී වෙනත් විකල්ප සැපයුම් මාර්ගයක් නොවීය. නිෂ්පාදිත අන්තර් පර්යන්ත මාරු කිරීම සඳහා මුතුරාජවෙල පර්යන්තය හා කොළොන්නාව ස්ථාපිතය අතර සම්බන්ධකමක් නොවීම හේතුවෙන් එම පර්යන්ත දෙකෙහිම ප්‍රශස්ථ උපයෝජනයට බාධා මතුවී තිබුණි.

"රට හරහා නල මාර්ග ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2012 සැප්තැම්බර් 13 දින ලබා දී තිබුණද, එම ව්‍යාපෘතිය 2015 දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. කොළඹ වරායේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා දිවෙන රට හරහා නල මාර්ග ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය පහත දැක්වේ.

| නලයේ ප්‍රමාණය (අඟල්) | නිෂ්පාදනය | වත්මන් තත්ත්වය |
|---|---|---|
| 10 | ඩීසල් | ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |
| 10 | අනෙකුත් පිරිපහදු කළ ඉන්ධන (Other White Oil) | අක්‍රීයව පවතී |
| 10 | නැප්තා | අක්‍රීයව පවතී |
| 12 | නැප්තා | අක්‍රීයව පවතී. CPSTL ආයතනය විසින් ප්‍රතිස්ථාපනය කරමින් පවතී. (කිලෝ මීටර් දෙකක දුර ප්‍රමාණයක් දැනටමත් නිම කර ඇත) |
| 14 | දැවිතෙල් | ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |

**(ඊ) ත්‍රිකුණාමලයේ තෙල් ගබඩා ටැංකි සංකීර්ණය**

සණ මීටර 12,500(මෙට්‍රික් ටොන් 10,000) ධාරිතාවයෙන් යුත් තෙල් ටැංකි 100කින් සහ වෙනත් පහසුකම්ද ඇතුලත්ව 1930 දි මෙය ඉදිකර ඇත. වපසරියෙන් හෙක්ටයාර් 358.553ක් වන අතර තෙල් ටැංකි සංකීර්ණය ශ්‍රී ලංකා රජය විසින් බ්‍රිතාන්‍යය රජයේ නාවික කොමසාරිස්වරුන්ට වසර 999ක බද්දකට නිදහසට පෙර ලබා දී තිබුණි.1961 දී ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත ලංකා ඛනිජ නීතිගත තෙල් සංස්ථාව විසින් ස්ටර්ලින් පවුම් 250,000ක් වාරික තුනකින් ගෙවීමෙන් අනතුරුව ඉඩම, ටැංකි සංකීර්ණය,ගොඩනැගිලි සහ අනෙකුත් පහසුකම් පිළිබඳ හිමිකම 1964 අප්‍රේල් 01 දින සිට පවරා ගන්නා ලදී. නමුත් ඉහත ඉඩම සඳහා නිතීමය ලියවිල්ලක් රජයෙන් ලබා ගෙන නොතිබුණි.

2003 දී ශ්‍රී ලංකා රජය ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ සංස්ථාව සමඟ ගිවිසුමට එළඹ තිබූ අතර, ගබඩා පහසුකම් සහ ඉඩම වර්ෂ 35 ක කාල පරිච්ඡේදයකට ලංකා ඉන්දියන් තෙල් සමාගමට බදු දීමට සංස්ථාව එකඟ වී තිබුණි. එසේම,එම ගිවිසුමට එළඹි දින සිට මාස 06ක් ඇතුළත කල්බදු ගිවිසුම ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. කෙසේ වුවද, සංස්ථාව මෙතෙක් කිසිදු කල්බදු ගිවිසුමකට එළඹ නොතිබූ අතර,මෙම ගබඩා පහසුකම් භාවිතා කිරීම වෙනුවෙන් කිසිදු කල්බදු කුලියක් අදාල සමාගමෙන් අය කරගෙන නොතිබුණි.

1942 වර්ෂයේදී යුද්ධය හේතුවෙන් එක් තෙල් ටැංකියක් සම්පූර්ණයෙන් විනාශ වී තිබුණි. දැනට පවතින 99 ක් වූ මුළුතෙල් ගබඩා ටැංකි අතුරින් ටැංකි 14 ක් ලංකා ඉන්දියන් තෙල් සමාගම විසින් භාවිතා කරනු ලබන අතර ඉතිරි ටැංකි 85 අතහැර දමා තිබුණි. 2015 මාර්තු මාසයේදී ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර ලංකා ඉන්දියන් තෙල් සමාගම හා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව එකතු වී චීන වරායේ ඇති ටැංකි සංවර්ධනය කිරීමට එකඟ වී තිබුණි. අනතුරුව 2015 අප්‍රේල් 29 දින සිට බලපැවැත්වෙන පරිදි ඒකාබද්ධ කාර්ය සාධක බලකායක් ස්ථාපනය කරන ලද අතර එය සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත වන අතර (ඉන්දියානු සාමාජිකයින් 4ක් සහ ලංකාවෙන් සාමාජිකයින් 6ක්) සභාපති වශයෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ද පත්කර ඇත.

**(උ) සංස්ථාව සහ ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර සේවා ගිවිසුම**

---

සංස්ථාව සහ ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර සේවා ගිවිසුම ඇති කර ගත් සේවා ගිවිසුමක් නොතිබූ අතර එම නිසා එකිනෙක ආයතන විසින් සපයන සේවාවන් සම්බන්ධයෙන් විධිමත් එකඟතාවයක් පැහැදිලිව නිශ්චය කර නොතිබුණි. තවද ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් සපයනු ලබන ඛනිජ තෙල් නිෂ්පාදනවල තිබිය යුතු ප්‍රමාණය හා ගුණත්වය සහතික කිරීම සඳහා කාර්යසාධන දර්ශකයන් ඇතුළුව අධීක්ෂණ ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි සංස්ථාව විසින් නිර්මාණය කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඌ) තොග සමාලෝචන කමිටුව**

---

සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ජේසීඊ ඔයිල් බැංකුව, ලංකා ඉන්දියානු ඔයිල් සමාගම සහ ලංකා විදුලි බල මණ්ඩලයේ සාමාජිකයින් සහ රේඛීය අමාත්‍යාංශයේ නිලධාරියෙකුගෙන් තොග සමාලෝචන කමිටුව සමන්විත වූ අතර එහි රැස්වීම් සෑම සතියකම පවත්වා තිබුණි. කෙසේ වෙතත් තොග මට්ටම් එනම් යලි ඇණවුම් මට්ටම, උපරිම මට්ටම, අවම මට්ටම ,යලි ඇණවුම් ප්‍රමාණය ආදිය සම්බන්ධයෙන් වාර්තා සංස්ථාව විසින් පවත්වා නොතිබුණි. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ඉදිරිපත් කරනු ලබන තොග පවත්වා ගැනීමේ වාර්තාව පදනම් කර ගෙන පමණක් ඛනිජ තෙල් නිෂ්පාදිත ඇණවුම් කළ යුතු ප්‍රමාණය තීරණය කර තිබූ අතර ඛනිජ තෙල් නිෂ්පාදිත තොග පවත්වා ගැනීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු වාර්තාවක් සංස්ථාවේ තොග සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වෙතත් SAP පද්ධතිය හඳුන්වා දුන් දින සිට තොග ආශ්‍රිත වාර්තා උපුටා ගැනීමට හා ඉදිරිපත් කිරීමට සංස්ථාවට නොහැකි වී තිබුණි.

(එ) මුතුරාජවෙල පර්යන්තය උපයෝජනය කිරීම

ඛනිජ තෙල් නිෂ්පාදිත නිකුත් කිරීමේදී මුතුරාජවෙල පර්යන්තය අවම මට්ටමකින් භාවිතා කර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව කරන ලද ආයෝජනයෙන් පහත සඳහන් ප්‍රතිලාභ සංස්ථාව අත්කර ගෙන නොතිබුණි.

- වරාය ගාස්තු ඉතිරි කර ගැනීම
- නැව් තබා ගැනීමේ කාලය අවම කර ගැනීම
- නැව් ප්‍රමාද ගාස්තු අඩු කර ගැනීම
- බෙදා හැරීමේ පිරිවැය අවම කර ගැනීම
- මානව සම්පත් පිරිවැය අවම කර ගැනීම
- නල මාර්ග මගින් ඉන්ධන මුදා හැරීමේ බෙදා හැරීමේ පිරිවැය ඉතිරි කර ගැනීම
- බවුසර් මගින් ඉන්ධන ප්‍රවාහනයේ අවහිරතා අඩු කර ගැනීම

(ඒ) ධීවර ඉන්ධන සහනාධාර වැඩසටහන

ඉන්ධන මිල සංශෝධනය කිරීම තුළින් ධීවර කර්මාන්තයට වූ අහිතකර බලපෑම අවම කිරීමේ අරමුණින් රජය විසින් 2012 මාර්තු සිට ධීවර යාත්‍රා හිමියන්ට ඉන්ධන සහනාධාර ලබාදීමේ වැඩසටහනක්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක කර තිබුණි. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉන්ධන සහනාධාර කූපන්පත් ධීවර යාත්‍රා හිමියන් අතර බෙදාහැර තිබූ අතර,එය 2013 සැප්තැම්බර් සිට නවත්වා තිබුණි. ධීවර කූපන් සඳහා ඉන්ධන නිකුත් කිරීමට සංස්ථාව විසින් බෙදාහරින්නන් තෝරාගෙන තිබූ අතර ඒ අනුව, යාත්‍රා හිමියන් විසින් එම කූපන්පත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෝරාගත් ප්‍රාදේශීය බෙදුම්කරුවන් වෙත ඉදිරිපත් කර ඉන්ධන ලබාගෙන තිබුණි. බෙදුම්කරුවන් විසින් සංස්ථාව වෙත එම කූපන්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සංස්ථාව විසින් අදාල වටිනාකම බෙදුම්කරුවන්ට පියවීම සිදුකර තිබුණි. ඒ අනුව, සංස්ථාව විසින් දරන ලද වටිනාකම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department
AGDSL

32

i. විගණනයට ලැබී ඇති තොරතුරු වලට අනුව ධීවර කූපන් වැඩසටහන යටතේ 2015 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් බෙදුම්කරුවන් වෙත ගෙවා තිබූ වටිනාකම රු. 4,371,312,889 ක් විය. කෙසේ වුවත් වාරික තුනක් යටතේ සංස්ථාව විසින් මහා භාණ්ඩාගාරයෙන් රු. 4,549,775,000 ක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

සංස්ථාව විසින් රු. 178,462,111 ක් වැඩිපුර ප්‍රතිපූර්ණය කරගෙන තිබූ නමුත් එය 2016 ජූලි 31 දින වන විටත් මහා භාණ්ඩාගාරය වෙත පියවා නොතිබුණි.

ii. සංස්ථාවේ ධීවර සහනාධාර ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත දුර්වලතා නිරීක්ෂණය විය

- ධීවර කූපන්පත් සඳහා ලබා ගත යුතු ඉන්ධන ප්‍රමාණය ධීවර යාත්‍රා හිමියන් විසින් ලබා ගෙන නොතිබූ අතර ඒ වෙනුවට ඔවුන් විසින් සහනාධාර කූපන්පතේ මුහුණත වටිනාකමට සමාන ඉන්ධන ප්‍රමාණයක් පමණක් ලබාගෙන තිබුණි.

- ධීවර යාත්රා හිමියන් විසින් තෙල් ලබාගැනීම වෙනුවට ඉන්ධන කූපන්පත් වට්ටම් කර බෙදුම්කරුවන් වෙතින් මුදල් ලබාගෙන තිබුණි. බෙදුම්කරුවන් විසින් එම කූපන්පත් සංස්ථාව වෙත ඉදිරිපත් කර කූපන්පත්වල සම්පූර්ණ වටිනාකම ප්‍රතිපූර්ණය කර තිබුණි.

- ප්‍රතිපූරණය කළයුතු මුදලට වඩා වැඩිපුර බෙදුම්කරුවන්ගේ ගිණුම් වලට මුදල් බැර කර තිබූ අවස්ථා තිබුණි. නියැදි පරීක්ෂාවට අනුව 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූරණය කළයුතු මුදලට වඩා වැඩිපුර රු. 9,759,350 ක් බෙදුම්කරුවන්ගේ ගිණුම් වලට බැරකර තිබුණි. සංස්ථාවේ සභාපතිවරයාගේ අදහස් දැක්වීමට අනුව මේවායින් කොටසක් පසුව අයකරගෙන තිබුණි.

- සමහර අවස්ථාවල ධීවර කූපන්පත් ලබාගැනීමකින් තොරව බෙදුම්කරුවන්ගේ ගිණුම් වලට මුදල් බැරකර තිබුණු අතර පසුව ඒ සඳහා හිලවු කිරීමට කූපන්පත් ඉදිරිපත් කර තිබුණි. එවැනි අවස්ථාවක් නම්, සංස්ථාව විසින් රු. 24,310,000 ක වටිනාකමක් බෙදුම්කරුවන්ගේ ගිණුම්වලට බැරකර මාස 01 සිට මාස 12 දක්වා කාලයක් තුල ජර්නල් සටහන් මගින් නිවැරදි කර හෝ පසුව ලැබෙන කූපන්පත් වලින් හිලව් කරගෙන තිබුණි.

iii. ධීවර කුපන්පත් වලට තෙල් බෙදාහැරීම සඳහා නුසුදුසු බෙදුම්කරුවන් තෝරාගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය විය. උදාහරණ ලෙස, මාතර වෙරළ සිට කි.මී. 24 ක් දුරින් හක්මන ප්‍රදේශයේ පිහිටා ඇති ඉන්ධන පිරවුම්හලක් ධීවර කුපන් සඳහා තෙල් බෙදාහැරීමට තෝරාගෙන තිබුණි.

iv. ධීවර යාත්‍රා හිමියන්ට සත්‍ය වශයෙන් නිකුත් කරන ලද සහනාධාර කුපන්පත් වටිනාකම හා බෙදුම්කරුවන් විසින් සංස්ථාව වෙත මුදල් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද කුපන්පත් වටිනාකම අතර වෙනස රු. 81,886,701 ක් විය.

v. බෙදුම්කරුවෙකු වෙත පියවන ලද ඉන්ධන බිල්පත් වටිනාකම් පිළිබඳව සිදුකළ පරීක්ෂණයකදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

- සංස්ථාව විසින් 2012 මාර්තු සිට 2013 සැප්තැම්බර් දක්වා කාලය අතරතුර මෙම බෙදුම්කරු වෙත ඉන්ධන සහනාධාර කුපන්පත් වෙනුවෙන් ආසන්න වශයෙන් රු. මිලියන 321 ක් ගෙවා තිබූ නමුත් එම වටිනාකම සඳහා ලබාගතයුතු ඉන්ධන ප්‍රමාණයක් අදාල කාලය තුල මොහු සංස්ථාවෙන් ලබාගෙන නොතිබුණි.

- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර කුපන් ක්‍රමවේදය අනුව, බෙදුම්කරුවන්ට වෙනත් දිස්ත්‍රික්කයක ධීවර යාත්‍රා හිමියන්ට තෙල් නිකුත් කිරීමට නොහැකි විය. එසේ වුවත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටුවා තිබූ ඉහත බෙදුම්කරුගේ පිරවුම්හල, ඔහු විසින් මුලතිවු හා යාපනය දිස්ත්‍රික්කවල ධීවර යාත්‍රා හිමියන්ගේ ධීවර කුපන්පත් වට්ටම් මුදලකට ලබාගෙන (තෙල් නිකුත් නොකර), මුදල් ලබාගැනීම සඳහා සංස්ථාව වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව රු. 17,508,875 ක වටිනාකමකින් යුතු ධීවර කුපන්පත් මුදල් ලබාගැනීම සඳහා සංස්ථාව වෙත ඉදිරිපත් කර තිබූ නමුත් සංස්ථාව විසින් එම මුදල් පියවා නොතිබුණි. තවද 2016 ජූනි 30 දින වන විට රු. 6,281,250 ක් වටිනාකමැති කුපන්පත් සංස්ථාව භාර නොගැනීම නිසා බෙදුම්කරු භාරයේ රඳවාගෙන තිබුණි.

- මේ සම්බන්ධව සිදුකරන ලද අභ්‍යන්තර විගණන විමර්ශනයට අනුව, මෙම බෙදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද රු.2,658,015ක් වටිනාකමැති ව්‍යාජ කුපන්පත් වෙනුවෙන්

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL



සංස්ථාව විසින් මුදල් ගෙවා තිබුණි. කෙසේ නමුත් සංස්ථාව විසින් මෙයට වගකිවයුතු නිළධාරීන් සම්බන්ධව කිසිදු විමර්ෂණයක් ආරම්භ කර නොතිබුණි.

(ඔ) තාර ව්‍යාපාරය

2004 ජනවාරි දක්වා රටේ තාර ව්‍යාපාරය සංස්ථාව විසින් තනිවම කර ගෙන ගිය අතර 2004 ජනවාරි 21 දින සිට තාර ආනයනය හා විකිණීම සඳහා ලංකා ඉන්දියන් තෙල් සමාගම (LIOC) වෙත අනුමැතිය ලබා දී තිබුණි. එසේම 2011 නොවැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය විසින් සංස්ථාවෙන් විරුද්ධතාවයක් නොමැති බවට ලිපියක් ලබා ගෙන රටට තාර ආනයනය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අවසර ලබාදී තිබුණි. මේ අනුව, වරාය හා මහා මාර්ග අමාත්‍යාශයේ නිර්දේශයන් යටතේ වෙනත් පෞද්ගලික සමාගම් 15කට ඔවුන්ගේ හදුනාගත් ව්‍යාපෘති සඳහා තාර ආනයනයට අනුමැතිය ලබා දී තිබුණි.

පසුගිය කාල පරිච්ජේදය තුල සංස්ථාව විසින් 60/70 කාණ්ඩය හා 80/100 කාණ්ඩය යන වර්ග දෙක ප්‍රධාන වශයෙන් ආනයනය කර අලෙවිය සිදු කරන ලදී. සමාලොචිත වර්ෂය තුල සංස්ථවේ තාර ව්‍යාපාරය පිළිබඳ සිදු කළ විගණන පරීක්ෂණයේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

i. 2014 වර්ෂයේ අවසාන කාර්තුවේදී සංස්ථාව විසින් 60/70 කාණ්ඩයේ තාර බැරල් 140,123ක් ආනයනය සඳහා ඉල්ලුම් කරන ලද අතර 2015 වර්ෂය තුලදී එම තොග ලැබී තිබුණි. ඒ අනුව තාර බැරල් 28,015 කින් හෝ සියයට 25 කින් ආනයනය ප්‍රමාණය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුලදී ඉහළ ගොස් තිබුණි. එසේම පසුගිය වර්ෂය සමඟ සැසදීමේදී තාර බැරල් 80,258 කින් හෝ සියයට 67 කින් එම නිෂ්පාදනයේ අලෙවිය පහළ ගොස් තිබුණි. මේ හේතුවෙන් එම නිෂ්පාදනයේ අවසාන තොගය තාර බැරල් 101,195 කින් හෝ සියයට 336 කින් සමාලෝචිත වර්ෂය තුලදී ඉහළ ගොස් තිබුණි.

ii. සමාලෝචිත වර්ෂය සඳහා රටේ තාර අවශ්‍යතාවය සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ආනයනය කළ තාර ප්‍රමාණය සම්බන්ධ තොරතුරු සංස්ථාව විසින් හෝ අමාත්‍යාංශය විසින් පවත්වාගෙන නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂය තුල ආනයනය කළ යුතු තාර අවශ්‍යතාවය විධිමත්ව පුරෝකථනය කිරීමට සංස්ථාවට නොහැකි වී තිබුණි.

iii. සංස්ථාව විධිමත් තොග පාලන ක්‍රම නිර්මාණය කර ක්‍රියාත්මක කර නොතිබූ අතර ඒ අනුව තොගවල යලි ඇණවුම් මට්ටම, යලි ඇණවුම් ප්‍රමාණය, අවම මට්ටම සහ උපරිම මට්ටම තාර සඳහා පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ හේතුවෙන් තොග හානිවීම් සහ අවිධිමත් තොග පාලනයන් නිසා අඩු මිලට තාර විකිණීමෙන් අලාභයන් දැරීම නිරීක්ෂණය විය.

iv. විගණනය සඳහා තාර සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරිපත් නොවූ අතර එවැනි සැලසුමක් 2015 හෝ 2016 වර්ෂ සඳහා සකස් කරනු ලැබූ ක්‍රියාකාරී සැලසුමෙහිද ඇතුලත් කර නොතිබුණි.

v. 2014 දෙසැම්බර් සිට 2015 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුල 60/70 බාණ්ඩයේ වටිනාකම එ.ජ.ඩො 13,350,480ක් වූ තාර බැරල් 147,180ක් ලැබී තිබූ අතර එයින් තාර බැරල් 129,802ක (මෙට්‍රික් ටොන් 23,364) තොගයක් 2015 දෙසැම්බර් 31 වන දිනට ඉතිරිව තිබුණි. කෙසේ වෙතත් වෙළඳපොලේ තාර මිල පහළ යාමත් සමඟ තාර තොගය ලාභ ආන්තිකයකට විකිණීමට නොහැකි වූ අතර එම නිසා 2016 ජනවාරි 22 සිට බලපැවැත්වෙන පරිදි රු. 6,480 කින් මිල අඩු කරන තෙක් එම තොගය සෙමින් චලනය වන අයිතම ලෙස පැවතුණි. 2016 පෙබරවාරි 01 සිට ජූලි 31 දක්වා කාලපරිච්ඡේදය තුල තාර බැරල් 88,833ක් සංස්ථාව විසින් බැරලයක් රු.3,504.60ක් බැගින් පාඩු පිට අලෙවි කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය තුල සංස්ථාව විසින් රු.මිලියන 311.3ක ඇස්තමේන්තු අලාභයක් දරා තිබුණි.

vi. 2014 වර්ෂයේ රු.මිලියන 485.90 ක පිරිවැයක් යටතේ මිලදී ගෙන තිබූ හා 2015 සැප්තැම්බර් මස දක්වා ලැබී තිබූ 60/70 බාණ්ඩයේ තාර බැරල් 36,679 ක් 2016 ජූලි 31 දින අවසන් තොගයට ඇතුලත්ව තිබුණි. ඒ අනුව සංස්ථාවේ ප්‍රධාන අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය වන ව්‍යාපාර කටයුත්තක් නොවන තාර ව්‍යාපාරයට මෙවැනි විශාල මුදලක් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් විගණනයේදී ප්‍රශ්න ගත විය.

vii. තොග මට්ටම් පවත්වා ගැනීම සඳහා විධිමත් සැලැස්මක් විකුණුම් ඉලක්ක, පාරිභෝගික ඉල්ලුම හා වෙළඳපොළ කොටස පිළිබඳ තොරතුරු ආදිය නොමැතිව තිබියදී සංස්ථාව විසින් 60/70 කාණ්ඩයේ තාර වටිනාකම එ.ජ. ඩො 2,360,000 ක ( ආසන්න වශයෙන් රු. මිලියන. 344.10) පිරිවැය වූ තාර බැරල් 55,556ක් (මෙට්‍රික් ටොන් 10,000) සංස්ථාව විසින් 2016 මාර්තු 15 දින මිලදී ගෙන තිබූ අතර ඒවා 2016 ජූලි 31 දින වන විටත් තොගයේ පැවතුණි.

**(ඕ) දඩ මුදල් ගෙවීම**

------------------

සංස්ථාව විසින් 2014 ජුනි 20 දින නැව් තෙල් මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම උදෙසා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර ගැනීමේ පදනම යටතේ 2002 වසරේ සිට ගෙවිය යුතු ශේෂයක්ව පැවති රු.57,736,913ක් රේගු දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. කෙසේ වෙතත් රේගු දෙපාර්තමේන්තුව විසින් මෙම ගෙවීම දඩ මුදලක් ලෙස හඳුනා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරන ලදී.

i. සංස්ථාව විසින් ගෙවූ වටිනාකම 2016 ජූලි 31 දින තෙක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර නොමැත.

ii. 2016 ජූලි 31 දින තෙක් එම පහසුකම භාවිතා කර ගෙන නැව් තෙල් ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොතිබුණි.

iii. ලැබී ඇති තොරතුරු වලට අනුව මෙම ගෙවීමෙන් සියයට 50 ක් හෝ රු.28,868,456 ක් රේගු නිලධාරීන් අතර බෙදා දී තිබූ අතර තවත් සියයට 20 ක් හෝ රු.11,547,383 ක් රේගු නිලධාරීන්ගේ සුභසාධක අරමුදලට වෙත බැර කර තිබූ බව නිරීක්ෂණය විය.

iv. රාජ්‍ය ආයතන අතර මෙවැනි ආකාරයේ ගනුදෙනු හිලව් කර ගැනීමට අවස්ථාව පැවතියත් රේගු ආඥා පනතේ 154 හා 165 වගන්ති වලට අනුව සංස්ථාව විසින් මේ වෙනුවන් කිසිදු අභියාචනාවක් ඉදිරිපත් කර නොතිබුණි.

**(ඓ) ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුම**

---

වර්ෂ කිහිපයක සිට සංස්ථාව විසින් ලංකා විදුලිබල මණ්ඩලට ඉන්ධන විකුණුවද එකී පාර්ශවයන්ට මෙහෙයුම් කටයුතු පහසු කිරීම සහතිකවීම පිණිස දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුමක් හෝ අවබෝධතා ලියවිල්ලක් නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---

**(අ) පිරිපහදුවේ ක්‍රියාකාරීත්වය**

---

1969 වර්ෂයේදී ස්ථාපිත, වර්ෂ 45 ක් පැරණි වූ මෙම පිරිපහදුවෙන් රටේ වැඩිවන ඛණිජතෙල් නිෂ්පාදිත අවශ්‍යතාවය සැපයීමට නොහැකි වී ඇති අතර, ඉතා අඩු පිරිවැයකට ඉන්ධන නිපදවීම සඳහා පහසුකම් ඇති සහ එමගින් පිරිපහදු මෙහෙයුම් කාර්යක්ෂමව උපරිම කිරීමට හැකිවන වෙනත් නවීන ලෝකයේ උසස් තාක්ෂණයන් සහිතව පහළ නිෂ්පාදන තුලින් පෙට්‍රල්, ඩීසල් වැනි ඉහළ වටිනාකම් ඇති නිෂ්පාදන ලබා ගැනීමට හැකි වන පරිදි මෙහෙයුම් කෙරෙන පිරිපහදු සමහ සැසඳීමේ දී මෙම පිරිපහදුව ඉතා අඩු කාර්යක්ෂමතාවයකින් මෙහෙයුම් සිදු කෙරේ. කෙසේ වුවද, පිරිවැය ඵලදායිතා ආකාරයෙන් ඛණිජතෙල් නිෂ්පාදිත වෙළඳපොළට සැපයීම තහවුරු කර ගැනීම සඳහා යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට මෙතෙක් නොහැකි වී ඇත. මෙම අරමුණ සඳහා මූලික

ශක්‍යතා අධ්‍යයනය අවසන් වී ඇති අතර අවශ්‍ය ඉඩම් ප්‍රමාණය (අක්කර 35) අත්පත් කර ගෙන ඇති නමුත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති වීම හේතුවෙන් සංස්ථාවට මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී ඇත. පිළි ගෙවුම් කාලය වසර අටකට සහ පිරිවැය එ.ජ.ඩො බිලියන 2.1 කට ඇස්තමේන්තු කර ඇති මෙම ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය එ.ජ.ඩො මිලියන 1,535 ක් විය හැක. තවද, සංස්ථාව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වියදම් වශයෙන් දරන ලද 2015 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධන ව්‍යාපෘතිවල නොනිමි වැඩ වශයෙන් දක්වා ඇති රු. මිලියන 837ක මුදල අනාර්ථික ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය විය.

ලැබී ඇති තොරතුරු අනුව SPBM නලයේ වූ බිඳ වැටීමක් නිසා බොර තෙල්වල ඇති වූ හිඟයක් හේතුවෙන් 2014 වර්ෂය තුලදී එක් වරක් මාසයක කාලයක් සඳහා පිරිපහදුව වසා දමා තිබූ අතර ආසන්න වශයෙන් මාසය කාලයක් ප්‍රතිසංස්කරණ දෙකක් නිසා අඩු නිමැවුම් තත්ත්වයක් 2014 වර්ෂයේදී පැවතුණි. එම නිසා ලාභදායීත්වය හා මෙහෙයුම් නම්‍යශීලීත්වය වැඩි කරමින් පැරණි උපකරණවල බිදවැටීම් මහ හැරීමට සහ අඛණ්ඩ ප්‍රතිසංස්කරණ මහහැරීමට කඩිනම් තාක්ෂණික නවීකරණයක් පිරිපහදුවට අවශ්‍ය බව පෙන්නුම් කර තිබුණි.

**(ආ) පාරිභෝගිකයන් වෙත තොග ඉන්ධන විකුණුම්**

සංස්ථාව විසින් පාරිභෝගිකයන් වෙත සිදු කරන තොග ඉන්ධන විකුණුම් පරීක්ෂාවේදී පහත ඌණතාවයන් නිරීක්ෂණය විය.

i. ලැබී ඇති තොරතුරුවලට අනුව, බෙදුම්කරු වෙත නිවැරදි ඉන්ධන තොග නොලැබීම, නිසි වෙලාවට ඉන්ධන තොග බෙදුම්පොල වෙත ලඟා නොවීම හා ඉන්ධන තොග අනෙකුත් බාල නිෂ්පාදන සමග කළවම් වීම ආදී කරුණු හේතුවෙන් නිරතුරුවම ලැබුණ පැමිණිලි අවම කර ගැනිම සඳහා බෙදුම්කරු සතු ටැංකි රථ මගින් තම පිරවුම්හල වෙත ඉන්ධන ප්‍රවාහනය කර ගැනිමට අනුමැතිය 1996 වර්ෂයේ සංස්ථාව විසින් බෙදුම්කරුවන් වෙත ලබා දී තිබුණි.

ii. තවද , 2008 ජුනි 23 දිනැති අංක 43/1073 දරන අධ්‍යක්ෂක මණ්ඩල වාර්තාව සහ 2008 අගෝස්තු 29 අංක 898 දරණ සංස්ථාවේ අභ්‍යයන්තර චක්‍රලේඛ අනුව එම ක්‍රියාවලිය 2008 වර්ෂයේ සංශෝධනය කර තිබුණි. ඒ අනුව බෙදුම්කරුවන් වෙත පහත නියමයන්

හා කොන්දේසි වලට අනුව පාරිභෝගිකයන් වෙත ඉන්ධන ප්‍රවාහනය සඳහා අනුමැතිය ලබා දී ඇත.

- පාරිභෝගිකයන් වෙත කෙලින්ම ඉන්ධන බෙදා හැරීම.
- බෙදුම්කරුවන්ගේ නමින්ම ඉන්වොයිස් පත් පිළියෙල කිරිම.
- සියයට 2.5 වට්ටමක් ලබා ගත හැකි නමුත් ප්‍රවාහන ගාස්තු සඳහා හිමිකම් නොමැත.
- එම ඉන්ධන අලෙවිය බෙදුම්කරුගේ තොග අලෙවිය ලෙස සැළකීම.
- ඩීසල් පමණක් ආසන්නම තොග ගබඩාවෙන්, කොළොන්නාව නිමාවෙන්, සපුගස්කන්ද හෝ මුතුරාජවෙල පර්යන්තයන්ගෙන් ලබා ගැනීමට හැකිවීම.
- පිරවුම හල් වෙත ඉන්ධන ප්‍රවාහනය කිරීමට තම ටැංකි රථ යොදාගෙන ප්‍රවාහන ගාස්තු සංස්ථාවෙන් අය කර ගන්නා බෙදුම්කරුවන්ට තොග විකුණුම් සඳහා අවසර නොදීම.

iii කෙසේ වෙතත් ඉහත යාන්ත්‍රනයේ සමහර අසාර්ථකත්වයන් හේතුකර ගෙන 2013 අගෝස්තු 15 දිනැති ලිපි අංක MKT/13/35 අනුව සංස්ථාවේ අලෙවි කළමණාකරු විසින් පහත කොන්දේසි හඳුන්වා දෙන ලදී.

- බෙදුම්කරුවන්ට සපුගස්කන්ද පර්යන්තයෙන් පමණක් ඩීසල් ලබා ගත හැක.
- වට්ටම් අලෙවිය මත පදනම් වන නමුත් ප්‍රවාහන ගාස්තු සඳහා හිමිකම් නොමැත.

ඉහත නව කොන්දේසි සංස්ථාව විසින් හඳුන්වා දීමේ අරමුණු වන්නේ, ගබඩා සහ බෙදාහැරීමේ පහසුකම් සැපයීම සම්බන්ධයෙන් CPSTL ආයතනය වෙත ගෙවන පර්යන්ත ගාස්තු ඉතිරි කර ගැනීම සහ සපුගස්කන්ද පර්යන්තයේ මෙහෙයුම් හැකියාව ප්‍රශස්ත මට්ටමින් උපයෝගිතාවයෙහි යෙදවීමට දිරි ගැන්වීම වේ.

iv කෙසේ වෙතත් සපුගස්කන්ද පර්යන්තය මගින් පාරිභෝගිකයන් වෙත ඉන්ධන කෙලින්ම බෙදාහැරීම වෙනුවට, එක් බෙදුම්කරුවකු තම ඉන්ධන තොග වලින් පාරිභෝගිකයන් වෙත තොග ඉන්ධන ප්‍රමාණයන් පොම්ප දෙකක් (පොම්ප අංක 4 සහ 5 ) යොදාගනිමින් ඩීසල් නිකුත් කර තිබුණි. එසේම බෙදුම්කරු විසින් ගාල්ල සහ මාතර තොග ගබඩා වලින් ඉන්ධන මිලදී ගෙන තිබුණි.

v ඔහුගේ තොග භාවිතා කරමින් තොග අලෙවිය සිදුකළ ඉහත සඳහන් පොම්ප දෙකෙහි (පොම්ප අංක 4 සහ 5 ) ප්‍රමාණ ශෝධනයන් ප්‍රාදේශීය කළමණාකරු මිනුම් ඒකක ප්‍රමිත සහ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරියකුගේ සහාය ඇතිව පරීක්ෂා කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවට අනුව එම පොම්ප දෙකෙහි සත්‍ය ක්‍රමාංකයන් සම්මත මට්ටම ඇතුලත නොමැති බව නිරීක්ෂණය විය. තවදුරටත් පහත නිරීක්ෂණයන් හඳුනා ගන්නා ලදී.

- එම පොම්ප දෙක විශාල තොග නිකුත් කිරීමට පමණක් යොදා ගෙන තිබීම.
- එම පොම්ප වල ප්‍රමාණ ශෝධනයන් පරීක්ෂා කිරීමේ වගකීම ප්‍රාදේශීය කළමණාකරු විසින් පැහැර හැර තිබීම.
- බෙදුම්කරු විසින් තම ඉන්ධන තොග යොදා ගනිමින් සිදු කරන ලද අවිධිමත් තොග අලෙවිය නිවැරදි කිරීමට ප්‍රාදේශීය කළමණාකරු සහ අලෙවි කළමණාකරු විසින් කිසිදු ප්‍රතිකාර්මික විසඳුමක් ගෙන නොතිබුණි.

vi ඉහත සඳහන් කරන ලද 2013 අගෝස්තු 15 දිනැති ලිපි අංක MKT/13/35 හි සඳහන් කොන්දේසි අනුව ඉහත කී බෙදුම්කරුට තොග අලෙවිය සඳහා වට්ටම් පමණක් ගෙවිය යුතු වේ. කෙසේ වෙතත් බෙදුම්කරුට ගෙවන වට්ටමට අමතරව සංස්ථාව විසින් CPSTL ආයතනය වෙත ගබඩා හා බෙදාහැරීමේ පහසුකම් සඳහා ගෙවන පර්යන්ත ගාස්තු හා ප්‍රවාහන ගාස්තු ගෙවා තිබුණි. 2015 පෙබරවාරි සිට 2015 අප්‍රේල් කාල පරිච්ඡේදය තුල විශාල තොග අලෙවිය සම්බන්ධව සිදු කරන විගණන පරීක්ෂාවට අනුව බෙදුම්කරුට ගෙවන වට්ටමට අමතරව ඉහත බෙදුම්කරුට සිදු කරන විශාල තොග අලෙවිය සම්බන්ධයෙන් සංස්ථාව විසින් රු. 12,012,134 ක මුදලක් CPSTL ආයතනය වෙත ගෙවා තිබුණි. තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | වට්නාකම |
|---|---|
| | රු. |
| (i) පර්යන්ත ගාස්තු | 8,678,928 |
| (ii) ප්‍රවාහන ගාස්තු | 830,519 |
| (iii)ප්‍රවාහන (ගාල්ල සිට බෙදුම්කරු) | 2,502,687 |
| **එකතුව** | **12,012,134** |

ඉහත සඳහන් නුසුදුසු භාවිතයන්ට අනුව සංස්ථාව විසින් දරන ලද මුළු ඇස්තමේන්තු ගත අලාභය ආසන්න වශයෙන් රු. 48,048,536 ක් (12,012,134 x 4)පමණ වේ.

vii විශාල තොග අලෙවිය සඳහා බෙදුම්කරුවන් තෝරා ගැනීම සඳහා යෝග්‍ය පරිපාටියක් නොමැතිකම සහ තොග අලෙවිය සම්බන්ධ ක්‍රියාවලියේ පවතින මෙහෙයවීම් ක්‍රමයේ දුර්වලතා හේතු කර ගෙන පහත දුර්වලතා නිරීක්ෂණය විය.

- සපුගස්කන්ද පර්යන්තයෙන් පමණක් සෘජුව ඉන්ධන පාරිභෝගිකයන් වෙත බෙදාහැරීම වෙනුවට බෙදුම්කරුවන් විසින් තම තොග නුසුදුසු පරිදි විශාල තොග ප්‍රමාණයන්ගෙන් පාරිභෝගිකයන් වෙත බෙදාහැරීමට පුරුදු වී සිටීම.

- බෙදුම්කරුවන් විසින් තම තොග පාරිභෝගිකයන් වෙත බෙදාහැරීමට යොදා ගනු ලබන බවුසර් මුද්‍රා තබා නොමැති බව අනාවරණය විය. ඒ අනුව විශාල තොග අලෙවි පදනම මත බෙදුම්කරුවන් විසින් බෙදාහරින ලද ඉන්ධන වල ගුණත්වය සහ ප්‍රමාණය සහතික කර ගැනීම සඳහා යෝග්‍ය පරිපාටියක් සංස්ථාව විසින් පිහිටුවා නොමැති බව නිරීක්ෂණය විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

41

- යෝග්‍ය ක්‍රියාවලියක් නොමැතිකම නිසා බෙදුම්කරුවන් විසින් ක්‍රියාත්මක කරන විශාල තොග අලෙවි කිරීමේදී දුෂ්‍ය ඉන්ධන පාරිභෝගිකයන් වෙත ගොඩබෑමේ අවධානමක් පැවතීම.

- පාරිභෝගිකයන්ගෙන් බලය නොලත් ගාස්තු අය කර ගැනීම. උදාහරණ ලෙස විශාල තොග අලෙවියේදී සිල්ලර මිල ගණන් වලට වඩා වැඩි මිල ගණන් අය කිරීම නිරීක්ෂණය විය.

- විශාල තොග අලෙවිය මත ගෙවන පර්යන්ත ගාස්තු හා ප්‍රවාහන ගාස්තු ලෙස අනවශ්‍ය ගෙවීමක් සිදු කිරීම මගින් සංස්ථාව විසින් විශාල අලාභයක් දැරීම.

- සමහර බෙදුම්කරුවන් විසින් සංස්ථාවේ කිසිදු අනුමැතියකින් තොරව විශාල තොග අලෙවි කිරීම් පවත්වාගෙන ගොස් තිබූ අතර බලය නොලත් වාසි ලබා ගෙන තිබුණි. විගණන පරීක්ෂාවට අනුව සමහර බෙදුම්කරුවන් විසින් විශාල තොග අලෙවි කිරීමේ පදනම මත සිය ඉන්ධන තොග කිසිදු අනුමැතියකින් තොරව බෙදාහැරීම් සිදු කර බලය නොලත් වාසි උපයාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. උදාහරණ වශයෙන්,

    - එක් බෙදුම්කරුවකු විසින් කිසිදු අනුමැතියකින් තොරව 2015 සැප්තැම්බර් මාසයේ මුහුදු සේවාවන් සඳහා විශාල තොග අලෙවි කිරීමේ පදනම මත ඩීසල් ලීටර් 54,800 ක් විකුණා තිබීම. ඒ අනුව සංස්ථාව විසින් 2015 සැප්තැම්බර් මාසයේ රු. 136,285 ක ඇස්තමේන්තු ගත අලාභයක් දරා තිබුණි.

    - එම බෙදුම්කරු විසින් කිසිදු අනුමැතියකින් තොරව තොග විකුණුම් පදනම මත ඩීසල් ලීටර් 13,200 ක් විකුණා තිබුණි. ඒ අනුව සංස්ථාව රු. 32,828 ක ඇස්තමේන්තුගත අලාභයක් අවස්ථා දෙකකදී දරා තිබුණු බව අනාවරණය විය.

viii සෑම පිරවුම්හලකම ප්‍රමාණවත් ඉන්ධන තොග පවත්වාගෙන යාම සහ ටැංකි ට්‍රක් රථ සඳහා පවරන කාල රාමු , ගොඩ බෑමේ කාල රාමු ,කුලී ට්‍රක් රථ සඳහා ගෙවීම් යනාදී තොරතුරු විශාල තොග බෙදාහැරීමේ ජාලය පාලනය කරන සංස්ථාවෙහි ප්‍රතිපත්ති

පිළිබඳ දැනුවත් වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය කළමණාකරු සහ අධීක්ෂකවරු වගකිව යුතුය. කෙසේ වෙතත් ඉහත සිදු කරන ලද විගණන පරීක්ෂාවට අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය කළමණාකරුවන් සහ අධීක්ෂකවරුන් ඔවුන්ගේ වගකිම පැහැර හැර තිබූ බව නිරීක්ෂණය විය.

- බෙදුම්කරුවන්ගේ විශාල ඉන්ධන තොග අලෙවිය සම්බන්ධයෙන් සංස්ථාවෙහි ප්‍රතිපත්ති සමග අනුගත වීම.
- බෙදුම්කරුවන්ගේ තොග ලෙස බලය නොලත් විශාල තොග අලෙවි සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනිම.
- බෙදුම්කරුවන්ගේ අක්‍රමවත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිවැරදි සහ කාලානුරූප තොරතුරු සංස්ථාවට සැපයීම .

ix පිරවුම්හල්වල ක්‍රියාකාරකම් පාලනය සහ සුපරීක්ෂණය කිරීමේ දුර්වලතා හේතු කොට ගෙන බෙදුම්කරුවන් විසින් ඉන්ධන පොම්ප අවිධිමත්ව භාවිතා කර ඇති බව නිරීක්ෂණය විය. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- 2015 ඔක්තෝබර් 01 දින ගාල්ලේ සිල්ලර පිරවුම්හලක සිදු කළ විගණන පරීක්ෂාවකට අනුව පහත දුර්වලතා නිරීක්ෂණය විය.

    - ඉන්ධන පොම්ප අංක 1 සහ 2 ඇතුලත් ප්‍රධාන පුවරු මුද්‍රාවන් බෙදුම්කරු විසින් ප්‍රාදේශීය සුපරීක්ෂකවරයාට සහ ප්‍රාදේශීය කළමණාකරුට දැනුවත් කිරීමෙන් තොරව නඩත්තු කටයුතු සඳහා ඉවත් කර තිබුණු අතර ඒ පිළිබඳ ප්‍රාදේශීය සුපරීක්ෂකවරයා දැනුවත් වී නොතිබුණි. කෙසේ වෙතත් එම පොම්ප ප්‍රධාන පුවරු මුද්‍රාවන් නොමැතිව ඉන්ධන නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය.

    - ඩීසල් පොම්ප අංක 3 හි ප්‍රධාන පුවරු මුද්‍රාවන් ප්‍රාදේශීය සුපරීක්ෂකවරයාට දැනුවත් කර අලුත්වැඩියා කිරීම සඳහා ඉවත් කර තිබුණි. කෙසේ වෙතත් ප්‍රාදේශීය සුපරීක්ෂකවරයා එය ප්‍රාදේශීය

කාර්යාලයේ පැමිණිලි ලේඛණයේ සඳහන් කර නොතිබුණි. තවදුරටත් එම පොම්පය ප්‍රධාන පුවරු මුද්‍රාවන් නොමැතිව ඩීසල් නිකුත් කිරීමට යොදා ගෙන තිබුණි.

- 2015 ඔක්තෝබර් 02 දින පිරවුම්හලක සිදු කරන ලද විගණන පරීක්ෂාවට අනුව පොම්ප 03 හි පැවති සමහර දෝෂයන් නිසා වැඩ කරන තත්ත්වයේ නොපැවතුණි. එසේ වුවත් බෙදුම්කරු විසින් මෙම වරද සම්බන්ධයෙන් ප්‍රාදේශීය සුපරීක්ෂකවරයාට දැනුම් දී තිබුණද ප්‍රාදේශීය සුපරීක්ෂකවරයා මේ කාරණය නිවැරදි කිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ඇ) හඳුනාගත් පාඩු**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලැබී ඇති තොරතුරු අනුව, ලිහිසි තෙල් බහාලුම් හා තොග අවිධිමත් ලෙස මෙහෙයවීම නිසා පහත අලාභයන් සංස්ථාව විසින් දරා තිබුණි. කෙසේ වුවත් සංස්ථාවේ කළමණාකාරීත්වය විසින් මෙම අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 අනුව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

| වර්ෂය | පාඩුවේ ප්‍රමාණය | හානි සඳහා හේතු හා කළමනාකරණය මගින් ගෙන තිබූ පියවර |
|---|---|---|
| | රු. | |
| 2012 | 8,670,455 | ඉදිරිපත් වී නොමැත |
| 2013 | ඉදිරිපත් වී නොමැත | - |
| 2014 | 14,822,315 | ඉදිරිපත් වී නොමැත |
| 2015 | 16,759,825 | ඉදිරිපත් වී නොමැත |

(ii) පිරිපහදු ක්‍රියාවලියෙන් 2015 වර්ෂයේදී නිෂ්පාදනය කරනු ලැබූ පහත සඳහන් ඛනිජ තෙල් නිෂ්පාදන තුන තුලින් රු. මිලියන 70.5 ක අසාමාන්‍ය අලාභයක් සංස්ථාව විසින් දරා තිබුණි. විස්තර පහත දැක්වේ.

| නිෂ්පාදිතය | ඉඩ දෙන මෙහෙයුම් පාඩුව (0.5%) | පිරිවැය ලේඛන අනුව සත්‍ය පාඩුව | ඉඩ දෙන පාඩුවට වඩා වැඩි වන අසාමාන්‍ය පාඩුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| දැවි තෙල් (800) | 73,224,814 | 116,508,897 | 43,284,083 |
| ලංකා දැවි තෙල් (1500) | 46,525,010 | 71,713,240 | 25,188,230 |
| Special Boiling Point (S.B.P.) | 778,404 | 2,852,103 | 2,073,699 |
| **එකතුව** | **120,528,228** | **191,074,240** | **70,546,012** |

**4.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් වත්කම් අත්පත්කරගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි.

(අ) **වනාතමුල්ලේ පිහිටි හල්ගහකුඹුර ඉඩම-** එල්පී ගෑස් ව්‍යාපෘතිය සහ ක්‍රීඩා භූමියක් සඳහා රු.මිලියන 10.6කට මෙම ඉඩම අත්කර ගෙන තිබුණි. එසේ වුවත්, මෙම ඉඩම නීති විරෝධී පදිංචිකරුවන් (දුර්වාසීන්) 700 ක් පමණ අත්පත් කර ගෙන තිබුණි.

(ආ)**මාහේන ඉඩම -** ලබා ගත හැකි වූ ලියවිලි අනුව, සංස්ථාව විසින් මෙම ඉඩම අත්පත් කර ගැනීම සඳහා රු. මිලියන 0.625ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම ඉඩම සංස්ථාවේ පොත්වල ගිණුම් ගත කර නොතිබූ අතර 1986 වර්ෂයේ සිට එය පෙර අයිතිකරු විසින් භාවිතා කරමින් පැවතුණි.

(ඇ)**ආයෝජන-** 2015 දෙසැම්බර් 31 දිනට කොටස් වෙළඳ පොළේ මිල සඳහන් කළ හා නොකළ සමාගම් හතරක කොටස්වල කළ ආයෝජනයන්හි ධාරණ අගය රු.මිලියන 34.63ක් විය. කෙසේ වෙතත් දිගු කාලයක සිට මේවායින් කිසිදු ලාභාංශයක් සංස්ථාවට ලැබී නොතිබුණි.

**4.5 වෙනත් ආයතන සඳහා නිදහස් කළ සම්පත්**

----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය, 2006 ජනවාරි 04 දින අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද අංක සීඑස් ඒ/පී1/40 දරන හා 2010 මැයි 14 දින නිකුත් කරන ලද අංක සීඑස්/1/17/1 දරන ලිපි සහ 2004 ජනවාරි 08 දින නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 21හි දැක්වෙන විධි විධානවලට පටහැනිව පහතින් දක්වා ඇති සම්පත් සංස්ථාව විසින් වෙනත් ආයතන වෙත නිදහස් කර තිබූ අතර එසේ නිදහස් කරන ලද සේවකයින් වෙත පාරිශ්‍රමික සහ වෙනත් දීමනාද, නිදහස් කරන ලද වාහන සඳහා ඉන්ධන හා නඩත්තු වියදම්ද වශයෙන් ගෙවීම් කිරීමෙන් සැලකිය යුතු මුදලක් දරා තිබුණි. විස්තර පහතින් දක්වා ඇත.

| නිදහස් කල සම්පත | 2015 | | 2014 | | 2013 | |
|---|---|---|---|---|---|---|
| | ගණන | සංස්ථාව විසින් දැරූ පිරිවැය | ගණන | සංස්ථාව විසින් දැරූ පිරිවැය | ගණන | සංස්ථාව විසින් දැරූ පිරිවැය |
| | | රු. | | රු. | | රු. |
| මානව සම්පත් | 11 | 3,452,737 | 56 | 46,261,907 | 44 | 41,980,142 |
| වාහන | 3 | 641,375 | 7 | 7,808,961 | 7 | 4,461,920 |
| **එකතුව** | | **4,094,112** | | **54,070,868** | | **46,442,062** |

(ආ) තවද, සංස්ථාව විසින් 2014 වර්ෂයේ සිට නිළධාරීන් 02 ක් වැටුප් රහිතව නිදහස් කර තිබුණි.

(ඇ) තවදුරටත්, ලබා ගත හැකි වූ තොරතුරු අනුව සංස්ථාව විසින් 2016 වර්ෂය අතරතුරදීත් අඛණ්ඩව එම ප්‍රතිපත්තිය මේ තත්ත්වය පවත්වාගෙන ගොස් තිබූ බව අනාවරණය විය.

(ඇ) ඒ අනුව, සංස්ථාවේ කළමණාකාරීත්වය විසින් එම තත්ත්වය නිවැරදි කිරීමට හෝ එම අවපාලනයන් සඳහා වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව ප්‍රතිකර්ම ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.6 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ අනුමත සේවක මණ්ඩලය වූ 3,284 අතුරින් තනතුරු 705ක් හෝ සියයට 21ක් පමණ 2015 දෙසැම්බර් 31 දිනට වන විට පුරප්පාඩුව පැවති අතර ඉන් තනතුරු 120 ක් හෝ සියයට 27ක් අභ්‍යන්තර විගණක කළමනාකරු, කෘෂි රසායන කළමනාකරු ඇතුළුව තනතුරු විධායක මට්ටමේ තනතුරු නියෝජනය විය. ඒ අනුව මෙවැනි විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් තිබියදීත් ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාවලීන්ට බලපෑමක් නොමැතිව ආයතනය පවත්වාගෙන යාම විගණනයට ප්‍රශ්නකාරී විය.

(ආ) සංස්ථාවේ අනුමත සේවක තත්ත්වය අනුව කළමණාකරු (ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්) තනතුර 2012 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි.

(ඇ) මානව සම්පත් කළමනාකරණ ක්‍රියාපිළිවෙත් ඇතුලත් අත්පොත, අංක 12 දරන 2003 ජූනි 02 දින නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 දරන වගන්තිය අනුව පිළියෙල කර නොතිබුණි.

(ඈ) ඉහත සඳහන් චක්‍රලේඛයේ දක්වා ඇති ප්‍රතිපාදන අනුව ඉහළ කළමනාකරණයේ නිළධාරීන් විශ්‍රාම ගිය පසු එම තනතුරු පිරවීම සඳහා විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් සංස්ථාව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. කෙසේ වෙතත් අනුප්‍රාප්තික සැලැස්මක් නොමැති වීම නිසා සංස්ථාව විසින් විශ්‍රාම ගිය නිළධාරීන්ගේ සේවය කොන්ත්‍රාත් පදනම මත දීර්ඝ කර තිබූ බව අනාවරණය විය.

## 5 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

2014 සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා සංස්ථාව විසින් සංයුක්ත සැලැස්ස සහ 2015 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැසුම් සකස් කර තිබුණද, පහත සඳහන් වැදගත් ඉලක්ක ළඟා කර ගැනීමට 2015 වර්ෂය තුළදී අපොහොසත් වී තිබුණි.

(අ) දෙවන තාර වැංකිය ඉදි කිරීම

(ආ) විද්‍යුත්/හයිඩ්‍රජන් බැටරි සහිත නවීන මෝටර් රථ නැවත ආරෝහනය කර ගැනීම සඳහා ආරෝහන මුලස්ථාන 25 ක් දිවයින පුරා සිපෙට්කෝ (CEYPETCO) ඉන්ධන පිරවුම්හල්වල පිහිටුවීම.

(ඇ) හයිරැක්ස් ඔයිල් සමාගම සමඟ ලිහිසි තෙල් මිශ්‍ර කිරීමේ කර්මාන්ත ශාලාව මුතුරාජවෙලදී ඉදි කිරීම (2016 මැයි 06 වන දින මේ සම්බන්ධයෙන් මැලේසියාවේ හයිරැක්ස් ඔයිල් සමාගම සමඟ ගිවිසුමකට එළඹ තිබූ බව අනාවරණය විය)

(ඇ) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල කලාප II පියවර සංවර්ධනය කිරීම සහ ඉන්ධන නැවත ලබාදෙන පර්යන්ත පහසුකම් වැඩිදියුණු කිරීම් යටතේ ඉදිකිරීමට නියමිත ගුවන්යානා සඳහා ඉන්ධන ලබා දීමේ නල පද්ධතිය ඉදිකිරීම.

### 5.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යය සුදුසු හා දක්ෂ පුද්ගල සම්පත් වලින් සමන්විත විය යුතු අතර, එය අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සහ එම අංශය මුල්‍ය අධ්‍යක්ෂක සහ ප්‍රධාන විධායකගෙන් ස්වාධීනව කටයුතු කරන බව තහවුරු විය යුතු අතර, අභ්‍යන්තර විගණන වැඩ කටයුතුවල ප්‍රතිඵල විගණන කමිටුව වෙත වාර්තා කිරීමට වගකීම් දරන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරියකු (නියොජ්‍ය සාමාන්‍යාධිකාරී) විසින් පාලනය කළ යුතුය. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණාත්මකභාවය සහ ඵලදායීත්වය පරීක්ෂා කිරීම, ඇගයීම සහ මෙහෙයවීම ඇතුළුව සියළුම අංශ පරීක්ෂා කිරීමට තරම් ශක්තිමත් විය යුතු වුවත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සංස්ථාව විසින් පහත පරිදි පරිහානියට පත් කර තිබූ බව නිරීක්ෂණය විය.

(අ) අභ්‍යන්තර විගණන අංශයේ අනුමත සේවක සංඛ්‍යාව වන තනතුරු 42 න් තනතුරු 15 ක් හෝ සියයට 36ක් 2015 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවති අතර ඉන් තනතුරු හතක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ විය.

(ආ) සංස්ථාවේ සංවිධාන සටහන අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක සෘජුවම සංස්ථාවේ කළමණාකාර අධ්‍යක්ෂක වෙත වගකීම දරයි.

(ඇ) ඉදිරි සුරකුම් ගණුදෙනු (හෙජින්) සම්බන්ධයෙන් පවත්වන විනය සම්බන්ධ පරීක්ෂණයක් හේතුවෙන් 2008 වර්ෂයේ සිට නියෝජ්‍ය ප්‍රධාන කළමණාකරු (මූල්‍ය)අනිවාර්ය නිවාඩු යවා ඇති බැවින් එම තනතුරෙහි වැඩ බැලීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක 2011 වර්ෂයේ මැද භාගයේ සිට පත්කර තිබුණි.තවද හිටපු නියෝජ්‍ය ප්‍රධාන කළමණාකරු (මූල්‍ය) 2016 අගෝස්තු 16 දින සිට බලපැවැත්වෙන පරිදි සේවයෙන් පහ කර ඇත.

(ඈ) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු තිබියදීත් පූර්ව විගණන සේවාව සංස්ථාව විසින් ආරම්භ කර තිබුණි. ඒ අනුව වර්තමානයේදී අභ්‍යන්තර විගණන නිළධාරීන් පූර්ණ කාලීනව පූර්ව විගණන කටයුතු සඳහා යොදා ගැනීම නිසා අභ්‍යන්තර විගණන කටයුතු ඉතා දුර්වල තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

5.3 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්
------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

49

| ප්‍රධාන අංශ | නිරීක්ෂණ |
|---|---|
| ---------------- | ------------------ |
| (අ) මානව සම්පත් පරිපාලනය | කළමනාකරණ අධ්‍යක්ෂ සංස්ථාවේ ප්‍රධාන විධායක නිළධාරී වන අතර සභාපති හා ප්‍රධාන විධායක නිළධාරී එකම පුද්ගලයකු වේ. 2016 වර්ෂයේ පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී එම තනතුරු දෙක සඳහා පුද්ගලයින් දෙදෙනෙකු පත් කරන ලෙස නිර්දේශ කළද ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් මේ වන තෙක් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. බඳවා ගැනීම් පරිපාටිය අනුමත කර ගැනීමට අපොහොසත් වී තිබුණි. |
| (ආ) මූල්‍ය පාලනය | සංස්ථාවේ ප්‍රධාන අරමුණු සඳහා මුදල් යෙදවීම ක්‍රියාත්මක කිරීම. |
| (ඇ) වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | නියමිත කාලයේදී හිඟ හිටි මුදල් එකතු කිරීම සහ ණය ගෙවීම් පැහැර හැරීමේ අවධානම අඩු කිරීම සම්බන්ධයෙන් වූ පාලනයන්ගේ දුර්වලතා. |
| (ඈ)ගිණුම්කරණය හා මූල්‍ය කළමණාකරණය | සංස්ථාවේ ප්‍රධාන අරමුණු සඳහා මුදල් යෙදවීම ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් පරිදි සිදු කර නොතිබුණි. |
| (ඉ) ප්‍රසම්පාදන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් සමඟ අනුකූල වීම. |
| (ඊ) සම්පත් උපයෝජනය | චක්‍රලේඛ උපදෙස් සම්පත්වල යෙදවීමේ අනුකූලතාවය. |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

වැඩ බලන විගණකාධිපති

# දස වසරක සාරාංශය

**දේශීය විකුණුම් තොග නිෂ්පාදන**

| රුපි . මිලියන . | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 (නැවත ප්‍රකාශිත) | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **(අ) වටිනාකම** | | | | | | | | | | |
| පෙට්‍රල් | 36,677.34 | 46,579.62 | 66,433.73 | 60,055.14 | 65,157.91 | 90,498.78 | 117,600.05 | 132,397.75 | 140,885.02 | 127,879 |
| ඩීසල් | 92,474.65 | 113,737.17 | 151,070.45 | 119,046.26 | 122,360.42 | 165,800.16 | 246,441.20 | 216,419.74 | 244,407.04 | 174,984 |
| සුපර් ඩීසල් | 349.805 | 467.764 | 885.25 | 866.145 | 1,170.27 | 1,587.58 | 3,539.87 | 4,151.77 | 5,104.32 | 5,998 |
| භූමිතෙල් | 13,209.91 | 12,459.33 | 14,000.05 | 9,754.54 | 10,711.00 | 12,804.33 | 18,099.54 | 16,803.23 | 15,365.55 | 9,831 |
| දැවිතෙල් | 36,421.65 | 43,941.11 | 66,220.15 | 33,157.15 | 35,792.02 | 49,990.51 | 84,790.17 | 60,651.35 | 70,020.50 | 34,841 |
| **එකතුව** | 179,133.35 | 217,184.99 | 298,609.63 | 222,879.22 | 235,191.62 | 320,681.36 | 470,470.83 | 430,423.84 | 475,782.43 | 353,533 |
| **(ආ) ප්‍රමාණය - (මෙ.ටො.)** | | | | | | | | | | |
| පෙට්‍රල් | 367.60 | 382.10 | 383.75 | 415.67 | 484.26 | 563.37 | 618.67 | 640.35 | 687.33 | 838 |
| ඩීසල් | 1,335.30 | 1,449.70 | 1,371.32 | 1,427.33 | 1,422.12 | 1,848.66 | 1,930.40 | 1,559.06 | 1,757.39 | 1,579 |
| සුපර් ඩීසල් | 4.70 | 5.40 | 7.19 | 8.55 | 11.37 | 14.07 | 22.10 | 24.89 | 30.98 | 47 |
| භූමිතෙල් | 196.60 | 168.50 | 151.31 | 150.69 | 165.11 | 146.88 | 142.86 | 126.12 | 121.78 | 130 |
| දැවිතෙල් | 911.10 | 985.20 | 994.55 | 1,095.73 | 1,004.50 | 1,092.82 | 1,187.08 | 667.51 | 722.30 | 512 |
| **එකතුව** | 2,815.30 | 2,990.90 | 2,908.11 | 3,097.97 | 3,087.35 | 3,665.80 | 3,901.11 | 3,017.92 | 3,319.78 | 3,106 |
| **(ඇ) ඛනිජ තෙල් නිෂ්පාදන සිල්ලර අලෙවි කිරීමේ මිල** | | | | | | | | | | |
| (කොළඹ ස්ථානගත මිල දෙස. 31 දිනට ලීටරයකට) | | | | | | | | | | |
| සුපර් පෙට්‍රල් | 95.00 | 92.00 | 120.00 | 115.00 | 115.00 | 125.00 | 159.00 | 162.00 | 150.00 | 117.00 |
| ඩීසල් | 92.00 | 60.00 | 70.00 | 73.00 | 73.00 | 76.00 | 115.00 | 121.00 | 111.00 | 95.00 |
| සුපර් ඩීසල් | 65.30 | 65.30 | 85.30 | 88.30 | 88.30 | 98.30 | 142.00 | 145.00 | 133.00 | 110.00 |
| භූමිතෙල් | 48.00 | 48.00 | 50.00 | 51.00 | 51.00 | 61.00 | 106.00 | 106.00 | 81.00 | 49.00 |
| දැවිතෙල් 800" | 44.40 | 44.40 | 33.90 | 34.90 | 40.00 | 52.20 | 92.20 | 92.20 | 92.20 | 80.00 |
| දැවිතෙල් 1500" | 43.30 | 43.30 | 31.70 | 32.70 | 40.00 | 50.00 | 65.00 | 90.00 | 90.00 | 80.00 |
| දැවිතෙල් 3500" | 41.00 | 41.00 | 25.00 | 26.00 | 40.00 | 50.00 | 65.00 | 90.00 | 90.00 | 80.00 |
| **ආදායම සහ වියදම** | | | | | | | | | | |
| ආදායම | 196,767 | 238,364 | 341,670 | 237,663 | 256,329 | 356,442 | 512,910 | 490,381 | 525,182.09 | 376,734 |
| විකුණුම් පිරිවැය | 187,231 | 222,763 | 334,849 | 232,271 | 269,316 | 420,227 | 540,439 | 464,374 | 499,956 | (337,119) |
| ලාභ අන්තරය | 9,536 | 15,601 | 6,821 | 5,392 | (12,987) | (63,785) | (27,529) | 26,007 | 25,226 | 39,615 |
| වැඩ කිරීමේ සහ පිහිටුවීමේ වියදම් පොලියද සහිතව | 11,451 | 11,617 | 21,557 | 16,745 | 13,936 | 30,572 | 62,041 | 33,897 | 24,097 | (55,927) |
| හෙජින් වියදම | - | | - | | - | - | 7,612 | - | - | (3,864) |
| බදු පෙර ලාභය/ (අලාභය) | (1,915.00) | 3,984.00 | (14,735) | (11,353) | (26,923.00) | (94,357) | (97,182) | (7,889) | 1,129 | (20,176) |

| රුපි. මිලියන | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014(නැවත ප්‍රකාශිත) | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **යෙදවූ ප්‍රාග්ධනය** | | | | | | | | | | |
| ප්‍රාග්ධනය | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000 | 1,000 | 3,500 | 3,500 | 3,500 | 3,500.00 | 28500 |
| සංචිත | 10,065.90 | 12,567.80 | (2,416.40) | (14,038) | (38,369) | (134,736) | (232,045) | (239,967) | (235,757) | (257,653) |
| දිගු කාලීන වගකීම් | 16,705.00 | 13,728.20 | 10,908.40 | 32,779 | 28,478 | 27,646 | 1,998 | 1,351 | 703.48 | 342 |
| පාරිතෝෂිත වෙන්කිරීම් | 514.30 | 541.40 | 566.50 | 735 | 746 | 627 | 547 | 538 | 663.95 | 861 |
| **එකතුව** | 28,285 | 27,837 | 10,059 | 20,476 | (8,145) | (102,964) | (226,000) | (234,578) | (230,890) | (227,950) |
| **නියෝජනය වන්නේ** | | | | | | | | | | |
| කෙරීගෙන යන වැඩ සමඟ ස්ථාවර වත්කම් | 4,461 | 4,375 | 4,624 | 5,041 | 8,280 | 8,850 | 9,599 | 13,137 | 13,617 | 13,638 |
| ආයෝජන | 2,553 | 2,547 | 2,542 | 2,542 | 2,542 | 5,042 | 5,058 | 5,044 | 15,028 | 41,849 |
| ශුද්ධ ජංගම වත්කම් | 21,272 | 20,916 | 2,893 | 12,893 | (18,967) | (116,856) | (240,657) | (252,758) | (259,534) | (283,437) |
| **එකතුව** | 28,286 | 27,837 | *10,059* | *20,476* | (8,145) | (102,964) | (225,999) | (234,578) | (230,890) | (227,950) |
| **සංක්ෂිප්ත මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | | | | | | | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් (භාවිතා කළ) ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | (7,034) | 37 | (1,228) | 41,840 | (24,169) | (102,756) | (68,408) | (13,920) | (1,817) | 9,416 |
| ආ. ක්‍රියාකාරකම් වලින් (භාවිතා කළ) ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | 662 | 1,166 | 41 | (309) | (3,376) | (644) | 1,148 | (7,547) | (1,826) | (23,568) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් (භාවිතාකළ) ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | (2,478) | (3,326) | (1,001) | (21,340) | (4,379) | 119,017 | 62,540 | 7,232 | 28,745 | 41,049 |
| **මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/ (අඩු වීම)** | (8,850) | (2,123) | (2,188) | 20,191 | (31,924) | 15,617.000 | (4,720) | (14,235) | 25,102 | 26,897 |
| වර්ෂය අරම්භය මුදල් හා මුදල් සමාන දෑ | 20,934 | 12,084 | 9,961 | 7,772 | 27,963 | (3,961) | 11,656 | 6,936 | (7,299) | 17,803 |
| වර්ෂය අවසාන මුදල් හා මුදල් සමාන දෑ | 12,084 | 9,961 | 7,772 | 27,963 | (3,961) | 11,656 | 6,936 | (7,299) | 17,803 | 44,700 |
| **ගණකාධිකරණ අනුපාතයන්** | | | | | | | | | | |
| **ලාභදායීත්ව අනුපාතයන්** | | | | | | | | | | |
| දළ ලාභ අනුපාතය | 4.8% | 6.5% | 2.0% | 2.3% | -5.1% | -17.9% | -5.4% | 5.3% | 4.8% | 10.5% |
| ශුද්ධ ලාභ අනුපාතය | -0.5% | 1.2% | -4.4% | -4.9% | -10.5% | -26.5% | -18.9% | -1.6% | 0.2% | -5.8% |
| **මෙහෙයුම් අනුපාතයන්** | | | | | | | | | | |
| අදායම් බදු වෙත පිරිවැය | 99.8% | 97.9% | 102.6% | 102.7% | 109.4% | 121.8% | 108.9% | 97.8% | 97.7% | 92.8% |
| තොග පිරිවැටුම් අනුපාතය | 6.97 | 6.65 | 9.34 | 8.13 | 8.04 | 10.70 | 10.89 | 7.30 | 7.77 | 6.44 |
| පොළී අනුපාතය | 0.20 | 2.28 | (3.66) | (1.39) | (2.93) | (9.48) | (3.88) | 0.57 | 1.08 | (0.08) |
| **ද්‍රවශීල අනුපාතය** | | | | | | | | | | |
| වර්තමාන වත්කම් අනුපාත | 1.32 | 1.22 | 0.98 | 1.06 | 0.82 | 0.58 | 0.43 | 0.39 | 0.34 | 0.31 |
| ක්ෂණික අනුපාත | 0.73 | 0.64 | 0.69 | 0.86 | 0.57 | 0.45 | 0.28 | 0.24 | 0.19 | 0.21 |

# මූල්‍යමය ප්‍රකාශ සඳහා පාරිභාෂිතය

**ගණකාධිකරණ ප්‍රතිපත්ති** - මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී ආයතනයක් විසින් ගලපාගනු ලබන විශේෂිත මූලධර්ම, පදනම් කර ගැනීම්, සම්මුතීන්, නීති සහ භාවිතයන්.

**උපචිත පදනම** – ගනුදෙනු සහ වෙනත් සිදුවීම්වල බලපෑම ඒවා ඇතිවන අවස්ථාවේදීම හඳුනාගනිමින් එම මුදල් හෝ මුදල් සමාන දෑ ලැබීම් සහ ගෙවීම් සිදුවන තුරු නොසිටීම.

**මුදල් සමාන දෑ** - වටිනාකමේ වෙනස්වීම් වල කැපී පෙනෙන අවදානමකට යටත්ව හඳුනාගත හැකි මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන්ම පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීලිතාවයක් සහිත ආයෝජන.

**අවිනිශ්චිත ගෙවීම්** - අනාගතයේදී ඇතිවිය හැකි හෝ ඇතිවිය නොහැකි සිදුවීම් මඟින් නිර්ණය කරනු ලබන මූල්‍ය බලපෑමක් සහිත, මූල්‍ය තත්ව ප්‍රකාශයේ දැනට පවත්නා තත්වයන් හෝ සිදුවීම්

**ද්‍රවශීල අනුපාතය** - පවත්නා ජංගම වත්කම් සමඟ පවත්නා ගෙවීම් නැවත ගණනය කරනු ලබන වාර ගණන ගණනය කරනු ලබයි.

**ණයගැතියන්ගේ පිරිවැටුම** - සේවාදායකයන් වෙත ලබා දෙන ලද ණය ගණනය කිරීම (එනම්, දිනවලින් දක්වා ඇත්නම්, සාමාන්‍ය ණය පියවීමේ කාලපරිච්ඡේදය)

**වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිදුවීම්** - මූල්‍ය ප්‍රකාශන දිනට හෝ නිකුත් කිරීමට අවසරලත් දිනට පසු මූල්‍ය ප්‍රකාශන තත්ත්ව දිනට පසුව ඇතිවන කැපී පෙනෙන සිදුවීම්

**සාධාරණ අගය** - සමීප ගණුදෙනුවකදී රුචිකත්වය දක්වන ලද පාර්ශව හෝ දැනුමැති පාර්ශව අතර වත්කම් හුවමාරු කර ගැනීම හෝ ගෙවීම් පියවීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයන්.

**පොළී ආවරණය** - පොළී සහ බදු පෙර ලාභය මඟින් ආවරණය වන පොළිය වෙනස්වීම් වෙත ගණනය කිරීම්

**ගෙවීම්** - අවිනිශ්චිත කාල නිර්ණය කිරීම් හෝ ප්‍රමාණයන් සඳහා ගෙවීම්

**ආශ්‍රිත පාර්ශව** - මූල්‍යමය සහ මෙහෙයුම් තීරණ/ ප්‍රතිපත්ති ගැනීමේදී අනිත් පාර්ශවය පාලනය කළ හැකි හෝ කැපී පෙනෙන බලපෑමක් කළ හැකි පාර්ශවයන්.

**අංශයන්** - ස්වාභාවය සහ මෙහෙයුම්වල සමානතාවය අනුව කාණ්ඩ කරන ලද ගනුදෙනුකාර ව්‍යාපාර

**කාරක ප්‍රාග්ධනය** - එදිනෙදා මෙහෙයුම් මූල්‍යනය කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රාග්ධනය. (වර්තමාන වත්කම් අඩු කළා වර්තමාන ගෙවීම්)